මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
Central Environmental Authority

වාර්ෂික වාර්තාව - 2022



පරිසර අමාත්‍යාංශය
சுற்றாடல் அமைச்சு
Ministry of Environment

දැක්ම

විශිෂ්ට සේවාවක් තුලින් "
පිවිතුරු
හරිත පරිසරයක් "

මෙහෙවර

"මනා සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය,
මහජන සහභාගීත්වය, නීති ක්‍රියාත්මක කිරීම,
නිසි තාක්ෂණික මැදිහත්වීම්
සහ
පරිසර අධ්‍යාපනය හා දැනුවත්කිරීම් මඟින්
පරිසරයේ ගුණාත්මක බව සුරකින
සහ
හසුරුවන ජාතියේ පෙර ගමන්කරු"

පෙරවදන

2022 වර්ෂය සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මෙම අධිකාරියේ අංශ / ඒකක 15 ක, පළාත් කාර්යාල 09 ක අධ්‍යක්ෂවරුන්, ඒකක ප්‍රධානීන් හා පරිසර සභාව විසින් සපයනු ලැබූ තොරතුරු මත සම්පාදනය කරන ලදි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා අදල තොරතුරු මෙහි අන්තර්ගත වී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ ප්‍රධාන අංශ / ඒකකයන්හි හා පළාත් කාර්යාල වල ප්‍රගතිය පිළිවෙලින් වාර්තා වී ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාර හා යහ පාලන ගුරු උපදෙස් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ප්‍රගතිය, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවට ද ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා ඒ ඒ අංශ / ඒකක/ පළාත්කාර්යාල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය තොරතුරු සපයා දෙමින්, දෙනු ලැබූ අගනා සහයෝගය හා දායකත්වය සම්බන්ධයෙන් ඔවුනට ස්තූතිය පිරිනැමීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙමු.

සැලසුම් ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය

මධම පරිසර අධිකාරියේ ජාතික මෙහෙවරට 41 වසරක් සපිරෙන මෙම වසරේ, මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) වාර්ෂික වාර්තාව සහ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇතුළත් විගණනය කරන ලද ගිණුම් පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මා අතිශයින් සතුටට පත් වෙමි.

රටේ සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියට පාරිසරික කරුණු ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය පාරිසරික අවශ්‍යතා සහ සංවර්ධන අවශ්‍යතා එක් පොදු වේදිකාවක් බවට පත් කරමින් විශේෂ සේවාවක් ඉටු කරයි.

පිවිතුරු හරිත පරිසරයක් උදෙසා ක්‍රියාත්මක වීමේ දී, පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) කාර්මික ක්‍රියාකාරකම් වලින් සිදුවන විමෝචන සහ බැහැරකිරීම් පාලනය කිරීමේ ප්‍රධාන නෛතික මෙවලම වේ. ජාතික පාරිසරික පනතේ (NEA) විධිවිධානවලට අනුව ස්ථාපිත පාරිසරික ප්‍රමිතීන් සහ සම්මතයන්ට අනුකූලව කර්මාන්ත වල ක්‍රියාකාරිත්වය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ඉතා වැදගත් වේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 දී ඉහළ දූෂක කර්මාන්ත 904 ක් සහ මධ්‍යම දූෂක කර්මාන්ත 14,418 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත.

මෙරට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සලකා බැලීමේදී එම ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ විධිමත් හා අවිධිමත් අංශ වල දායකත්වයෙනි. විද්‍යුත් අපද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් අවිධිමත් අංශය හරහා එකතු කිරීම සහ බැහැරලීම අඛණ්ඩව සිදුවේ. මෙම ක්‍රියාවලීන් ස්වභාවයෙන්ම අක්‍රමවත් බැවින් සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් ඇති කිරීමට ඉතා විශාල හැකියාවක් පවති. එබැවින්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් බස්නාහිර සහ දකුණු පළාත්වල බලපත්‍රලාභී විද්‍යුත් අපද්‍රව්‍ය එකතුකරන්නන් සමඟ විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදි.

ජාතික පාරිසරික පනත විසින් බලගන්වා ඇති ප්‍රධාන නියාමන මෙවලම්වලින් එකක් වන්නේ පරිසර බලපෑම් ඇගයීම් (EIA) පටිපාටියයි. 2022 වර්ෂය තුළ නව ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් අනුමත කිරීම් 21ක් සහ මූලික පාරිසරික අධ්‍යයනයන් (IEE) සඳහා අනුමැතීන් 207ක් නිකුත් කරන ලද අතර, තවමත් අවසන් කර නොමැති, දැනටමත් අනුමත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් අනුමැතීන් දීර්ඝ කිරීම් 02ක් ලබා දෙන ලදි.

පොලිතීන් තහනම් කිරීමේ රෙගුලාසිය ප්‍රකාශයට පත් කිරීමට සමගාමීව පොලිතීන් ලන්ච් ෂීට් සඳහා විකල්පයක් ලෙස දිරාපත්වන ලන්ච් ෂීට් හඳුන්වා දෙන ලදි. එම රෙගුලාසිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජෛව භායනයට ලක්වන ලන්ච් ෂීට් සඳහා ප්‍රමිතීන් සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලා සිටි අතර, ඒ අනුව ඔවුන් කොම්පෝස්ට් කළ හැකි ලන්ච් ෂීට් ප්‍රමිතිය සකස් කර ඇති අතර ආහාර දවටන තහඩු සඳහා SLS ප්‍රමිතියට අනුකූල ඒවා නිපදවන ලෙස සමාගම්වලින් ඉල්ලුම් කර ඇත.

ඒ අතරම, ජාතික පාරිසරික පනතේ විස්තීරණ නිෂ්පාදක වගකීම (EPR) ක්‍රියාවට නැංවීමේ නියාමනය සකස් කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක විධිවිධාන ඇතුළත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය මූලිකත්වය ගෙන ඇත. මීට අමතරව, මධ්‍යම පරිසර අධිකාරිය රටේ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා සිය සහය ලබා දී ඇත. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනයේ අවසන් බැහැර කිරීම් සඳහා පහසුකම් සැලසීම වැනි සමහර ක්‍රියාකාරකම් ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැක.

ශ්‍රී ලංකා පොලිසියේ සහ පාරිභෝගික සේවා අධිකාරියේ සහය ඇතිව අපද්‍රව්‍ය අවම කිරීම සහ නිසි ලෙස බැහැර කිරීම පිළිබඳ විධිමත් කිරීමේ නීති කඩ කිරීම් සොයා බැලීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පොලිතීන් වැටලීම් අඛණ්ඩව සිදු කරන ලදි. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 වර්ෂය තුළ වැටලීම් 3,979 ක් සිදු කර ඇති අතර, උල්ලංඝනය කිරීම් 122 (ටොන් 3.77) සියහාරයට ගෙන ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 දක්වා පරිසර ආරක්ෂණ ප්‍රදේශ (EPAs) 10 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් සමනල ස්වභාවික රක්ෂිතයට යාබද වර්ණගලවත්ත ප්‍රදේශය ජාතික පාරිසරික පනත යටතේ පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට මූලික පියවර ගෙන ඇත.

පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීමේදී පරිසරය පිළිබඳ දැනුම සහ දැනුවත්භාවය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 වර්ෂය තුළ පාරිසරික අධ්‍යාපනය, දැනුවත් කිරීම් සහ ප්‍රවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් අතරට පාරිසර නියමු වැඩසටහන, පාරිසරික අධ්‍යාපනය සඳහා පුස්තකාල පිහිටුවීම, සමාජයේ විවිධ ස්ථර ඉලක්ක කර ගනිමින් අධ්‍යාපනික වැඩසටහන් සිදු කිරීම පෙන්වා දිය හැක.

මධ්‍යම පරිසර අධිකාරිය පරිසරය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමෙන් නොනැවතුණු අතර, මහජන ගැටලුවලට ද අවධානය යොමු කරයි. මධ්‍යම පරිසර අධිකාරියට ප්‍රධාන වශයෙන් CEA Hotline සේවාව (1981), ලිපි සහ ඊමේල් (complaint@cea.lk) සහ මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය (www.cea.lk) හරහා මහජන පැමිණිලි ලැබේ. එබැවින්, මහජනතාවට පාරිසරික කරුණු පිළිබඳ ඔවුන්ගේ පැමිණිලි අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන අවකාශයක් ස්ථාපිත කර ඇත. 2022 වර්ෂය තුළ පැමිණිලි 2,463 ක් ලැබී ඇති අතර සම්පූර්ණ පැමිණිලිවලින් 1,884 ක් සම්පූර්ණයෙන් විසඳා අවසන් කොට ඇත.

2022 වර්ෂය තුළ මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ ඉලක්ක සැකසීමට ලබා දුන් දායකත්වය වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සේවකයින් වෙත මාගේ අවංක ප්‍රණාමය පුදකර සිටිමි. මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට සහ පරිසර සභාවේ සාමාජිකයින්ට ඔවුන්ගේ සහයෝගය, මගපෙන්වීම, උපදෙස් සහ මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීමේදී මට ලබා දුන් සහයෝගයට ස්තුති කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි. පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරු ඇතුළු සියලුම නිලධාරීන්ට ඔවුන් දැක්වූ සහයෝගය වෙනුවෙන් මගේ ප්‍රශංසාව හිමි වෙනවා.

සභාපති

මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

TABLE 1 : මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

නම	තනතුර	සුදුසුකම්
සිරිපාල අමරසිංහ මහතා (සභාපති)		
පී.බී. හේමන්ත ජයසිංහ මහතා (අධ්‍යක්ෂ ජනරාල්)		
ඉංජී. ජේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අපද්‍රව්‍ය කළමනාකරණ)	විද්‍යාවේදී (ඉංජිනේරු) ගෞරව, ශාස්ත්‍රපති, වරලත් ඉංජිනේරු, Grad. IE (Aus.)
එම්.ජේ.ජේ. ප්‍රනාන්දු මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්)	විද්‍යාවේදී (ව්‍යාපාරික විද්‍යාව), විද්‍යාපති (වන විද්‍යාව), පශ්චාත් ඩිප්ලෝමාව (RS & GIS)
ආචාර්ය ආර්.එම්.එස්.කේ. රත්නායක මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)	විද්‍යාවේදී (විශේෂ), ආචාර්ය උපාධිය, වරලත් රසායනඥ, රසායන විද්‍යා ඩිප්ලෝමාව
කේ.ජී.ටී.එන්. කිරිඇල්ල මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)	විද්‍යාවේදී, විද්‍යාපති
ජී.ඒ. වීරසුන්දර මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්)	විද්‍යාවේදී, දර්ශනපති
එන්.එස්.ගමගේ මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර කළමනාකරණ හා ඇගයීම්)	විද්‍යාවේදී, දර්ශනපති
එච්.එස්.ප්‍රේමවන්ද්‍ර මහතා	අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)	විද්‍යාවේදී (විශේෂ) ගෞරව, විද්‍යාපති, වරලත් පරිසරවේදී, M.I.Biol, MIEPSL, MPMI (US)
එම්.එස්.ඒ.ඊ. තිස්මල්පොල මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)	නීතීඥ, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා
එම්. සිවකුමාර් මහතා	අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)	විද්‍යාවේදී (කෘෂිකර්ම විද්‍යාව) ගෞරව, පරිසර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, විද්‍යාපති (ස්වභාවික සම්පත් කළමනාකරණය), වරලත් පරිසරවේදී
වසන්තා විජේසිංහ මිය	අධ්‍යක්ෂිකා (රසායනාගාර සේවා)	විද්‍යාවේදී (රසායන විද්‍යාව) ගෞරව, විද්‍යාපති (විශ්ලේෂණ රසායන විද්‍යාව), M.I.chem., වරලත් රසායනඥ
මනූජා විමලසේන මිය	අධ්‍යක්ෂිකා (නීති)	නීතීඥ, නීතිවේදී උපාධිය (ශ්‍රී ලංකා), ප්‍රසිද්ධ නොතාරිස් (සිංහල / ඉංග්‍රීසි), දිවුරුම් කොමසාරිස් සහ සමාගම් ලේකම්
කේ.ඒ.පී. වැලිකන්නගේ මහතා	අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති, ශාස්ත්‍රපති, පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව), මානව සම්පත් කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව
දේවිකා විතානගේ මහත්මිය	අධ්‍යක්ෂිකා (අනුකූලතා පසු විපරම්)	විද්‍යාවේදී, විද්‍යාපති(පරිසර විද්‍යාව), පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව)
එන්.ජී. සෙනවිරත්න මහත්මිය	අධ්‍යක්ෂ (වයඹ පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර විද්‍යාව)
චතුර මල්වාන මහතා	අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික්කය)	විද්‍යාවේදී (ජීවවිද්‍යාව), විද්‍යාපති (පරිසරවිද්‍යාව)
එම්.ඒ.සී. නජීබ් මහතා	අධ්‍යක්ෂ (ඌව පළාත)	විද්‍යාවේදී (ජීවවිද්‍යාව), විද්‍යාපති (වනවිද්‍යාව)
සුසන්ත වෙදගේ මහතා	අධ්‍යක්ෂ (දකුණු පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති

නම	තනතුර	සුදුසුකම්
ආචාර්ය ආර්.ඒ.සී.එච්. විජයසිංහ මහත්මිය	අධ්‍යක්ෂ (සැලසුම්)	ආචාර්ය උපාධිය (ව්‍යාපාර පරිපාලන), ශාස්ත්‍රපති (ව්‍යාපාර පරිපාලන), විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) විශේෂ
කේ.ජී.එස්. ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	විද්‍යාවේදී (ජීව විද්‍යාව), විද්‍යාපති (පරිසර ඉංජිනේරු හා කළමනාකරණ)
එච්.ජී.එස්. ජයසේකර මහත්මිය	අධ්‍යක්ෂ (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර ඉංජිනේරු හා කළමනාකරණ)
ඒ.ඒ.පී. දාබරේ මිය	අධ්‍යක්ෂිකා (තොරතුරු)	ශාස්ත්‍රවේදී, විද්‍යාපති, **ALA,** වරලත් පුස්තකාලයාධිපති
ප්‍රියන්ගනී ගුණතිලක මහත්මිය	අධ්‍යක්ෂිකා (ස්වභාවික සම්පත් කළමනාකරණ)	විද්‍යාවේදී (ජීව විද්‍යාව), විද්‍යාපති (වන විද්‍යාව හා පරිසර කළමනාකරණය), පස්චාත් උපාධි ඩිප්ලෝමා
එස්.පී. පෙරියප්පෙරුම මහත්මිය	අධ්‍යක්ෂිකා (පරිසර ප්‍රවර්ධන)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර හා වන විද්‍යාව), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
එස්.එම්.ඒ. සේනානායක මහතා	අධ්‍යක්ෂ (සබරගමුව පළාත)	විද්‍යාවේදී (භෞතික විද්‍යා), විද්‍යාපති (පරිසර විද්‍යා), පශ්චාත්උපාධි ඩිප්ලෝමා
පී.ආර්.ඩී.එන්.කේ. අත්තනායක මහත්මිය	අධ්‍යක්ෂිකා (පරිසර බලපෑම් ඇගයීම්)	විද්‍යාවේදී (උද්භිද විද්‍යා), විද්‍යාපති (ස්වභාවික සම්පත් කළමනාකරණය),
සුනිල් උඩුකල මහතා	අධ්‍යක්ෂ (පරිසර අධ්‍යාපණ)	ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති
ප්‍රදීප් වක්වැල්ල මහතා	අධ්‍යක්ෂ (මුදල්)	ACA, B.Sc. (Applied Accounting)
කමල් ප්‍රියන්ත මහතා	අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික්කය)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර විද්‍යාව) පශ්චාත්උපාධි ඩිප්ලෝමා (පරිසර විද්‍යාව)
සුනිල් ගුණසිංහ මහතා	අධ්‍යක්ෂ (විමර්ෂණ)	විද්‍යාවේදී, පශ්චාත්උපාධි ඩිප්ලෝමා
පී. එම්. එම්. ප්‍රියදර්ශනී	අධ්‍යක්ෂිකා (අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි කළමණාකරණ)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර විද්‍යාව) පශ්චාත්උපාධි ඩිප්ලෝමා (පරිසර විද්‍යාව)
ඒ.ජී.ඩී.එල්. කරණාරත්න මහතා	අධ්‍යක්ෂ (උතුරුමැද පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර විද්‍යාව), පශ්චාත්උපාධි ඩිප්ලෝමා (පරිසර විද්‍යාව), සිද්ධායුර්වේදඥ (වෛද්‍ය)
ඩබ්ලිව්. ආර්. එල්. එච්.ජෑන්ස්	අධ්‍යක්ෂිකා (උපාය මාර්ගික පාරිසරික ඇගයීම්)	පශ්චාත්උපාධි ඩිප්ලෝමා (පරිසර ඉංජිනේරු හා කළමණාකරන)
ජී. යූ. විතානාරච්චි මිය	අභ්‍යන්තර විගණක	විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික, **HDM**

පටුන

පෙරවදන ii
මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ii
පටුන iv
වගු ලැයිස්තුව v
රූප ලැයිස්තුව vii
Chapter 1 : මධ්‍යම පරිසර අධිකාරිය 1
A. හැඳින්වීම 1
B. අරමුණු 1
C. බලතල, කාර්ය සහ රාජකාරී 1
D. පරිසර සභාව 2
E. ආයතන ව්‍යුහ 5
Chapter 2 : පරිසර දූෂණ පාලන අංශය 6
A. හැඳින්වීම 10
Chapter 3 : අපද්‍රව්‍ය කළමණාකරන අංශය 17
Chapter 4 **: පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය** 28
4.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය. 52
Chapter 5 **: පර්යේෂණ හා සංවර්ධන ඒකකය** 60
Chapter 6 : නීති ඒකකය 64
Chapter 7 : පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය 67
Chapter 8 : සැලසුම් හා පසුවිපම් ඒකකය 85
Chapter 9 : අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය 87
Chapter 10 : අභ්‍යන්තර විගණන ඒකකය 95
Chapter 11 : විමර්ශණ ඒකකය 96
Chapter 12 : තොරතුරු තාක්ෂණ ඒකකය 102
A. හැඳින්වීම 102
B. 2022 වර්ෂය තුල තොරතුරු තක්ෂණ ඒකකයේ ප්‍රධාන කාර්යයන් 102
C. මෘදුකාංග පද්ධති සංවර්ධනය 102
D. මධ්‍යම පරිසර අධිකාරියේ ඩිජිටල් පරාවර්තනය (2020 - 2030) 102
Chapter 13 : මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල 103
B. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම 103
C. දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC) 103
Chapter 14 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල 105
A. හැඳින්වීම 105
II. නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 107
Chapter 15 **: ප්‍රාදේශීය මෙහෙයුම් අංශය** 112
Chapter 16 **: පළාත් කාර්යාල වලින් සාර්ථක වැඩසටහන්** 115
Chapter 17 : මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරණු ලබන විශේෂ ව්‍යාපෘති. 120
17.1 "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන 120
Chapter 18 : මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මූල්‍ය අංශය 126
18.1 මානව සම්පත් සංවර්ධන ඒකකය 126
18.3 මුදල් ඒකකය 129
Chapter 19 : විගණකාධිපති වාර්තාව 154

වගු ලැයිස්තුව

Table 1 : මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ii
Table 2 : පරිසර සභාවේ සාමාජිකත්වය 2
Table 3 : “ අ” , “ ආ” සහ “ ඇ” කාණ්ඩයේ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම 7
Table 4 : : සල්ෆර් ඩයොක්සයිඩ් (SO2) හා නයිට්‍රජන් ඔක්සයිඩ් (NO2) පිළිබඳ මිනුම් 12
Table 5 : වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් අංශය මඟින් සිදු කරනු ලැබූ මිනුම් කටයුතු පිළිබඳ විස්තර 15
Table 6 : : අනෙකුත් ආයතන / අංශ සමග සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම්. 16
Table 7 : අපද්‍රව්‍ය කළමනාකරණය 2022 වර්ෂය 26
Table 8 : පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් 2022 වසර සඳහා අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති ලැයිස්තුව. 28
Table 9 : පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැතිව 2022 වසරේදී පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 30
Table 10 : අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් ඇති ප.බ.ඇ./ මූ.පා.ප. ව්‍යාපෘති ලැයිස්තුව 30
Table 11 : ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම හේතුවෙන් ප.බ.ඇ. ක්‍රියාවලියට යොමු කර නොමැති ව්‍යාපෘති. 34
Table 12 : 2022 වසරේ දී අනෙකුත් අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල/ වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 35
Table 13 : අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය එකඟතාව ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව 38
Table 14 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත තාක්ෂණික සහය/ මාර්ගෝපදේශ ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව 41
Table 15 : 2022 වසර තුළ දී පාරිසරික උපදේශන කමිටුව වෙත යොමු කර ඇති නව අයදුම්පත් 42
Table 16 : 2022 වසර තුල දී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ පාරිසරික උපදේශන කමිටු රැස්වීම් ලැයිස්තු 43
Table 17 : 2022 වසර තුල දී පාරිසරික උපදේශන කමිටු මඟින්නව නව පාරිසරික අනුමැතිය ලබා දී ඇති ව්‍යාපෘති 44
Table 18 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ ව්‍යාපෘති කමිටු 45
Table 19 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නියාමන කමිටු 45
Table 20 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ අධීක්ෂණ කමිටු රැස්වීම් 46
Table 21 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ වෙනත් විවිධ රැස්වීම් ලැයිස්තුව 46
Table 22 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නීති උපදේශන සැසි 47
Table 23 : 2022 වර්ෂය තුළ අධීක්ෂණය කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 47
Table 24 : 2022 වසර තුළදී පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන් 49
Table 25 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ වැඩසටහන් 49
Table 26 : 2022 වර්ෂය තුළ පාරිසරික බලපෑම් ඇගයීම් ඒකකය පැමිණිලි සඳහා මැදිහත් වූ ව්‍යාපෘති 49
Table 27 : තොරතුරු දැනගැනීමේ පනතේ හි විධිවිධාන පරිදි මහජනතාව ඉල්ලා සිටින තොරතුරු සඳහා ද අවස්ථා 08 ක දී පිළිතුරු ලබා දීම. 51
Table 28 : සහභාගී වූ වැඩමුළු/ රැස්වීම් ගණන 52
Table 29 : කළමනාකරණ කමිටු රැස්වීම් 53
Table 30 : සිදු කරන ලද පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන 54
Table 31 : ස්වභාවික සම්පත් කළමනාකරණය හා අදාලව පැමිණිලි 56
Table 32 : පර්යේෂණ යෝජනා 61
Table 33 ඊ අවසන් කළ ව්‍යාපෘති 61
Table 34 ඊ තවදුරටත් සිදුකරමින් පවතින ව්‍යාපෘති 62
Table 35 : පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය 64
Table 36 : 2022 වසරේ ප්‍රගතිය 68
Table 37 : 2022 වසරේ පරිසර ළමා සමාජ ප්‍රගතිය 68

Table 38 : 2022 වර්ෂයේදී අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් සිදුකරන ලද කර්මාන්ත අනුකූලතා පසුවිපරම් තොරතුරු 87
Table 39 : 2022 වර්ෂයේදී පළාත් / දිස්ත්‍රික් කාර්යාල මගින් දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද අනුකූලතා පසුවිපරම් සංඛ්‍යාව 88
Table 40 : යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාව - "ඒ","බී"හා"සී" කාණ්ඩ හා දිස්ත්‍රික්ක අනුව 91
Table 41 : අංක 2034/34 දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි බලාත්මක කිරීම 96
Table 42 : අංක 2211/51 දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි බලාත්මක කිරීම 97
Table 43 : සමීක්ෂණය සිදු කරන ලද දිනයන් 100
Table 44 : පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම. 106
Table 45 : නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 107
Table 46 : මූලික පාරිසරික පරීක්ෂණ (IEE) / පරිසර බලපෑම් ඇගයීම (EIA) නියමයන්ට අනුකූලව 2022 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව. 109
Table 47 : 2022 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව 110
Table 48 : 2022වසර තුළ ශ්‍රී ලංකාවේ සියලුමපළාත් ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා 30 ක් “සුරකිමු ගංගා” ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් අනුමත කරන ලදුව ප්‍රතිපාදන නිදහස් කර ඇත. 121
Table 49 : “සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහනේ පොදු කර්තව්‍යන්ගේ ප්‍රගතිය 123
Table 50 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය 124
Table 51 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ වියදම් සාරාංශය 125
Table 52 : 2022 වර්ෂයේ සේවයට බඳවා ගැනීම්, උසස්වීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය හැර යාම සහ විශ්‍රාම ගැනීම 127
Table 53 : මධ්‍යම පරිසර අධිකාරියට 2022 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබී ඇත. 132
Table 54 : මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 133
Table 55 : මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 133
Table 56 : මුදල් ප්‍රවාහ ප්‍රකාශය 135
Table 57 : කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය 136
Table 58 : මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 137

රූප ලැයිස්තුව

Figure 1 : ආයතන ව්‍යුහය 5
Figure 2 : :“ අ” , “ ආ” සහ “ ඇ” කාණ්ඩ වල මුළු කර්මාන්ත ගණන පහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ. 8
Figure 3 : : 2022 වසර තුල රැස්කරනු ලැබූ සම්පූර්ණ ජල නියැදි සන්ඛ්‍යාව 11
Figure 4 : 2022 වසරේදි මාසික සාමානය සල්පර් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය 13
Figure 5 : : 2022 වසරේදි මාසික සාමානය නයිට්‍රජන් ඩක්සයිඩ් සාන්ද්‍රණය 13
Figure 6 : : ශ්‍රී මහ බොධිය අසල ස්ථාපිත සන්වේදක වායු තත්ව පසුවිපරම් කිරීම 14
Figure 7 : : යාපනය නගරයේ ස්ථාපිත සන්වේදක වායු තත්ව පසුවිපරම් කිරීම උත්සවාකරයෙන් විවිත කිරීම 14
Figure 8 : : 2022 වසර තුල රැස්කරනු ලැබූ සම්පූර්ණ ජල නියැදි සන්ඛ්‍යාව 15
Figure 9 : : “රත්නපුර සමන් දේවාලය” පිරිසිදු කිරීමේ වැඩසටහන 21
Figure 10 : : වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන 22
Figure 11 : : ශ්‍රී පාද සිද්ධස්ථානය” පිරිසිදු කිරීමේ වැඩසටහන 22
Figure 12 : : USAID CLEAN CITY BLUE OCEAN වැඩසටහන මගින් ලැප්ටොප් පරිගණකයක් භාරදීම 25
Figure 13 : CMC කාර්ය මණ්ඩලය සඳහා පොලිතින් වැටලීම් දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන 25
Figure 14 : සනීපාරක්ෂක බිම්පරිවුම 26
Figure 15 : : සම්පූර්ණ ජෛව භායනයට ලක්විය හැකි අපද්‍රව්‍ය හැසිරවීම සහ අපද්‍රව්‍ය සනීපාරක්ෂක කසළ රඳවනයට බැහැර කිරීම. 27
Figure 16 : අපද්‍රව්‍ය හැසිරවීම මගින් උපයාගත් මුළු ආදායම. 27
Figure 17 : ඉඩම් පරිහරණ තොරතුරු වාර්තාව 54
Figure 18 : දැනුවත් කිරීමේ වැඩසටහන් 55
Figure 20 : විශේෂ පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 55
Figure 21 : ලෝක තෙත්බිම් දින සැමරුම 56
Figure 22 : ලෝක තෙත්බිම් දිනය සැමරුම් වැඩසටහන් 56
Figure 23 : දේවක වීරකොන් මහතා විසින් දේශනයක් පැවැත්වීම 58
Figure 24 : උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් දේශනයක් පැවැත්වීම. 58
Figure 25 : ක්ෂේත්‍ර පරීක්ෂණය : ඇල්ල කන්ද, 2022.12.23 59
Figure 26 : දින 30කට පසු නියැදිවල නිරීක්ෂණ 60
Figure 27 : දින 210කට පසු නියැදිවල නිරීක්ෂණ 60
Figure 28 : 03 තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සම්ප්‍රයුක්ත ඡායාරූපය 61
Figure 29 : ස්වර්ණ සහතිය හා පදක්කම 68
Figure 30 : ජනාධිපති පදක්කම් පරීක්ෂණ පැවැත්වීම. 69
Figure 31 : දකුණු පළාතේ හා බස්නාහිර පළාතේ පදක්කම් ප්‍රදානය 70
Figure 32 : පාරිසරික රූ සටහන් ග්‍රන්ථය එලි දැක්වීම 70
Figure 34 : මුල්දින කවරය 71
Figure 33 : මුද්දරය 71
Figure 35 : පරිසර සාහිත්‍ය තරගාවලියේ ත්‍යාග ප්‍රදානය කිරීම 72
Figure 36 : පරිසර නියමු වැඩසටහන අභිප්‍රේරණය කිරීම 73
Figure 37 : අපජල කළමනාකරණය පිළිබඳ වාර්තා වැඩසටහන 74
Figure 38: විවිධ ආයතනවල පවත්වන ලද ප්‍රදර්ශනවල විශේෂ අවස්ථා 75
Figure 39 : අත්තිඩිය සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය 75
Figure 40 : රූමස්සල සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය 75
Figure 41 : අනුරාධපුර කලාපය සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනේ විශේෂ අවස්ථා 76
Figure 42 : ගම්පහ අනුර මධ්‍ය මහා විද්‍යාලයේ දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන 77
Figure 43 : ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගැනීම සඳහා සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහන් 81
Figure 44 : මුහුණු පොතට සිදුකළ උඩුගත කිරීම් 82

Figure 45: මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා මහජන පැමිණිලි යොමු කිරීමේ නව ක්‍රමවේදය නිල 90
Figure 46 : දිවයින පුරා "ඒ" ,"බී" හා "සී" කාණ්ඩවලට අදාලව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 92
Figure 47 : පළාත් අනුව "ඒ" ,"බී" හා "සී" කාණ්ඩවලට අදාලව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 93
Figure 48 : දිස්ත්‍රික්ක මට්ටමින් යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාවට එදිරිව ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇති 93
Figure 49 : "ඒ" කාණ්ඩයේ මුළු පැමිණිලි සංඛ්‍යාවට එදිරිව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීම 94
Figure 50 : කැස්බෑව කර්මාන්තයක පොලිතින් ලන්ච් ෂීට් වැටලීම පිළිබඳව පළ කරන ලද පුවත්පත් වාර්ථාවක්..... 96
Figure 51 : දිස්ත්‍රික් මට්ටමින් වැටලීම් වැඩසටහන 97
Figure 52 : වැටලීම් සංඛ්‍යාවට එදිරිව උල්ලංඝනය කිරීමේ ප්‍රතිශතයේ වාර්ෂික ප්‍රවණතාවය..... 97
Figure 53 : වෙරළ ආශ්‍රිත කසල විශ්ලේෂණය 2022.12.19 98
Figure 54 :බුද්ධංගල වනජීවී අභයභූමිය ආසන්නයේ අධ්‍යයනය හා සමීක්ෂණය කිරීම 99
Figure 55 : ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහිත අලි වසුරු Figure 56 : දේශීය ප්‍රජාවන්ට බලපාන 99
Figure 57 : කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගල්ල වැවේ සමීක්ෂණය..... 99
Figure 58 : වාරිමාර්ග වැව්වල සැඟේ පැකට් බැහැර කිරීම් සංසන්දනය කිරීම..... 100
Figure 59 : රාපත් නොවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම 101

CHAPTER 1 : මධ්‍යම පරිසර අධිකාරිය

හැදින්වීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 1981 ස්ථාපිත කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය 2022 වන විට වසර 41 ක් සම්පූර්ණ කරයි. පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය මඟින් ඇති කරනු ලැබූ පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතන වලින් එකකි. 2022 වාර්ෂික වාරතාව මඟින් 2022 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය සාධනය හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් හා විදේශ මූල්‍යාධාර යොදවමින් පළාත් කාර්යාල 09, දිස්ත්‍රික් කාර්යාල 15 හා එක් සම්බන්ධීකරණ කාර්යාලයෙහි ක්‍රියාකාරකම් සහ 2022 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ගේ ළඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සපයනු පිණිස එම වර්ෂය තුල සාක්ෂාත් කරගත් සාර්ථකත්වය මෙන්ම අසාර්ථකත්වය පිළිබඳ තක්සේරුවක් ද පෙන්නුම් කරයි.

අරමුණු

මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත 1980 අංක 47 දරන පාරිසරික පනත පිළිවෙලින් 1988 අංක 56 දරන පාරිසරික පනත යටතේ සහ 2000 අංක 53 දරන පනත යටතේ සංශෝධනය කරන ලදි. 1980 ජාතික පාරිසරික පනත පහත සඳහන් ප්‍රධාන බලතල වලින් සමන්විත වේ.

ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම, අනතුරුදායක වීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ග වල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා පාලනය කිරීම

පාරිසරික බලපෑම් ඇගයීම් උපයෝගී කරගෙන, ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයන් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම

පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය ලබාගැනීම. විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම භූගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම අනුග්‍රාහක පිරිස් වැඩි දෙනෙකුට සේවය සලසමින් පරිසර ආශ්‍රිත

පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ප්‍රබල ලෙස ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති තොරතුරු සහ දත්ත සපයන මධ්‍යම මධ්‍යස්ථානයක් සේ ක්‍රියා කිරීම

බලතල, කාර්ය සහ රාජකාරී

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙහි සඳහන් බලතල, කාර්ය හා රාජකාරී වලින් මධ්‍යම පරිසර අධිකාරියේ දැනටතම අවධානය පහත සඳහන් ප්‍රධානතම බලතල, කාර්ය සහ රාජකාරී වලට යොමු කරයි.

ජාතික පාරිසරික පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝග හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

දූෂණ ඇතිවීමේ හේතූන්, එහි ස්වභාවය, ප්‍රමාණය සහ එය වැලැක්වීමෙහිලා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ සහ විමර්ශන පවත්වන්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ ආයතනවලට සහාය වීම සහ සහයෝගය දීම

පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාලව පරීක්ෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානි වැලැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද, වැඩි දියුණු කිරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

පරිසරය වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා ද, එහි තත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන් සහ උපමානයන් නිශ්චය කිරීම

පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ යම් අංශ පිළිබඳව වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම හා අධ්‍යාපනය ලබාදීම1988 හා 2000 වර්ෂ වලදී ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියට බලතල පැවරිනි. අනෙකුත් දේ අතර, මෙම සංශෝධනය මඟින් මධ්‍යම පරිසර අධිකාරියට පැවරෙන ප්‍රධාන බලතල පහත දැක්වේ.

පරිසරයට දූෂ කාරකයන් පිට කිරීම සිදු වන අවස්ථා වලදී එම කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිති හා මිනුම් දඬු වලට අනුකූලව නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ එසේ කිරීමට නියම කිරීම

ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ඒවා විසින් පාරිසරික බලපෑම් ඇගයීම් කළ යුතු යැයි නියම කිරීම

නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිටකරන කටයුතු ගැසට් කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර නොමැතිව කිසිම

I. හැඳින්වීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 7 වගන්තිය යටතේ පරිසර සභාව පිහිටුවා ඇත.

II. පරිසර සභාවේ ප්‍රධාන කාර්ය

උක්ත පනත ප්‍රකාරව පරිසර සභාවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- සිය වගකීම්, බලතල, රාජකාරී හා කාර්යයන් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් ලබා දීම
- අධිකාරියේ කිසියම් කරුණක් පිළිබඳ උපදෙස් ලබාදී අධිකාරිය ඒ සඳහා යොමු කිරීම

III. පරිසර සභාවේ ව්‍යුහය

1980 අංක 47 දරන සංශෝධිත ජාතික පාරිසරික පනතේ සඳහන් පරිදි පාරිසරික සභාව පරිසර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත වේ. 2021 පුද්ගලයෙකු කිසිම නිශ්චිත කටයුත්තක් නොකිරීම තහවුරු කිරීම.

පරිසර සභාව

නොවැම්බර් 29 වන දින පැවති රැස්වීමෙන් 14 වන සැසි වාරයේ වර්ෂ 3ක කාලසීමාවක් සඳහා ආරම්භ විය.

IV. 14 වන සැසි වාරය

ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමන් විසින් පරිසර සභාවේ 14 වන සැසිවාරය සඳහා පහත සඳහන් පරිදි පත් කිරීම් සිදු කරන ලදි.



V. පරිසර සභාවේ සාමාජිකත්වය

TABLE 2 : පරිසර සභාවේ සාමාජිකත්වය

	සාමාජිකයාගේ නම	අමාත්‍යාංශය හා තනතුර
1.	පී බී හේමන්ත ජයසිංහ මහතා	අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය, (ලේකම් - පරිසර සභාව)
2.	ශ්‍රී ලංකා වැදිජනතාවගේ නායක, ඌරුවරිගේ වන්නියලැත්තෝ	-
3.	ආර්. ඩී. එස්. ජයතුංග මහතා	අතිරේක ලේකම් (පරිසර සංවර්ධන), පරිසර අමාත්‍යාංශය
4.	සුජීවා එස්. ගුරුගේ මහත්මිය	අතිරේක ලේකම් (පාලන), ඉඩම් අමාත්‍යාංශය
5.	එච්. නිලක්ෂි එන්. ගුණසේකර මහත්මිය	අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත් සංවර්ධන)කෘෂිකර්ම අමාත්‍යාංශය
6.	වෛද්‍ය ලක්ෂ්මි සී. සෝමතුංග මහත්මිය	අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යාංශය
7.	ඩබ්. බී. පලුගස්වැව මහතා	අතිරේක ලේකම් (ඉංජිනේරු), මහාමාර්ග අමාත්‍යාංශය
8.	බී. නන්දනී සමරවික්‍රම මිය	අතිරේක ලේකම්, බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

	සාමාජිකයාගේ නම	අමාත්‍යාංශය හා තනතුර
9.	එන්. වී. එන්. ඩී. ජයවර්ධන මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන පාලන), ප්‍රවාහන අමාත්‍යාංශය
10	දිපාල් චන්ද්‍රරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන), කම්කරු අමාත්‍යාංශය
1	සුරංගා ප්‍රේමනී විතානගේ මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), සංචාරක අමාත්‍යාංශය
12	රේණුකා එම්. වීරකෝන් මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (ආයෝජන අංශය) ජනාධිපති කාර්යාලය
1	ආර්. ඩී. එස්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ), ධීවර අමාත්‍යාංශය
14	එන්. ආර්. අනීස් මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) විදුලි බල මණ්ඩලය
1	කුමුදු මීගහගේ මහතා	අධ්‍යක්ෂ (සංවර්ධන) වෙළඳ අමාත්‍යාංශය
16	ආර්. එම්. සිරිනාම මහත්මිය	අධ්‍යක්ෂ (සංවර්ධන), වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය
17	පී. ඒ. සුනිල් මහතා	විදුහල්පති, අගුණකොළපැලැස්ස.
18	තිලංග නදීර පොල්වත්තගේ මහතා	-
19	ලසන්ත සංජය සෙනරත්ආරච්චි මහතා	-
20	ජේ. එම්. බුද්ධි මංගල මහතා	-
2	ඩී.එම්.කේ.කොඹඹෑකඩුව මහතා	-

VI. පරිසර ආරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විශේෂඥයින්

1. නීතිඥ ආචාර්ය ජගත් ගුණවර්ධන මහතා, පරිසරවේදී
2. ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය, මහාචාර්ය, වයඹ විශ්ව විද්‍යාලය.

VII. ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයින්

1. පුබුදු වීරරත්න මහතා, සභාපති, ජෛව සංරක්ෂණ මධ්‍යස්ථානය

ඉහත නම් සඳහන් නිලධාරි මණ්ඩලය විවිධ අවස්ථාවල සංශෝධනය වූ බැවින්, (උසස්වීම් හා ස්ථාන මාරුවීම්) ඒ වෙනුවට පහත නිලධාරීන් 2022 වසර අවසන් වන විට සභාව නියෝජනය කරනු ලැබේ.

1. හසන්ති උරුගොඩවත්ත දිසානායක මහත්මිය, අතිරේක ලේකම් වැ/බ, , සමුද්‍රීය කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස, විදේශ කටයුතු අමාත්‍යාංශය.
2. ආර්. එම්. පී. එස්. රත්නායක මහතා, අතිරේක ලේකම්, පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති, ආරක්ෂක අමාත්‍යාංශය
3. අයි. එස්. එච්. ජයසේන ඉලුක්පිටිය මහතා, අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය.
4. අයි. සී. පතිරාජ මහතා, අතිරේක ලේකම්, කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන අමාත්‍යාංශය
5. බී. එල්. ඩී. බාලසූරිය මෙනෙවිය, අධ්‍යක්ෂ (කෘෂි හා පරිසර), අධ්‍යාපන අමාත්‍යාංශය.
6. සුරේකා එන් අත්තනායක මහත්මිය, අධ්‍යක්ෂ ප්‍රතිපත්ති හා මෙහෙයුම්), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
7. රිස්වාන් මොහොමඩ් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන අමාත්‍යාංශය.

8. ඩී. එච්. ආර්. ඩී. විජේසිංහ මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.
9. කේ. බන්දුල අබේරත්න මහතා, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මුදල් අමාත්‍යාංශය.



VIII. රැස්වීම් පැවැත්වීම හා කාර්යය

2022 වර්ෂය සඳහා රැස්වීම් 05ක් පවත්වා ඇති අතර 2022 වර්ෂයේ රටේ පැවැති ආර්ථික හා සමාජ වාතාවරණය මත පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීම් බොහෝමයක් අවලංගු කිරීමට සිදුවිය.

පරිසරවේදී, නීතිඥ, ආචාර්ය ජගත් ගුණවර්ධන මහතා පරිසර සභාවේ සභාපතිධුරය හොබවන්නේ ය. පරිසර සභාව සාමාජිකයින් 26 දෙනෙකුගෙන් සමන්විත අතර කාලීන පාරිසරික ගැටලූ වෙනුවෙන් පෙනී සිටීමින් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රගමනය වෙනුවෙන් නිරතුරුව දායකත්වය සපයයි. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ දායකත්වය ද නිරතුරුව ලබා ගැනේ.

මීට අමතරව 14 වන සැසිවාරය තුළ පහත සඳහන් කරුණු සඳහා ද පරිසර සභාවේ මැදිහත්වීම සිදුවේ.

1. වර්ණගලවත්ත ප්‍රදේශය පරිසර ආරක්ෂණ කලාපයක් බවට පත්කිරීම සඳහා සාකච්ඡා කිරීම.
2. සූර්ය විදුලි බලාගාර සැකසීම හා ඒ සඳහා වනාන්තර ඉඩම් අත්පත් කරගැනීම සීමා කිරීම.
3. ආරක්ෂිත වනාන්තර වලට ගවයන් ඇතුළු ගෘහාශ්‍රිත සතුන් ඇතුළත් කිරීම සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීම.
4. වරක් භාවිත කර ඉවත් කරන ප්ලාස්ටික් හා ඒ සම්බන්ද නෛතික තත්ත්ව පිළිබඳ ක්‍රියාත්මක වීම.
5. වෙඩිතලතිව් වනජීවී රක්ෂිතය වෙනුවෙන් තවදුරටත් පෙනී සිටීම.







E. ආයතන වූ




FIGURE 1 : ආයතන ව්‍යුහය

Chapter 2 : පරිසර දූෂණ පාලන අංශය

මෙම අංශය යටතේ ඒකක දෙකක් ස්ථාපිත කර ඇති අතර ඒවායේ ක්‍රියාකාරකම් පහතින් විස්තර කොට ඇත.

2.1. පරිසර දූෂණ පාලන ඒකකය

රටෙහි සිදුවන සීඝ්‍ර කාර්මික සංවර්ධනය සහ නාගරීකරණයත් සමඟ පිරිසිදු හරිත පරිසරයක් වෙත රට යොමු කිරීම සහ පවත්වාගෙන යෑම පහසු කාර්යයක් නොවේ. එබැවින් නෛතික සහ පරිපාලන ක්‍රියාවලීන් මඟින් පරිසර දූෂණය පාලනය සහ එය අඛණ්ඩව පවත්වාගෙන යෑම මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම වේ.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය, පාරිසරික නිර්දේශ ක්‍රියාවලිය කර්මාන්ත සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැපයීම (විශේෂඥ උපදේශකවරුන් ලියාපදිංචි කිරීම, රසායනාගාර ලියාපදිංචි කිරීම, කාර්මික අපජලය බැහැර කිරීම සඳහා වූ ගලි බවුසර් සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම, මහා පරිමාන සහ මධ්‍යම පරිමාන කර්මාන්ත ස්ථානගත කිරීමේදී තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා වූ විශේෂඥ කමිටුව) සහ විශේෂ ව්‍යාපෘතීන් (වැව් සහ ගංහා ජලයෙහි ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා වූ ව්‍යාපෘතිය සහ කර්මාන්ත වල පාරිසරික කැපවීම් ඇගයීම සඳහා වූ ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන) යන ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම තුළින් පිරිසිදු හරිත පරිසරයක් ඇති කිරීම සඳහා පරිසර දූෂණ පාලන ඒකකය කැපවී ක්‍රියාකරනු ලැබේ.

A. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය සහ පාරිසරික නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

I. නීතිමය පැතිකඩ ශක්තිමත් කිරීම සඳහා රෙගුලාසි සංශෝධනය කිරීම.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පරිසර දූෂණ පාලන ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වේ. ජාතික පාරිසරික පනතේ විධිවිධාන වලට අනුව නියමිත ක්‍රියාකාරකම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීම නීතිමය අවශ්‍යතාවයකි. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත ක්‍රියාකාරකම් ලැයිස්තුව 2022 වර්ෂයේදී සංශෝධනය කරන ලද අතර සංශෝධිත නියමිත ක්‍රියාකාරකම් ලැයිස්තුව අංක 2264/18 සහ 2022.01.27 දිනැති ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. එසේම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සඳහා වූ රෙගුලාසි අංක 2264/17 සහ 2022.01.27 දිනැති ගැසට් පත්‍රයෙන් සංශෝධිත අංක 1534/18 සහ 2008.02.01 ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ සංශෝධනය අවසන් වෙමින් පවතින අතර ඒ සඳහා පරිසර දූෂණය පාලනය සඳහා වෙළඳපොළ පාදක කරගත් මෙවලමක් වන දූෂකාරක සඳහා ගෙවීම් මූලධර්ම සංකල්පය ඇතුලත් කොට ඇත. මෙම දූෂකාරක සඳහා ගෙවීම මූලධර්මය ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි කෙටුම්පත් කල යුතු වේ. මෙම රෙගුලාසි කෙටුම්පත් කර අවසන් වූ පසු එය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් පරිසර දූෂණ පාලන ඒකකය විසින් සකස් කරමින් පවතී.

II. මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/දිස්ත්‍රික් කාර්යාල සහ පළාත් පාලන ආයතන වෙත මාර්ගෝපදේශ සැපයීම.

මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/දිස්ත්‍රික් කාර්යාල සහ පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ සහ පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙමින්, මනා සම්බන්ධීකරණයක් තුළින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය කාර්යක්ෂම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර දූෂණ පාලන ඒකකය කටයුතු කරනු ලැබේ. අංක 2264/18 සහ 2022.01.27 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් සුළු පරිමාන දූෂකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත පවරා ඇත. 2022.01.27 දිනැති අංක 2264/17 සහ අංක 2264/18 යන ගැසට්පත්‍ර මඟින් සංශෝධිත රෙගුලාසි සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු නියමිත ක්‍රියාකාරකම් පිළිබඳව, සියලුම පළාත් පාලන ආයතන වල පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත වැඩසටහන් 04 ක් පවත්වන ලදී. එමෙන්ම 2022 වර්ෂයේදී පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන බලපත්‍ර ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා සුළු පරිමාන දූෂකාරක කර්මාන්ත වලට අදාලව පාරිසරික ආරක්ෂණ බලපත්‍රවලට ඇතුළත් කළ යුතු කොන්දේසි සකස්

කරන ලදී. තවද, සුළු පරිමාන දූෂකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාල මාර්ගෝපදේශය යාවත්කාලීන කර මුද්‍රණය කරන ලදී.

නව රෙගුලාසි පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ද දැනුවත් කිරීමේ වැඩසටහන් 07 ක් පවත්වන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා සම්බන්ධ දත්ත පද්ධතිය පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් විසින් මාසිකව සමාලෝචනය කරනු ලබන අතර දත්ත පද්ධතියෙහි අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය සමඟ කටයුතු කරනු ලැබේ.

III. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ නියමිත ක්‍රියාකාරකම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

“ අ” , “ ආ” සහ “ ඇ” කාණ්ඩයේ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ. 2022.12.31 දින වන විට කර්මාන්ත 26,238 ක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලියට ඇතුලත් වී ඇත.

TABLE 3 : “ අ” , “ ආ” සහ “ ඇ” කාණ්ඩයේ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම

පළාත	“අ” කාණ්ඩය			“ආ” කාණ්ඩය			“ඇ” කාණ්ඩය		
	මුළු ගණන	පා.ආ.බ. නිකුත් කර ඇති සංඛ්‍යාව	පා.ආ.බ. නිකුත් කර ඇති ප්‍රතිශතය (%)	මුළු ගණන	පා.ආ.බ .නිකුත් කර ඇති සංඛ්‍යාව	පා.ආ.බ. නිකුත් කර ඇති ප්‍රතිශතය (%)	මුළු ගණන	පා.ආ.බ.නිකුත් කර ඇති සංඛ්‍යාව	පා.ආ.බ. නිකුත් කර ඇති ප්‍රතිශතය (%)
බස්නාහිර	655	460	70.23	5792	3852	66.97	2713	2019	74.42
දකුණ	57	49	85.96	1466	1010	68.89	2641	1811	68.57
නැගෙනහිර	14	13	92.86	927	710	76.59	999	880	88.09
ඌව	17	13	76.47	777	611	78.64	589	417	70.8
මධ්‍යම	47	35	74.47	1501	1105	73.62	1045	925	88.52
උතුරු මැද	27	26	96.30	922	602	65.29	482	371	76.97
සබරගමුව	80	71	88.75	1282	1088	84.87	1166	1006	86.28
උතුර	22	19	86.36	900	763	84.78	958	837	87.37
වයඹ	41	20	48.78	732	239	32.65	426	204	47.89
මුළු ගණන	**960**	**706**	**73.54**	**14259**	**9980**	**69.99**	**11019**	**8470**	**76.87**




FIGURE 2 : :“ අ” , “ ආ” සහ “ ඇ” කාණ්ඩ වල මුළු කර්මාන්ත ගණන පහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ.

IV. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත සඳහා එකඟතා ලිපි නිකුත් කිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය සහිතව ශ්‍රී ලංකා ආයෝජන මන්ඩලය මඟින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරනු ලැබේ. එකඟතා ලිපි නිකුත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කරනු ලබන අතර පරිසර දූෂණය පාලනයට අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කරමින් 2022 වර්ෂයේදී කර්මාන්ත 768 ක් සඳහා එකඟතා ලිපි නිකුත් කර ඇත. එකඟතා ලිපි නිකුත් කිරීමේ ප්‍රතිශතය 70.5% ක් වේ.

V. අපනයන සැකසුම් කලාප සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

දීපව්‍යාප්තව අපනයන සැකසුම් කලාප 12 ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරිත්වය යටතේ පවත්වාගෙන යනු ලැබේ. ජාතික පාරිසරික පනතේ විධි විධාන වලට යටත්ව පරිසර දූෂණ පාලන ක්‍රම අනුගමනය කරමින් මෙම කලාප පවත්වාගෙන යෑමට අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම් පරිසර දූෂණ පාලන ඒකකය මඟින් සිදුකරනු ලැබේ. 2022 වර්ෂයේ අපනයන සැකසුම් කලාප 06 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පරිසර දූෂණ පාලන ඒකකය විසින් සිදුකර ඇති අතර සීතාවක අපනයන සැකසුම් කලාපය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුකූලව පවත්වානොගැනීම හේතුවෙන් මේවනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

VI. පාරිසරික නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය

නව කර්මාන්තයක් / නියමිත කටයුත්තක් ස්ථානගත කිරීමට පෙර පාරිසරික නිර්දේශයක් ලබා ගැනීම පරිසර දූෂණය පාලනයෙහිලා වූ වැදගත් උපායමාර්ගයක් වේ. කර්මාන්තයක් ආරම්භක අවස්ථාවේම පරිසර දූෂණ පාලන ක්‍රමවේද අනුගමනය කිරීම තුළින් පරිසරයට මෙන්ම කර්මාන්ත හිමිකරුට ද ප්‍රතිලාභ අත්වේ. 2022 වර්ෂය තුළ කර්මාන්ත 663ක් සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කරන ලදී.

B. තාක්ෂණික පහසුකම් සැපයීම.

I. මහා පරිමාන සහ මධ්‍යම පරිමාන කර්මාන්ත ස්ථානගත කිරීමේදී තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා වූ විශේෂඥ කමිටුව.

කර්මාන්ත අපද්‍රව්‍ය වලින් කැළණි ගඟ ආරක්ෂා කර ගැනීමේ අරමුණින් කැළණි ගංඟා ද්‍රෝණිය ආශ්‍රිතව නව කර්මාන්ත ස්ථානගත කිරීම කැබිනට් පත්‍රිකාවක් මඟින් සීමා කර ඇත. ඒ අනුව කැළණි ගංඟා ද්‍රෝණියේ නව කර්මාන්ත ස්ථානගත කිරීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කමිටුවක් පත්කර ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය, කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය මෙම කමිටුව නියෝජනය කරනු ලැබේ. මෙම කමිටුව හා අදාලව 2022 වර්ෂය තුළ රැස්වීම් 7 ක් පවත්වා ඇති අතර ව්‍යාපෘති යෝජනා 26 ක් ඇඟයීමට ලක්කර අදාල තාක්ෂණික මඟ පෙන්වීම් සිදු කර ඇත.

II. මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් ඒකක සහ වෙනත් ආයතන සඳහා තාක්ෂණික විශේෂඥ දැනුම ලබාදීම.

ව්‍යාපෘතියක සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන පරිසර බලපෑම් හඳුනාගැනීමට සහ ඒ සඳහා පරිසර දූෂණ පාලන උපක්‍රම හඳුනාගැනීමට, ව්‍යාපෘතිය සැලසුම් කරන අවධියේම පාරිසරික පරීක්ෂණයකට භාජනය කළ යුතුය.මෙම පාරිසරික පරීක්ෂණ සිදු කිරීමේ නීතිමය මෙවලම වන්නේ පාරිසරික බලපෑම් ඇගයීම (EIA) සහ මූලික පාරිසරික පරීක්ෂණ (IEE) ක්‍රියාවලීන් වේ. 2022 වර්ෂය තුළ පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් විසින් ඉහත ක්‍රියාවලීන් හා සම්බන්ධ තාක්ෂණික කමිටු 36 කට සහ ක්ෂේත්‍ර පරීක්ෂණ 8 ට සහභාගී වී ඇත. මෙහදී තාක්ෂණික කමිටු සහ ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගී වෙමින් පරිසර අධිකාරියේ මෙන්ම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා ද පරිසර දූෂණ පාලනයට අදාලව තාක්ෂණික මඟ පෙන්වීම් සිදු කර ඇත.

එමෙන්ම 2022 වර්ෂය තුළ පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් විසින් විවිධ රැස්වීම් 145 කට සහ ක්ෂේත්‍ර පරීක්ෂණ 54 කට සහභාගී වෙමින්

පරිසර දූෂණය පාලනය කිරීමෙහිලා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දී ඇත.

III. කාර්මික අපජලය ප්‍රවාහනය සඳහා ගලිබවුසර් සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම.

කාර්මික අප ජලය සුදුසු ස්ථානයක් කරා නිසිලෙස ප්‍රවාහනය කිරීම තුළින් පරිසර දූෂණය පාලනය කිරීමෙහිලා ගලිබවුසර් සේවා සපයන්නන් විසින් සිදු කරනු ලබන සේවය විධිමත් කිරීමේ අරමුණෙන් අංක 2264/18 සහ 2022.01.27 දිනැති ගැසට් පත්‍රයෙහි සඳහන් නියමිත ක්‍රියාකාරකම් මඟින් බැහැර කරනු ලබන කාර්මික අපජලය ප්‍රවාහනය කරනු ලබන ගලිබවුසර් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම පරිසර දූෂණ පාලන ඒකකය මඟින් සිදු කරනු ලබයි. 2022 වර්ෂය තුළ ගලිබවුසර් සේවා සපයන්නන් 38 ක් ලියාපදිංචි කර ඇත.

IV. රසායනාගාර සහ තාක්ෂණික උපදේශන සපයනු ලබන විශේෂඥයින් ලියාපදිංචි කිරීම.

මධ්‍යම පරිසර අධිකාරියට දිවයින පුරා පිහිටි කර්මාන්ත වල රසායනාගාර මිනුම් පරීක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීමට අපහසු වේ.ඒ අනුව පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීම තුළින් පරිසරයේ ගුණාත්මකභාවය පවත්වාගැනීම සඳහා පරීක්ෂණ සිදුකරනු ලබන රසායනාගාර සහ තාක්ෂණික උපදේශන සපයනු ලබන විශේෂඥයින් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම සිදු කරයි.

2023/2024 වර්ෂයන් සඳහා රසායනාගාර සහ උපදේශන සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් 03 ක පුවත්පත් දැන්වීමක් 2022 වර්ෂයේදී පළ කරන ලදී.

C. විශේෂ ව්‍යාපෘති.

I. දියවන්නා ඔයෙහි ජලයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යෑම.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ යනු රජයේ කාර්යාල සහ නේවාසික නිවාස වලින් යුත් සැලසුම්ගත නාගරික නගරයකි. ජනගහනය වැඩිවීම සහ නාගරීකරණය හේතුවෙන් දියවන්නා ඔයෙහි ජල පෝෂක ප්‍රදේශය විවිධ පාරිසරික, සමාජීය සහ ආර්ථික වෙනස්කම් වලට ලක්ව ඇත.2022 වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හිදී, දියවන්නා ඔයෙහි ජල පෝෂක ප්‍රදේශයේ දූෂණ මූලාශ්‍ර හඳුනාගැනීම සඳහා අනෙකුත් පාර්ශව ආයතන සමඟ එක්ව පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කරන ලදී.

මෙහිදී අපජලය බැහැරකිරීම පිළිබඳව විශේෂ අවධානයකට ලක්කරන ලද අතර සමීක්ෂණ සිදු කරන ලද ස්ථාන 230 න් 69 ක් දියවන්නා ඔය දූෂණ ප්‍රභවයන් ලෙස හඳුනාගෙන ඇත. මෙම දූෂණ ප්‍රභව 69 අතරින් 42 ක් මඟින් ගෘහස්ථ අපජලය ද, ප්‍රභව 27 ක් මඟින් කාර්මික අපජලය ද මුදාහරින බව හඳුනාගෙන ඇත.

II. ජනාධිපති පරිසර සම්මාන

පවතින පාරිසරික ප්‍රමිතීන් ඉක්මවා පරිසර දූෂණය පාලනය සහ පරිසර සංරක්ෂණය සඳහා යොමු වී ඇති කර්මාන්ත ඇගයීම අත්‍යාවශ්‍ය වේ. මෙමඟින් එම කර්මාන්ත කාණ්ඩයන් අතර තරහකාරීත්වයක් ඇතිකිරීම තුළින් පරිසර දූෂණය පාලනය වඩාත් ඵලදායීව සිදු කිරීම සඳහා කර්මාන්ත දිරිගැන්වීම සිදු වේ.

මේ සඳහා , පාරිසරික ගුණාත්මකභාවය වැඩිදියුණු කරමින් තිරසාර සංවර්ධනයට දායක වූ කර්මාන්ත හඳුනාගෙන ඔවුන් ඇගයීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජනාධිපති පරිසර සම්මාන උළෙල හඳුන්වා දී ඇත. 2022 වර්ෂයේදී පරිසර දූෂණ පාලන ඒකකයේදී නිලධාරීන් විසින් කර්මාන්ත අංශය යටතේ අයදුම්පත් 181 ක් ඇගයීමට ලක් කරන ලදී.

2.2. රසායනාගාර සේවා ඒකකය

A. හැඳින්වීම

රසායනාගාර සේවා අංශය ප්‍රධාන වශයෙන් ජල තත්ව විශ්ලේෂණ රසායනාගාරය සහ වායු සම්පත් කළමනාකරණ හා පසුවිපරම් යන ඒකක දෙකකින් සමන්විත වන අතර, ~~එ~~ පරිසර ආරක්ෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ.
ජාතික පාරිසරික පනත 4 බී කොටසට අනුකූලව ජාතික පාරිසරික බලපත්‍රය ලබා ගත යුතු කර්මාන්ත ක්‍රියාවලින් සඳහා අවශ්‍ය විශ්ලේෂණ වාර්තා ලබා දීම ජල තත්ව රසායනාගාරයේ මූලික කාර්යය භාරය වේ.
මේ අනුව බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කර්මාන්ත වල පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය සඳහා ද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම, අලුත් කිරීම, නීතිමය ගැටළු හා පසු විපරම් කටයුතු සඳහා ද විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලබයි.
මීට අමතරව පළාත් රසායනාගාර මඟින් රැස්කරනු ලබන ජල සාම්පල වල එම රසායනාගාරයන්හි සිදු කිරීමට නොහැකි විශ්ලේෂණ ජලයෙහි තත්වය පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි. තවද ජලජ පරිසරය සංරක්ෂණය හා කළමනාකරණය සිදු කිරීම උදෙසා රට තුල ඇති මතුපිට ජලාශ වල එම ජලයේ තත්වය පසුවිපරම් කිරීමද සිදු කරනු ලබයි.

මීට අමතරව ප්‍රධාන රසායනාගාරයේ සම්බන්ධීකරණය යටතේ පවතින පළාත් රසායනාගාර 08ක සහ දිස්ත්‍රික් රසායනාගාර 01ක සියළුම අවශ්‍යතා වල කටයුතු සම්බන්ධීකරණ කිරීම සිදු කරනු ලබයි.

වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය කාර්මික ශබ්ද මට්ටම් සහ දූෂකාරක වායු මිනුම් කිරීම සහ රට පුරා සංසරණ වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ.
ඊට අමතරව එක්සත් රාජධානියේ පරිසර හෝ ධීවර හා ජලජ විද්‍යා මධ්‍යස්ථානය (CEFAS) ආධාරයෙන් 2022 දී පොලිතීන් පාදක ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර පහසුකම් ලබා දෙන ලදී.

B. 2022 දී රසායනාගාර සේවා විසින් සිදු කරන ලද නියාමන කාර්යය

I. 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) රෙගුලාසි සංශෝධනය කිරීම.

පවතින රෙගුලාසිවලට අනුකූල නොවන ශබ්දය නිකුත් වන ක්‍රියාකාරකම් හේතුවෙන් රට තුළ පවතින ශබ්ද ගැටළු නිරාකරණය කිරීම සඳහා 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) රෙගුලාසි සංශෝධනය කර සකස් කරන ලද කෙටුම්පත නීතිගත කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට මේ වන විට ලබා දී ඇත. පරිසර අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.

II. වායු, ඉන්ධන සහ වාහන ආනයනය සඳහා ඒකාබද්ධ ගැසට් පත්‍රයක් සකස් කිරීම.

වායු, ඉන්ධන සහ වාහන ආනයනය සඳහා සකස් කරන ලද ඒකාබද්ධ ගැසට් පත්‍රයේ අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.

III. ස්ථාවර මූලාශ්‍ර වායු විමෝචන රෙගුලාසි නැවත සලකා බැලීම

2022.10.11 වන දින පවතින ස්ථාවර මූලාශ්‍ර වායු විමෝචන රෙගුලාසි නැවත සංශෝධනය සඳහා ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (SLEMA) සමඟ පහත කාර්යයන් සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී.

1. නිශ්චල මූලාශ්‍ර සඳහා විමෝචන ප්‍රමිතීන් නැවත සංශෝධනය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.
2. එකී ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික උපදෙස් සකස් කිරීම.
3. පුහුණු අත්පොතක් සකස් කිරීම සහ ස්ථාවර මූලාශ්‍ර විමෝචනය පිළිබඳ පුහුණු ක්‍රියාත්මක කිරීමක් සිදු කිරීම

C. 2022 දී මධ්‍යම රසායනාගාරය විසින් සිදු කරන ලද පරීක්ෂණ සේවාව

I. කාර්මික අපසන්දන හා රට අභ්‍යන්තර ජලාශ වල ජල තත්ව විශ්ලේෂණ වාර්තා ලබාදීම.

2022 වර්ෂය තුල තෝරාගන්නා ලද ජල දේහ 03ක් එනම් කැළණි ගඟ, මා ඔය සහ දියවන්නා ඔය වාර්ෂික සැලැස්මක් යටතේ පසු විපරම් සිදු කර ඇත. කැළණි ගඟෙහි ස්ථාන 17ක් ද , මා ඔය සඳහා ස්ථාන 8ක් සහ දියවන්නා ඔය සඳහා ස්ථාන 8ක මතුපිට ජලයේ තත්වය පරීක්ෂා කිරීම මැයි මස අවසානය දක්වා සිදු කර ඇත. ඉන්ධන අර්බුදය හේතුවෙන් 2022 නොවැම්බර් දක්වා පසු විපරම් කිරීමේ සැලැස්ම සංශෝධනය කොට ක්‍රියාත්මක කරන ලදි. විවිධ අරමුණු සඳහා එකතු කරන ලද මුළු

ජල නියැදි සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත (වගුව I)




FIGURE 3 : : 2022 වසර තුල රැස්කරනු ලැබූ සම්පූර්න ජල නියැදි සන්ඛ්‍යාව

II. දියවන්නා ඔයේ ඇල්ගී පිළිබඳ විමර්ශනය සහ අධීක්ෂණය

2022 වර්ෂය තුල දියවන්නා ඔයෙහි ඇතිවූ ඇල්ගී තත්වය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරය පරිසර ආරක්ෂක අංශය සමඟ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ අධිකාරිය හා එක්ව දියවන්නා ඔයෙහි මහරගම ජල පෝෂක කලාපය තුල හදුනාගත හැකි ප්‍රභවයන් අධීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධව කටයුතු කරන ලදි. මේ සඳහා දියවන්නා ඔයට ජලය විමෝචනය කරනු ලබන සියළුම ආයතන වලින් බැහැර කරනු ලබන ආයතන පරීක්ෂා කිරීම හා එම ජලය විශ්ලේෂණය කිරීම සඳහා දියවන්නා ඔයෙහි ජලයේ තත්වය ආරක්ෂා කරමින් ව්‍යාපෘති සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදි. මේ යටතේ එවැනි ආයතන 74ක් පරීක්ෂා කිරීම හා ජල සාම්පල 66 විශ්ලේෂණ සිදු කිරීම සිදුකරන ලදි.

D. ISO/IEC 17025:2017 ජාත්‍යන්තර ප්‍රමිති තත්ව පවත්වා ගැනිමට අදාලව කටයුතු සිදු කිරීම.

I. ISO/IEC 17025:2017 ජාත්‍යන්තර ප්‍රමිති තත්ව ජල තත්ත්ව රසායනාගාරය සඳහා පවත්වා ගැනීම

2022 වසරේදී ISO/IEC 17025:2017 ජාත්‍යන්තර ප්‍රමිති තත්ව පවත්වා ගැනිමට අදාලව තාක්ෂණික කටයුතු සිදුකිරීම් 2022 වසර පුරාම සිදු කරන ලදී. 2022 වසරේදී ප්‍රථම විගණන පරීක්ෂණයට පෙනිසිටින ලදී. තවද 2022 වසර තුලදී නයිට්‍රේට (Nitrate), මුළු පොස්පේට් ප්‍රමාණය (Total Phosphate), මුළු අවලම්බිත අංශු ප්‍රමාණය (TSS) සහ දියවූ ඝනද්‍රව්‍ය ප්‍රමාණය (TDS) යන නව පරාමිතින් 4 ක් සඳහා ප්‍රමිති තත්වය ලබා ගන්නා ලදි.

ඒ අනුව දැනට ජාත්‍යන්තර ප්‍රමිති තත්වය ලබා ගෙන ඇති පරාමිතින් සහ නව පරාමිතින් ඇතුළු පරාමිතින් 12ක් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) මගින් පවත්වනු ලැබූ පරීක්ෂණ විශ්ලේෂණ ඇගයීමකට (Proficiency Testing) 2023 වසර තුලදී සහභාගි වූ අතර එලෙස සහභාගී වූ සියලුම පරාමිතීන් ඉහල මට්ටමේ ඇගයීමක් ලබාගෙන ඇත. මෙම ප්‍රතිතකරණ ක්‍රියාවලිය ප්‍රාදේශිය රසායනාගාර වලට හඳුන්වා දීමේ මූලික කටයුතු මෙම වසර තුලදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.



II. ISO 9001 : 2015 සඳහා වායු තත්ව කළමනාකරණ හා අධීක්ෂණ ඒකකයේ දායකත්වය

වායු තත්ව කළමනාකරණ හා පසු විපරම් ඒකකයේ දායකත්වය මඟින් ISO 9001: 2015 යටතේ තත්ව සහතික ලබා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය ක්‍රියාවලින් හා මාර්ගෝපදේශ සකස් කිරීම 2022 වර්ෂය තුලදි සිදු කරන ලදි.

E. සංසරණ වායු තත්වය පසු විපරම් කිරීම

I. ස්වයංක්‍රීය සංසරණ වායු තත්ත්ව අධීක්ෂණ මධ්‍යස්ථාන භාවිතයෙන් අවට වාතයේ තත්ත්ව පරීක්ෂා කිරීම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන විමෝචන භාර අරමුදල (VETTF) විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද තත් කාලීන ස්වයංක්‍රීය වායු තත්ත්ව අධීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් බත්තරමුල්ල සහ මහනුවර නගරයේ ස්ථාපිත කොට ඇති අතර එමගින් 2019 ජනවාරි මස සිට වායු තත්ව පසුවිපරම් කිරීම කරනු ලබේ.

මෙමගින් සංසරණ වායුගෝලයේ ඇති PM $_{10}$ (මයික්‍රෝන 10ට අඩු වායුගතික විෂ්කම්භය ඇති අංශු), PM $_{2.5}$ (මයික්‍රෝන 2.5 ට අඩු වායුගතික විෂ්කම්භය අංශු), නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO_2), සල්ෆර් ඩයොක්සයිඩ් (SO_2), කාබන් මොනොක්සයිඩ් (CO) සහ ඕසෝන් (O_3) සහ කාලගුණික පරාමිතීන් මිනුම් කල හැක.

නමුත් මෙම උපකරණයේ සේවා හා නඩත්තු කිරීම සඳහා 2021 වසරේ මැද භාගයේ සිට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුකොට ගෙන තාවකාලික ක්‍රියාත්මක නොවූ අතර 2022 සැප්තැම්බර් මස සිට ප්‍රතිපාදන ලැබීමෙන් පසුව අදාල නඩත්තු සේවා සිදු කොට නැවත ක්‍රියාත්මක කරන ලදි.

ඒඅනුව සංසරණ වායුගෝලයේ වායු තත්ත්ව දත්ත 2022 ඔක්තොම්බර් සිට දෙසැම්බර් දක්වා පමණක් පවතී.

II. රසායනික විශ්ලේෂණ ක්‍රම මඟින් සංසරණ වායු තත්ව දත්ත පරීක්ෂා කිරීම.

2022 කොටුව වායු තත්ව පසු විපරම් ඒකකයේ ස්ථාපිත වායු තත්ව මැනීමේ උපකරණ මඟින් රසායනික විශ්ලේෂණ ක්‍රම මඟින් සල්ෆර් ඩයොක්සයිඩ් (SO_2) හා නයිට්‍රජන් ඔක්සයිඩ් (NO_2) පිළිබඳ මිනුම් ලබා ගැනීම සිදු කොට ඇත.

ඒ සඳහා ලබාගත් වාර්ෂික සාමාන්‍ය අගය පහත වගුවෙහි දක්වා ඇත.

TABLE 4 : : සල්ෆර් ඩයොක්සයිඩ් **(SO2)** හා නයිට්‍රජන් ඔක්සයිඩ් **(NO2)** පිළිබඳ මිනුම්

විස්තරය	NO_2	SO_2
වාර්ෂික මධ්‍යනය	1.8E – 0.09	1.66E - 09




FIGURE 4 : 2022 වසරේදී මාසික සාමානය සල්පර් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය




FIGURE 5 : : 2022 වසරේදී මාසික සාමානය නයිට්‍රජන් ඩක්සයිඩ් සාන්ද්‍රණය

සටහන : රටතුල පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ජූලි මාසය තුල අදාල පසු විපරම් කටයුතු සිදු නොකරන ලදි.

II. සන්වේදක උපකරණ (Sensor Based) මඟින් වායු තත්ව පසු විපරම් කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය වෙත සංසරණ වායු තත්ව පසු විපරම් කිරීමේ කටයුතු සඳහා සන්වේදක **සහිත** උපකරණ තුනක් ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් පරිත්‍යාග කරන ලදි. මේ සඳහා පරිසර අමාත්‍යාංශය මැදිහත් වීම සිදු කරන ලද අතර ඒවා උතුරු මැද පලාතේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය, වයඹ පලාතේ කුරුණෑගල නගර සභාව හා උතුරු පලාතේ යාපනය නගරයේ ස්ථාපිත කොට මේ වන විට පර්යේෂණ මිට්ටමේ ක්‍රියාත්මක වෙමින් පවති.

සංසරණ වායු තත්ව පසු විපරම් කිරීමේ හා එවැනි උපකරණ ස්ථාපිත කිරීම සම්බන්ධව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක 11.6 යටතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැවරී ඇති අතර 2022 වසර

තුලදි ලෝක සෞඛ්‍ය සංවිධානය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ එක්ව සංසරණ වායු තත්ව පසු විපරම් කිරීමේ උපකරණ ස්ථාපිත කිරීම යම්තාක් දුරට සිදු කොට ඇත.



FIGURE 6 : : ශ්‍රී මහ බොධිය අසල ස්ථාපිත සන්වේදක වායු තත්ව පසුවිපරම් කිරීම



FIGURE 7 : : යාපනය නගරයේ ස්ථාපිත සන්වේදක වායු තත්ව පසුවිපරම් කිරීම උත්සවාකරයෙන් විවිත කිරීම

IV. 2022 වසර අවසාන භාගයේදී වායු තත්ව වෙනස් වීම පිළිබඳව මිනුම් කටයුතු සිදු කිරීම.

2022 අගභාගයේදී රට තුල පැවති අයහපත් වායු තත්වය අන්තර් දේශසීමා (trans - boundary)වායු දූෂණය හේතුවෙන් සිදු වූ අතර ඒ හේතුවෙන් සංසරණ වාතයේ අංශුමය ද්‍රව්‍යයන් සාන්ද්‍රණය ඉහල යාම නිරීක්ෂණය කරන ලදි. මේ සම්බන්ධව මිනුම් කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සිදු කරන ලද අතර වාර්තාවක් සකස් කොට පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට ඇත.

V. ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

පිරිසිදු වාතය මිනිස් සෞඛ්‍ය සඳහා මූලික අවශ්‍යතාවයක් වන අතර එය ජාතියේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන පිරිවැය අඩු කරයි. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර පහත සඳහන් ප්‍රධාන අරමුණු වේ

දුර්වල ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය හා සම්බන්ධ රටේ සෞඛ්‍ය වියදම් අඩු කිරීම සහ ශ්‍රම බලකායේ ධාරිතාව වැඩි කිරීම

ගොඩනැගිලි තුළ ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

නිසි පාරිසරික දැනුමක් ඇති නිරෝගී ජාතියක් බිහි කිරීම

2022 වර්ෂය තුළ CECB සමඟ එක්ව දිවයින පුරා පාසල්, රාජ්‍ය ආයතන සහ නිවාස වැනි ස්ථාන 18 කදී ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය මනිනු ලැබීය. රජයේ අයවැය චක්‍රලේඛ අංක 3/2022 හේතුවෙන් ගෘහස්ථ වායු තත්ත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලදී.

F. පැමිණිලි විශ්ලේෂණයේදී හා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයට අදාල තාක්ෂණික දායකත්වය ලබා දීම.

වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් අංශය මඟින් උක්ත කාරණා වලට අදාලව සිදු කරනු ලැබූ මිනුම් කටයුතු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

TABLE 5 : වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් අංශය මඟින් සිදු කරනු ලැබූ මිනුම් කටයුතු පිළිබඳ විස්තර

අ.අ	මිනුම් කටයුතු සිදු කරනු ලැබූ සේවා		ලබා දුන් සේවා සංඛ්‍යාව
6.1	ශබ්ද මට්ටමේ මිනුම් කිරීම	දිවා කාලය	39
6.2		දිවා හා රාත්‍රී කාලය	19
6.3	සම්පූර්ණ අවලම්භිත අංශු ප්‍රමාණය (TSPM fugitive emission)		21
6.4	ඇස්බැස්ටෝස් තන්තු මිනුම් කිරීම		05
6.5	මයික්‍රෝන 10ට අඩු වායු ගතික විශ්කම්භ ඇති අංශු සඳහා වූ මිනුම් මකිරීම		2
6.6	මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග සඳහා කරන ලද මිනුම් කිරීම		11
6.7	විශේෂත්වය සඳහන් කල නොහැකි මිනුම් කටයුතු (අලිවෙඩි ශබ්ද මිනුම් කිරීම, නිදහස් දින ශබ්ද මිනුම් කිරීම)		04

G. දැනුවත් කිරීමේ වැඩසටහන් වලට ලබාදුන් දායකත්වය

කොතලාවල ආරක්ෂණ අධ්‍යනය අංශයේ උපාධි අපේක්ෂකයන් හා විවෘත විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකයේ හා ජල තත්ව රසායනාගාරයේ දායකත්වය ලබා දෙන ලදී. තවද පරිසර අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද ස්ථාවර වායු විමෝචන ප්‍රමිතින් සඳහා කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදි.

පිළිබඳව 2022 තවත් ඔක්තොම්බර් මස පවත්වන ලද මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර වැඩමුළුව සඳහා සහභාගීවී , 2020 කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රට වැසීම හේතුකොට ගෙන කාලගුණික දත්ත විචලනයන් ගේ සහ වායු දූෂක වල ප්‍රවාහන මාර්ග පිළිබඳ සම්බන්ධතාව පිළිබඳව ශ්‍රී ලංකාවේ අවට වායු තත්ව පෝස්ටර් ප්‍රකාශ කිරීම සිදු කරන ලදි. (Data Interpretation Combining Satellite and Ground-Level Observation in the Asian Monsoon Region)

H. රසායනාගාර සේවා අංශය මඟින් ආදායම් උත්පාදනය 2022

2022 වසරේදී උපයන ලද අතර සේවාවක් ලෙස මුදල් උපයනු නොලැබූ විශ්ලේෂණ වටිනාකම රු.මි.4.0ක් පමණ වේ.

I. වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය

2022 වසරට අදාල මෙම අංශයේ සිදු කරන ලද මිනුම් කටයුතු වලින් රු.මි. 1, 850 ක් මුදල් උපයා ගැනීමට හැකි වී ඇත.

II. ජල තත්ව විශ්ලේෂණ මඟින් 2022 වසර තුල උපයන ලද ආදායම ප්‍රධාන රසායනාගාරය ජල තත්ව විශ්ලේෂණ කටයුතු වලින් රු.මි.2.279ක මුදලක් උපයන ලදි. තවද සියළුම ජල තත්ව රසායනාගාර මඟින් රු.මි.13ක මුදලක්




FIGURE 8 : : 2022 වසර තුල රැස්කරනු ලැබූ සම්පූර්ණ ජල නියැදි සන්ඛ්‍යාව

I. ප්‍රාදේශීය රසායනාගාර වල පහසුකම් ලබා දීම.

ප්‍රධාන රසායනාගාරය ඇතුළු ප්‍රාදේශීය රසායනාගාර 09 සඳහා රසායනාගාර උපකරණ ලබාදීම

ප්‍රාදේශීය රසායනාගාර වෙත රසායනාගාර විශ්ලේෂණ කටයුතු සඳහා අයනහරිත ජලය නිපදවන උපකරන ලබා දෙන ලදී. මේ සඳහා රුපියල් මිලියන 3.46 ක් මුදලක් වැය කරන ලදි. මෙමගින් විශ්ලේශණ කටයුතු සඳහා අවශය අයනහරිත ජලය ලබාගැනීම සිදු කරනු ලැබේ. ප්‍රධාන රසායනාගාරය මගින් පළාත් 09 පළාත් රසායනාගාර 08ක සහ දිස්ත්‍රික් රසායනාගාර 01ක සියළුම රසායන ද්‍රව්‍ය, රසායනාගාර උපකරණ අළුත්වැඩියා කටයුතු, ප්‍රධාන රසායනාගාරයේ උපකරණ ක්‍රමාංකනය කිරීම් ඇතුළු සියළුම කාර්යයන් ඉටු කිරීම් හා සම්බන්ධීකරණය ද 2022 වසර පුරාම පුනරාවර්තන වියදම්, මිලියන 05ක මුදල වැය සංකේත 407 යටතේ සිදු කරන ලදි.

TABLE 6 : : අනෙකුත් ආයතන / අංශ සමග සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම්.

අ.අ	වැඩ සටහනේ ස්වභාවය	වැඩ සටහන් ගණන
01	තාක්ෂණික කමිටු/ පාරිසරික බලපෑම් ඇගයීම්/මූලික පාරිසරික බලපෑම් ඇගයීම්/ රැස්වීම්	43
02	පුහුණු වැඩමුළු	20
03	දැනුවත් කිරීමේ වැඩසටහන් සහභාගිත්වය	06
04	ක්ෂේත්‍ර අධ්‍යයන වලට සහභාගි වීම	04
05	මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර පසු විපරම් කිරීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ	01
06	අඹතලේ ස්ථාපිත ස්වන්ක්‍රිය ජලතත්ව පසු විපරම් කිරීමේ කටයුතු	15
07	හදිසි/ අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ	02
08	වෙනත්	7

J. විශ්ව විද්‍යාල සිසුන් පුහුණු කිරීම.

2022 වර්ෂය තුල කොවිඩ් ව්‍යසන තත්වය පැවතියද ලංකාවේ විවිධ විශ්ව විද්‍යාල වලින් පැමිණි උපාධි අපේක්ෂිත සිසුන් 07 කට (Internship training) සහ රසායනාගාරය තුල පුහුණු වීම් කටයුතු සිදු කර ඇත. මෙම සිසුන් සඳහා රසායනාගාර විශ්ලේෂණ කටයුතු, රසායනාගාර උපකරණ භාවිතා කිරීම හා රසායනාගාර තත්ව පාලන කටයුතු පිළිබඳ මනා පුහුණුවක් ලබා දීමට ජල තත්ව රසායනාගාරය කටයුතු කරන ලදි.

පානිය ජල බොතල් ඇසුරුම් වලින් ක්‍රුද්‍ර ප්ලාස්ටික් පානිය ජලයට එකතු වීම පිළිබඳව පරීක්ෂාකිරීම සඳහා සබරගමුව විශ්ව විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂිත සිසුවකුට ජල සාම්පල 35 පරීක්ෂාකිරීම සඳහා පහසුකම් සැලසීම 2022 වසර තුලදි සිදු කරන ලදි මීට අමතරව තවත් සාම්පල කිහිපයක් (කොම්පෝස්ට් සාම්පල,අවසාදිත සාම්පල, ජලය සාම්පල සහ වෙරළ සාම්පල ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණය පිළිබඳ මූලික විශ්ලේෂණය කරන ලදී.

Chapter 3 : අපද්‍රව්‍ය කළමණාකරන අංශය

මෙම ඒකකය මධ්‍යම පරිසර අධිකාරියට අළුතින් එක්වූ අංශයක් වන අතර ඒ යටතේ ඒකක දෙකක් ස්ථාපිත කොට ඇත.

3.1 රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍යකළමනාකරණ ඒකකය මඟින් ඉටු කරන ලද ක්‍රියාකාරකම්

(අ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

(ආ) අන්තර්ජාතික සම්මුතීන්ට අදාළ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

(ඇ) රසායනික ද්‍රව්‍ය කළමනාකරණයට අදාළ කටයුතු ඉටු කිරීම

(ඉ) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම යන මූලික කාර්යයන් ඉටුකිරීමට කටයුතු සිදු කර ඇත.

ඒ අනුව 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රතිපාදන මඟින් වෙන් කරන ලද රු.,1,000,000.00 ක මුදලින් රු. 965,443.00 ක මුදලක් ඉතා ප්‍රයෝජනවත් ආකාරයට යොදවා 96.54% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. මීට අමතරව ඒකකය මඟින් 16,883,516.06 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත උපයා දී ඇත.

A. ශ්‍රී ලංකාව තුළ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී කළමනාකරණ රෙගුලාසි (අංක1534/18 දරණ 2008 පෙබරවාරි 01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස 2022 වසර තුළ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර 550 නිකුත් කර ආදායම ලෙස 3,497,646.96 (තිස් හතර ලක්ෂ අනු හත් සහස් හයසිය හතලිස් හයයි ශත අනු හයයි) ආදායමක් උපයා ඇත.

B. අන්තර්ජාතික සම්මුතීන්ට අදාළ කටයුතු

බාසල් සම්මුතිය

ශ්‍රී ලංකාව 1992.08.28 දින සිට දේශසීමා අතර උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය සඳහා වූ බාසල් සම්මුතියට එළඹ ඇති අතර එතැන් පටන් මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුළ මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස කටයුතු කරයි. මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සම්බන්ධීකරණ කමිටුව මෙරට උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වලට අදාළ නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය අවශ්‍ය සහාය ලබාදීම සඳහා තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කොට ඇත. බාසල් සම්මුතිය ක්‍රියාත්ම කිරීමට අදාලව 2022 වර්ෂය තුල ආනයන අවස්ථාවන් 471ක් නිකුත් කල අතර ඉන් ලද මුළු ආදායම රු. 6,067,924.65 ක් වේ. වර්ෂය තුල බාසල් තාක්ෂණික රැස්වීම් 06 ක් පැවැත්වූ අතර ඒ සඳහා රු. 218,675.00 ක් වැය විය. එහිදි කරුණු 51 කට අදාලව ආනයන ගැටළු සාකච්ඡා කරන ලද අතර ඉන් ලද ආදායම රු. 460,000.00 ක් වේ.

දේශාන්තර (දේශසීමා හරහා) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය

ශ්‍රී ලංකාව තුළ බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය 2022 වර්ෂය තුළදී බාසල් හි "A" සහ "B" ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති අපද්‍රව්‍ය රට හරහා සංක්‍රමණ කිරීම් (Transboundary movement) 53 ක් සහ අපනයන 40 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. සම්මුතිය සහ රු. 590,217.80 අපනයන අනුමැතීන් නිකුත් කිරීමෙන් උපයා ඇත.

I. රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හා කෘමිනාශක වර්ග සඳහා ආනයනයේදී හෝ අපනයනයේදී පූර්ව අවසරයක් ලබා ගැනීමේ අන්තර්ජාතික වෙළඳ සම්මුතිය වන රොටර්ඩෑම් සම්මුතියට 2006 වසරේදී ශ්‍රී ලංකාව එළඹෙන ලදි. එම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේදී උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය පිළිබඳව බලයලත් ආයතනය වනුයේ මධ්‍යම පරිසර අධිකාරිය වන අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් සඳහා අප ඒකකය සෘජුවම දායකවේ.

රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික

කමිටුවක් පත්කොට ඇති අතර 2022 වසර සඳහා තාක්ෂණික කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු. 159,068.00 ක පිරිවැයක් දරා ඇත. එම තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම් මඟින් ගත් තීරණ අනුව ඇස්බැස්ටෝස් අමුද්‍රව්‍ය ආනයන අවස්ථා 139 ක් වෙත අනුමැතිය ලබාදී ඇත. ඉන් උපයන ලද ආදායම රු. 1,821,509.00 ක් වේ.

මෙහිදි රසායනික කළමනාකරණය සඳහා රෙගුලාසි සකස් කිරීම වෙනුවෙන් එක් රැස්වීමකදී රසායනික අනතුරු වැලැක්වීම සඳහා එක් රැස්වීමක්ද පවත්වන ලදී.

C. රසායනික ද්‍රව්‍ය කළමනාකරණය

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අමතරව රසායනික ද්‍රව්‍ය කළමනාකරණයද මධ්‍යම පරිසර අධිකාරිය ඉහල කළමනාකාරීත්වය විසින් 2019 වසරේ සිට අප ඒකකයට පවරන ලදි.

මේ වන විට රසායනික ද්‍රව්‍ය කළමනාකරණය අප ඒකකය මඟින් සිදු කරනු ලබන අතර රසායනික ද්‍රව්‍ය මඟින් සිදුවිය හැකි අනතුරු අවම කිරීමේ මූලික පියවරක් ලෙස රසායනික ද්‍රව්‍ය ගබඩා සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ.මේ වසරේ දී එවැනි පාරිසරික නිර්දේශ 14 ක් නිකුත් කර ඇති අතර රසායනික ද්‍රව්‍ය ආනයන අනුමැතීන් 330ක් නිකුත් කර ඇත. ඉන් රු. 4,446,216.96 ක මුලු මුදලක් අප ඒකකය උපයා ඇත.

I. රසායනික අනතුරු වැලැක්වීම

කාර්මික රසායනික අනතුරු වැලැක්වීමේ පියවරක් ලෙස තෝරාගත් කර්මාන්ත 03 ක් දැනුවත් කරන ලද අතර අවදානම් හඳුනාගැනීම් සහ අවදානම් අවම කිරීමේ පියවරයන් සහිත අවදානම් තක්සේරු වාර්තා 03 ක් සකස් කරන ලදී.

D. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සලකා බැලීමේදි විධිමත් සහ අවිධිමත් යන දෙයාකාරයට පරිසරය සැකසී පවතී. එසේම විධිමත් ආකාරයෙන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ කොටස් කිරීම සැලකිය යුතු ප්‍රමාණයකින් පවතින අතර මේ ක්‍රියාවන් විශාල පාරිසරික සහ සෞඛ්‍යමය බලපෑම් ඇති කරයි.

එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් වරින්වර මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාලවල සහභාගීත්වයෙන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

ඒ අනුව, 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරනලද ප්‍රථම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය. බස්නාහිර පළාතේ ගම්පහ කොළඹ සහ කළුතර දිස්ත්‍රික් කාර්යාලවල සහභාගීත්වයෙන් ගෘහස්ථ මට්ටමින් ජනනය වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීම සිදු කරන ලදී. මෙහිදී ඉලෙක්ාට්‍රානික අපද්‍රව්‍ය ටොන් 4.2 ක ප්‍රමාණයක් එකතු වූ අතර වැඩසටහන 2022 ජනවාරි මස 28 සහ 29 යන දින දෙක තුලදී 2021 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන වලින් සිදු කරන ලදී.















දෙවන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහන දකුණු පළාත් කාර්යාලයේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර එහිදී ගෘහස්ථ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පමණක් එකතු කිරීම කරන ලදී. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ ආයතන 03 ක සහභාගීත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ටොන් 02 ක අපද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු කරන ලදී. මේ සඳහා රු.97,000.00 ක මුදලක් වැය කරන ලදී.

E. දැනුවත් කිරීමේ අත්පත්‍රිකා හා පොත් පිළියෙල කිරීම

I. දැනුවත් කිරීමේ වැඩසටහන්







උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් තාක්ෂණික දැනුමැති පුද්ගලයින් සම්පත් දායකයින් ලෙස සහභාගී කරවා ගනිමින් මාර්ගගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කරන ලදී.

3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය

පිවිතුරු හරිත පරිසරයක් රට තුළ ඇති කිරීමේ දැක්මක් උදෙසා ප්‍රතිපත්ති සැකසීම,රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා ඉලක්ක කණ්ඩායම් අතර දැනුවත් කිරීම ඇති කිරීම මඟින් රට තුළ නිවැරදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම යන මෙහෙවර ප්‍රකාශය යටතේ අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය පිහිටුවන ලදි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ප්‍රධාන අංශ තුනක් යටතේ එහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලබයි.

01. ප්‍රතිපත්ති හා තාක්ෂණික මැදිහත්වීම්.
02. නීති හා රෙගුලාසි බලාත්මක කිරීම.
03.විශේෂ ව්‍යාපෘති

A. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති හා තාක්ෂණික මැදිහත්වීම්.

ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය ප්‍රතිපත්ති, උපාය මාර්ග, මාර්ගෝපදේශ හා සැලසුම් සැකසීම මේ යටතේ සිදු කරනු ලබයි.

I. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ 3R සංකල්පය ක්‍රියාත්මක කිරීම.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ 3R සංකල්පය ප්‍රගුණ කිරීම සඳහා 2022 වසරේදී පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය පිළිබඳ දත්ත ආකාර 3ක් යටතේ රැස් කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලද අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම පහත පරිදි වේ.

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍යවල එකතු කිරීමේ දත්ත ගබඩාව.

- මහාචාර්ය අජිත්ද අල්විස් විසින් පවත්වන ලද අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන
- ආචාර්ය පද්මිණි බටුවිටගේ විසින් මෙහෙයවනු ලැබූ චක්‍රීය ආර්ථිකය(Circular Economy)කය පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන
- ඉංජී. සමන්ත කුමාරසේන විසින් පවත්වන ලද කාර්මික අවදානම් කළමනාකරණය පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන.

මෙම වැඩසටහන් සඳහා වැය වූ සම්පූර්ණ මුදල රු.60,000.00 ක් වේ.

II. දැනුවත් කිරීමේ මාර්ගෝපදේශ

- බාසල් මාර්ගෝපදේශයේ සිංහල මාධ්‍ය පිටපත් 500 ක් මුද්‍රණය කිරීම.


මේ සඳහා රු.420,000.00 සහ බදු මුදලක් 2022 වාර්ෂික ප්‍රතිපාදන මගින් වෙන් කරන ලදී.

- දිවයින පුරා ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ දත්ත පද්ධතිය යාවත් කාලීන කර මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා ප්‍රචාරය කර ඇත.

- පරිසර හිතකාමී ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එකතු කරන බවට ලබා ගත් ක්ෂේත්‍ර පරීක්ෂණ නිරීක්ෂණය මත, 2022 දෙසැම්බර් දක්වා උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එකතුකරන්නන් 370 ක් දෙනෙකු මධ්‍යම

කසළ වර්ගය	ඇස්තමේන්තුගත එකතු කළ ප්‍රමාණය (ටොන්/ වර්ෂයකට)
ප්ලාස්ටික්	86724
ලෝහ	60612
කඩදාසි	55764
වීදුරු	45012
කාඩ්බෝඩ්	37920

පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇත. ඒ අනුව ලියාපදිංචි එකතුකරන්නන් විසින් ලබා දී ඇති දත්ත අනුව වාර්ෂික ප්ලාස්ටික් ටොන් 86724 , කඩදාසි ටොන් 55764, කාඩ්බෝඩ් ටොන් 37920, වීදුරු ටොන් 45012 සහ ලෝහ ටොන් 60612 ප්‍රතිචක්‍රීකරණය සඳහා මාසිකව එක්රැස් කර ඇත.



ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාකාරී සැලැස්ම හි 3R ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන වලින් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- **“රත්නපුර සමන් දේවාලය” පිරිසිදු කිරීමේ වැඩසටහන**

මධ්‍යම පරිසර අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, රත්නපුර මහ නගර සභාව සහ ශ්‍රී ලංකා පොලිසිය - රත්නපුර එක්ව "රත්නපුර මහා දෙවොල්" වාර්ෂික "ඇසළ" උත්සවයේදී පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා සහභාගී වූවන් 200ක් පමණ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අවශේෂ ලෙස වෙන් කරන ලද අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 300ක් පමණ එකතු කරන ලදී. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලද අතර අනෙකුත් ඒවා පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සඳහා රත්නපුර මහ නගර සභාව වෙත භාර දෙන ලදී.






FIGURE 9 : : “රත්නපුර සමන් දේවාලය” පිරිසිදු කිරීමේ වැඩසටහන

- **වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන**

සාගර පරිසරයේ විශාල ප්ලාස්ටික් කොටස් වලින් සිදුවන දූෂණය අධ්‍යයනය කිරීම සඳහා විමර්ශන ඒකකයේ සහයෝගීතාවයෙන් වෙරළ අපද්‍රව්‍ය සමීක්ෂණය දික්ඔවිට වෙරළ තීරයේදී සිදු කරන ලදී.




FIGURE 10 : : වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන

- **ශ්‍රීපාද සිද්ධස්ථානය" පිරිසිදු කිරීමේ වැඩසටහන.**

මධ්‍යම පරිසර අධිකාරිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහයෝගීතාවයෙන් දින 03 ක "ශ්‍රීපාද සිද්ධස්ථානය" පිරිසිදු කිරීමේ වැඩසටහන පහත සඳහන් ආයතනවල සහභාගීත්වයෙන් පවත්වන ලදී.

1. මධ්‍යම පරිසර අධිකාරිය නුවරඑළිය දිස්ත්‍රික්කය.
2. අඹගමුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
3. කොළඹ විශ්වවිද්‍යාලය.
4. මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
5. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය




FIGURE 11 : : ශ්‍රී පාද සිද්ධස්ථානය" පිරිසිදු කිරීමේ වැඩසටහන

BOI කර්මාන්ත වෙතින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ශාලා මඟින් ප්ලාස්ටික්/පොලිතින් **අපද්‍රව්‍ය ඉවත් කර ප්‍රතිචක්‍රීකරණය සඳහා එකතු කරන්නන් සඳහා සහ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය එකඟතා ලිපි නිකුත් කරනු ලැබේ.** මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඇති ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත ඔවුන්ගේ පොලිතින්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය යැවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සමගාමී ක්‍රියා පටිපාටිය යටතේ ලියාපදිංචි කර ඇති සියලුම ආයෝජන මණ්ඩල කර්මාන්ත සඳහා මෙම ක්‍රියාවලිය අදාළ වේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද නිසි පාරිසරික ආරක්ෂණ බලපත්‍ර මාර්ගෝපදේශ, පොලිතින්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය යැවීමේ ක්‍රියා පටිපාටිය සහ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය කර්මාන්තය අනුගමනය කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය වූ විට ආයෝජන මණ්ඩලයේ කර්මාන්තශාලා පරිශ්‍රයේ අදාළ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් පරීක්ෂණ සිදු කරනු ලැබේ.

නිකුත් කරන ලද එකඟතා ලිපි වලින් ලබාගත් දත්ත වලට අනුව, 2022 වර්ෂයේදී BOI කර්මාන්ත වලින් ප්ලාස්ටික් / පොලිතීන් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 409,687 ක් යවා ඇත. පොලිතීන්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය යැවීමේ නිර්ණායක සහ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය තහවුරු කිරීම සඳහා"එකඟතා ලිපි" නිකුත් කිරීමට පෙර 2022/10/21 දින BOI

කර්මාන්ත තුනක පරීක්ෂණ සිදු කරන ලද අතර පහත සඳහන් දෝෂ නිරීක්ෂණය කරන ලදී.

- සමහර කර්මාන්ත වල පොලිතින්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසි ස්ථානයක ගබඩා කර නොතිබුණි.
- කර්මාන්ත ශාලාවේ ජනනය වන සාමාන්‍ය කසළ නිසි ස්ථානයක් නොමැතිව ගොඩනැගිල්ලෙන් පිටත ගබඩා කර ඇත.
- සාමාන්‍ය කසළ දිරාපත් වන, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි, ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කාණ්ඩවලට වෙන් කර නොමැත

එම කර්මාන්තවල දෝෂ මහහරවා ගැනීම සඳහා නිර්දේශ සහ උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව පරිසරය පිරිසිදුව හා සෞඛ්‍ය සම්පන්නව තබා ගැනීම සඳහා තම පද්ධතිවල අඩුපාඩු හඳුනා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් ලබා දෙන උපදෙස් සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන් පූර්වාරක්ෂාව ගෙන ඇත.

- **නැව් මගින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල එකතු කිරීම.**

නැව් මගින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතුකරන්නන් සඳහා පරිසර නිර්දේශ නිකුත් කිරීම සහ නැව් මඟින් කසල එකතු කරන්නන් 17 දෙනෙකු සඳහා පරිසර නිර්දේශ නිකුත් කිරීම 2021 වසරේදී ආරම්භ කරන ලදි. එමඟින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතුකරන්නන් 11 දෙනෙකු 2021 වර්ෂය සඳහා පරිසර නිර්දේශ නැවත අලුත් කිරීමට අයදුම් කර ඇත.

මෙම ලියාපදිංචි කසළ එකතු කරන්නන් ගෙන් ලබා ගත් දත්ත අනු ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 17 ක්, පොලිතින් අපද්‍රව්‍ය ටොන් 11 ක්, ලෝහ අපද්‍රව්‍ය ටොන් 101 ක් සහ විදුරු අපද්‍රව්‍ය ටොන් 12 ක් සහ කඩදාසි අපද්‍රව්‍ය ටොන් 36ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා මාසිකව එකතු කර ඇත. (ප්‍රස්ථාර 01) 2022 වර්ෂය සඳහා මුළු නැව් අපද්‍රව්‍ය එකතු කිරීම සාමාන්‍යයෙන් මසකට ටොන් 187 කි.

- **ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණය**

නිසි එකතු කිරීමේ යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් ඇලුමිනියම් කෑන් ප්‍රතිචක්‍රීකරණය කිරීම අභියෝගාත්මක විය. ප්‍රතිචක්‍රීකරණය කරන ලද නිෂ්පාදන සඳහා සැලකිය යුතු අගයක් එකතු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ එම අංශයේ විශාල නිෂ්පාදකයන් සමඟ එක්ව “Meting point” නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ කම්හල 2022 දී මහනුවර පිළිමතලාවේ දී ආරම්භ කරන ලදී.





II. කසළ ප්‍රතිකර්ම හා අවසන් බැහැර කිරීම

පළාත් පාලන ආයතන තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති, කොම්පෝස්ට් කිරීම, ප්‍රතිචක්‍රීකරණය, බලශක්ති ප්‍රතිසාධනය වැනි අපද්‍රව්‍ය පිරිපහදු කිරීම් සහ අවසාන බැහැර කිරීම සඳහා තාක්ෂණික වශයෙන් පහසුකම් සපයනු ලැබේ. 2022 දී පහත පහසුකම් සපයන ලදී.

- මාතර නගර සභාව තුළ දිරාපත් වන ඝන අපද්‍රව්‍ය සඳහා තිරසාර විසඳුමක් ලබා දීම සඳහා මාතර කොටවිල කසල මඟින් විදුලිය නිෂ්පාදය කිරීමේ ව්‍යාපෘතිය (Waste to Energy Project) ආරම්භ කරන ලදී. 2022 දී, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට පහසුකම් සැලසීම සඳහා ගැටළු සාකච්ඡා කරන ලදී.
- පළාත් පාලන ආයතනවලට ඔවුන්ගේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම සඳහා ‘පිළිසරු’ නම් ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. දැනට ලැබෙමින් පවතින ඉල්ලීම් මත පදනම්ව පහසුකම් සැලසීම සහ ගැටළු විසඳීම ක්‍රියාවලීන් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රතික්ෂේප කරන ලද අයිතම බැහැර කිරීම.

සාමාන්‍යයෙන්, ආනයනය කරන ලද භාණ්ඩ නිසි පරිදි නොමැති විට, ශ්‍රී ලංකා රේගුව විසින් එම භාණ්ඩ ප්‍රතික්ෂේප කරන අතර, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ (සාමාන්‍යයෙන්, ප්‍රදේශය භාරව සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින්) පරිසර හිතකාමී ලෙස එම භාණ්ඩය උපදෙස් දීමට හෝ බැහැර කිරීමට ආනයනකරුවන් හට උපදෙස් ලබා දෙනු ලැබේ.

ඒ අනුව, 2022 දී, ශ්‍රී ලංකා රේගුව විසින් භාණ්ඩ 17ක් (49* 40'' සහ 14 * 20" කන්ටේනර්) ප්‍රතික්ෂේප කර ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒවායේ බැහැර කිරීමේ යෝජනා ඇගයීම මත පදනම්ව විරෝධතා නොමැති ලිපි 17ක් නිකුත් කර ඇත. එම භාණ්ඩ 17 න් භාණ්ඩ 10 ක් සාර්ථකව විනාශ කර අවසන් කර ඇති අතර එකක් තාවකාලිකව අතර මග නතර කර ඇති අතර 06 ක් ඉතිරිව ඇත.









රෙගුලාසි හා නීති බලාත්මක කිරීම.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ නීති කෙටුම්පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම රෙගුලාසි හා නීති බලාත්මක කිරීම යටතේ සිදුවේ.

III. නිෂ්පාදකයාගේ විස්ථාරණ වගකීම (EPR).

නිෂ්පාදකයාගේ විස්ථාරණ වගකීම (EPR) යනු නිෂ්පාදකයන්ට තම නිෂ්පාදනවල ජීවන චක්‍ර කළමනාකරණයේදී සැලකිය යුතු වගකීමක් පැවරෙන ප්‍රතිපත්තිමය ප්‍රවේශයකි. විශේෂයෙන් ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පරිසර දූෂණය පාලනය කිරීමේ අදහසින් මෙම මෙවලම ලොව පුරා බොහෝ රටවල බහුලව භාවිතා වේ.

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින්, EPR ක්‍රියාත්මක කිරීමේ නියාමනය සකස් කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතේ සංශෝධනයට ඇතුළත් කර ඇත. මහජන අවශ්‍යතා නීති පදනම සමඟ සහයෝගීත්වයෙන් පනතට සංශෝධන සමඟ සමාන්තරව EPR පහසු කිරීම සඳහා රෙගුලාසි කෙටුම්පත් කිරීම සිදුවෙමින් පවතී.

EPR ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවයක් ලෙස, ලංකා වාණිජ මණ්ඩලය විසින් ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වූ පුද්ගලික අංශයේ කර්මාන්ත වලින් වාර්තා ලබාගැනීම සඳහා පරිසර අධිකාරිය වෙත ලැප්ටොප් පරිගනකයක් ලබාදී

අන්තර්ජාල වාර්තාකරණ පද්ධතියක් සකස් කරන ලදී. මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ මෘදුකාංග සංවර්ධන සමාගම හා එක්ව ලංකා වාණිජ මණ්ඩලය CCC විසින් අදාළ නිලධාරීන් පුහුණු කරන ලදී.



FIGURE 12 : : USAID CLEAN CITY BLUE OCEAN වැඩසටහන මගින් ලැප්ටොප් පරිගණකයක් භාරදීම

B. පොලිතීන් කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

• 2017 දී, පොලිතින් ලන්ච් ෂීට් තහනම් කිරීමේ රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලද අතර පොලිතින් ලන්ච් ෂීට් සඳහා විකල්පයක් ලෙස පෙවහායනයට ලක්වන ලන්ච් ෂීට් හඳුන්වා දෙන ලදී. පෙව හායනයට ලක්විය හැකි ලන්ච් ෂීට් නිෂ්පාදනය කරන ආයතන 08 ක ලියාපදිංචි කිරීම් මධ්‍යම පරිසර අධිකාරියේ 2022 වසර සඳහා අලුත් කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියේ දත්ත පද්ධතිය යාවත්කාලීන කරන ලදී. එම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, දිරාපත් වන ලන්ච් ෂීට් සඳහා ප්‍රමිතීන් සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලා සිටින ලදී . ඒ අනුව, 2021 වසරේ SLS ප්‍රමිතිය කොම්පෝස්ට් කළ හැකි ලන්ච් ෂීට් ප්‍රමිතිය සකස් කර ඇති අතර ආහාර දවටන සඳහා SLS ප්‍රමිතියට අනුකූල වන ලෙස සමාගම්වලින් ඉල්ලා සිටියේය.

• කොළඹ මහ නගර සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පොලිතීන් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.






FIGURE 13 : CMC කාර්ය මණ්ඩලය සඳහා පොලිතින් වැටලීම් දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන

විශේෂ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසිවල වලට අනුකූල වන ක්‍රියාකාරකම් සිදු වෙමින් පවතී.

C. විශේෂ ව්‍යාපෘති

දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනයේ මෙහෙයුම් නඩත්තු හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඇතුළු ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ව්‍යාපෘති සහ ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය විශේෂ ව්‍යාපෘති යටතේ සිදු කෙරේ.

I. දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය - Green Park ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය

දොම්පේ කිරිදිවැල ප්‍රදේශයේ පිහිටි ග්‍රීන් පාක් ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මධ්‍යම පරිසර අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ සනීපාරක්ෂක බිම් පිරවුම් කිරීමේ ස්ථානය වේ. මෙම මධ්‍යස්ථානය සනීපාරක්ෂක කසළ රඳවන ස්ථානය, කොම්පෝස්ට් කරන ස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානයකින් සමන්විත වේ. කොරියානු සහයෝගිතා නියෝජිතායතනය (KOICA) විසින් ඔවුන්ගේ මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව ගොඩකිරීමේ ස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානය ඉදිකරන ලදී. සමස්ත ඇස්තමේන්තුගත ආයෝජනය පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 6 ක්, කොරියානු රජය විසින් මිලියන 4.5 ක් සහ CEA විසින් මිලියන 1.5 ක් පමණ ව්‍යාපෘතියක් ලබා දී ඇත.

මෙම සනීපාරක්ෂක කසළ රඳවන ස්ථානයේ බැහැර කිරීමේ ධාරිතාව දිනකට ටොන් 90ක් පමණ වන අතර මුලදී මෙම කසළ රඳවනය දිනකට අපද්‍රව්‍ය ටොන් 10ක් කළමනාකරණය කිරීමේ අරමුණින් දොම්පේ ප්‍රාදේශීය සභාවේ අවසාන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය ලෙස ක්‍රියා කිරීමට සැලසුම් කර ඇත.කෙසේ වෙතත්, දොම්පේ ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම්ගතව ඇති කර්මාන්ත සහ මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුම් යටතේ ඇති කර්මාන්ත සඳහා දැනට කසළ රඳවනයට දිනකට මෙට්‍රික් ටොන් 10-30 ක ධාරිතාවයකින් යුත් ඉහත ආකාරයේ අපද්‍රව්‍ය ලැබේ.

සනීපාරක්ෂක බිම් පිරවුම් මධ්‍යස්ථානය ගොඩකිරීමේ පහසුකම, රැගෙන එන අපද්‍රව්‍ය කිරුම්, පටිගත කිරීමේ පහසුකම, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම, ලීචේට් එකතු කිරීමේ පහසුකම, ලීචේට් පවිත්‍ර කිරීමේ පහසුකම, ගෑස් පිරිපහදු කිරීමේ පහසුකම, ජල දූෂණය වැළැක්වීමේ ලයිනර් පහසුකම, භූගත ජල අධීක්ෂණ ළිං, ආවරණ පාංශු තොග, ගොඩකිරීමේ උපකරණ (ඩෝසර්, කැණීම් යන්ත්‍රය, ටිපර් ආදිය)පරිපාලන සහ කළමනාකරණ පහසුකම් සහ CCTV ආරක්ෂක පද්ධති වලින් සමන්විත වේ.

2022 වර්ෂයේ අපද්‍රව්‍ය කළමනාකරණය

TABLE 7 : අපද්‍රව්‍ය කළමනාකරණය **2022** වර්ෂය

ආයතනය	රැගෙන එන අපද්‍රව්‍ය ප්‍රමාණය (kg)	ආදායම (රු.)
දොම්පේ ප්‍රාදේශීය සභාව /බිම් පිරවුම් අපද්‍රව්‍ය	1190930	-
දොම්පේ ප්‍රාදේශීය සභාව (වියෝජනය වන / කොම්පොස්ට්කරණය කළ හැකි)	179540	-
දොම්පේ ප්‍රාදේශීය සභාව - කර්මාන්ත	445010	1,557,535.00
අපද්‍රව්‍ය-වෙනත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුම් ගතව)	979715	7,888,400.00
වීදුරු ලොම් (මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුම් ගතව)	201820	8,373,600.00
කෙඳි අපද්‍රව්‍ය (වීදුරු ලොම්)	2430	121,500.00
වෙනත් පළාත් පාලන ආයතන (මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුම් ගතව)	6940	13,880.00
එකතුව	**3006385**	**17,954,915.00**

II. කොම්පෝස්ට් නිෂ්පාදනය

මේ වන විට කොම්පෝස්ට් අංගනය දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ජෛව භායනයට ලක්විය හැකි අපද්‍රව්‍ය ලබා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය අඛණ්ඩ සිදු කරගෙන යනු ලැබේ. කොම්පෝස්ට් අංගනයේදී, අපද්‍රව්‍යවල කෙටි කාලීන ජෛව භායනයට ලක්විය හැකි කාබනික කොටස, වටිනා පාංශු තත්ත්ව කාරකයක් වන කොම්පෝස්ට් බවට පරිවර්තනය කරනු ලැබේ.



FIGURE 14 : සනීපාරක්ෂක බිම්පරිවුම



කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානයේ දිනකට පෙව භායනයට ලක්විය හැකි අපද්‍රව්‍ය ටොන් පහක් පමණ සකස් කිරීමේ හැකියාව පවතියි. කෙසේ වෙතත්, මේ වන විට කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් සහ ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් දිනකට කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා පෙව භායනයට ලක්විය හැකි අපද්‍රව්‍ය ටොන් 1ක් පමණ ලැබේ. කෙසේ වෙතත්, 2022 වසරේ අග භාගයේදී පෙව භායනයට ලක්වන අපද්‍රව්‍ය ලබා ගැනීම ක්‍රමයෙන් වැඩි කර එය ස්ථාවර තත්ත්වයකට රැගෙන එන ලදී. ගොවීන් සඳහා නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක මිලකට අලෙවි කරන අතර ග්‍රීන් පාක් අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කරන කොම්පෝස්ට් සඳහා සෑම විටම ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. උසස් තත්ත්වයේ සහ අඩු මිල නිසා 2022 වර්ෂයේදී කොම්පෝස්ට් අලෙවියෙන් රුපියල් 27680.00ක් උපයා ඇත.

බිම් පිරවුම

2022 වසර අවසානයේදී, 4 වන කොටු ප්‍රදේශයේ 1 වන ස්ථරයට අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් 2/3 ක් පමණ අවසන් විය. කෙසේ වෙතත්, 2015 මැයි මාසයේ සිට ගොඩකිරීමේ පහසුකම මෙහෙයුම් ආරම්භ කරන ලද අතර, 2022 අවසානයේ අපද්‍රව්‍ය ටොන් 25467.37ක් ගොඩබිමට මුදා හැර ඇති අතර මුළු කොම්පෝස්ට් නිෂ්පාදනය ටොන් 400.96ක් පමණ විය.

පහත ප්‍රස්ථාරවල (ප්‍රස්ථාර 1 සහ ප්‍රස්තාරය 2) දැක්වෙන පරිදි පෙර වසරවලට සාපේක්ෂව මුළු අපද්‍රව්‍ය හැසිරවීම සහ උපයාගත් ආදායම.




FIGURE 15 : : සම්පූර්ණ පෙව භායනයට ලක්විය හැකි අපද්‍රව්‍ය හැසිරවීම සහ අපද්‍රව්‍ය සනීපාරක්ෂක කසළ රඳවනයට බැහැර කිරීම.




FIGURE 16 : අපද්‍රව්‍ය හැසිරවීම මගින් උපයාගත් මුළු ආදායම.

CHAPTER 4 : පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය

A. පරිසර කළමනාකරණ හා ඇගයීම් ඒකකය

B. නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම

පරිසර බලපෑම් ඇගයීම් (ප.බ.ඇ.) ඒකකයේ ප්‍රධාන නියාමන කාර්යභාරය වනුයේ පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් සියලුම 'නියමිත ව්‍යාපෘති' සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාමයි. මෙම කාර්යභාරයට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් හා තාක්ෂණික, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සඳහා නිර්ණේය විෂයයන් සැකසීම, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ඇගයීම, ඇගයීම් කමිටු රැස්වීම් කැඳවීම, මහජන සහභාගීත්වය සඳහා අවකාශ ලබාදීම හා ඉන් අනතුරුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම හා අනුමත කරන ලද ව්‍යාපෘති පසුවිපරම් කිරීම යන කරුණු ඇතුලත් වේ. 2022 වසර තුල දී ජාතික පාරිසරික පනතේ IV (ඇ) වගන්තිය යටතේ අනුමැතිය ලබාගත යුතු ව්‍යාපෘති 64 ක් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ඔස්සේ සලකා බැලීමට පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් කටයුතු කර ඇත. ඒ අනුව ව්‍යාපෘති 21ක් ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබා දී ඇති අතර එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු වගු අංක 1හි සඳහන් වේ. එසේම, පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති ව්‍යාපෘති 02ක පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කර ඇති අතර එම තොරතුරු වගු අංක 2හි සඳහන් වේ. 2022 වසරේදී කිසිදු ව්‍යාපෘතියක් සඳහා පරිසර අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප වී නොමැත.

TABLE 8 : පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ**,** පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් **2022** වසර සඳහා අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති ලැයිස්තුව.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ. / මූ.පා.ප. / අ.ප.බ.ඇ. /අ.මූ.පා.ප	අනුමැතිය ලබාදුන් දිනය
1.	හොරණ, මිල්ලැව යෝජිත බන්ධනාගාර ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** නාගරික සංවර්ධන අධිකාරිය	ප.බ.ඇ	2022.02.03
2.	යෝජිත, ඉදිකිරීම-අයිතිය-ක්‍රියාත්මක කිරීම සහ පැවරීමේ (BOOT) පදනම මත කෙරවලපිටිය ප්‍රදේශයේ මෙගාවොට් 350 ක සංයුක්ත චක්‍ර RLNG විදුලි බලාගාරයක් ඉදිකිරීම **ව්‍යා.යෝ.-** සොබාදනවි (පුද්) සමාගම (ලක්දනවි (පුද්) සමාගම යන නම වෙනස් කර ඇත)	ප.බ.ඇ	2022.01.13
3.	කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ප්‍රවාහන අමාත්‍යාංශය හා ගුවන් සේවා අමාත්‍යාංශය	ප.බ.ඇ	2022.01.16
4.	ජා-ඇල/ඒකල මලාපවහන නළ ආවරණය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම **ව්‍යා.යෝ.-** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ	2022.05.30
5.	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල එකතු කිරීමේ සහ බැහැර කිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ	2022.09.12
6.	මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා යෝජිත අපජල බැහැර කිරීමේ පහසුකම **ව්‍යා.යෝ. -** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ	2022.12.09
7.	ලංවා සංස්ථා වානේ (පුද්) සමාගම විසින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය තුළ යෝජිත වානේ කර්මාන්ත ශාලාව **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	අ.ප.බ.ඇ	2022.12.29
8.	යෝජිත කොළඹ වරාය පුලුල් කිරීම සඳහා කෙරවලපිටිය අක්වෙරළ මුහුදු වැලි කැණීමේ ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා වරාය අධිකාරිය	මූ.පා.ප	2022.01.28

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ. / මූ.පා.ප. / අ.ප.බ.ඇ. /අ.මූ.පා.ප	අනුමැතිය ලබාදුන් දිනය
9.	යෝජිත කි.වො. 132 මැදගම සිට අම්පාර දක්වා අධිබල සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප	2022.05.09
10.	යෝජිත මෙගාවොට් 10 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හම්බන්තොට **ව්‍යා.යෝ.-** ඩුඩු අන්තර්ජාතික පුද්ගලික සමාගම	මූ.පා.ප	2022.05.23
11.	යෝජිත මෙගාවොට් 10 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හම්බන්තොට **ව්‍යා.යෝ.-** නිධන්යා අන්තර්ජාතික පුද්ගලික සමාගම	මූ.පා.ප	2022.05.23
12.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 64, බුත්ගමුව පාර, රාජගිරිය **ව්‍යා.යෝ.-** බයිලි ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්) සමාගම	මූ.පා.ප	2022.04.27
13.	යෝජිත මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය පුනානි, මඩකලපුව **ව්‍යා. යෝ.-** සෝලා ෆෝජ් (පුද්) සමාගම	මූ.පා.ප	2022.07.07
14.	යෝජිත මෙගාවොට් 60ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සෙවනගල, මොණරාගල **ව්‍යා.යෝ.-** සෝලා ෆෝජ් මොණරාගල (පුද්) සමාගම	මූ.පා.ප	2022.10.26
15.	ඉහළ ඇලහැර ඇල දකුණු ද්වාරයෙහි යෝජිත අතිරේක භූමි ප්‍රදේශය (හෙක්ටයාර 1.46), ICB-2A කොන්ත්‍රාත් පැකේජය, ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප	2022.10.13
16.	යෝජිත හුණුගල් කැණීම් ව්‍යාපෘතිය අරුවක්කාලු, එළුවන්කුලම් **ව්‍යා.යෝ.- සියැම් සිටි සිමෙන්ති (පුද්) ලංකා**	මූ.පා.ප	2022.11.10
17.	යෝජිත කාමර 48 බුටික් හෝටලය, වෝටර්ස් එජ් **ව්‍යා.යෝ.-** වෝටර්ස් එජ් ලිමිටඩ්	මූ.පා.ප	2022.11.23
18.	යෝජිත මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය නිලාවේලි, ත්‍රිකුණාමලය **ව්‍යා.යෝ.-** 3 W පවර් මැනේජ්මන්ට් (පුද්) සමාගම	මූ.පා.ප	2022.12.13
19.	MAS ෆැබ්රික් උද්‍යානයේ දැනට පවතින මධ්‍යගත අපජල පිරිපහදු පද්ධතියේ ධාරිතාවය දිනකට ඝන මීටර 2500 දක්වා වැඩි කිරීම **ව්‍යා.යෝ.-** MAS ෆැබ්රික් පාර්ක් , තුල්හිරිය	අ.මූ.පා.ප	2022.03.31
20.	හම්බන්තොට වරාය ආශ්‍රිත කාර්මික කලාපය **ව්‍යා.යෝ.-** හම්බන්තොට ජාත්‍යාන්තර වරාය සමූහ සමාගම	අ.මූ.පා.ප	2022.12.21
21.	ත්‍රිකුණාමලය කන්නියා ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත කසල භාවිතයෙන් විදුලි ජනන ව්‍යාපෘතිය යෝජිත අපද්‍රව්‍ය බලශක්තිය ව්‍යාපෘතිය කන්නියා, ත්‍රිකුණාමලය **ව්‍යා.යෝ.-** සී.ජී.එල්. ඉන්ටර්නැෂනල් ඉකෝ (පුද්) සමාගම	මූ.පා.ප	2022.12.09

ප.බ.ඇ.	-	පරිසර බලපෑම් ඇගයීම
මූ.පා.ප.	-	මූලික පාරිසරික පරීක්ෂණය
අ.ප.බ.ඇ	-	අතිරේක පරිසර බලපෑම් ඇගයීම
අ.මූ.පා.ප.	-	අතිරේක මූලික පාරිසරික පරීක්ෂණය
ව්‍යා.යෝ.	-	ව්‍යාපෘති යෝජක

TABLE 9 : පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැතිව **2022** වසරේදී පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ. / මූ.පා.ප. / අ.ප.බ.ඇ. /අ.මූ.පා.ප	අනුමැතිය ලබාදුන් දිනය
1.	වත්තේගම සහ මඩුගම ඒකාබද්ධ සීනි කර්මාන්ත ව්‍යාපෘතිය, සියඹලාණ්ඩුව **ව්‍යා.යෝ-** ඇකිමලේ වැවිලි (පුද්) සමාගම	ප.බ.ඇ	2022.09.21
2.	බෙස්ලයින් මාර්ගයට සම්බන්ධිත මාර්ගයක් සහිතව නව කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහා මාර්ගය **ව්‍යා.යෝ.-** මාර්ග සංවර්ධන අධිකාරිය	ප.බ.ඇ	2022.10.25

2022 වර්ෂය තුළ ප.බ.ඇ.හෝ මූ.පා.ප. අපේක්ෂා කරන අයදුම්පත් (BIQs) 88ක් ලැබී ඇත. ඒ අනුව, පරිසර බලපෑම් ඇගයීම සහ අතිරේක පරිසර බලපෑම් ඇගයීම (විෂයගත රැස්වීම් 17ක් සහ විෂයගත ක්ෂේත්‍ර පරීක්ෂණ 9ක්) ක්‍රියාවලියට ලක් කරන ලද ව්‍යාපෘති 23ක් සම්බන්ධයෙන් විෂයගත රැස්වීම් / විෂයගත ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී.

එසේම, **මූ.පා.ප.** සඳහා යොමු කරන ලද ව්‍යාපෘති 17ක් සඳහා විෂයගත රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී.

පරිසර අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් පවතින ව්‍යාපෘති 38 (2022 වසරේ සිට පැවත ආ ව්‍යාපෘති 15ක් ද ඇතුළුව) පිළිබඳ තොරතුරු වගු අංක 3අ හි සඳහන් වේ.

TABLE 10 : අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් ඇති ප.බ.ඇ./ මූ.පා.ප. ව්‍යාපෘති ලැයිස්තුව

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප/.ඇ.බ. මූ.ප.ප.	තත්ත්වය
ප්‍රවාහන			
1.	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 2 (ඉංගිරියේ සිට රත්නපුර දක්වා) සහ 3 (රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා) **ව්‍යා.යෝ.-** මාර්ග සංවර්ධන අධිකාරිය	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
2.	රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා අධිවේගී මාර්ගය **ව්‍යා.යෝ.-** මාර්ග සංවර්ධන අධිකාරිය	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
3.	යෝජිත දුම්රිය මාර්ගය කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා වෙනස් කිරීම **ව්‍යා.යෝ.-** ප්‍රවාහන හා සිවිල්ගුවන් සේවා අමාත්‍යාංශය	ප.බ.ඇ	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය (ToR) නිකුත් කල යුතුව ඇත.
4.	කෝස්ටික් සෝඩා/ ක්ලෝරීන් නිෂ්පාදන ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** සීමාසහිත පරන්තන් රසායන සමාගම	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත. ව්‍යාපෘති යෝජක විසින් නිර්ණේය විෂය හි වලංගු

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප/.ඇ.බ. මූ.ප.ප.	තත්ත්වය
			කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇත.
5.	කටුනායක කර්මාන්ත කලාපය **ව්‍යා.යෝ.-** කර්මාන්ත අමාත්‍යාංශය	මූ.පා.ප	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
6.	ද්‍රවීකෘත ස්වභාවික වායු පහසුකම සංවර්ධනය FSRU පද්ධතිය හා නල මාර්ගය ස්ථාපිත කිරීම **ව්‍යා.යෝ.-** නිව් ෆෝට්‍රස් එනර්ජි පුද්ගලික සමාගම	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
අපද්‍රව්‍ය කළමනාකරණය			
7.	ගොහාගොඩ සනීපාරක්ෂක කසල රඳවනය **ව්‍යා.යෝ.-** මහනුවර මහ නගර සභාව	මූ.පා.ප	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	වාරිමාර්ග		
8.	මුන්දෙණිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
9.	හංවැල්ල සිට කැලණි ගඟේ ගං මෝය දක්වා ගංවතුර අවම කිරීම සඳහා යෝජිත ගංවතුර පාලන බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
10.	යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය, මාවනැල්ල **ව්‍යා. යෝ.-** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
11.	බෝවතැන්න ජලාශයේ සිට වැමැඩිල්ල ජලාශය දක්වා ඉදිවන දෙවන උමං මාර්ගය ඉදිකිරීම සහ වැමැඩිල්ල ජලාශයේ දකුණු ඉවුරු ඇළ වැඩිදියුණු කිරීම **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
12.	ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
13.	අඹතලේ ප්‍රදේශයේ දී කැලණි ගඟ හරහා ලවන බාධකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
	හෝටල්		
14.	යෝජිත කාමර 200 තරු පහේ හෝටල් ව්‍යාපෘතිය, සීදුව **ව්‍යා.යෝ.-** මෙල්වා හොටලේස් ඇන්ඩ් රිසෝට්ස් (පුද්) සමාගම	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප/.ඇ.බ. මූ.ප.ප.	තත්ත්වය
15.	හල්දුම්මුල්ල, යෝජිත "ඉකෝ ගෝල්ෆ් රිසෝට්" ව්‍යාපෘතිය. **ව්‍යා.යෝ.-** ඇල්ෆා සහ ඔමේගා ඩිවලොපර්ස් (පුද්) සමාගම	ප.බ.ඇ	ව්‍යාපෘතිය අත්හැර ඇත.
16.	එලිෆන්ට් නේචර් රිසෝට් හෝටල් ව්‍යාපෘතිය, ගෙඩිගස්වලාන, පලාහේන, සීගිරිය **ව්‍යා. යෝ.-** ග්‍රීන් ප්ලැනට් (පුද්) සමාගම	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
17.	යෝජිත ගොල්ෆ් පිටිය සහ මෙල් වත්ත සංවර්ධන ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** මෙල් වත්ත දේපල සංවර්ධන (පුද්) සමාගම	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
18.	කදම්බ නදී ජල උද්‍යානය, අනුරාධපුර **ව්‍යා. යෝ.-** බී චන්ද්‍රසිරි මහතා, 42, පුත්තලම පාර, පණ්ඩුලගම, අනුරාධපුර	ප.බ.ඇ/ මූ.පා.ප	පිරික්සීමට ලක් කරමින් පවතී (screening)
	කැණීම්		
19.	යෝජිත ඛණිජ වැලි කැණීමේ ව්‍යාපෘතිය, පොදුවාකට්ටු, ත්‍රිකුණාමලය **ව්‍යා.යෝ.-** ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
20.	ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මුතුරාජවෙල ඉඩම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
21.	ඇඹිලිපිටිය, පනහඳුව ප්‍රදේශයේ යෝජිත කැල්සයිට් කැණීමේ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ලංවා සංස්ථා සිමෙන්ති (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීමක් පවත්වා ඇත.
	විදුලිබල හා බලශක්ති		
22.	යෝජිත පුනරීන් සුළං- සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය අදියර- 03 (මෙගාවොට් 108.27ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය) **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත.
23.	නව හබරණ සිට නව අනුරාධපුර දක්වා යෝජිත කිලොවොට් 220ක සම්ප්‍රේෂණ මාර්ගය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
24.	යෝජිත මෙගාවොට් 100ක මන්නාරම සුළං බල ව්‍යාපෘතිය අදියර II **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	ප.බ.ඇ	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය නිකුත් කර ඇත.
25.	යෝජිත මෙගාවොට් 60ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය කප්පල්තුරෙයි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** වින්ඩ් පෝස් (පුද්) සමාගම	මූ.පා.ප	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය නිකුත් කර ඇත.
26.	යෝජිත මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය මුතූර්, ත්‍රිරිකුණාමලය **ව්‍යා. යෝ.-** ඕබිට් එනර්ජි (පුද්) සමාගම	මූ.පා.ප	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
27.	මන්නාරමේ යෝජිත මෙගාවොට් 275ක සුළං බල ව්‍යාපෘතිය (අදියර II) **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප/.ඇ.බ. මූ.ප.ප.	තත්ත්වය
28.	මන්නාරම අදියර I සුළං බල ව්‍යාපෘතියේ ධාරිතාවය මෙගාවොට් 35ක් දක්වා ඉහළ නැංවීමට යෝජිත ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
29.	පුනරීන් හි යෝජිත මෙගාවොට් 100ක සුළං බල ව්‍යාපෘතිය -(අදියර I) **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
30.	යෝජිත මෙගාවොට් 133ක සුළං බල ව්‍යාපෘතිය (අදියර I) **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
31.	කෙරවලපිටියේ සිට කිරිදිවැල දක්වා යෝජිත කිලෝවොට් 400ක සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
32.	යෝජිත මෙගාවොට් 216ක සුළං බල ව්‍යාපෘතිය වේරවිල්, කිලිනොච්චි දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය නිකුත් කර ඇත.
33.	නව හබරණ සිට කප්පල්තුරේ දක්වා යෝජිත කිලොවොට් 220ක සම්ප්‍රේෂණ මාර්ගය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
34.	යෝජිත මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය කරච්චි කිලිනොච්චි දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** ප්‍රයිම් රෝඩ් ඕල්ටනේටිව් (පුද්) සමාගම	මූ.පා.ප	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය නිකුත් කළ යුතුව ඇත.
කෘෂිකර්ම			
35.	රඹකැන්ඔය පොල්ලේබැද්ද කෘෂිකාර්මික හා සත්ත්ව පාලන ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප	නිර්ණේය විෂය නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් ප.බ.ඇ වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
36.	දුරියන් වගා ව්‍යාපෘතිය, නාගස්තැන්න වතුයාය, යටියන්තොට **ව්‍යා.යෝ.-** නෙල්නා ඇග්‍රි ඩිවෙලොප්මන්ට් (පුද්) සමාගම	ප.බ.ඇ	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
37.	මුතුවැල්ල කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය- මහවැලි 'බී' කලාපය **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
ජලජීවී වගාව			
38.	යෝජිත ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතිය, පූනකරි කිලිනොච්චිය **ව්‍යා.යෝ.-** සෙන්කුවා (පුද්) සමාගම	මූ.පා.ප	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.

ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම හේතුවෙන් සමහර ව්‍යාපෘති ප.බ.ඇ. ක්‍රියාවලියට යොමු කර නොමැත. එවැනි ව්‍යාපෘති 10 ක් පිළිබඳ විස්තර 3ආ වගුවේ දක්වා ඇත.

TABLE 11 : ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම හේතුවෙන් ප.බ.ඇ. ක්‍රියාවලියට යොමු කර නොමැති ව්‍යාපෘති.

අනු අංක	**ව්‍යාපෘතියේ නම**		**තත්ත්වය**
1.	කඩුගන්නාව සිට මාතලේ කොටස දක්වා මාතලේ දුම්රිය මාර්ගය සංවර්ධනය (මහනුවර තදාසන්න දුම්රිය) **ව්‍යා.යෝ.-** ප්‍රවාහන අමාත්‍යාංශය	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අවසන් කරන ලද ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ යුතුය.
2.	හම්බන්තොට ජාත්‍යන්තර වරාය පරිශ්‍රයේ යෝජිත පැරා බෙන්සොක්සීනෝන් සහ මැංගනීස් කාබනේට් නිෂ්පාදනය සහ අපනයනය කිරීමේ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
3.	ත්‍රිකුණාමලයේ චයිනා බේ තෙල් ටැංකි සංකීර්ණය ටැංකි 24ක් සංවර්ධනය කිරීම **ව්‍යා. යෝ.-** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
4.	යෝජිත අපද්‍රව්‍ය කොම්පෝස්ට්/ විදුලි ව්‍යාපෘතිය, පොහොරවත්ත, නාගොඩ, කළුතර **ව්‍යා.යෝ.-** රීසයිකල් එනර්ජි (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
5.	යෝජිත රණ්දෙණිගල කළුගඟ හුවමාරු ඇළ ව්‍යාපෘතිය **ව්‍යා.යෝ.-** ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
6.	යෝජිත මෙගාවොට් 50ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය. චෙට්ටිකුලම් වවුනියාව දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** සිලෝන් ඉලෙක්ට්‍රිසිටි පවර් (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
7.	යෝජිත මෙගාවොට් 700 ක සූර්ය උද්‍යානය සහ පූනකරි වැවේ තටාක ජාල උපපොළ කිලිනොච්චි දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** යුනයිටඩ් පවර් එනර්ජි (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
8.	පූනකරි වැව අවට පස් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම හා මුහුදු ජලය පාලන වේලි (Barrages) ඉදිකිරීම **ව්‍යා. යෝ.-** යුනයිටඩ් සෝලා (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
9.	නව හබරණ සිට වවුනියාව දක්වා යෝජිත කිලෝ වොට් 400 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය **ව්‍යා. යෝ.-** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් අතිරේක විස්තර ඉදිරිපත් කළ යුතුය.
10.	යෝජිත මෙගාවොට් 50ක සුළං බල ව්‍යාපෘතිය මරුතකර්නි යාපනය දිස්ත්‍රික්කය **ව්‍යා. යෝ.-** සෙනොක් වින්ඩ් පවර් (පුද්) සමාගම	ප.බ.ඇ/ මූ.පා.ප	මූලික රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය නිකුත් කළ යුතුව ඇත.

II. ප.බ.ඇ.හා මූ.පා.ප.ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත යොමු කිරීම.

ජාතික පරිසර පනතේ ප්‍රකාශයට පත් කර ඇති ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන මඟින් 'නියමිත ව්‍යාපෘති' සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂයේ දී ලැබුණු අයදුම්පත් 23 (වගුව 04 හි අ කොටස යටතේ නිරූපණය කර ඇති පරිදි) පිරික්සීමේ ක්‍රියාවලිය (Screening) හරහා වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අනුයෝජිත ආයතන වෙත යොමු කරන ලදි.

මීට අමතරව සංකීර්ණ පාරිසරික ගැටලු රහිත 'නියමිත ව්‍යාපෘති' වලින් කොටසක් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ පලාත් කාර්යාල වෙත බලය පවරා ඇත. මෙම ව්‍යාපෘතිවලට අදාල කටයුතු කර ගෙන යාමේ දී අවශ්‍ය සහාය හා මඟ පෙන්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් ලබා දී ඇත. ඒ අනුව ව්‍යාපෘති 16 ක් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කරන ලදි. 2022 වසරේ දී එසේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ඉහත සඳහන් කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව වගුව 04 හි අ කොටස යටතේ දක්වා ඇත.

TABLE 12 : 2022 වසරේ දී අනෙකුත් අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල/ වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව

අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ව්‍යාපෘති			
අ.අනුයෝජිත ආයතන වෙත යොමු කරන ලද ව්‍යාපෘති- 20			
අනු අංක	**ව්‍යාපෘතියේ නම**	**ව්‍යාපෘති යෝජක**	**අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය/ ඒකකය**
1.	මන්නාරම දූපතේ පවතින මන්නාරම සුළං බලාගාරයට මෙගාවොට් 35ක් නව ධාරිතාවක් එකතු කිරීමට යෝජිත ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
2.	බහු මහල් රථගාල හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 180, අබ්දුල් කාදර් මාවත, කොළඹ 11	NEM ඉදිකිරීම් (පුද්) සමාගම	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
3.	වෙඩිතලතිව්හි යෝජිත ජලජීවී වගා ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4.	නුවර වැව භූමි අලංකරණ ව්‍යාපෘතිය අනුරාධපුර	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5.	යෝජිත පෙක්කුලම ජලාශ ව්‍යාපෘතිය	වාරිමාර්ග දෙපාර්තමේන්තු	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය	එච්.නන්දාවති මෙනවිය, අංක 67, 19 කොටස, හඳුන්ගමුව	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
7.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය	කේ ජී අබේමැණිකා මෙනවිය, අංක 667, 19 කොටස, හඳුන්ගමුව	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය	ආර් එම් එම් චමිලා හේරත් මෙනවිය, අංක 706, 19 කොටස, හඳුන්ගමුව	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
9.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය	කිරිහොඳා මහතා, අංක 641, තුන්හිරියවැව, හඳුන්ගමුව	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
10.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය, හඳුන්ගමුව	ජී ජී යසෝ මැණිකේ මෙනවිය, අංක 471, 7 වැනි කොටස, හඳුන්ගමුව, විල්ගමුව	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
11.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය, දුනුවිලපිටිය	ඊ එම් යූ කුමාරි මෙනවිය, අංක 447, මැදකන්ද., දුනුවිලපිටිය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
12.	යෝජිත ගස් කැපීමේ ව්‍යාපෘතිය, දුනුවිලපිටිය	ජී ජී හීන්බණ්ඩා මහතා, 489, රත්තොටයාය, දුනුවිලපිටිය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ව්‍යාපෘති			
අ.අනුයෝජිත ආයතන වෙත යොමු කරන ලද ව්‍යාපෘති- 20			
අනු අංක	**ව්‍යාපෘතියේ නම**	**ව්‍යාපෘති යෝජක**	**අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය/ ඒකකය**
13.	යෝජිත ගස් කැපීමේ ව්‍යාaපෘතිය, මැදකන්ද, දුනුවිලපිටිය	ඩබ්ලිව් එම් විජේරත්න බණ්ඩා මහතා, අංක 440, මැදකන්ද, දුනුවිලපිටිය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
14.	යෝජිත කාමර 140 හෝටල් ව්‍යාපෘතිය, ඉහළ ලේක් පාර, නුවරඑළිය	අබාන්ස් රිසෝට්ස් (පුද්) සමාගම.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
15.	ප්‍රජා ඒකාබද්ධ නිවාස වැඩසටහන (නිවාස ඒකක 300), වවුනියාව	ශ්‍රී ලංකා ඉස්ලාමීය සහන කමිටුව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16.	වවුනියාව පෙරියකොමරාසකුලම් හි යෝජිත කළුගල් කැණීමේ ව්‍යාපෘතිය	වික්‍රමපාල මහතා, හැඩුන්කුලම, මාමඩුවහර, වවුනියාව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
17.	කුඩා තේ සහ රබර් පුනර්ජීවන (STARR) ව්‍යාපෘතිය, වැවිලි අමාත්‍යාංශය	STARR ව්‍යාපෘතිය, වැවිලි අමාත්‍යාංශය	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
18.	වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි ඉඩම් නොමැති ජනතාව වෙනුවෙන් රජයේ ඉඩම් බෙදාදීම	ප්‍රාදේශීය ලේකම්, වවුනියාව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19.	කිලිනොච්චිය පූනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලිකුඩා ග්‍රාම නිලධාරී වසමේ මණ්ඩකලාරු බැම්ම ඉදිකිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
20.	පම්පයිමඩු කසල බැහැරලන ස්ථානය සංවර්ධනය	වව්නියාව දකුණ දමිළ ප්‍රාදේශීය සභාව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
21.	යෝජිත විලා ව්‍යාපෘතිය අංක 4211, ගංගාපිටිය වත්ත, අලුත්වත්ත, කෙන්ගල්ල, දිගන	වික්ටෝර්යා රෙසිඩන්සීස් (පුද්) සමාගම.	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
22.	යෝජිත රග්බි ක්‍රීඩාංගණ ව්‍යාපෘතිය සියඹලාගස්තැන්න, මහනුවර	සිල්වෙස්ට්‍රෝ බෙනඩික්ටින් සභාව	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
23.	යෝජිත බොරළු කැණීමේ ව්‍යාපෘතිය වෙහෙරගල, සූරියගල, දිඹුලාගල	පී.ජී.ඒ.ජේ.ප්‍රියංකරගේ මහතා, 192/ඒ, බෝගස්හංදිය, අරලගන්විල	වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව
ආ. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ව්‍යාපෘති- 16			
අංකය	**ව්‍යාපෘතියේ නම**	**ව්‍යාපෘති යෝජක**	**ව්‍යාපෘතිය අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය**
1.	මොරටුව වේල්ස් කුමර විද්‍යාලය අසල පදිකයන් සඳහා පාලමක් ඉදිකිරීම කොළඹ ගාල්ල හම්බන්තොට වැල්ලවාය පාර (A 002)	මාර්ග සංවර්ධන අධිකාරිය	බස්නාහිර පළාත් කාර්යාලය
2.	මාදිවෙල පාලම ප්‍රතිසංස්කරණය කිරීම	මාර්ග සංවර්ධන අධිකාරිය	බස්නාහිර පළාත් කාර්යාලය

අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ව්‍යාපෘති			
අ.අනුයෝජිත ආයතන වෙත යොමු කරන ලද ව්‍යාපෘති- 20			
අනු අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය/ ඒකකය
3.	යෝජිත ජාත්‍යන්තර පාසල, පොල්වත්ත, දෙපානම, පන්නිපිටිය	හවුස් ඔෆ් ෆැෂන්ස් ගාමන්ට්ස් (පුද්) සමාගම.	බස්නාහිර පළාත් කාර්යාලය
4.	මොරටුව - රත්මලාන ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව	බස්නාහිර පළාත් කාර්යාලය
5.	සීදුව ලියනගේමුල්ල ප්‍රදේශයේ යෝජිත කඩදාසි නිෂ්පාදන කම්හල මෙල්වයර් රෝලින්(පුද්) සමාගම	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
6.	යෝජිත කොළඹ කුරුලු උද්‍යානය මාදිවෙල	කලම්බෝ බර්ඩ් පාක් (පුද්) සමාගම.	බස්නාහිර පළාත් කාර්යාලය
7.	යෝජිත දියවන්නාව අපජල එකතු කිරීමේ සහ බැහැර කිරීමේ ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	බස්නාහිර පළාත් කාර්යාලය
8.	යෝජිත කාර්යාලය සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය අංක 28, බුත්ගමුව පාර, රාජගිරිය	බයිලි ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්) සමාගම	බස්නාහිර පළාත් කාර්යාලය
9.	අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය (A007) 0+800km සිට 42+640km දක්වා මාර්ගය i රෝඩ් වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම	මාර්ග සංවර්ධන අධිකාරිය	සබරගමුව පළාත් කාර්යාලය සහ මධ්‍යම පළාත් කාර්යාලය
10.	අපනයනකරුවන් සඳහා ගබඩා සහ ලොජිස්ටික් සේවා ව්‍යාපෘතිය අලවකන්ද වත්ත, අඹගස්පිටිය, යක්කල	ඩිසයින් ලොජිස්ටික්ස් (පුද්) සමාගම	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
11.	යෝජිත නිවාස ව්‍යාපෘතිය, "බ්ලිස් ඔෆ් වත්තල", නො. 566/5, මීගමුව පාර, වත්තල	සීමාසහිත ජනශක්ති සමාගම	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
12.	අනුරාධපුර උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතිය-කුබිච්චන්කුලම වැව ගල් වැටි දමා ප්‍රතිසංස්කරණය කිරීම	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	උතුරු මැද පළාත් කාර්යාලය
13.	මුතුරාජවෙල පර්යන්තයේ 15000m^3 ගබඩා ටැංකි 2ක් සහ 10000m^3 ගබඩා ටැංකියක් ඉදිකිරීම	සීමාසහිත සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
14.	යෝජිත කිරි නිෂ්පාදන ව්‍යාපෘතිය, වල්සපුගල, හම්බන්තොට, මහවැලි පද්ධතිය - වලව	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	දකුණු පළාත් කාර්යාලය
15.	මහකම්බිලියාව වැව ප්‍රතිසංස්කරණය කිරීම සහ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	උතුරු මැද පළාත් කාර්යාලය
16.	‘‘වාරි සෞභාග්‍යා’’ වැඩසටහන යටතේ කුඩා දික්වැව වැව ප්‍රතිසංස්කරණය කිරීම මහවැලි එල් පද්ධතිය	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	උතුරු මැද පළාත් කාර්යාලය

III. ප.බ.ඇ. / මූ.පා.ප. ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම.

ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන මඟින් 'නියමිත ව්‍යාපෘති' සඳහා ද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය මගින් අනුමැතිය ලබාදීම සඳහා ව්‍යාපෘති 51 ක් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත යොමු කර ඇත (වගුව 05)

එම අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත තාක්ෂණික සහාය ලබාදීමේ ක්‍රියාවලියේ දී නිර්ණේය විෂය (ToR) කෙටුම්පත් කිරීම, තාක්ෂණික කමිටුව නියෝජනය කිරීම සහ ප.බ.ඇ. / මූ.පා.ප. වාර්තා සඳහා අදහස් / නිරීක්ෂණ ලබාදීම ද මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් සිදු කරන ලදි. එසේම මෙම ආයතන අවසන් අනුමැතිය ලබාදීමට පෙර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව එම ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් එකඟතාවය ලබා දීමේ දී අවසන් අනුමැතියට අන්තර්ගත කළ යුතු නිර්දේශ / කොන්දේසි ලබා දෙනු ලබයි.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද පිළිවෙලින් වෙරළ සංරක්ෂණ පනත සහ වන සත්ත්ව හා ශාක්ෂලතා ආරක්ෂණ පනත්වල ප්‍රතිපාදන යටතේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කරනු ලබයි. එම ආයතන සඳහා ද පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අවශ්‍ය තාක්ෂණික සහාය එම පනත් වලට අනුකූලව ලබා දී ඇත.

TABLE 13 : අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය එකඟතාව ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	ප.බ.ඇ/ මූ.පා.ප
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව -15			
1.	යෝජිත කාමර 652 හෝටල් ව්‍යාපෘතිය අංක 594, ගාලු පාර, කොළඹ 03	දම්රෝ ලෙෂර් (පුද්) සමාගම.	ප.බ.ඇ
2.	යෝජිත පුනරීන් සුළං බල ව්‍යාපෘතිය, අදියර I සහ II	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප.බ.ඇ
3.	කොළඹ වරාය සංවර්ධනය (නැගෙනහිර බහාලුම් පර්යන්තය සංවර්ධනය (අදියර 2)	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	ප.බ.ඇ
4.	යෝජිත කාමර 113 සහිත පාරිසරික සංචාරක නිකේතනය - එරුමුටිව් දූපත, කල්පිටිය	කන්සල්ටින් ඉන්ජිනියර්ස් ඇන්ඩ් ආකිටෙක්ට්ස් ඇසෝසියේටඩ් (පුද්) සමාගම.	ප.බ.ඇ
5.	යෝජිත මන්නාරමේ දැනට පවතින තම්බපවනි සුළං බල ව්‍යාපෘතියේ ධාරිතාව වැඩි දියුණු කිරීම (පළමු අදියර දිගුව)	ලංකා විදුලිබල මණ්ඩලය	ප.බ.ඇ
6.	ඔලුවිල් වරායේ යෝජිත එල් එන් ජී ගබඩා පහසුකම් ව්‍යාපෘතිය	සිලෝන් එල් එන් ජී ඉන්ටනැෂනල් (පුද්) සමාගම	ප.බ.ඇ
7.	යෝජිත මහල් 20කින් හා ඒකක 145 කින් යුත් නේවාසික මහල් නිවාස ව්‍යාපෘතිය, අංක 351, පෝරුතොට පාර, මීගමුව	ප්‍රයිම් රෙසිඩන්සිස් (පුද්) සමාගම අංක 75, ඩී.එස්. සේනානායක මාවත, බොරැල්ල, කොළඹ 8	මූ.පා.ප
8.	යෝජිත මහල් 13කින් යුත් නිවාස හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, පැරට් හන්දිය, වැල්ලබොඩ, මාදම්පේ, අම්බලන්ගොඩ	ග්ලෝබල් හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම නො. 75/A, ආර්නෝල්ඩ් රත්නායක මාවත, කොළඹ 10	මූ.පා.ප
9.	පුත්තලමේ යෝජිත මෙගාවොට් 10 සුළං බල ව්‍යාපෘතිය	වින්ඩ් ෆ්ලෝට් පුද්ගලික සමාගම	මූ.පා.ප
10.	නිලාවේලි වෙරළ තීරයේ සිට කෝකිලායි කලපුවේ දකුණු මායිම	ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්	මූ.පා.ප

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	ප.බ.ඇ/ මූ.පා.ප
	දක්වා බනිජ වැලි කැණීම සඳහා යෝජිත ව්‍යාපෘතිය		
11.	යෝජිත මධ්‍යම ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, පානදුර	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	මූ.පා.ප
12.	යෝජිත කාමර 35 යාල නිවාඩු නිකේතන ව්‍යාපෘතිය, පලටුපාන, යාල	යාල හොලිඩේ රිසෝට් (පුද්) සමාගම	මූ.පා.ප
13.	යෝජිත කාමර 63 සීක්‍රට් බීච් නිකේතන ව්‍යාපෘතිය පරගල්ලවත්ත, කෝපාරමුල්ල, මිරිස්ස	එම් එස් බී ආර් සංවර්ධන (පුද්) සමාගම	මූ.පා.ප
14.	යෝජිත නිවාස ඒකක 270කින් යුත් නේවාසික මහල් ව්‍යාපෘතිය කුඩාවස්කඩුව, කළුතර	හෝම් ලැන්ඩ්ස් ස්කයිලයින් (පුද්) සමාගම	මූ.පා.ප
15.	යෝජිත නාවික අධ්‍යයන මධ්‍යස්ථානය ඉදිකිරීම, ඉංජිනේරු පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය	ඉංජිනේරු පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, අංක 391/1, මාතර පාර, මාගාල්ල, ගාල්ල	මූ.පා.ප
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව -21			
1.	බයෝෆ්ලොක් දැඩි ඉස්සන් ගොවිපල, නගකෝවිල්, යාපනය	එස් කේ ගොවිපල සහ කෘෂිකර්ම(පුද්) සමාගම, අංක 14, 2 වන හරස් වීදිය, උදයනගර්, කිලිනොච්චිය	ප.බ.ඇ
2.	සන්රයිස් නිවාඩු නිකේතනය, උඩවලව	එච් ගුණවර්ධන මහතා	මූ.පා.ප
3.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, විල්පත්තු	පී එස් අබේවර්ධන මහතා	මූ.පා.ප
4.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, උස්සන්ගොඩ	ලහිරු දනිත දිසානායක මහතා	මූ.පා.ප
5.	යෝජිත බෝට්ටු නිෂ්පාදනය ව්‍යාපෘතිය, බලපිටිය	ධනුෂ මැරින් ලංකා එක්ස්පෝට් පුද්ගලික සමාගම	මූ.පා.ප
6.	මාදුව පාලම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය	මූ.පා.ප
7.	යෝජිත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය, සූරියආර, තණමල්විල	ජේ.පී සමින්ද මහතා, නො. 16 1/2, සූර්ය ආර, තණමලවිල	මූ.පා.ප
8.	යෝජිත කුඩාවිලව්විය ජලාශ ව්‍යාපෘතිය	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	මූ.පා.ප
9.	යෝජිත නිවාස ව්‍යාපෘතිය, ග්ලෙනෝර්වි වත්ත, අඹේවෙල	භූමි රියලිටි හෝල්ඩින් පුද්ගලික සමාගම	මූ.පා.ප
10.	යෝජිත නිවාස ඉදිකිරීම්, මින්නේරිය	ශ්‍රීයංගනී වැන්ඩකෝන් මහත්මිය	මූ.පා.ප
11.	වැලි කැණීමේ ව්‍යාපෘතිය, ලුණුගම්වෙහර- තාක්ෂණික ඇගයීම් කමිටුව	එස් පී අන්දරවීර මහතා	මූ.පා.ප
12.	පොලොන්නරුවේ යෝජිත මෙගාවොට් 10ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය	මහව සෝලා	මූ.පා.ප

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	ප.බ.ඇ/ මූ.පා.ප
13.	යෝජිත මෙගාවොට් 50ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, යාපනය	ලංකා විදුලි බල (පුද්) සමාගම	මූ.පා.ප
14.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය පොතාන, සීගිරිය	එච් පී ධර්මරත්න මහතා	මූ.පා.ප
15.	ගිරාදුරුකෝට්ටේ යෝජිත කැවෙන්ඩිෂ් කෙසෙල් වගා ව්‍යාපෘතිය	ඩෝල් ලංකා(පුද්) සමාගම	මූ.පා.ප
16.	කාබනික පොහොර නිෂ්පාදනය සහ අපනයන කෘෂිකාර්මික භෝග වගාව සඳහා යෝජිත ව්‍යාපෘතිය	නිරංජන් ජයවර්ධන මහතා, 837, ඌනගලවෙහෙර, පොළොන්නරුව	මූ.පා.ප
17.	යෝජිත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය	ඉන්දික උදේශ් රණසිංහ මහතා, 39, එදිරිවීර මාවත, දෙහිවල	මූ.පා.ප
18.	යෝජිත බුටික් විලා හෝටල් ව්‍යාපෘතිය, බලපිටිය	ආර් එස් ඒ කෝරලගේ මහතා	මූ.පා.ප
19.	කෘෂිකාර්මික ගබඩාව සහ කාබනික ගොවිතැන, කටුකැලියාව, මින්නේරිය	පී දිමුත් සංජීව මහතා, නො. 437, අත්තම් නිවාස පාර, හිඟුරක්ගොඩ	මූ.පා.ප
20.	යෝජිත ඉඩම් අක්කර 40ක් සහ වැව් පරිසර හිතකාමී සංවර්ධන ව්‍යාපෘතිය, මුරුංගෙයියායිකුලම්	බී එල් ටී එම් පීරිස් මහතා මඩු හන්දිය, මඩු	මූ.පා.ප
21.	යෝජිත කාමර 9 කින් යුත් චීන හට් විලේජ් සංචාරක නිකේතන ව්‍යාපෘතිය	ඩබ්ලිව් එම් එස් රණසිංහ මහතා, අංක 66, ගල්කන්ද පාර, අනිවත්ත	මූ.පා.ප
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව -04			
1.	මතුගම සිට අම්බලන්ගොඩ දක්වා33 kV සම්ප්‍රේෂණ මාර්ගය	ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප
2.	ක්වාර්ට්ස් කැණීමේ ව්‍යාපෘතිය කොටිකම්බොක්ක, වැල්ලවාය	ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම	මූ.පා.ප
3.	ඉහළ ඇලහැර ඇළ ව්‍යාපෘතිය- ICB-2A යටතේ තාවකාලික බැහැර කිරීමේ ස්ථානය	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප
4.	යෝජිත මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	අ.මූ.පා.ප
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය - නාගරික සංවර්ධන අධිකාරිය - 07			
1.	යෝජිත අපජල එකතු කිරීම, පිරිපහදු කිරීම සහ බැහැර කිරීමේ පද්ධතිය, හලාවත නගරය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ
2.	යෝජිත දීර්ඝ කිරීම - රත්මලාන - මොරටුව ප්‍රදේශයේ අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය අදියර 2- I කොටස	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ප.බ.ඇ
3.	නිවාස ඒකක 750ක් ඉදිකිරීම, ෆර්ගියුසන් පාර, කොළඹ 12	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	මූ.පා.ප
4.	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10	එල් කේ නන්දසේන මහතා, 19, ශ්‍රී සංඝරාජමාවත, කොළඹ 10	මූ.පා.ප
5.	යෝජිත අධිකරණ සංකීර්ණය ඉදිකිරීම කොළඹ 12	අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	මූ.පා.ප

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	ප.බ.ඇ/ මූ.පා.ප
6.	වන් ට්‍රාන්ස්වර්ක් ස්කවයා 114, නීති වීදිය, කොළඹ 01.	ක්‍රිෂ් ට්‍රාන්ස්වර්ක් (පුද්) සමාගම	මූ.පා.ප
7.	යෝජිත බහුවිධ ඒකාබද්ධ නිකේතන සංවර්ධන ව්‍යාපෘතිය අංක 100 සහ 100, ග්ලෙනි වීදිය සහ අංක 01, 03 සහ 05, ජස්ටිස් අක්බර් මාවත, කොළඹ 02	ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම	මූ.පා.ප
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය -01			
1.	යෝජිත කෘෂිකර්ම ව්‍යාපෘතිය වැලිකන්ද සිංහපුර	එම් ජී එස් ඉසෙඩ් රාජපක්ෂ මහතා, අංක 04, වෑකන්ද පාර, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ	මූ.පා.ප

තවද ප.බ.ඇ. ඒකකය මගින් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මගින් හසුරුවන ව්‍යාපෘති සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබා දීම සිදු කරයි (වගුව 6). ඒ අනුව ප.බ.ඇ. ඒකකය විසින් ව්‍යාපෘති 16ක් සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත තාක්ෂණික සහය/ මාර්ගෝපදේශ ලබා දෙන ලදී.

TABLE 14 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත තාක්ෂණික සහය/ මාර්ගෝපදේශ ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව

අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක	ප්‍රාදේශීය කාර්යාලය
1.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය අංක 49, ධර්මපාල පාර, කොළඹ 03	සීලෙක්ස් එන්කලයාර් (පුද්) සමාගම.	බස්නාහිර පළාත් කාර්යාලය
2.	බේස්ලයින් මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය - අදියර III (කිරුළපන හන්දියේ සිට බර්නාඩ් හන්දිය දක්වා)	මාර්ග සංවර්ධන අධිකාරිය	බස්නාහිර පළාත් කාර්යාලය
3.	යෝජිත කොළඹ කුරුළු උද්‍යාන ව්‍යාපෘතිය මාදිවෙල	කලම්බෝ බර්ඩ් පාර්ක් (පුද්) සමාගම	බස්නාහිර පළාත් කාර්යාලය
4.	කළු ගල් කැණීම, බුලනේකන්ද, කිතලවලාන, මීරිගම	ඔරුමික්ස් ඇස්පෝල්ට් (පුද්) සමාගම	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
5.	යෝජිත කළුගල් කැණීම් ව්‍යාපෘතිය, බෝතලේ, පහළගම, තිරුවානා ගොඩැල්ල ඉඩම, ගම්පහ	එම්.ආර්.අබේරත්න මහතා, අංක 46/1, දඹුගොල්ල, අඹේපුස්ස	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
6.	යෝජිත කළුගල් කැණීම් ව්‍යාපෘතිය දඹුවකන්ද, හගවත්ත, බදුරාගොඩ	එස්.ඒ.එල්. ගුණවර්ධන මහතා, ආර්. ගුණවර්ධන මහතා, බී.සී.වමින්ද මහතා, හගවත්ත, බදුරාගොඩ	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
7.	යෝජිත රාජ්‍ය කළුගල් කැණීමේ ව්‍යාපෘතිය දඹුවකන්ද	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
8.	යෝජිත කළුගල් කැණීමේ ව්‍යාපෘතිය පෙරිකොමරාසකුලම්, ආශිකුලම්, වව්නියාව	රංජනී සුමතිපාල මිය, මාමඩුව, වවුනියාව	උතුරු පළාත් කාර්යාලය

9.	යෝජිත කළුගල් කැණීම් ව්‍යාපෘතිය මරදම්දුව, වවුනියාව	වී වික්‍රමපාල මහතා, හෙඩුන්කුලම, මාමඩුවහර, වවුනියාව	උතුරු පළාත් කාර්යාලය
10.	යෝජිත බොරළු කැණීමේ ව්‍යාපෘතිය ආන්ඩියපුලියාකුලම්, වවුනියාව	බී.එම්. ෆයිස් මහතා, නො. 88B, මුස්ලිම් පල්ලිය පාර, පට්ටකාඩු, වවුනියාව	උතුරු පළාත් කාර්යාලය
11.	යෝජිත බොරළු කැණීමේ ව්‍යාපෘතිය ආන්ඩියපුලියාකුලම්, වවුනියාව	එම්.එම්. මන්සීර් මහතා, අංක 159, බසාර් වීදිය, වවුනියාව	උතුරු පළාත් කාර්යාලය
12.	වින්ඩ් ෂිල්ඩ් පාක් සංචාරක ව්‍යාපෘතිය	G.O.D.S. KOMOTEES ((පුද්) සමාගම	මධ්‍යම පළාත් කාර්යාලය
13.	යෝජිත ඩොලමයිට් කැණීමේ ව්‍යාපෘතිය 394, කළුගොඩ, ගොඩවෙල, කොළොන්න	හිරන්ත අබේදිවාකර මහතා,324/2, ගනේවත්ත කෝවිල පාර,	සබරගමුව පළාත් කාර්යාලය

C. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සහ ඒ හා සම්බන්ධ කරුණු/ ගැටලු විසඳීම සඳහා රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණය

I. නාගරික සංවර්ධන අධිකාරියේ පාරිසරික උපදේශන කමිටු සඳහා සහභාගීත්වය

පා.බ.ඇ. / මූ.පා.ප යටතේ "නියමිත ව්‍යාපෘති" ලෙස නොගැනෙන නිවාස සහ වාණිජ ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලබන කැබිනට් මණ්ඩල , අනුමැතියෙන් පත් වූ පාරිසරික උපදේශන කමිටු වෙත පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් තාක්ෂණික සහාය ලබා දෙන ලදි .ඒ අනුව ,2022 වසරේ දී නව අයදුම්පත් 07 ක් පාරිසරික උපදේශන කමිටුව වෙත යොමු කර ඇති අතර ඒවා 07 ආ වගුවේ දක්වා ඇත. පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් වගු අංක 07 ආ හි දක්වා ඇති ව්‍යාපෘතීන් සඳහා පාරිසරික උපදේශන කමිටු රැස්වීම් වාර 25 ක් සඳහා සහභාගී වී ඇත.

අනතුරුව අධ්‍යයන වාර්තා සමාලෝචනය කර මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් අනෙකුත් ඒකක (එනම් පරිසර දූෂණ පාලන ඒකකය සහ බස්නාහිර පළාත් කාර්යාලය) වෙතින් අදහස් සම්පාදනය කරමින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත යවා ඇත. 2022 වසරේ දී නව ව්‍යාපෘති 16 ක් සඳහා පාරිසරික අනුමැතිය ලබා දී ඇති අතර අනුමැතීන් 03 ක් අලුත් කර ඇත. ඒ පිළිබඳ විස්තර 7 ඇ වගුවේ දක්වා ඇත.

TABLE 15 : 2022 වසර තුළ දී පාරිසරික උපදේශන කමිටුව වෙත යොමු කර ඇති නව අයදුම්පත්

අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක
1.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 27, රෝහල් පාර, තලපත්පිටිය	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටිමයම් (පුද්) සමාගම.
2.	යෝජිත සැපයුම් පහසුකම් සහ ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය, ඒකල, ජා ඇල	ඇක්සස් ඉංජිනියරින් (පුද්) සමාගම.
3.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 49, ධර්මපාල මාවත, කොළඹ 03	එල් ටී එල් ඉඩම් සංවර්ධන (පුද්) සමාගම.
4.	අඩු ආදායම්ලාභී නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය සමරකෝන්වත්ත, මහරගම	නාගරික සංවර්ධන අධිකාරිය, නිවාස අංශය
5.	යෝජිත සුඛෝපභෝගී මහල් නිවාසය, දෙල්කඳ	Ocean View Development Company (පුද්) සමාගම

6.	අධිකරණ සංකීර්ණය ඉදිකිරීම, කොළඹ 12	අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

TABLE 16 : 2022 වසර තුල දී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ පාරිසරික උපදේශන කමිටු රැස්වීම් ලැයිස්තු

අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක
1.	පවුල් නැවත පදිංචි කිරීම සඳහා මාලපල්ලෙහි යෝජිත මහල් නිවාසය දුම්රිය කොරිඩෝව - KV මාර්ගය	මාගා ඉංජිනේරු (පුද්) සමාගම.
2.	දුම්රිය මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, මරදාන	මාගා ඉංජිනේරු (පුද්) සමාගම.
3.	යෝජිත මහල් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය, අංක 345, පන්නිපිටිය පාර, තලවතුගොඩ	ග්‍රෑන්ඩ් කැපිටල් රෙසිඩන්සීස් (පුද්) සමාගම.
4.	යෝජිත තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර සඳහා වන උසස් අධ්‍යාපන ආයතනය අංක 62, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 03	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
5.	යෝජිත නිවාස ව්‍යාපෘතිය - ස්ටේඩියම්ගම (නිවාස 210)	නාගරික සංවර්ධන අධිකාරිය
6.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 27, රෝහල් පාර, තලපත්පිටිය	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටිමයම් (පුද්) සමාගම.
7.	මැදි ආදායම් කාණ්ඩය සඳහා දැරිය හැකි මිලකට නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මූල්‍යකරණය, මාකුඹුර, කොට්ටාව	තුඩාවේ සහෝදරයෝ (පුද්) සමාගම
8.	යෝජිත නිවාස ඒකක 700ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, ඇපල්වත්ත, කොළඹ 10	සීමාසහිත චීන දුම්රිය සමූහ සමාගම- 25 වන කාර්යාංශය
9.	නිවාස ඒකක 700ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, මාදම්පිටිය, කොළඹ 14	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටිමයම් (පුද්) සමාගම.
10.	යෝජිත තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර සඳහා වන උසස් අධ්‍යාපන ආයතනය අංක 62, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 03	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
11.	සැලසුම්, ගොඩනැගීම, මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීම සහ හුවමාරු කිරීමේ පදනම මත යෝජිත බහු මහල් රථගාල යුනියන් පෙදෙස, කොළඹ 02	ඇක්සස් ඉන්ජිනියරින් (පුද්) සමාගම
12.	අනුරාධපුර දැරිය හැකි නිවාස ව්‍යාපෘතිය	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
13.	යෝජිත ඔඩෙල් සංවර්ධනය, අංක 10 සහ 15, කන්නන්ගර මාවත, කොළඹ 7	ඔඩෙල් පුද්) සමාගම
14.	යෝජිත අමතර කොටස් ගබඩා සංකීර්ණය අංක 651/10, 651/12, කේ. සිරිල් සී පෙරේරා මාවත, බිලූමෙන්ඩල්, කොළඹ15.	අනුර සමූහ ව්‍යාපාරය
15.	යෝජිත කාර්යාල ගොඩනැගිල්ල, අංක 29, බ්‍රිබaaක් වීදිය, කොළඹ 02	කැපිටල් ක්‍රෙසිඩාස් (පුද්) සමාගම

16.	යෝජිත නිවාස ඒකක ඉදිකිරීම, ෆර්ගියුසන් පාර, කොළඹ 12	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
17.	යෝජිත විවාහක සේවා පුද්ගලයන් සඳහා ඉදිකරන නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය, පොතුඅරාව පාර, කින්නදෙණිය, තලංගම උතුර, මාලඹේ	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් පුද්. සමාගම
18.	ෆ්ලෙමින්ටන් 360°, 26 C, සේනානායක මාවත, නාවල	අයිලිෂ් හයිරයිස් පුද්. සමාගම
19.	යෝජිත ගොඩනැගිල්ල, නාරාහේන්පිට හමුදා රෝහල	ශ්‍රී ලංකා යුද හමුදාව
20.	යෝජිත මහල් නිවාස සංවර්ධනය අංක 33 සහ 35, ලයනල් එදිරිසිංහ මාවත, සහ අංක 191/17, අවිසාවේල්ල පාර, කොළඹ 05	ට්‍රිලියම් ප්‍රොපටි මැනේජ්මන්ට් ඇන්ඩ් සර්විසස් ලිමිටඩ්
21.	සභාධිපත්‍ය නේවාසික මහල් නිවාසය, අංක 35, 37, අබ්දුල් ගෆූර් මාවත, කොළඹ 03	වන් ටූ වන් පුද්. සමාගම
22.	යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය, අංක 27, 27A, 27B, ගාලුමුවදොර, කොළඹ 03	සීමාසහිත ගෝල් ෆේස් ප්‍රොපටීස්
23.	යෝජිත මහල් නිවාස ව්‍යාපෘතිය අංක 294, 294/1, 294/2, 294/3, 294a, 294/3A, 294/6 සහ 294/5, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 7 සහ අංක 11 සහ 15, බ්‍රේබෘක් පෙදෙස, කොළඹ	බ්‍රේබෘක් රෙසිඩෙන්ෂල් ටවර්ස් (පුද්) සමාගම

TABLE 17 : 2022 වසර තුල දී පාරිසරික උපදේශන කමිටු මගින්නව නව පාරිසරික අනුමැතිය ලබා දී ඇති ව්‍යාපෘති

අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක
1.	දුම්රිය කොරිඩෝව - KV මාර්ගයෙහි පදිංචි පවුල්, නැවත පදිංචි කිරීම සඳහා මාලපල්ලෙහි යෝජිත මහල් නිවාස ව්‍යාපෘතිය	මාගා ඉංජිනේරු (පුද්) සමාගම
2.	නිවාස ඒකක 1000ක් සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ ව්‍යාපෘතිය ස්ටේඩියම්ගම	ඇක්සස් ඉංජිනියරින් (පුද්) සමාගම
3.	යෝජිත පැලියගොඩ (අදියර I) නිවාස ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය
4.	මැදි ආදායම් කාණ්ඩය සඳහා දැරිය හැකි මිලකට නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මූල්‍යකරණය, මාකුඹුර, කොට්ටාව	තුඩාවේ සහෝදරයෝ (පුද්) සමාගම
5.	යෝජිත නිවාස ඒකක 700ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම, ඇපල්වත්ත, කොළඹ 10	සීමාසහිත චීන දුම්රිය සමූහ සමාගම- 25 වන කාර්යාංශය
6.	මැදි ආදායම් කාණ්ඩය සඳහා දැරිය හැකි මිලකට නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මූල්‍යකරණය, අංක 49 C, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත	මාගා ඉංජිනේරු (පුද්) සමාගම
7.	මැදි ආදායම් කාණ්ඩය සඳහා දැරිය හැකි මිලකට නිවාස සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මූල්‍යකරණය, අංක 49 C, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත	ඇක්සස් ඉංජිනියරින් (පුද්) සමාගම
8.	දුම්රිය මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම, මරදාන	මාගා ඉංජිනේරු (පුද්) සමාගම
9.	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 27, රෝහල් පාර, තලපත්පිටිය	ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටිමයම් (පුද්) සමාගම.

අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක
10.	යෝජිත තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර සඳහා වන උසස් අධ්‍යාපන ආයතනය අංක 62, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
11.	මාගා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, අංක 200, නාවල පාර, නාරාහේන්පිට	මාගා ඉංජිනේරු (පුද්) සමාගම
12.	ෆ්ලෙමින්ටන් 360°, 26 C, සේනානායක මාවත, නාවල	අයිලිෂ් හයිරයිස් (පුද්) සමාගම
13.	අනුරාධපුරයේ යෝජිත නිවාස ව්‍යාපෘතිය	සතුට බිල්ඩර්ස් පුද්ගලික සමාගම
14.	කොළඹ නගරයේ යෝජිත නිවාස ව්‍යාපෘතිය, ස්ටේඩියම්ගම (නිවාස 210)	ජියෝ ඉකෝ පුද්ගලික සමාගම
15.	යෝජිත බහු මහල් රථගාල, යුනියන් පෙදෙස, කොළඹ 02	ඇක්සස් ඉංජිනියරින් (පුද්) සමාගම
16.	යෝජිත නිවාස ඒකක 450ක් සැලසුම් කිරීම, මූල්‍යකරණය සහ ඉදිකිරීම, 601 වත්ත, සිරිල් සී පෙරේරා මාවත, කොළඹ 14	ඇක්සස් ඉංජිනියරින් පුද්. සමාගම
පාරිසරික අනුමැතිය අලුත් කිරීම්		
1.	මහජන බැංකුව සඳහා යෝජිත කාර්යාල ගොඩනැගිල්ල, අංක 374, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02	ඩිසයින් ග්‍රැප් ෆයිව් (පුද්) සමාගම
2.	යෝජිත කාර්යාල ගොඩනැගිල්ල, අංක 29, බ්‍රේබෘක් වීදිය, කොළඹ 02	කැපිටල් ක්‍රෙසිඩාස් (පුද්) සමාගම
3.	යෝජිත මහල් නිවාස ව්‍යාපෘතිය අංක 294, 294/1, 294/2, 294/3, 294a, 294/3A, 294/6 සහ 294/5, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 7 සහ අංක 11 සහ 15, බ්‍රේබෘක් පෙදෙස, කොළඹ	බ්‍රේබෘක් රෙසිඩෙන්ෂල් ටවර්ස් (පුද්) සමාගම

II. ව්‍යාපෘති කමිටු, නියාමන කමිටු, ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු, කැබිනට් උප කමිටු, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම් සහ නීති උපදේශන සැසි සඳහා සහභාගී වීම.

වගුව 6 න් දක්වන ලද පාරිසරික උපදේශන කමිටුවලට අමතරව පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිළධාරීන් පහත වගු හි සඳහන් පරිදි පිළිවෙලින් ව්‍යාපෘති කමිටු, නියාමන කමිටු, කැබිනට් උප කමිටු, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම් සහ නීති උපදේශන සැසි සඳහා ද සහභාගීත්වය දක්වා ඇත.

TABLE 18 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ ව්‍යාපෘති කමිටු

අංකය	ව්‍යාපෘති කමිටුවේ නම
1.	ශ්‍රී ලංකාවේ ප්‍රවාහන යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන භූ දර්ශන ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම උපදේශන වැඩමුළුව
2.	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

TABLE 19 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නියාමන කමිටු

අංකය	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ නම
1.	ඛනිජ වැලි කැණීම් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය ව්‍යා.යෝ.- ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (රැස්වීම් 4ක්)
2.	කාර්මික කලාප පිළිබඳ කමිටු රැස්වීම

	ව්‍යා. යෝ.- අවුට්ඩෝ ඉංජිනේරු ලංකා (පුද්) සමාගම.

TABLE 20 : : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ අධීක්ෂණ කමිටු රැස්වීම්

අංකය	අධීක්ෂණ කමිටුවේ නම
1.	මෙට්‍රෝ කොලම්බෝ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
2.	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

TABLE 21 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ වෙනත් විවිධ රැස්වීම් ලැයිස්තුව

අංකය	රැස්වීම / අදාල ව්‍යාපෘතිය / අවස්ථාව
1.	මොරපිටිය කුඩා ජල විදුලි ව්‍යාපෘතිය
2.	පරිසර අමාත්‍යාංශයේ ලේකම් සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරියෙකු සමඟ විශේෂ හමුවක්
3.	යෝජිත මෙගාවොට් 100ක සුළං බල ව්‍යාපෘතිය, මන්නාරම
4.	අඩු හා මධ්‍ය පරිමාණ කාර්මික කලාප පිහිටුවීමට සහ නව ව්‍යවසායකයින් සඳහා ආයෝජන අවස්ථා ලබාදීමේ ජාතික ව්‍යාපෘතිය
5.	සංචාරක ආයෝජන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම සඳහා වූ අවබෝධතා ගිවිසුම (Memorandum of Understanding- MOU)
6.	2022 අයවැය යෝජනාව යටතේ යෝජිත කුලී රහිත නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
7.	බත්තරමුල්ලේ යෝජිත ෆ්‍රොලික් අයිලන්ඩ් ව්‍යාපෘතිය
8.	යෝජිත බන්ධනාගාර නැවත ස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය, මිල්ලෑව, හොරණ
9.	සියඹලාණ්ඩුව මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය
10.	උතුරු පළාතේ ආයෝජන අවස්ථා සඳහා වන පාර්ශවකරුවන්ගේ රැස්වීම
11.	යෝජිත කුරුළු උද්‍යාන ව්‍යාපෘතිය, මාදිවෙල
12.	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා මංතීරු හතරක අධිවේගී මාර්ගය සංවර්ධනය කිරීම
13.	නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටු රැස්වීම අංක -08/2022
14.	ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම
15.	පුනර්ජනනීය බලශක්ති අංශයේ ඉඩම් ගැටළු විසඳීමේ රැස්වීම
16.	සිමෙන්ති නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය ලෙස භාවිතා කිරීමට බනිජ කැණීම සම්බන්ධ ගැටළු
17.	මඩකලපුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් සහ එහි පාරිසරික හා සමාජීය බලපෑම් පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය
18.	අනු කමිටු රැස්වීම- යෝජිත රෙදිපිළි කලාපය, එරාවුර් මඩකලපුව (එරාවුර් රෙදිපිළි නිෂ්පාදන කලාපයේ ජල හා විදුලි පහසුකම් වඩාත් කාර්යක්ෂමව සැපයීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම)
19.	ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ සැලැස්ම සඳහා සැලසුම් සහ අධීක්ෂණ රැස්වීම/ වලංගු කිරීම: නාගරික සැලසුම් සහ මානව ජනාවාස අංශය ජාතික වශයෙන් තීරණය කරන ලද දායකයින්
20.	ඉලෙක්ට්‍රොනික බස් මගින්, මගීන් සඳහා ඉලෙක්ට්‍රොනික ප්‍රවාහනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳ පාර්ශවකරුවන්ගේ රැස්වීම
21.	සංචාරක අමාත්‍යාංශයේ රෙසිලියන්ස් වැඩසටහන පිළිබඳ හඳුන්වාදීමේ රැස්වීම
22.	රජයේ ඉඩම් බදු දීම සඳහා චක්‍රලේඛයක් සකස් කිරීමේ රැස්වීම
23.	වින්ෆීල්ඩ් පාර්ක් වැවිලි හා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපෘතිය

TABLE 22 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නීති උපදේශන සැසි

අංකය	ව්‍යාපෘතිය
1.	යෝජිත කුරුණෑගල හබරණ දුම්රිය දිගු ව්‍යාපෘතිය
2.	සිංහරාජ වනාන්තරය හරහා මාර්ගයක් ඉදිකිරීම
3.	රුවන්පුර අධිවේගී මාර්ගය
4.	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා මංතීරු හතරක උස් අධිවේගී මාර්ගය සංවර්ධනය කිරීම - II අදියර රාජගිරිය (කි.මී.6.9) සිට අතුරුගිරිය දක්වා (කි.මී.16.4)
5.	ද්‍රව සහ ඝණ අපද්‍රව්‍ය දහන යන්ත්‍රය (තාප ඔක්සිකාරක) ස්ථාපනය කිරීම ව්‍යා. යෝ.- ක්‍රිස්ටික් ලංකා පොලිමර්ස් (පුද්) සමාගම

D. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී හා පහසු ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට අදාළ ව ජාතික පාරිසරික පනතේ දැනට පවතින නීති රෙගුලාසි යාවත්කාලීන කිරීම.

වර්තමාන තත්ත්වයන් සහ ඉදිරි අවශ්‍යතාවයන් සළකා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය වඩාත් පහසු ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා නියමිත ව්‍යාපෘති ලැයිස්තුව, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන ලැයිස්තුව සහ ප.බ.ඇ. සම්බන්ධ රෙගුලාසි සමාලෝචනය කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. එසේම මේ සම්බන්ධව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

ඒ අනුව, ඉහත ලියකියවිලි අවසාන අදියරේ පවතින අතර ඒවා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

I. ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

දැනට පවතින ජාතික පාරිසරික පනතේ පවතින හඳුනා ගත් අඩුපාඩු මහඟරවා ගැනීම සඳහා අවශ්‍ය විධි විධාන සහිතව ජාතික පාරිසරික පනත සංශෝධනය කරමින් පවතී. ඒ අනුව, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය පහත සඳහන් කරුණු සම්බන්ධව ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමට අදාල ව කටයුතු ආරම්භ කර ඇත.

II. ජාතික පාරිසරික පනතේ IV ඇ උල්ලංඝනය කිරීම සඳහා දඩ මුදල් පැනවීම ජාතික පාරිසරික පනතේ iv ඇ උල්ලංඝනය කිරීමේ දී සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් වෙන වෙනම දඩුවම් පැනවීම සඳහා පවත්නා පනතෙහි විධිවිධාන අඩංගු නොවේ.

III. අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය

අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම පිළිබඳව පනතෙහි පැහැදිලිව සඳහන් කර නොමැත. එසේම පරිසර බලපෑම් අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ එම ක්‍රියාමාර්ග හරහා පරිසරික බලපෑම් අවම වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේද යන්න පිළිබඳ අනුකූලතා වාර්තා ව්‍යාපෘති යෝජක විසින් ඉදිරිපත් කිරීමට අදාල ප්‍රතිපාදන දැනට ජාතික පාරිසරික පනතේ අන්තර්ගත නොවේ. එබැවින් අනුමත කරන ලද ව්‍යාපෘති අධීක්ෂණය/ පසුවිපරම් කිරීම සඳහා පරිසර කළමනාකරණ සැළැස්මක් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජක වගවන ලෙසට ජාතික පාරිසරික පනතට ප්‍රතිපාදන ඇතුළත් කිරීමට යෝජනා වී ඇත.

D. අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම

ව්‍යාපෘති අනුමත කිරීමේ දී දෙනු ලබන කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘති නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේදැයි සහතික කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අනුමැතිය ලබා දුන් ව්‍යාපෘති පසු විපරම් කරනු ලබයි. ඒ අනුව රැස්වීම් හා ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් පහත සඳහන් ව්‍යාපෘති පසුවිපරම් කිරීම සිදු කර ඇත.

වගුව 13 : 2022 වසර තුළදී පසු විපරම් කරන ලද ව්‍යාපෘති

TABLE 23 : 2022 වර්ෂය තුළ අධීක්ෂණය කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව

අනු අංකය	ව්‍යාපෘතිය	ව්‍යාපෘති යෝජක
1.	මධ්‍යම අධිවේගී මාර්ගය- කඩවත සිට දඹුල්ල දක්වා	මාර්ග සංවර්ධන අධිකාරිය
2.	මධ්‍යම අධිවේගී මාර්ගය- පොතුහැර සිට ගලගෙදර දක්වා	මාර්ග සංවර්ධන අධිකාරිය
3.	කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීම	මාර්ග සංවර්ධන අධිකාරිය
4.	නාවල සහ අංගම්පිටිය යා කරමින් යෝජිත නව පාලම (ඇතුල්කෝට්ටේ)	මාර්ග සංවර්ධන අධිකාරිය
5.	රුවන්පුර අධිවේගී මාර්ගය_ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටස	මාර්ග සංවර්ධන අධිකාරිය

අනු අංකය	ව්‍යාපෘතිය	ව්‍යාපෘති යෝජක
6.	මොරපිටිය ජල විදුලි ව්‍යාපෘතිය	ලංකා විදුලිබල මණ්ඩලය
7.	කෙරවලපිටියේ යෝජිත මෙගාවොට් 350ක RLNG බල ව්‍යාපෘතිය	සෝභාදනවි ලිමිටඩ්
8.	කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය-2 (ECT-II) සහ බටහිර බහාලුම්, SLPA පර්යන්තය-1 (WCT-I) ගොඩකිරීම සඳහා කෙරවලපිටිය SLPA ප්‍රදේශයෙන් අක්වෙරළ වැලි ලබාගැනීමේ යෝජිත ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා වරාය අධිකාරිය
9.	හම්බන්තොට රැකව ප්‍රදේශයේ යෝජිත ඉස්සන් වගා ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
10.	වේයන්ගොඩ සිට පාදුක්ක දක්වා යෝජිත කිලෝ වොට් 220/400ක සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය	ලංකා විදුලිබල මණ්ඩලය
11.	යෝජිත වී ඔය කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	පවර් බේස් ටෙක්නොලජී පුද්ගලික සමාගම
12.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	වාරිමාර්ග අමාත්‍යාංශය
13.	මෙට්‍රෝ කොලොම්බෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අමාත්‍යාංශය
14.	ශ්‍රී ලංකාව තුළ ඝායනික අපද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර කිරීමේ සහ බැහැර කිරීමේ සේවා ස්ථාපිත කිරීම	සිසිලි හනාරෝ එන්කෙයාර් පුද්ගලික සමාගම
15.	යෝජිත ඝායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය කෙලියපුර, හම්බන්තොට	GFC අපද්‍රව්‍ය කළමනාකරණ පුද්ගලික සමාගම
16.	බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
17.	කුල්බෝන් කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	වැවිලි කළමනාකරණ සේවා (පුද්) සමාගම
18.	ඇතිමලේ සීනි ව්‍යාපෘතිය වත්තේගම සහ මාදුගම, සියඹලාන්ඩුව	ඇතිමලේ වැවිලි පුද්ගලික සමාගම ලිමිටඩ්.
19.	අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදන කලාපයක් පිහිටුවීම.	ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය
20.	බිබිල සීනි ව්‍යාපෘතිය, බිබල	බිබිල ෂුගර් ඉන්ඩ්‍රස්ට්‍රීස් ලිමිටඩ්
21.	කඩවල I මෙගාවොට් 5.0 කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	යුනිට් එනර්ජී ලංකා (පුද්) සමාගම
22.	කඩවල II මෙගාවොට් 2.2 කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	සමන්ජල විදුලි (පුද්) සමාගම
23.	පහළ නෙළුව කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	නෙළුව Cascade (පුද්) සමාගම
24.	මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය- අදියර IV	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

E. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන්

I. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළු

ප.බ.ඇ. / මූ.පා.ප. අධ්‍යයන ක්‍රියාවලිය ආශ්‍රිතව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් ගේ ගැටලු විසඳීම හා දැනුම වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ වගකීම වේ. ඒ අනුව, මෙම පුහුණු වැඩසටහන ඔස්සේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය නියමාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ හා උපදෙස් පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් හට ලබා දී ඇත.

ඒ යටතේ, පහත සඳහන් වැඩමුළු පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් සිදු කර ඇත.

TABLE 24 : 2022 වසර තුළදී පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන්

අනු අංකය	පුහුණුව / වැඩමුළුව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	පැවැත්වූ දින ගණන
1.	කර්මාන්ත හරිතකරණය තුළින් ආයතනික පාරිසරික තිරසාරභාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	04	10
2.	ලෝක බැංකුව විසින් පවත්වනු ලබන භූ සක්‍රීයතා අධීක්ෂණ පද්ධතිය (Geo Enable Monitoring System) (GEMS) පිළිබඳ පුහුණු වැඩසටහන	01	03
3.	හරිත හා ඔරොත්තු දෙන මාර්ග යටිතල පහසුකම් ගොඩනැගීමේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන	02	05
4.	සංවර්ධන නිලධාරීන් සඳහා පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	03	10
5.	ශ්‍රී ලංකාවේ ප.බ.ඇ. ක්‍රියාවලිය පිළිබඳ තෙදින නේවාසික පුහුණුව	01	03

II. වෙනත් ආයතන මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්තවය ලබා දීම.

වෙනත් ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් අනුව, පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් පහත සඳහන් වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගී වී ඇත.

TABLE 25 : 2022 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ වැඩසටහන්

අංක	වැඩසටහන
බාහිර වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය – 05	
1.	ශ්‍රී ලංකා පරිසර ව්‍යෘතීයවේදීන් ගේ ආයතනය විසින් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව
2.	පාරිසරික සංරක්ෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ නියාමන (ප.බ.ඇ, ස්.ස.ක)
3.	ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ (NIBM) උපාධි අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකාවේ ප.බ.ඇ. සම්බන්ධ පුහුණු වැඩසටහන
4.	ශ්‍රී ලංකාවේ ප.බ.ඇ. ක්‍රියාවලිය පිළිබඳ තෙදින නේවාසික පුහුණුව
5.	සංවර්ධන නිලධාරීන් සඳහා පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

E. පා.බ.ඇ/ මූ.පා.ප ක්‍රියාවලියට අදාළව පැන නගින ගැටුම් නිරාකරණයට සහභාගී වීම

I. ව්‍යාපෘති පිළිබඳව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම

පා.බ.ඇ /මූ.පා.ප ක්‍රියාවලියට භාජනය වූ ව්‍යාපෘති සහ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පැන නගින ගැටුම් නිරාකරණය කිරීමට පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මැදිහත් වී ඇත. ඒ අනුව, වගු අංක 16 හි සඳහන් වන ව්‍යාපෘති සම්බන්ධයෙන් මතු වූ පැමිණිලි 13 ක් සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ඒකකය මැදිහත් වී ඇත.

TABLE 26 : 2022 වර්ෂය තුළ පාරිසරික බලපෑම් ඇගයීම් ඒකකය පැමිණිලි සඳහා මැදිහත් වූ ව්‍යාපෘති

අංක	ව්‍යාපෘතියේ නම	**ව්‍යාපෘති යෝජක**	**ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය**	**ප.බ.ඇ/ මූ.පා.ප**
1.	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස (3 කොටස)	මාර්ග සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ

2.	මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත සිට දඹුල්ල දක්වා කොටස (1,2 සහ 4 කොටස්)	මාර්ග සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ
3.	නව කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා වන බෛස්ලයින් මාර්ගයට සම්බන්ධ අධිවේගී මාර්ගය	මාර්ග සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ
4.	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 1 (කහතුඩුව සිට ඉංගිරිය දක්වා)	මාර්ග සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ
5.	වරකාපොල පාර අතුරු මාර්ගය	මාර්ග සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය සබරගමුව පළාත් කාර්යාලය	මූ.පා.ප
6.	සියඹලාණ්ඩුව වත්තේගම සහ මඩුගම ඒකාබද්ධ සීනි කර්මාන්ත ව්‍යාපෘතියක් පිහිටුවීම	ඇතිමලේ වැවිලි (පුද්ගලික) සමාගම	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ
7.	පහළ නෙළුව කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	නෙළුව කැස්කේඩ් (පුද්) සමාගම	මධ්‍යම පරිසර අධිකාරිය	මූ.පා.ප
8.	මොරපිටිය කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	සකුරා එනර්ජි (පුද්) සමාගම	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	මූ.පා.ප
9.	කොළඹ නගරාශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය.	නාගරික සංවර්ධන, අපද්‍රවය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ
10.	යෝජිත කාමර 48 කින් යුත් බුටික් හෝටලය, වෝටර්ස් එජ් බත්තරමුල්ල	වෝටර්ස් එජ් ලිමිටඩ්	මධ්‍යම පරිසර අධිකාරිය	මූ.පා.ප
11.	රොන්මඩ සහ වැලි නිස්සාරණ ව්‍යාපෘති- වෙල්ලනාවල් රජයේ ඉඩම, සාෆිනගර් ග්‍රාම නිලධාරී වසම, මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ත්‍රිකුණාමලය	නිසල්මා ඉදිකිරීම් (පුද්) සමාගම	තීරණය කර නැත	
12.	වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය	මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	ප.බ.ඇ
13.	මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර IV	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	මධ්‍යම පරිසර අධිකාරිය	ප.බ.ඇ

II. තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලා සිටින තොරතුරු වලට ප්‍රතිචාර දැක්වීම

තොරතුරු දැනගැනීමේ පනතේ හි විධිවිධාන පරිදි පාරිසරික බලපෑම් ඇගයීම් අංශය වෙතින් මහජනතාව ඉල්ලා සිටින තොරතුරු සඳහා ද අවස්ථා 08 ක දී පිළිතුරු ලබා දී ඇත.

TABLE 27 : තොරතුරු දැනගැනීමේ පනතේ හි විධිවිධාන පරිදි මහජනතාව ඉල්ලා සිටින තොරතුරු සඳහා ද අවස්ථා **08** ක දී පිළිතුරු ලබා දීම.


අංක	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති යෝජක
1.	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ පිහිටි සිමෙන්ති කර්මාන්තය සඳහා හම්බන්තොට වරාය හරහා ගල් අඟුරු ආනයනය කිරීම	ආයෝජන මණ්ඩලය
2.	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල එකතු කිරීමේ සහ බැහැර කිරීමේ ව්‍යාපෘතිය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
3.	මරගල කන්ද හරහා යෝජිත මාර්ගය	මාර්ග සංවර්ධන අධිකාරිය
4.	යෝජිත ගොල්ෆ් පිටිය සහ මැල්වත්ත සංවර්ධන ව්‍යාපෘතිය	මෙල්වා ප්‍රොපර්ටීස් (පුද්) සමාගම
5.	කෙහෙල්ගමුව ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, කෙහෙල්ගමුව	පාම්ස් පවර් (පුද්) සමාගම.
6.	යෝජිත, ඉදිකිරීම-අයිතිය-ක්‍රියාත්මක කිරීම සහ පැවරීමේ (BOOT) පදනම මත කෙරවලපිටිය ප්‍රදේශයේ මෙගාවොට් 350 ක සංයුක්ත චක්‍ර RLNG විදුලි බලාගාරයක් ඉදිකිරීම	සොබාදනවි (පුද්) සමාගම
7.	යෝජිත පොල්පිටිය සිට පන්නිපිටිය දක්වා කිලොවොට් 220ක සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
8.	යෝජිත කාමර 652 හෝටල් ව්‍යාපෘතිය අංක 594, ගාලු පාර, කොළඹ 03	දම්රෝ ලෙෂර් (පුද්) සමාගම.

4.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය.

පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, ප්‍රකාශිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල අන්තර් ආයතන සම්බන්ධීකරණය සහ අදාළ ප්‍රතිපත්ති, රෙගුලාසි මාර්ගෝපදේශ සකස් කිරීම සහ ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇති උපායමාර්ග හා නිර්දේශ ක්‍රියාවට නැංවීම ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබයි.

A. **දැනුවත් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම:**

I. පාරිසරික බලපෑම් ඇගයීම් සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය යටතේ නොවන ක්‍රියාකාරකම් / ව්‍යාපෘතීන් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම සලකා බැලීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමේදී අනුගමනය කලයුතු මාර්ගෝපදේශ මාලාවක් සකස් කර සියලුම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත ඒ අනුව කටයුතු කිරීම සඳහා ලබා දෙන ලදී.




II. **තෙත්බිම් අසිරිය ග්‍රන්ථය**

පාසල් ළමුන්ට පරිශීලනය සඳහා යෝග්‍ය අතිරේක කියවීම් පොතක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති තෙත්බිම් අසිරිය ග්‍රන්ථයේ දැනට පවතින තොරතුරු ඇතුළත්ව සකස් කරන ලද සිවිවන සංස්කරණය මුද්‍රණය කරන ලදි.

B. ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික සම්පත් සඳහා කේන්ද්‍රීය දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යාම.

ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික සම්පත් දීර්ඝ කාලීනව ඥනාන්විතව භාවිතය, අධීක්ෂණය උදෙසා හා රටේ ස්වභාවික සම්පත් වල තිරසර කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ තීරණ ගැනීමේදී උපයෝගී කර ගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ සහයෝගය සහිතව කේන්ද්‍රීය දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

ඒ අනුව ඉඩම් සම්පත, වන සම්පත සහ වන සත්ත්ව සම්පත සම්බන්ධව දත්ත 2022 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන ආයතන සමඟ රැස්වීම් ගණනාවක් පවත්වා ලබා ගන්නා ලදි. එම දත්ත, පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් මධ්‍යම දත්ත පද්ධතිය වෙත පෝෂණය කරන ලදි.



C. වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පාරිසරික කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ලබාදීම

ස්වභාවික සම්පත් කළමනාකරණය බහු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව ක්‍රියාවලියක් වන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය මගින් ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළව ක්‍රියාකාරකම් සම්බන්ධව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පාර්ශවකාර ආයතන විසින් පවත්වනු ලබන විවිධ කමිටු රැස්වීම්වලදී තාක්ෂණික මාර්ගෝපදේශ, විශේෂඥ දැනුම සහ අදහස් සැපයීම සිදු කරනු ලැබේ. 2022 වර්ෂයතුල ස්වභාවික සම්පත් කළමනාකරණය හා අදාල පාර්ශවකාර ආයතනවල පවත්වන ලද කමිටු රැස්වීම්, වෙනත් රැස්වීම්, වැඩමුළු හා මධ්‍යම පරිසර අධිකාරියේ වෙනත් අංශ මඟින් පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් ඇතුළුව රැස්වීම් 92 ට කැඳවීම් අනුව සහභාගී වී අවශ්‍ය අදහස් සහ උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත.

TABLE 28 : සහභාගී වූ වැඩමුළු/ රැස්වීම් ගණන

ක්‍රියාකාරකම්	සහභාගී වූ වාර ගණන/ වැඩමුළු ගණන
1. පෙව ආරක්ෂාව/ තත්ව කළමනාකරණ පද්ධතිය /වෙනත් පිළිබඳ වැඩමුළු සහ පුහුණු සැසි	07
2. ශ්‍රී ලංකා ජලජීවී සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීම්	04

3. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති කමිටු රැස්වීම්	03
4. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පැවැත්වෙන සැලසුම් කමිටු රැස්වීම්	24
5. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදේශණ කාරක සභා රැස්වීම්	07
6. පාරිසරික බලපෑම් හඳුනාගැනීම්/ පාරිසරික බලපෑම් ඇගයීමට අදාළ විෂය පථය නිර්ණය / තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්	12
7. පරිසර අමාත්‍යාංශයේ පවත්වන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම් (එක් එක් ක්ෂේත්‍රයට අදාළව) සකස් කිරීමේ රැස්වීම්, ඇතුළුව පවත්වන ලද වෙනත් රැස්වීම් / ජනාධිපති කාර්ය සාධක බලකාය කැණීම් ක්ෂේත්‍රයට අදාළව පවත්වන ලද රැස්වීම් / වෙනත් රැස්වීම්	35
එකතුව	**92**

D. පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

I. වර්ණගල වත්ත ප්‍රදේශය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සලකා බැලීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන තෙක් සමනල ස්වභාව රක්ෂිතයට යාබදව පවතින

E. හාලි ඇළ ජල මූලාශ්‍ර රක්ෂිත සංරක්ෂණය සඳහා සලකා බැලීම

හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තේ වතු තුළ පිහිටි ජල මූලාශ්‍ර රක්ෂිත ඉඩම් වල වර්තමාන ඉඩම් පරිහරණය හඳුනාගැනීම සඳහා අදාළ පාර්ශවකාර ආයතන සමඟ ක්ෂේත්‍ර පරීක්ෂණ 5 ක් සිදු කරන ලද අතර ක්ෂේත්‍ර අධ්‍යයනයේදී ලබාගත් නිරීක්ෂණ හා තොරතුරු භාවිතකර අධ්‍යයන වාර්තාව සකස් කරන ලදි.

II. පරිසර අමාත්‍යාංශයේදී පරිසර අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාල පාර්ශවකාර ආයතන සමග පවත්වන ලද රැස්වීමේදී ඉඩම් පරිහරණය හා අදාල අධ්‍යනයේදී සංරක්ෂණය කිරීම සඳහා සුදුසු ලෙස හඳුනා ගන්නා ලද ඉඩම් කැබලි 362 ක් ඇතුලත්ව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා වර්ණගල වත්ත ප්‍රදේශය ජාතික පාරිසරික පනත මඟින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව අදාල පාර්ශවකාර ආයතන සහභාගිත්වයෙන් රැස්වීම් වාර කිහිපයක් (4ක්) හා අදාල ප්‍රදේශයේ ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදුකරන ලද අතර සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව සකස් කර ඇත.

තීරණය විය. ඒ අනුව සකස් කරන ලද ගැසට් නිවේදන කෙටුම්පත සම්බන්ධව පාර්ශවකාර ආයතන සමඟ සාකච්ඡා කරන ලදුව අනුමැතිය පිණිස නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.

F. පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය කිරීම

I. පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු රැස්වීම්

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම අදාළ පළාත් / දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය කර පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන ලද අතර අවශ්‍ය අවස්ථාවන් වලදී තාක්ෂණික උපදෙස් ලබා දීම සිදුකරන ලදී.

TABLE 29 : කළමනාකරණ කමිටු රැස්වීම්

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ	පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීම් ගණන
හන්තාන පරිසර ආරක්ෂක ප්‍රදේශය	05
වරාතැන්න හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	03
මරගල කඳුවැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	02

II. පාරිසරික ආරක්ෂණ ප්‍රදේශවල කළමනාකරණ කටයුතු

a. බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සඳහා කළමනාකරණ කමිටුවක් පිහිටුවීම සඳහා පාර්ශවකාර ආයතන සමඟ රැස්වීමක් පවත්වා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

b. මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තිරසරව පවත්වා ගැනීම පිළිබඳව පැන නැගී ඇති ගැටළු සම්බන්ධව ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී එළඹී තීරණයකට අනුව මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තිරසරව පවත්වා ගැනීම උදෙසා එම ප්‍රදේශය සඳහා වන අනුමත භාවිතයන් හැර වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවලට ඉඩම් නිදහස් නොකරන ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත දැනුම්දීමට කටයුතු කරන ලදි. මුතුරාජවෙල තෙත්බිම සම්බන්ධයෙන් පැවැති නඩු කටයුතු වලදී අධිකරණයේ නියෝග මත මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තුල දැනුවත් කිරීමේ නාම පුවරු දෙකක් සකස්කර සවි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා යොමු කරන ලදි.

c. වරාතැන්න -හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

වරාතැන්න -හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සඳහා වන අංක 2024/6 දරණ 2017.06.19 දිනැති ගැසට් නිවේදනයේ අවසරලත් භාවිතයන්




FIGURE 17 : ඉඩම් පරිහරණ තොරතුරු වාර්තාව

ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කලයුතු කොන්දේසි වලට වැඩිමනත් වශයෙන් භාවිත කල හැකි උපමාන හා නිර්ණායක ඇතුළත් මාර්ගොපදේශ මාලාවක් සකස් කර මධ්‍යම පළාත් කාර්යාලය වෙත ලබා දෙන ලදි.

d. හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය විහිදී ඇති ග්‍රාම නිලධාරී වසම් වල ග්‍රාම නිලධාරීන් සහ හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා එම ප්‍රදේශය පසු විපරම් කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. පසු විපරම් කටයුතු කිරීමේදී භාවිත කිරීම සඳහා එක් එක් ග්‍රාම නිලධාරී වසම් වලට අදාලව සිතියම් 21 ක් අදාල ග්‍රාම නිලධාරීන් වෙත ලබා දෙන ලදි.

G. පාරිසරික ආරක්ෂක ප්‍රදේශ පසුවිපරම් කිරීම

I. **ප්‍රකාශයට පත්කර ඇති පහත වගුවේ පරිදි පාරිසරික ආරක්ෂක ප්‍රදේශ තුළ අවශ්‍ය පරිදි පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 38ක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.**

TABLE 30 : සිදු කරන ලද පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන

	පාරිසරික ආරක්ෂක ප්‍රදේශ	**පවත්වන ලද පසුවිරපම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන**
1	බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	28
2	තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	05
3	ග්‍රෙගරි වැව පරිසර ආරක්ෂණ ප්‍රදේශය	02
4	මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	02
5	නකල්ස් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	01
6	වලව්වේවත්ත වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	01

II. විශේෂ පසුවිපරම් වැඩසටහන්

a. කළුතර දිස්ත්‍රික්කයේ බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ බණ්ඩාරගම සහ පානදුර ප්‍රාදේශීය පසු විපරම් කමිටු වල අදාල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදි.





b. බොල්ගොඩ පාර්සරික ආරක්ෂක ප්‍රදේශයේ බෝට්ටු භාවිතයෙන් විශේෂ පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ දෙකක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

FIGURE 18 : දැනුවත් කිරීමේ වැඩසටහන්



FIGURE 19 : විශේෂ පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ

H. ප්‍රකාශිත පාරිසරික ආරක්ෂණ ප්‍රදේශවල පවතින ගැසට් නිවේදන කාලානුරූපීව සංශෝධනය කිරීම

a. මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය

පවතින ගැසට් නිවේදනය සංශෝධනය කිරීම සඳහාත් සංරක්ෂණය හා කළමනාකරණ උපාය මාර්ග හඳුනා ගැනීම උදෙසාත් පාර්ශවකාර ආයතන සමඟ සිදු කරන ලද අධ්‍යයනයේ නිර්දේශ හා මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා සකස් කර ඇති කළමනාකරණ සැලැස්මේ නිර්දේශ ද අනුව මරගල කඳුවැටියේ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ උපලේඛන I, II හා III සංශෝධනය කර, පාර්ශවකාර ආයතන වෙත යොමුකර අදහස් හා යෝජනා ලබාගැනීමෙන් අනතුරුව සංශෝධනය ඇතුලත් ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම. එම කෙටුම්පත් කරන ලද සංශෝධිත ගැසට් නිවේදනය මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටුව සමඟ සාකච්ඡා කර ඉදිරිපත් වූ යෝජනා හා සංශෝධන ද ඇතුළත්ව සකස් කරන ලද ගැසට් නිවේදනය එහි සිංහල, දමිළ හා ඉංග්‍රීසි පිටපත් සහිතව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කරන ලදී

I. ලෝක තෙත්බිම් දින සැමරුම් -පෙබරවාරි 02

a. ජාතික වැඩසටහන

2022 වසරේ ලෝක තෙත්බිම් දින සැමරීමේ ජාතික වැඩසටහන මධ්‍යම පරිසර අධිකාරිය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව "මිනිසා සහ සොබාදහම උදෙසා තෙත් බිම් ක්‍රියාකාරකම්" යන තේමාව යටතේ සංවිධානය කරන ලදී. ප්‍රධාන උත්සවය සඳහා අදාල විෂය භාර මැති ඇමතිවරුන්, අදාල රාජ්‍ය ආයතන ප්‍රධානීන් හා නිලධාරීන්, විද්වතුන්, පරිසර නියමුවන්, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, දෙමාපියන්, රාජ්‍ය නොවන පාරිසරික සංවිධාන නියෝජිතයින් හා මාධ්‍ය නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් බත්තරමුල්ල අජේගම පරිශ්‍රයේදී පවත්වන ලදී. 2022 වසරේ ලෝක තෙත්බිම් දින



FIGURE 20 : ලෝක තෙත්බිම් දින සැමරුම

සැමරීමේ ජාතික වැඩසටහනට සමගාමීව තෙත්බිම් පිළිබඳ කෙටිකතා සහ කවි තරඟයක් පාසල්, විශ්වවිද්‍යාල සහ විවෘත යන අංශ යටතේ පවත්වන ලද අතර එම තරඟයේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය අපේ ගම පරිශ්‍රයේදී පැවති ජාතික වැඩසටහනේදී සිදු කරන ලදි. ජාතික

b. පළාත් සහ දිස්ත්‍රික් වැඩසටහන්

ලෝක තෙත්බිම් දිනය සැමරීමේ පළාත් සහ දිස්ත්‍රික් වැඩසටහන් 24 ක් තෙත්බිම් ආශ්‍රිතව පවත්වන ලදි. එම වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පාරිසරික පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති තෙත්බිම් සහ රැම්සා තෙත්බිම් පිළිබඳ වාර්තාමය වීඩියෝපටයක් ද විකාශය කරන ලද අතර IWMI ආයතනයෙහි උපදේශක ආචාර්ය ප්‍රියානි අමරසිංහ මහත්මිය විසින් ආරාධිත දේශනය සිදු කරන ලදී.

නිරීක්ෂණ චාරිකා, ශ්‍රමදාන වැඩසටහන් සහ රුක් රෝපණ වැඩසටහන් ඇතුළු වැඩසටහන්වලින් සමන්විත වූ අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, රාජ්‍ය නිළධාරීන් හා ප්‍රජා සහභාගීත්වයෙන් සිදු කරන ලදි.



FIGURE 21 : ලෝක තෙත්බිම් දිනය සැමරුම් වැඩසටහන්

J. ස්වභාවික සම්පත් කළමනාකරණය සහ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වලට අදාල පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියමාර්ග ගැනීම

TABLE 31 : ස්වභාවික සම්පත් කළමනාකරණය හා අදාලව පැමිණිලි

පැමිණිලි වර්ගය	පැමිණිලි ප්‍රමාණය	විසඳන ලද පැමිණිලි ප්‍රමාණය
'අ' කාණ්ඩය	16	16
'ආ' කාණ්ඩය	01	01
මුළු ප්‍රමාණය	17	17

පැමිණිලි 17ක් ලැබෙන ලදී. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

K. විශේෂ වැඩසටහන්

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද (තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන සහ ජෙව සුරක්ෂිතතා පනත) විශේෂ වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදි.

4.3 උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය

A. හැඳින්වීම

උපාය මාර්ගික පාරිසරික ඇගයීම් යනු යෝජිත ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි පාරිසරික බලපෑම් ඇගයීමකට ලක් කිරීමේ ක්‍රමානුකූල ක්‍රියාවලියක් වේ. එමඟින් ඇති විය හැකි පාරිසරික බලපෑම් පිළිබඳ පුරෝකථනය කරන ලද තොරතුරු අනුව අදාළ ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන වෙනස් කිරීම තුළින් තීරණ ගැනීමක් සිදු කරයි. මෙහිදී ඍණාත්මක බලපෑම් අවම කර ගැනීම හෝ ඉවත් කර ගැනීමක් සහ ධනාත්මක බලපෑම් ප්‍රශස්ත කිරීමක් සිදු කළ හැක. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය 2022 වසර තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

B. ශ්‍රී ලංකාව තුළ උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරී .

1. ජාතික පාරිසරික පනත සංශෝධය සහ උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාත්ම කිරීම සඳහා අවශ්‍ය නෛතික බලතල (රෙගුලාසි සහ මාර්ගෝපදේශ) සකස් කිරීම.

2. ශ්‍රී ලංකාව තුළ යෝජිත ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් සඳහා උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධි විධාන අතුළත් කිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය සිදු කෙරමින් පවතී.

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ජාතික පාරිසරික පනත සශෝධන කෙටු ම්පතේ අඩංගු උපායමාර්ගික පාරිසරික ඇගයීම් සහ ස්වභාවික සම්පත් හානි තක්සේරුව පිළිබඳව විධි විධාන වෙත අදහස් සහ යෝජනා මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකය වෙත ලබා දී ඇත. ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සඳහා රැස්වීමක් 2022.11.09 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේදී පැවැත් වූ අතර ඒ සඳහා උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය සහභාගී විය.

II. පාර්ශවකාර රැස්වීම්

උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය මේ වන විට යෝජිත උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය සකස් කිරීමේ හා රෙගුලාසි කෙටුම්පත් කිරීමේ නිරතව වී සිටියි. එබැවින්, එම කෙටුම්පත සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ඉහළ කළමනාරීත්වයේ අදහස් සහ යෝජනා ලබා ගැනීම සඳහා රැස්වීමක් මධ්‍යම පරිසර අධිකාරියේ දී 2022.08.10 දින පවත්වන ලදී.

C. උපායමාර්ගික පාරිසරික ඇගයීම් පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

I. මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ / ධාරිතා ගොඩ නැඟීමේ වැඩමුළුව

උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් උපායමාර්ගික පාරිසරික ඇගයීම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් අධිකාරියේ නිළධාරීන් 116 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී 2022.11.25 දින සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලය සහ සියලුම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල නියෝජනය කරමින් නිළධාරීහු සහභාගී වූහ.

උපායමාර්ගික පාරිසරික ඇගයීම් පිළිබඳව හැඳින්වීම්, යෝජිත නීති සම්පාදනය, සම්බන්ධයෙන් දේශන 02ක් උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකයේ අධ්‍යක්ෂිකා සහ සහකාර අධ්‍යක්ෂිකා විසින් සිදු කරන ලදී. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල මේ සම්බන්ධයෙන් පවතින නීති සහ සිද්ධි අධ්‍යයනයන් පිළිබඳ දේශන ආරාධිත සම්පත් දායකයන් දෙදෙනෙකු විසින් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් අත්දැකීමක් ලෙස කොළඹ නාගරික ප්‍රදේශයේ තෝරා ගත් ප්‍රදේශ සඳහා වන වැසි ජලාපවාහන සැලැස්මේ උපාය මාර්ගික පාරිසරික තක්සේරුව පිළිබඳව සිද්ධි අධ්‍යයනය ඉදිරිපත් කරන ලදී.



FIGURE 23 : උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් දේශනයක් පැවැත්වීම.



FIGURE 22 : දේවක වීරකොන් මහතා විසින් දේශනයක් පැවැත්වීම.

D. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාත්මක කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ස්වේච්ඡා පදනම යටතේ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් සිදු කිරීම සඳහා අදාළ පාර්ශවකාර ආයතන සමඟ කටයුතු කිරීම සිදු කරනු ලැබේ.

I. කොළඹ නාගරික ප්‍රදේශයේ තෝරා ගත් ප්‍රදේශ සඳහා වන වැසි ජලාපවාහන සැලැස්මේ උපාය මාර්ගික පාරිසරික තක්සේරුව

බොල්ගොඩ, කළු ඔය සහ මුදුන් ඇළ ජල ද්‍රෝණි ප්‍රදේශවල දීර්ඝ කාලයක සිට පවතින ගං වතුර පාලනය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) එක්ව සිදු කරන ලද විශේෂ අධ්‍යයනයකින් පසුව උක්ත සඳහන් ගං වතුර පාලන සැලැස්ම ඉදිරිපත් කර ඇත. මෙම සැලැස්මට අදාළ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාව ඉදිරිපත් කර ඇත්තේ කොළඹ විශ්ව විද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමක් විසිනි.

මෙම කෙටුම්පත් කරන ලද උපාය මාර්ගික පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් අදහස් සහ යෝජනා ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කරන ලද අතර එම අදහස් සහ යෝජනා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පිටපතක් සහිතව ඉදිරිපත් කරන ලදී.

උපාය මාර්ගික පාරිසරික ඇගයීම් අවසන් වාර්තාව සම්බන්ධයෙන් මෙම අධිකාරිය විසින් අදාළ පාර්ශවකාර රාජ්‍ය ආයතනවල අදහස් සහ යෝජනා ලබා ගෙන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කරන ලදී.

මෙම උපාය මාර්ගික පාරිසරික ඇගයීම් තුළින් වාර්තාවූ පාරිසරික ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශ සහ ඒකක වෙත ඒ පිළිබඳව දැනුම් දෙන ලදී.

II. බස්නාහිර පලාත් සන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගයීම්

ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය, බස්නාහිර පළාත සඳහා සන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්මක් සැකසීමට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) සමඟ එක්ව කටයුතු ආරම්භ කර ඇත. එම සැලසුම් සඳහා උපාය මාර්ගික පාරිසරික තක්සේරුවක් කිරීමට විෂයය නිර්ණය පටිපාටිය මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇත.

මේ සම්බන්ධයෙන් රැස්වීම් 2ක් පරිසර කළමනාකරණ ඇගයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ගේ ප්‍රධානත්වයෙන් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පදනමේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ (බස්නාහිර පළාත) සහ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022 වර්ෂයේදී පවත්වන ලදී.

III. නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජිත ව්‍යාපෘති

කල්පිටිය නගරය සඳහා සංවර්ධන ප්‍රධාන සැලැස්මක් සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර ගෙන යන අතර ඒ පිළිබඳ සංකල්ප පත්‍රිකාව සකස් කිරීමට නියමිත වේ.

ඒ සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගයීම් සිදු කිරීමට නියමිතය. ඒ අනුව මේ පිළිබඳව මූලික සාකච්ඡාවක් ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයෙන් 2022.08.30 දින පවත්වන ලදී.

E. සමුච්ඡිත පාරිසරික බලපෑම් තක්සේරුගත කිරීම

ඇල්ල ප්‍රදේශයේ වත්මන් සංචාරක ආකර්ෂණය ඉහළ මට්ටමක පවතින අතර ඒ සමඟම පරිසරයට එල්ල විය හැකි බලපෑමද වැඩි වේ. ඒ අනුව පරිසර

අමාත්‍යතුමා විසින් සංචාරක ආකර්ෂණය ඇති ස්ථානද ඇතුළත් කර ගනිමින් ඇල්ල ප්‍රදේශයේ පාරිසරික ඇගයීමක් සිදු කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දී ඇත. තව ද නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ඇල්ල සංවර්ධන සැලැස්ම ඇගයීම පිළිබඳව ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවධානය යොමු කර ඇත.



FIGURE 24 : ක්ෂේත්‍ර පරීක්ෂණය : ඇල්ල කන්ද, **2022.12.23**

ඒ අනුව, ඇල්ල ප්‍රදේශයේ පවතින පාරිසරික ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකාර ආයතන සමඟ රැස්වීමක් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2022.12.22 දින පවත්වන ලදී. එමෙන්ම මෙම ඒකකයේ නිළධාරීන් විසින් ඇල්ල ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂණයක් 2022.12.22 හා 23 යන දෙදින තුළදී සිදු කරන ලදී.

F. **වෙනත් රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම**

I. වෙනත් රාජ්‍ය ආයතන වල ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීම

a. පහත සඳහන් රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් ප්‍රතිපත්ති පිළිබඳව අදහස් සහ යෝජනා උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් ලබා දී ඇත.

1. කිරි නිෂ්පාදන ප්‍රතිපත්තිය - කෘෂිකර්ම අමාත්‍යාංශය

2. ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය යාවත් කාලීන කිරීම - පරිසර අමාත්‍යාංශය

3. ජාතික ජල ප්‍රතිපත්තිය - වාරිමාර්ග අමාත්‍යාංශය

4. ශ්‍රී ලංකා තිරසාර ගුවන් සේවා ප්‍රතිපත්තිය - සිවිල් ගුවන් සේවා අධිකාරිය

II. **වෙනත්**

a. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය පහත කරුණු සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් 02 කට සහභාගී විය.

5. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා කෘෂි පාරිසරික භූ දර්ශන ප්‍රත්‍යාස්ථතා සැලැස්මක් සකස් කිරීම.

6. පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොලේ අපජල පවිත්‍රාගාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලබන තාක්ෂණික කමිටු රැස්වීම්.

a. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් පාර්ශවකරුවන්ගේ පහත උපදේශන වැඩමුළු 03 කට සහභාගී විය.

1. 2050 කාබන් ශුද්ධ ශූන්‍ය මාර්ග සිතියම සහ ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන වල තාක්ෂණික ධාරිතාවය ගොඩ නැඟීම පිළිබඳව පාර්ශවකරුවන්ගේ 2022/11/24 දින පවත්වන ලද උපදේශන වැඩමුළුව.

2. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ තිරසරභාවය ශක්තිමත් කිරීම පිළිබඳව පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව.

3. පරිසර අමාත්‍යාංශය විසින් පවත්වන ලද සෞඛ්‍ය සම්පන්න භූ දර්ශන ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම.

b. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් සාම්පලනිවු කළපුව ස්වභාවික රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල සංදේශයට සහ ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන ලදී.

G. මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් ඒකක / අංශ සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම.

I. මධ්‍යම පරිසර අධිකාරිය මේ වන විට ISO 9001:2015 ප්‍රමිතියට අනුව තත්ත්ව කළමනාකරණ සහතිකකරණය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරන අතර එහිදී අංශ සහ ඒකක අතර අභ්‍යන්තර විගණනයට උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය සහභාගී විය.

CHAPTER 5 : පර්යේෂණ හා සංවර්ධන ඒකකය

පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ ප්‍රධාන අභිමථාර්තයන් වන්නේ ,ඕනෑම ආකාරයකින් විය හැකි පරිසර හායනයන් වැලැක්වීම සඳහා අවශ්‍ය පර්යේෂණ /අධ්‍යයන /සමීක්ෂණ සිදුකිරීම, ඒවා ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය සහ එම තොරතුරු බෙදාහැරීම සහ භූගෝලීය තොරතුරු හා දුරස්ථ සංවේද තාක්ෂණය භාවිතයෙන් ස්වාභාවික සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම වේ. ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් පහත ක්‍රියාකාරකම් 2022 වර්ෂයේදී ඉටුකරන ලදී.

I. අධිකාරියේ කාර්යභාරයට අදාලව පර්යේෂණ/ අධ්‍යයන/ සමීක්ෂණ සිදුකිරීම් ඒ සඳහා පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණය

A. ශ්‍රී ලංකාවේ පාරිසරික තක්සේරුව සඳහා ජෛව විවිධත්වයෙන් යුතු පරිසර පද්ධතීන්ගෙන් සිදුවන සේවා දර්ශක හා මාර්ග සූචක ගොඩනැංවීම - කඹරව ගඟ උප දියඇස්නාව, මරගල හා හන්තාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ

- කඹරව ගඟ උපදිය බස්නාව සඳහා සිදුකරන ලද නියමු අධ්‍යයනය අවසන් කර ඇති අතර, තෝරාගත් ස්ථාන 23ක් ඇසුරෙන් සිදුකරන ලද අවසන් ක්ෂේත්‍ර සත්‍යාපනයෙන් අනතුරුව සකස් කල ගුරු උපදෙස් අවසන් නිරීක්ෂණ ලබාගැනීම සඳහා විද්වත් මණ්ඩලය වෙත යොමු කරන ලදී.
- හන්තාන හා මරගල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයන්ගේ භූමි පරිහරණ/ආවරණ තොරතුරු යාවත්කාලීන කිරීම අවසන් කරන ලදී. පාංශු කාබන් විශ්ලේෂණය සඳහා නියැදි ලබාගැනීම සිදුකරමින් පවතී.

B. ආහාර දවටන දිරාපත් වීම පිලිබඳ පර්යේෂණය

- විමර්ශන ඒකකයේ ඉල්ලීම පරිදි දිරාපත්වන බව සඳහන් ආහාර දවටන නිෂ්පාදන වර්ග 03ක් සහ එක් දිරාපත් නොවන ආහාර දවටන නිෂ්පාදනයක් (පාලක පරීක්ෂණය) ආහාර දවටන දිරාපත් වීම පිළිබඳ දෘශ්‍ය නිරීක්ෂණ මත පදනම් වූ මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදී. එක් වර්ගයකින් එක් නියැදිය බැගින් විවිධ කාල පරාසයන්හිදී දිරාපත් වූ ප්‍රමාණය පිලිබඳ ඇගයීමක් කිරීම සඳහා නිරීක්ෂණ ලබාගන්නා ලදී.

- මාස 07 ක් අවසානයේ ලද ප්‍රතිඵල වලට අනුව පාලකය හා එක් ආහාර දවටන නිෂ්පාදනයක් දිරාපත් නොවී තිබූ අතර, නිෂ්පාදන වර්ග 02 ක් දිරාපත් වීමට ලක්ව තිබුණි. (රූප සටහන 01 හා 02)




FIGURE 25 : දින **30**කට පසු නියැදිවල නිරීක්ෂණ



FIGURE 26 : දින **210**කට පසු නියැදිවල නිරීක්ෂණ

C. පරිසර ආරක්ෂණ ප්‍රදේශයන් (EPA) ඡායාරූපගත කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහයෝගය ඇතිව සැප්තැම්බර් මස 20 වන දින සිට 22 දින දක්වා තලංගම සහ වලව්වේවත්ත-වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශවල ඩ්‍රෝන මෙහෙයුම් සිදුකරන

ලදී. මෙම මෙහෙයුම් මඟින් ලබාගත් ඩ්‍රෝන ඡායාරූප භාවිතයෙන් එක් පරිසර ආරක්ෂණ ප්‍රදේශයකට එක් සම්ප්‍රයුක්ත ඡායාරූපය බැගින් සකස් කරන ලදී.



FIGURE 27 : 03 තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සම්ප්‍රයුක්ත ඡායාරූපය

D. පර්යේෂණ උපදේශක කමිටුව විසින් අනුමත කරන ලද පර්යේෂණ

අතුරින් පර්යේෂණ උපදේශක කමිටුව විසින් තෝරාගන්නා ලද පර්යේෂණ 03 සඳහා අනුමත මුදලින් පළමු වාරිකය බැගින් පහත සඳහන් පරිදි නිදහස් කරන ලදී.

- 2022 වසර තුල පර්යේෂණ හා සංවර්ධන එකකය වෙත ලැබුණු පර්යේෂණ යෝජනා 13 ක්

TABLE 32 : පර්යේෂණ යෝජනා

	පර්යේෂණ මාතෘකාව	අනුමත කරන ලද මුදල (රු:)
01	මුතුරාජවෙල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයේ ස්ථානීය දුෂණය පිලිබඳ විගණනය සහ එය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	400,000.00
02	ජලජ පරිසර පද්ධති සංවර්ධනයට අදාලව ප්‍රතිපත්ති, නෛතික රාමු සහ ක්‍රියාවලීන් සහ ජලජ පරිසර පද්ධති සංවර්ධනයට අදාලව පාරිසරික ඇගයීම සඳහා නව සම්මුති සකස් කිරීම	150,000.00
03	ශ්‍රී ලංකාවේ නාගරික සැකසුම් ආශ්‍රිතව ශක්ති කාර්යක්ෂමතාවය සහ පාරිසරික තිරසාරබව සහ හරිත තාක්ෂණයේ බලපෑම	50,000.00

- මෙම වැය ශීර්ෂය යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලද පහත දැක්වෙන පර්යේෂණ ව්‍යාපෘති 02 ක වැඩකටයුතු මෙම වර්ෂයේදී සාර්ථකව අවසන් කර ඇත.

TABLE 33 ඵ අවසන් කළ ව්‍යාපෘති

	ආරම්භ කරන ලද වර්ෂය	පර්යේෂණ ව්‍යාපෘතිය	මුළු වියදම (රු:)

01	2019	තෝරාගත් භෞතික හා රසායනික නිර්ණායක, ජෛවීය සාධක සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ප්‍රමාණය භාවිතා කරමින් කඳුකර ප්‍රදේශයන්හි ගංඟා ජලයේ ගුණාත්මය පිලිබඳ ඇගයීම	50,000.00
02	2019	රබර් කර්මාන්තයේ ජෛවීය ඔක්සිජන් ඉල්ලුම සහ රසායනික ඔක්සිජන් ඉල්ලුම අතර අනුපාතය යොදා ගනිමින් එක් මිනුමක් තෝරාගැනීම සඳහා සිදුකරන ලද අධ්‍යයනය	46,142.00

- තවද මෙම වැඩසටහන යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ආරම්භ කරන ලද පහත දැක්වෙන පර්යේෂණ ව්‍යාපෘති තවදුරටත් සිදුකරමින් පවතින අතර, ඉදිරි වර්ෂය තුලද සිදුකරගෙන යාමට නියමිතය.

Table 34 තවදුරටත් සිදුකරමින් පවතින ව්‍යාපෘති

	ආරම්භ කරන ලද වර්ෂය	පර්යේෂණ ව්‍යාපෘතිය
01	2019	කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් කුඩා ජල විදුලිබලාගාර ව්‍යාපෘතිවල බලපෑම ජෛව විවිධත්වයට විශේෂ අවධානයක් ලබාදෙමින් ඇගයීම
02	2019	කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජා පාරිසරික දැනුවත්භාවය පිලිබඳ සමීක්ෂණය
03	2019	තෝරාගත් වාණිජ වශයෙන් එළවලු සෝදන ස්ථානවල බැහැරවන ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම, ජෛව ඔක්සිජන් ඉල්ලුම සහ මුළු අවලම්භිත අංශු ප්‍රමාණය පරීක්ෂා කිරීම මඟින් ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය
04	2019	රත්නපුර දිස්ත්‍රික්කයේ ද්විතීක අධ්‍යාපන මට්ටමේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පාරිසරික දැනුවත්භාවය සහ ආකල්ප සංසංදනාත්මක අධ්‍යයනය
05	2021	“CCME” මතුපිට ජල තත්ත්ව දර්ශකය භාවිතයෙන් කළු ගංඟා ද්‍රෝණියේ ජල තත්ත්ව පිළිබඳ ඇගයීම
06	2021	වාහන සේවා ස්ථාන වලින් බැහැර කරනු ලබන අවසාදිත අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා පාංශු තත්ත්වය වෙනස්වීම පිලිබඳ ඇගයීම

III. භූගෝලීය දත්ත පද්ධති වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම

Industrial summary update upto 31.12.2022

	Province	District	Total A , B, C , D & BOI Industry	Total A , B, C & BOI Industry	Total "A" category	Total "B" category	Total "C" category	Total BOI Industry	Total "D" category
1	Western	Colombo	5004	4115	248	2582	1040	245	889
		Gampaha	4120	4029	210	2430	1072	317	91
		Kalutara	2695	1797	161	864	641	131	898
2	Southern	Galle	2953	1826	23	601	1138	64	1127
		Matara	2626	1368	11	427	906	24	1258
		Hambantota	3045	1138	22	434	643	39	1907
3	Eastern	Trincomalee	1406	595	3	239	333	20	811
		Ampara	1706	796	9	427	349	11	910
		Batticaloa	1225	668	2	276	378	12	557
4	Uva	Badulla	2652	813	10	460	329	14	1839
		Moneragala	1764	625	3	319	288	15	1139
5	Central	Kandy	3974	1502	25	832	591	54	2472
		Matale	1952	692	6	444	215	27	1260
		N'Eliya	947	510	7	242	241	20	437
6	North Central	Anuradhapura	2481	1052	20	682	329	21	1429
		Polonnaruwa	790	410	7	229	164	10	380
7	Sabaragamuwa	Ratnapura	2361	1426	33	743	615	35	935
		Kegalle	2189	1168	44	542	551	31	1021
8	Northern	Jaffna	1962	929	6	428	485	10	1033
		Mannar	482	227	0	121	104	2	255
		Vavuniya	476	291	12	201	73	5	185
		Kilinochchi	685	286	1	82	199	4	399
		Mullaitivu	428	190	3	72	113	2	238
9	North Western	Kurunegala	757	755	18	483	254	0	2
		Puttalam	450	450	20	258	172	0	0
	Total		49,130	27,658	904	14,418	11,223	1,113	21,472
	% of each Category				2	29	23	2	44

- ජාතික පාරිසරික පනත යටතේ 2022-01-27 දින නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) ක්‍රියාවලිය පිළිබඳ නව රෙගුලාසි වලට අනුකූල වන ලෙස දත්ත පද්ධතිය ප්‍රතිව්‍යුහගත කරන ලදී.
-

න් අනතුරුව නියමිත කර්මාන්ත /සේවාවන් පිළිබඳ දත්ත පද්ධතියේ සාරාංශගත කිරීම් සිදුකරන ලදී.

III. භූගෝලීය තොරතුරු පද්ධති (GIS) හා පර්යේෂණ ක්‍රියාවලීන් පිලිබඳ පර්යේෂණ හා සංවර්ධන ඒකකය/ ප්‍රධාන කාර්යාලය/ ප්‍රාදේශීය කාර්යාලවල නිළධාරීන්ගේ දැනුම වර්ධනය

- මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාලව වැඩසටහන් 09 ක් Zoom තාක්ෂණය භාවිතයෙන් සිදුකරන ලදී.

1. මාර්ගගත පැතුරුම් පත්‍ර (Online spread sheets) නඩත්තු කිරීම
2. දත්ත රැස්කිරීම සඳහා මාර්ගගත යෙදවුම් වලට දත්ත ඇතුලත් කිරීම
3. පරිසර කළමනාකරණ ක්ෂේත්‍රය තුල GIS භාවිතය

- පරිසර පද්ධතීන්ගෙන් සිදුවන සේවා දර්ශක හා මාර්ග සූචක ගොඩනැංවීම පිළිබඳ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයේ නිළධාරීන් හට දින 05 ක පුහුණුවක් ලබාදීම.

IV. භූගෝලීය තොරතුරු තාක්ෂණයට අදාල සේවාවන් මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ, ඒකක, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වෙත සැපයීම

- **අභ්‍යන්තරව සිදුකරන ලද ඉල්ලීම් 77 ක සංඛ්‍යාවක් සඳහා පහත සඳහන් පහසුකම් සපයන ලදී.**

1. සිතියම් නිමැවුම් 52 ක් සකස් කිරීම
2. ස්ථානීය දත්ත කට්ටල 08 ක පිහිටීම නිශ්චිත ප්‍රදේශයකට /වස්තුවකට සාපේක්ෂව පරීක්ෂා කරදීම
3. දත්ත රැස්කිරීම සඳහා මාර්ගගත යෙදවුම් 11 ක් සහ සැකසීම සහ මාර්ගගත ප්‍රදර්ශක පුවරු 06 ක් සකස් කිරීම

Chapter 6 : නීති ඒකකය

"අප එකිනෙකාගේ පැවැත්ම උදෙසා නීතිමය යාන්ත්‍රණය බලාත්මක කිරීම තුළින් පරිසරය සංවර්ධනය කිරීමෙන් ද දැනුම ලබාදීමෙන් ද පරිසරයේ සුවදායී පැවැත්ම තහවුරු කරමු."

A. ජාතික පාරිසරික පනත යටතේ ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග -

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලාත්මක වන නීති හා රෙගුලාසි ඔස්සේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධික්ෂණය යටතේ නීති අංශය මඟින් සිදු කරන ලද නෛතික කාර්යයන් පහත පරිදි වේ.

2022 වර්ෂය තුලදී මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකය විසින් ගොනු කරන ලද නඩු හා අවසන් කරන ලද නඩු කටයුතු රාශියකි. ඒ අනුව 2022 වර්ෂයේ දී මෙම අධිකාරිය පවත්වාගෙන යන නඩු සංඛ්‍යාව හාරසිය අනූ හතර (494) ක් වන අතර, ඒ තුළ අධිකාරියට එරෙහිව පවරන ලද නඩු හා අධිකාරිය විසින් පවරන ලද නඩු ඇතුලත් වන අතර, 2022 වර්ෂය තුල අධිකාරිය විසින් නඩු දෙසිය විසි දෙක (222) ක් අළුතෙන් පවරා ඇත.

එකී නඩුකරයන් මඟින් 2022 වර්ෂයේ දඩ මුදල් ලෙස අයකරගෙන ඇති මුළු මුදල රු. 1,456,827.06 කි.

TABLE 35 : පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

අනු අංකය	පළාත	**2021** වර්ෂය තුළදීඅළුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව	මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව	මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවසන් කරන ලද නඩු සංඛ්‍යාව
01.	බස්නාහිර	85	161	71
02.	මධ්‍යම	59	68	61
03.	ඌව	17	19	13
04.	දකුණ	23	19	15
05.	නැගෙනහිර සහ උතුර	15	25	24
06.	සබරගමුව සහ වයඹ	19	82	26
07.	උතුරු මැද	04	12	07
	එකතුව	**222**	**386**	**217**

B. මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු -

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පැවරූ නඩු එකසිය දහනවයක් (119) ක් 2022 වර්ෂයේ දී පවත්වාගෙන ගිය අතර, ඒවා මහේස්ත්‍රාත්, දිසා, මහාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණයන්හි පවරන ලද නඩු වේ.

නීති අංශයේ නිලධාරීන්, මහේස්ත්‍රාත්, දිසා, මහාධිකරණ, අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ වල මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු කටයුතු වලට පෙනී සිටින ලදි. තවද, අධිකරණයෙහි ගොනු කරන ලේඛන කෙටුම්පත් කිරීම සහ උපදේශන සාකච්ඡාවලට නීති අංශයේ නිලධාරීන් සහභාගී වන ලදි.

C. ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය -

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සමහර කර්මාන්තශාලා මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පාරිසරික පනතට අනුකූලව අපජලය පිරිපහදු පද්ධති සකස් කිරීමෙන්ද, සමහර කර්මාන්තශාලා ජාතික පාරිසරික පනතේ ප්‍රකාශිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව ශබ්ද පාලනය කිරීමෙන්ද සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන්ද අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගන්නා ලදී.

D. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම / අත්හිටුවීම / ප්‍රතික්ෂේප කිරීම/ හේතු දැක්වීමේ ලිපි

කර්මාන්තශාලාවල සිදු වන පරිසර දූෂණය සලකා බලා නිකුත්කොට ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම සඳහා කර්මාන්තශාලා තිස් එක (31) ක් වෙත ද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අනූ නවය (99) ක් වෙත ද ලිපියවා ඇත.

තවද, කර්මාන්තශාලා සම්බන්ධව නඩු පැවරීමට අදාළ පියවර ගැනීම සඳහා ශබ්ද මට්ටම් වාර්තා අපදියර විශ්ලේෂණ වාර්තා හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා කැඳවීම සඳහා ලිපිගොනු ගණනාවක් පරිසර දූෂණ පාලන අංශය සහ අදාළ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත සහ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කොට ඇත.

E. ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන විධානයන්

2022 වර්ෂයේ නීති ඒකකය මඟින් ජාතික පාරිසරික පනතේ 24ආ වගන්තිය යටතේ විධාන විසි පහ (25) ක් නිකුත් කර ඇත.

F. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේදී එහි කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකයේ නිලධාරීන් සහ පළාත් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති සහකාර නීති නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබයි.

G. ජාතික පාරිසරික පනත යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනා (මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය)

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අභියාචනා විභාග කිරීම් විසි හත (27) ක් සම්බන්ධයෙන් නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

H. නොතාරිස් කටයුතු -

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමේදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගොඩනැගිලි බදු පදනම මත ලබාගැනීම හා සේවා ලබා ගැනීම සඳහා බාහිර අංශ සමඟ එළඹෙන්නා වූ එකඟතා සහ ගිවිසුම්පත් පිළියෙළ කිරීම් සිදු කිරීම සහ එකී ගිවිසුම් පත්‍ර එකසිය හැත්තෑව (170) ක් සඳහා අනුමැතිය ලබාදීම සිදු කෙරිණ.

I. රැස්වීම්

නීති ඒකකයේ නිලධාරීන් පාරිසරික කරුණු සම්බන්ධයෙන් වන රැස්වීම් දෙසිය හැට දෙක (262) ක් සඳහා සහභාගී වී ඇත.

J. පැමිණිලි

නීති ඒකකයේ නිලධාරීන් පරිසර දූෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මහජනතාව, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අනෙකුත් ආයතන වලින් යොමු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගෙන ඇත.

K. සාකච්ඡාවලට සහභාගීවීම -

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරන ලද නඩු සහ මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව අධිකරණයේ ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් විරෝධතා, උත්තර, ලිඛිතදේශන සැකසීම සහ විභාග නඩු සම්බන්ධයෙන් උපදේශන සාකච්ඡා පනස් හත (57) ක් සඳහා නීති ඒකකයේ නිලධාරීන් සහභාගි වී ඇත.

L. **උපදෙස්**

නීති ඒකකයේ නිලධාරීන් විසින් පළාත් පාලන ආයතන තනි පුද්ගලයින් සහ වෙනත් අංශවලින් යොමු කරන ලද ගැටළු හත්සිය විසි හතර (724) ක් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත.

M. නීති නිවේදන

පරිසර දූෂණකාරී කර්මාන්ත තුන්සිය නවය (309) කට එරෙහිව නීති නිවේදන යවා ඇත.

N. ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා

අධිකරණ නියෝග වලට අදාළව අධිකරණයට ඉදිරිපත් කිරීම සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉදිරියේ පවත්වනු ලබන අභියාචනා විභාග වලට ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සඳහා නීති අංශයේ අනුමැතිය ලබා දී ඇත.

O. දැනුවත් කිරීම -

නීති අංශයේ නිලධාරීන් විසින් ජාතික පාරිසරික පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ දේශන දහ සය (16) ක් වෙනත් ආයතන වල නිලධාරීන් සඳහා පවත්වා ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වන වැඩමුළු සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගි වී ඇත.

තවද, නීති ශිෂ්‍යයින් සහ අනෙතුත් විශ්ව විද්‍යාල සිසු සිසුවියන්ගේඉල්ලීම් අනුව, පරිසර නීතිය හා පාරිසරික නියෝගයන්පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී.

P. ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

ජාතික පාරිසරික පනතට යෝජිත නව සංශෝධන පනත් කෙටුම්පතේ ඉංග්‍රීසි පිටපත පිළිබඳ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා පරිසර අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව අවසන් එකඟතාවයකට එළඹ ඇති අතර, උක්ත ඉංග්‍රීසි පනත් කෙටුම්පත සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා පරිසර අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට නියමිතය.

තවද යෝජිත සංශෝධන පනත් කෙටුම්පතේ සිංහල හා දමිල පිටපත් පරිවර්තන කටයුතු සිදු කිරීමට අදාළ පියවර සඳහා යොමු කිරීම් සිදු කිරීමට නියමිතය.

මීට අමතරව පහත සඳහන් අති විශේෂ ගැසට් පත්‍ර 2022 වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදි.

- අංක 2264/17 හා 2022.01.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (පාරිසරික ආරක්ෂණ හා තත්ව නියෝග)
- අංක 2264/18 හා 2022.01.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය (බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත කටයුතු)

Chapter 7 : පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය, පරිසර සංරක්ෂණය වෙනුවෙන් මහජනතාවගේ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වගකීම දරයි. පරිසරයේ තිරසාර බව සහතික කිරීම සඳහා පාරිසරිකව දැනුම්වත් පුරවැසියන් බිහිකිරීම මෙම ක්‍රියා පටිපාටියේ අරමුණයි. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ (EE&A) මෙහෙවර වන්නේ පරිසරය පිළිබඳ දැනුම්වත් වූ, එහි ගැටලු පිළිබඳව සැලකිලිමත් වන, තනි තනිව සහ සාමූහිකව මෙම ගැටලුවලට විසඳුම් සෙවීමට සහ තවදුරටත් පාරිසරික හායනය උග්‍රවීම නැවැත්වීමට පෙළඹෙන සමාජයක් නිර්මාණය කිරීමයි. වඩා හොඳ සහ වඩාත් ඵලදායී සේවාවන් සැපයීම සඳහා පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය පරිසර අධ්‍යාපන ඒකකය (EEU), පරිසර ප්‍රවර්ධන ඒකකය (EPU), සහ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය (NEIC) ලෙස ඒකක තුනකින් සමන්විත වේ.

7.1. පරිසර අධ්‍යාපන ඒකකයේ ප්‍රගතිය-2022

පරිසර සංවේදී පුරවැසියන් බිහිකිරීමත්, ඔවුන්ගේ දායකත්වයෙන් පරිසරය ආරක්ෂා කිරීමත්, සංරක්ෂණය කිරීමත් උදෙසා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන ඒකකය මගින් විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ක්‍රියාකාරී සැලැස්මට අනුව පරිසර අධ්‍යාපන ඒකකය 2022 වසර තුල පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

1. පරිසර නියමු වැඩ සටහනක්‍රියාත්මක කිරීම,අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමහා පෙර පාසල් වැඩසටහන
2. දිස්ත්‍රික් පරිසර පුවත්පත ප්‍රකාශයට පත් කිරීම
3. පරිසර නියමු කාර්යභාර ගුරුවරුන්පුහුණු කිරීම
4. පරිසර නියමු පදක්කම්පරීක්ෂණ පැවැත්වීම
5. පරිසර නියමු ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම
6. ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම
7. ස්වර්ණ පදක්කම් ප්‍රදානය
8. ජනාධිපති පදක්කම් ප්‍රදානය
9. පරිසර නියමු සංසදය මගින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
10. දිස්ත්‍රික් උපදේශක හා පරිසර නියමු කොමසාරිස් වරුන් වෙත වාර්ෂික ප්‍රවාහන දීමනා ලබාදීම
11. පාරිසරික ග්‍රන්ථ හා මුද්දරය එළිදැක්වීම
12. "පරිසර වියමන" ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කිරීම.
13. පුවත්පත් අතිරේක පළ කිරීම
14. පරිසර සාහිත්‍ය තරගාවලියේ ත්‍යාග ප්‍රදානය කිරීම
15. පරිසර නියමු වැඩසටහන අභිප්‍රේරණය කිරීම
16. පරිපර නියමු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
17. ප්‍රගති සමාලෝචන රැස්වීම්

A. පරිසරනියමුවැඩසටහන

පරිසර සංරක්ෂණ ක්‍රමවේදයන් පාසල් පද්ධතිය තුළින් අනාගත පරපුරට දායාද කිරීම උදෙසා මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ද පූර්ණ සහයෝගය ඇතිව ජාතික පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළට හඳුන්වා දෙන ලදී.

පාසල් සිසුන් පාරිසරික විෂය ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා දැනුම, න්‍යායික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සංවර්ධනය කර පාරිසරික දැනුම, ආකල්ප, කුසලතා වලින් හෙබි පාරිසරික සංවේදී පුද්ගලයන් බවට පත් කිරීම මෙම වැඩසටහනේ අභිලාෂය වේ.

ජාතික පරිසරනියමු වැඩසටහන උප වැඩසටහන් දෙකක් යටතේ ක්‍රියාත්මකවේ.

- ළමා සමාජ වැඩසටහන
- පරිසර නියමු වැඩසටහන

I. පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහන් හි ප්‍රගතිය

කොවිඩ් 19 වසංගත හා ආර්ථික අර්බුද තත්ත්වය හේතුවෙන් පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහනවසරේ මුල් කාර්තුවේදී සූම් තාක්ෂණය (Zoom technology) උපයෝගී කර ගෙන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන ලදී. අනතුරුව භෞතිකව වැඩසටහන පාසල් පද්ධතිය තුල ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ අධ්‍යාපන වර්ෂය 2023 මාර්තු මස දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් අදාළ පදක්කම් පරීක්ෂණ මේ වන විට සිදු කරමින් පවති.

II. පරිසර නියමු වැඩසටහනෙහි ප්‍රගතිය

වැඩසටහනට සම්බන්ධවනපරිසර නියමුවෙකුට නියමිතක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පදක්කම් පහක් දිනා ගැනීමට අවස්ථාව ලැබෙන

අතර අවසාන පදක්කම වන ජනාධිපති පදක්කම අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් ජනාධිපති මන්දිරයේදී ලබාගනී.

2022 වසරේ ප්‍රගතිය

TABLE 36 : 2022 වසරේ ප්‍රගතිය

පදක්කම	සංඛ්‍යාව
පරිසර නියමු	19,047
හරිත	5,516
රජත	1,660

පදක්කම	සංඛ්‍යාව
ස්වර්ණ	489
ජනාධිපති	28

a. ද්‍රව්‍ය නිෂ්පාදනය

පරිසරනියමුවැඩසටහනසඳහාඅවශ්‍යසහතික, පදක්කම් හා අනෙකුත් උපකාරක ද්‍රව්‍ය වාර්ෂිකව නිෂ්පාදන කරනු ලැබේ. 2023 වසරේ ස්වර්ණ සහතික-3000ක් හා ස්වර්ණ පදක්කම් -3000 ක් නිෂ්පාදනය කරන ලදී.





FIGURE 28 : ස්වර්ණ සහතිය හා පදක්කම

b. පරිසර ළමා සමාජ ප්‍රගතිය

පිවිතුරු හරිත පරිසරයක් බිහි කිරීම උදෙසා,ප්‍රාථමික අංශයේ 1 ශ්‍රේණියේ සිට 5ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන පාසල්සිසුන්තුළආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහනකි.මෙම වැඩසටහනට සම්බන්ධ කරගන්නා සිසුන් 6 වසරේ දී පරිසර නියමු වැඩසටහන සඳහා සම්බන්ධ වේ.

ළමා සමාජ වැඩසටහනට සහභාගිවන සිසුවෙකුට ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පදක්කම් තුනක් දිනා ගැනීමට අවස්ථාව ලැබේ.

2022 වසරේ ප්‍රගතිය

TABLE 37 : 2022 වසරේ පරිසර ළමා සමාජ ප්‍රගතිය

සහතිකය	සංඛ්‍යාව
තුරුලතා	26,703
විහග	10,687
සොබා	3557

c. පෙර පාසල් වැඩසටහනෙහි ප්‍රගතිය

පෙර පාසල් දරුවන්ගේ පාරිසරික සංවේදීතාව ඉහළ නැංවීම උදෙසා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පෙර පාසල් වැඩසටහන ආරම්භ කරන ලදී. පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය ගුරු අත්පොත මුද්‍රණය කර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2022.04.27,2022.08.16 හා 2022.08.31 දිනයන්හි කොළඹ, කෑගල්ල, හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් තුනක් ක්‍රියාත්මක කර ගුරුභවතුන් 190ක් පුහුණු කරන ලදී.

d.දිස්ත්‍රික්පරිසරනියමුපුවත්පතමුද්‍රණයකිරීම.

එක් එක් දිස්ත්‍රික්කය තුළ පරිසර නියමු වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් හි එකතුවක් ප්‍රකාශයට පත් කිරීමත්, අත්දැකීම් හා දැනුම බෙදා ගැනීමත් අරමුණු කර ගෙන දිස්ත්‍රික්ක 25 න් පරිසර නියමු පුවත්පත් 25ක් නිකුත් කරනු ලැබේ. පැවති මූල්‍ය ප්‍රතිපාදන ගැටළු හේතුවෙන් දිස්ත්‍රික් 23 ක තොරතුරු ඇතුලත් කර 2022 වසර සඳහා විද්‍යුත් පුවත්පතක් ප්‍රකාශයට පත් කරන ලදී

e. පුහුණු වැඩසටහන්

- **පරිසර නියමු කාර්ය භාර ගුරුවරුන් පුහුණු කිරීම.**

ඖතික පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා පරිසර නියමු කාර්‍යභාර ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් වාර්ෂිකව පවත්වනු ලැබේ.2022 වසරේ පහත පරිදි ගුරු පුහුණු වැඩසටහන් පවත්වන ලදී,

	දිස්ත්‍රික්කය	දිනය
1	කෑගල්ල	2022.09.20 2022.09.27
2	මොණරාගල	2022.06.28
3	මහනුවර	2022.01.27 2022.06.28 2022.06.30 2022.09.14 2022.09.22 2022.10.12
4	කොළඹ	2022.08.31
5	රත්නපුර	2022.10.20 2022.10.27
6	ත්‍රිකුණාමලය	2022.09.14
7	අනුරාධපුර	2022.09.30

f. පරිසර නියමු පදක්කම් පරීක්ෂණ පැවැත්වීම

පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මගින් හරිත, රජත, ස්වර්ණ හා ජනාධිපති පදක්කම් පූර්ව පරීක්ෂණ පවත්වයි. ඒ අනුවහරිත පදක්කම් පරීක්ෂණ 83 ක්, රජත පදක්කම් පරීක්ෂණ 55ක් හා ස්වර්ණ පදක්කම් පරීක්ෂණ 36 ක් කොළඹ, කළුතර, ගම්පහ, කෑගල්ල, කුරුණෑගල, මහනුවර, පොලොන්නරුව, පුත්තලම, බදුල්ල,මඩකළපුව,ගාල්ල,මාතර,රත්නපුර,හම්බන්තාට මාතලේ, මොණරාගල හා නුවරඑළිය දිස්ත්‍රික්කයන් හි පවත්වන ලදී.ජනාධිපති පදක්කම් පූර්ව පරීක්ෂණ 05ක් ගාල්ල,මොණරාගල,මාතර ,යාපනය හා කොළඹදිස්ත්‍රික්කයන් හි ද, අවසාන ජනාධිපති පදක්කම් පරීක්ෂණ 04ක් ගාල්ල,මොණරාගලමාතර,යාපනයදිස්ත්‍රික්කයන් හි පවත්වා ජනාධිපති පදක්කම්ලාභීන් 28ක් තෝරා ගන්නා ලදී.





දත්ත

FIGURE 29 : ජනාධිපති පදක්කම් පරීක්ෂණ පැවැත්වීම.

g. ජාතිකපරිසරනියමුමෙහෙයුම්කමිටුව

පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා අන්තර් ආයතනිය සහයෝගය ලබා ගැනීමත්,

ඉහලමට්ටමෙන්තීන්දු තීරණ ගැනීමත් උදෙසා ජාතිකපරිසරනියමුමෙහෙයුම්කමිටුව ස්ථාපනය කරන ලදී. 2022 වසරේදී වසර තුනක් සඳහා නව සාමාජිකයින් පත්කර 2022.11.22දින කමිටු රැස්වීම පවත්වන ලදී.

h. ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම.

පරිසර නියමු වැඩසටහනේ දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, දත්ත යාවත්කාලීන කිරීම හා හුවමාරු කර ගැනීමඅරමුණු කර ගෙන ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය සකසන ලදී. නව වැඩිදියුණු කරන ලද දත්ත පද්ධතිය පිළිබඳ පළාත්,දිස්ත්‍රික් කාර්යාලයන් හි තෝරාගත් නිළධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහනක් 2022.04.22 දින පවත්වන ලදී. මේ සඳහා සියළු කාර්යාල ආවරණය කරමින් නිළධාරීන් 56 දෙනෙකු පුහුණු කරන ලදී.

i. ස්වර්ණ පදක්කම් ප්‍රදානෝත්සව පැවැත්වීම

මොණරාගල, නුවර, කෑගල්ල, කොළඹ,ගම්පහ, යාපනය දිස්ත්‍රික්කන් හිපදක්කම් ප්‍රදානෝත්සව 6ක් පවත්වන ලද අතර දකුණු පළාතේ කඳවුරක් පවත්වාස්වර්ණ පදක්කම් ප්‍රදානය කරන ලදී.




FIGURE 30 : දකුණු පළාතේ හා බස්නාහිර පළාතේ පදක්කම් ප්‍රදානය

j. ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සව පැවැත්වීම

2020හා 2021 වසර වලදී ජනාධිපති පදක්කම්ලාභීන් 129 දෙනෙකු බිහි වූ අතර එම පදක්කම් ප්‍රදානය 2022 වසරේ පැවැත්වීමට සැලසුම් කරන ලදී. ඒ සඳහාඅවශ්‍ය පදක්කම්, පළඳනා සකස්කිරීම හා සමරු කලාප සහතික මුද්‍රණය කරන ලදී. පදක්කම් ප්‍රදානය 2023 දී පැවැත්වීමට නියමිතය.

k. ජනාධිපතිපදක්කම්ලාභීසංසඳයමගින්පරිසර සංරක්ෂණක්‍රියාකාරකම් සිදුකිරීම.

පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභීන් විසින් පිහිටුවා ගන්නා ලද දිස්ත්‍රික් පරිසර නියමු සංසඳ මගින්2021 වසරේ දී කොළඹ, කළුතර, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල, හම්බන්තොට හා මාතර යන දිස්ත්‍රික්ක 9 හි **"**නාගරික තුරුවියන් **"** රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.2022 වසරේදී මෙම නාගරික උද්‍යාන පසුවිපරම් කටයුතු කරන ලදී.

l. දිස්ත්‍රික් උපදේශක හා පරිසර නියමු කොමසාරිස් වරුන් වෙත වාර්ෂික ප්‍රවාහන දීමනා ලබාදීම.

දිස්ත්‍රික් උපදේශක හා පරිසර නියමු කොමසාරිස් වරුන් වෙතඔවුන්ගේ ඉල්ලීම් අනුව රු. 7,500මුදලක් ගෙවන ලදී.

m. පාරිසරික ග්‍රන්ථ හා මුද්දරය එලි දැක්වීම

- **"ගෙත්තමක සිත්තම" පාරිසරික රූ සටහන් ග්‍රන්ථ**








FIGURE 31 : පාරිසරික රූ සටහන් ග්‍රන්ථය එලි දැක්වීම


ජ්‍යෙෂ්ඨ පාරිසරික නිතිඥ ආචාර්ය, ජගත් ගුණවර්ධන මහතා විසින් අදින ලද විහඟ චිත්‍ර ඇතුළත් "ගෙත්තමක සිත්තම" පාරිසරික සංග්‍රහය මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය අනුග්‍රහයෙන්


2021 වසරේ දී මුද්‍රණය කරන ලදී. ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සහභාගිත්වයෙන් 2022.03.30 දින මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී මෙම පොත එළිදක්වන ලදී.

n. "පරිසරය පිළිබඳ සර්ව ආගමික ඉගැන්වීම් "

පරිසරය පිළිබඳ විවිධ ආගමික ඉගැන්වීම් ඒකරාශි කරමින්මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලද අතර ආගමික ඉගැන්වීම් හා පරිසර සංරක්ෂණය අතර අන්තර් සම්බන්ධතාව සමාජගත කිරීම මෙහි මූලික අරමුණ වේ. සිංහල හා ද්‍රවිඩ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම මෙම ග්‍රන්ථය 2021 වසරේදී මුද්‍රණය කරන ලදී.

2022.10.20 දින කතුවරුන්ගේ හා ක්ෂේත්‍ර යේ විද්වතුන්ගේ සහභාගිත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී මෙම පොත එළිදක්වන ලදී.









o. සමරු මුද්දරය නිකුත් කිරීම

පරිසර නියමු වැඩසටහන සංකේතවත් කිරීම උදෙසා දිවයින පුරා විසිරීසිටින පරිසර නියමුවන් අතර චිත්‍ර තරගයක් පවත්වා ප්‍රථම ස්ථානය ලබාගත් චිත්‍රය යොදාගෙන සමරු මුද්දරයක්ද දෙවන ස්ථානය ලබාගත් චිත්‍රය යොදාගෙන මුල් දින කවරයද නිර්මාණය කරන ලදී. මෙම මුද්දරය නිකුත් කිරීම හා ජයග්‍රහකයින් සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය 2022.10.20 දින ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඇතුළු මැති ඇමති වරුන්ගේ හා තැපැල් දෙපාර්තමේන්තුවේ ඉහල නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.



FIGURE 33 : මුල්දින කවරය



FIGURE 32 : මුද්දරය





p. පරිසර වියමන"ගුවන්විදුලි වැඩසටහන් විකාශනය කිරීම

මෙරට පාසල් දරුවන්ගේ අධ්‍යයන කටයුතු නංවාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් පවත්වාගෙන යන Vision FM නාළිකාව ඔස්සේ 2022වසරේදී පරිසර අධ්‍යාපන වැඩසටහන් 46 ක් ප්‍රචාරය කරන ලදී.

q. පුවත්පත් අතිරේක

විජය ළමා පුවත්පතේ පිටු දෙකක් පරිසර නියමු වැඩසටහන සඳහා අදාළ සමාගම විසින් නොමිලේ ලබා දී ඇත .මෙම "සංහිත"පරිසර පිටුවේ සතිපතා පුවත්පත් අතිරේක පල කරන ලදී

r. පරිසර සාහිත්‍ය තරඟාවලියේ ත්‍යාග ප්‍රදානය කිරීම

2021 වසරේකොරෝනා වසංගත සමයේ පරිසර නියමුවන්ගේ හා අනෙකුත් පුද්ගලයන්ගේ පාරිසරික සාක්ෂරතාව වර්ධනය කිරීම උදෙසා චිත්‍ර, ගද්‍ය රචනා, පද්‍ය රචනා හා කෙටි වාක්‍ය තරඟයක් පවත්වන ලදී. මෙම තරඟයේ බස්නාහිර පළාත් ජයග්‍රාහිකයන්ගේ ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීම 2022.09.06 දින මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.





FIGURE 34 : පරිසර සාහිත්‍ය තරඟාවලියේ ත්‍යාග ප්‍රදානය කිරීම

s. පරිසර නියමු වැඩසටහන අභිප්‍රේරණය කිරීම

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව සත්වෝද්‍යාන සතියක් ප්‍රකාශයට පත්කරනු ලැබේ. 2022 වසරේ දී මෙම සතියේ පලමු දිනය "සොබා සෙදුරු දිනය" ලෙස නම් කර පරිසර නියමුවන් සඳහා වෙන් කරන ලදී.සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව එදින ඔවුන් සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා නියමුවන්,ගුරුවරුන්ඇතුළු 750 ක් සහභාගිවිය.







FIGURE 35 : පරිසර නියමු වැඩසටහන අභිප්‍රේරණය කිරීම

t. පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීමේ වැඩමුළුව

පරිසර නියමුවන්, තරුණ කණ්ඩායම් හා වැඩසටහනට සම්බන්ධ ක්ෂේත්‍රයේ කණ්ඩායම් සම්බන්ධ කරගෙන පරිසර නියමු වැඩසටහන පිළිබඳ අදහස් යෝජනා ලබා ගැනීමේ වැඩමුළුවක් 2022නොවැම්බර් දින 10 ඔධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.



u. ප්‍රගති සමාලෝචන රැස්වීම්.

පරිසරනියමුවැඩසටහනටහාළමාසමාජවැඩසටහනටඅදාළව මධ්‍යම පළාතේ හා මඩකලපු දිස්ත්‍රික්කයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් 2022.11.දින හා30 25 වල පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ හා මඩකලපුව සර්වෝදය පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

7.2. පරිසර ප්‍රවර්ධන ඒකකය

තිබිලිසි ප්‍රකාශනයේ විශ්වීය වශයෙන් පිළිගත් අරමුණුවලට අනුකූලව පරිසර ප්‍රවර්ධන ඒකකය මඟින් විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා පුළුල් පරාසයක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරයි. එහි අරමුණු වන්නේ -

1. ආර්ථිකය, සමාජය සහ පරිසරයේ අන්තර් සම්බන්ධතාව පිළිබඳ දැනුවත්භාවය සහ සැලකිල්ල වැඩි කිරීම;

2. පරිසරය සුරැකීමට සහ වැඩිදියුණු කිරීමට අවශ්‍ය දැනුම, සාරධර්ම, ආකල්ප, කැපවීම සහ කුසලතා ඉගෙන ගැනීමට සැමට අවස්ථාව ලබා දීම සහ

3. පුද්ගලයන්, කණ්ඩායම් සහ සමස්ත සමාජය තුළ නව පාරිසරික හැසිරීම් රටා ඇති කිරීම වේ.

COMBI උපාය මාර්ගය (දැනුම, ආකල්ප සහ භාවිතයන් වර්ධනය කිරීම පිණිස වර්යාත්මක බලපෑමක් ඇතිකිරීම සඳහා සන්නිවේදනය සිදුකිරීම) සහ දැනුම, කුසලතා, ආකල්ප (KAP) වර්ධනය කරන ක්‍රියාකාරකම් බොහොමයක් පරිසර ප්‍රවර්ධන ඒකකය මඟින් භාවිතා කරයි. පරිසර ප්‍රවර්ධන ඒකකයේ ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය ඉලක්ක කණ්ඩායම්වල දැනුම, ආකල්ප සහ හැසිරීම් වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කරන අතර, පාරිසරික තිරසාරත්වය වැඩි කරන ප්‍රජා පාදක පරිසර හිතකාමී වැඩසටහන් වල ශක්‍යතාව සහතික කරයි. මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණට අනුකූලව සම්බන්ධීකරණය, මහජන සහභාගීත්වය, බලාත්මක කිරීම සහ සුදුසු තාක්ෂණික මැදිහත්වීමක ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ දැක්මට අනුව පිරිසිදු හා හරිත පරිසරයක් සාක්ෂාත් කර ගැනීමට එය උපකාරී වේ.

මෙම ඉලක්කය සපුරා ගැනීමේ පරමාර්ථයෙන් පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් විවිධ මහජන ඉලක්ක කණ්ඩායම් සඳහා 2022 වර්ෂයේ දී පහත දක්වා ඇති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

A. අධ්‍යාපනික ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම සහ නැවත මුද්‍රණය කිරීම (පෝස්ටර්, පත්‍රිකා, පොත් පිංච සහ වීඩියෝ)

පත්‍රිකා සහ පෝස්ටර් තොරතුරු බෙදා හැරීමේ ඵලදායී සන්නිවේදන මෙවලම් ලෙස පිළිගැනේ. 2022 දී පත්‍රිකා දෙකක් සහ උපදේශන වීඩියෝවක් සකස් කිරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය වෙත ලබා දී ඇත. කෙසේ වෙතත්, රජය විසින් දක්වා ඇති අරමුදල් සීමා කිරීම් හේතුවෙන් නව පත්‍රිකා හෝ පෝස්ටර් 2022 වර්ෂයේදී මුද්‍රණය නොකිරිණි.

2022 වර්ෂය තුළදී පෝස්ටර් 18488 ක් (කාණ්ඩ 9 ක්), අත්පොත් 237 ක් (කාණ්ඩ 9 ක්), සිංහල සහ දෙමළ භාෂාවලින් පත්‍රිකා 25,855 ක් (කාණ්ඩ 8 ක්) සහ අධ්‍යාපනික වීඩියෝ 244 ක්, ප්‍රවෘත්ති පත්‍ර 12,330 ක්, සොබාකෙත සඟරා 365 ක්, සීඩී තැටි 37 ක්, නිෂ්පාදනය කර ආයතන 37ක්, පාසල් 12ක්, විශ්වවිද්‍යාල 10ක්, රෝහල් 02ක්, දහම් පාසල් 02ක් අතර සහ විවිධ පුද්ගලයන්ගේ ඉල්ලීම් අනුව බෙදා දී ඇත.

ඉහත සඳහන් කළ අධ්‍යාපනික ද්‍රව්‍යවලට අමතරව, වීඩියෝ 04 ක් සැකසීම සහ නිෂ්පාදනය කිරීම අවසන් කරන ලදී. ඒවා පහත පරිදි වේ.





FIGURE 36 : අපජල කළමනාකරණය පිළිබඳ වාර්තා වැඩසටහන

1. අනුරාධපුර, යාපනය, කුරුණෑගල ප්‍රදේශයේ ස්ථාපිත වායු තත්ත්ව මනින උපකරණ පිළිබඳ වාර්තා වැඩසටහන.

2. පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ අධ්‍යාපනික වීඩියෝව

3. දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනයේ කාබනික ගොවිතැන පිළිබඳ වාර්තා වැඩසටහන.

B. මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ සහයෝගයෙන් ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.

ප්‍රදර්ශන, විවිධ පාරිසරික ගැටළු පිළිබඳ තොරතුරු බෙදා හැරීම සඳහා විශාල අවස්ථාවක් සපයයි. පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ සහයෝගයෙන් එවැනි ප්‍රදර්ශන සංවිධානය කරනු ලැබේ. පාසල්, විශ්වවිද්‍යාල, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන වැනි විවිධ ස්ථානවල පවත්වන ලද ප්‍රදර්ශන 09කට ප්‍රදර්ශන ඒකකය ලබා දී මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 2022 වර්ෂයේදී ප්‍රදර්ශන 09 ක් සඳහා සහභාගී විය.





FIGURE 37: විවිධ ආයතනවල පවත්වන ලද ප්‍රදර්ශනවල විශේෂ අවස්ථා

C. සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල (NFC) හි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ස්වභාවික පරිසරයක් තුළ දී ඵලදායී ආකාරයෙන් දැනුම්වත්භාවය වැඩි කිරීමට අවස්ථා සැපයේ. **සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ඇති** ස්වභාවික පරිසරයක සහ ස්වභාවික සෞන්දර්ය සහිත පසුබිමක මිනිසුන්ට එකිනෙකා සමඟ අන්තර් ක්‍රියා කළ හැකිය. 2022 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් අත්තිඩිය, කුණ්ඩසාලේ, රූමස්සල, රන්දෙණිය-කෑගල්ල ස්වභාවික ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල දී මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ එක්ව පාසල් ළමුන් සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 27ක් පවත්වන ලදී.





FIGURE 38 : අත්තිඩිය සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය

FIGURE 39 : රූමස්සල සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය

D. විවිධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා කාලීන ගැටලු, ඩෙංගු සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

සහයෝගය සහ උනන්දුව වැඩි දියුණු කිරීම, ක්‍රියාමාර්ග ගැනීමට ජනතාව පෙළඹවීම සහ පාරිසරික ආරක්ෂාව සඳහා දේශීය දැනුම සහ සම්පත් බලමුලු ගැන්වීම සඳහා මහජනතාව දැනුම්වත් කිරීම අත්‍යවශ්‍ය වේ. විවිධ ඉලක්ක කණ්ඩායම් අතර දැනුම්වත්භාවයේ මට්ටම ඉහළ නැංවීම පිණිස වත්මන් පාරිසරික ගැටළු විසඳීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් පවත්වනු ලැබේ. ඉලක්ක කණ්ඩායම් දැනුම්වත් කිරීම ඒකකයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකකි.

2022 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් වර්තමාන පාරිසරික ගැටළු විසඳීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ සහ ඉන් පිටත ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පවත්වන ලදී.

I. මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.

a. විශ්ව විද්‍යාලයේ සිසුන් තුළ පාරිසරික දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ඉල්ලීම පරිදි කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයේ පළමු වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා විශේෂ පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.




b. පරිසර සංරක්ෂණය සහ පාරිසරික නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම පිණිස බස්නාහිර පළාතේ පොලිස් නිලධාරීන් සඳහා විශේෂ පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.




c. දුම්රිය ස්ථාන පරිශ්‍රයේ පිරිසිදු, හරිත හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ඇති කිරීම සඳහා හරිත දුම්රිය ස්ථාන තරඟාවලිය වෙනුවෙන් එකම විෂයයන් යටතේ කොළඹ, නාවලපිටිය සහ අනුරාධපුර කලාපයේ දුම්රිය ස්ථානාධිපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් 3ක් පවත්වන ලදී.







FIGURE 40 : අනුරාධපුර කලාපය සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනේ විශේෂ අවස්ථා

IV. මධ්‍යම පරිසර අධිකාරියෙන් පිටත පවත්වනු ලබන වැඩසටහන්.

පාසල්, විශ්ව විද්‍යාල, කර්මාන්ත සහ තවත් බොහෝ ආයතන වැනි බාහිර කණ්ඩායම් විසින් පවත්වනු ලබන වැඩසටහන්වල දී ඔවුන්ගේ ඉල්ලීම් අනුව පරිසර ප්‍රවර්ධන ඒකකයේ නිලධාරීන් සම්පත් දායකයින් ලෙස දේශන පවත්වන ලදී. 2023 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් කොඩිගහකන්ද අසපුව, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ සිසුන්, කොළඹ ආනන්ද විද්‍යාලයේ සිසුන්, අනුර මධ්‍ය විද්‍යාලයේ සිසුන්, ගම්පහ - ලියෝ සමාජයේ සාමාජිකයින්, ස්ට්‍රෙච්ලයින් පුද්ගලික ආයතනය, ප්‍රිම් ඉන්ටිමේට්ස් ලංකා, ටෙක්ස්ලාන් ආයතනය, මැලිබන් පුද්ගලික ආයතනය, බියගම මාස් අයති ආයතනය, සහ මීඩාස් සේෆ්ටි ආයතනය යන ආයතනවල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්, මුල්ලේරියාව මූලික රෝහල සහ කළුතර සෙත්සරණ පදනම යන ආයතනවල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පවත්වා ඇත. මෙම සෑම වැඩසටහනකදීම සහභාගිවන්නන් අතර පෝස්ටර් සහ පත්‍රිකා බෙදාහරින ලදී.



FIGURE 41 : ගම්පහ අනුර මධ්‍ය මහා විද්‍යාලයේ දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

III. Webinars / Zoom තාක්ෂණය භාවිතයෙන් පවත්වනු ලබන වැඩසටහන්.


කොවිඩ් 19 වසංගත සමයේ සෞඛ්‍ය අවශ්‍යතා නිසා දැනුම්වත් කිරීම් සහ අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත ස්ථානයකට විශාල ප්‍රේක්ෂක පිරිසක් එක්රැස් නොකිරීමට උපදෙස් ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විවිධ කර්මාන්තවලින් ලැබෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේදී පහත සඳහන් දැනුවත් කිරීම් සිදු කිරීමට Zoom තාක්ෂණය භාවිතා කිරීමට පරිසර ප්‍රවර්ධන ඒකකය ට සිදු විය. 2022 දී, මධ්‍යම පරිසර අධිකාරියේ Zoom ගිණුම ද අලුත් කරන ලදී.

a. රාගම වෛද්‍ය පීඨයේ පශ්චාත් උපාධි සිසුන් (මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති) සඳහා “ඝන සහ අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය” පිළිබඳ Zoom තාක්ෂණය යොදා ගනිමින් ආරාධිත දේශනයක් පවත්වන ලදී.

b. කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා" ක්‍රීඩා ඉසව්වලදී අපද්‍රව්‍ය කළමනාකරණය" සහ "පරිසර සංරක්ෂණය" යන මැයෙන් දේශන පැවැත්වීම සඳහා Zoom තාක්ෂණය භාවිතා කරන ලදී.

c. බියගම මාස් අයති ආයතනයේ විධායක කාර්ය මණ්ඩලය සඳහා ටීම්ස් තාක්ෂණය යොදා ගනිමින් දින 2ක දී ආරාධිත දේශන දෙකක් පවත්වන ලදී.





F. සංස්කෘතික උත්සව සඳහා වැඩසටහන් පැවැත්වීම

මධ්‍යම පරිසර අධිකාරියේ දැක්ම, මෙහෙවර සහ ISO ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ජනතාව අතර දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා, පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් දිවයින පුරා පවත්වනු ලබන සංස්කෘතික උත්සවවලදී දැනුම බෙදාහැරීම සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම ඇතුළත් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සංස්කෘතික උත්සවවල දී උත්සවාකාර සැමරුම් පවත්වයි. මෙම සංස්කෘතික උත්සවවලට සැලකිය යුතු ප්‍රජා සහභාගීත්වයක් ලැබේ. පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් දැනුම බෙදා හැරීම (පත්‍රිකා බෙදා හැරීම, පෝස්ටර් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම) සහ ජනනය වන කුණු ඉවත් කිරීම සඳහා සිදු කරනු ලබන පිරිසිදු කිරීමේ වැඩසටහන් හරහා මහජනතාව තුළ දැනුම්වත්බව ඉහළ නැංවීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් පවත්වයි. මෙම ක්‍රියාකාරකම යටතේ 2022 වර්ෂය තුළ සංස්කෘතික උත්සව 2ක් පවත්වා ඇත.

- 2022 ශ්‍රීපාද වන්දනාවේ දී බැනර් 30 ක් නිෂ්පාදනය කර ප්‍රදර්ශනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ දැක්ම පිළිබඳව මහජනතාව දැනුවත් කරන ලද අතර, ඒ සෑම එකක්ම කසළ කළමනාකරණයට සුදුසු දැනුවත් කිරීමේ පණිවිඩ බෙදා හැරීම සඳහා භාවිතා කරන ලදී.
- අපද්‍රව්‍ය කළමනාකරණයට උචිත දැනුවත් කිරීම් සහිත බැනර් යොදා ගනිමින් මෙවැනිම දැනුවත් කිරීමේ වැඩසටහනක් තලවිල ආගමික උත්සවයේදී සිදුකෙරිණි.




F. රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රුක් රෝපණය කිරීම ශබ්ද සහ වායු දූෂණය නිවැරදි කිරීම සඳහා හොඳම ක්‍රමයකි. රුක් රෝපණය සමස්ත ජෛවගෝලය ආරක්ෂා කිරීම සඳහා සහය වන අතර ප්‍රදේශයේ සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කරයි. මධ්‍යම පරිසර අධිකාරියේ දැක්ම ට අනුව පිරිසිදු, හරිත හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ඇති කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම බෙහෙවින් උචිත වේ. මේ අනුව, 2022 වර්ෂයේ දී, කොළඹ, ගාල්ල, කළුතර, කිලිනොච්චි සහ යාපනය දිස්ත්‍රික්කව පැල 6650 ක් රෝපණය කිරීමෙන් රුක් රෝපණ වැඩසටහන් අටක් ("හුස්ම දෙන තුරු") සාර්ථකව නිම කරන ලදී.




G. විශේෂ දින වැඩසටහන් සහ අනෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සාමාන්‍ය ජනතාව තුළ පරිසර සංරක්ෂණය සහ පරිසර දූෂණය පාලනය පිළිබඳ දැනුම්වත්බව වැඩිකිරීම සඳහා විවිධ අංශ අතර සහ ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම පිණිස පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මිහිතල දිනය, කාන්තා දිනය, ලෝක පරිසර දිනය වෙනුවෙන් වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කරන ලදී.

විශේෂ දින වැඩසටහන් සහ අනෙකුත් වැඩසටහන් පැවැත්වීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් තරඟ ක්‍රියාත්මක කරන ලද අතර දිස්ත්‍රික් මට්ටමේ තරඟයක් සම්පූර්ණ කිරීමට සියලුම දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

a. මිහිතල දිනය සැමරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ විශේෂ වැඩසටහනක් පවත්වන ලදී.





b. 2022 ජූනි 5 වැනි දින ලෝක පරිසර දිනය සමරමින්, පෙර වසරවල මෙන්ම, මානව සමාජයේ සමෘද්ධිය කෙරෙහි අවධානය යොමු කරන පරිසර හිතකාමී සංකල්ප, ක්‍රමවේදයන් සහ භාවිතයන් යෙදූ "පරිසර හිතකාමී කුඩා පරිමාණ ව්‍යාපෘති" පිළිබඳ තරඟයක් පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලදී. පාරිසරික තිරසාරත්වය සමඟ. පරිසර දූෂණය අවම කිරීම, පරිසර පද්ධති යථා තත්ත්වයට පත් කිරීම, වෘක්ෂලතා ආවරණය වැඩි කිරීම, කාබනික ගොවිතැනට සහාය වීම, පොලිතින් සහ ප්ලාස්ටික් භාවිතය අධෛර්යමත් කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම එහි ප්‍රධාන අරමුණු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම තරඟ සඳහා ව්‍යාපෘති කාණ්ඩ කිහිපයක් ඉදිරිපත් කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් අදාළ නියෝජිතායතන වලින් සැදුම්ලත් සමාලෝචන මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනමන ලදී.

මීට අමතරව ජූනි 5 වන දින ලෝක පරිසර දිනය සැමරීම සඳහා Zoom හරහා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර දැනුම බෙදා හැරීම සඳහා දේශන 4 ක් පවත්වන ලදී.

H. ජනාධිපති පරිසර සම්මාන

තිරසාර පරිසරයක් පවත්වා ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ පාසල්, පොලිස් ස්ථාන, කර්මාන්තශාලා, රෝහල් , මාධ්‍ය ආයතන වැනි රජයේ සහ රාජ්‍ය නොවන ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් වාර්ෂිකව ජනාධිපති පාරිසරික සම්මාන ප්‍රදානෝත්සවය පවත්වනු ලැබේ. 2022 දෙසැම්බර් වන විට පරිසර ප්‍රවර්ධන ඒකකයෙන් මාධ්‍ය අංශයේ ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇත.

I. "සොබාකෙත" සඟරාව ප්‍රකාශයට පත් කිරීම

සොබාකෙත සඟරාව වසරකට වරක් නිකුත් වන පරිසර ප්‍රකාශනයකි. එහි වර්තමාන පාරිසරික ගැටළු සහ නැගී එන පාරිසරික ප්‍රවණතා පිළිබඳ ලිපි අඩංගු වේ.

පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මිල ගණන් කැඳවීමේ ක්‍රියාපටිපාටිය හරහා මුද්‍රණ ආයතනයක් තෝරාගන්නා ලදී. සඟරාව සඳහා වෘත්තිකයන්ගෙන් සහ වෙනත් ලේඛකයන්ගෙන් ලිපි එකතු කරන ලද අතර සෝබාකෙත සඟරාව සඳහා ගුවන් විදුලි සාකච්ඡා වැඩසටහන්වල ලිපි කිහිපයක් නැවත ලිවීම සහ සංස්කරණය කිරීම සිදු කරන ලදී . 2022 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් "සොබාකෙත"සඟරාවේ පිටපත් 1500ක් **මුද්‍රණය** කරන ලදී.





ගරු පරිසර අමාත්‍ය නසීර් අහමඩ මහතා 2022 දෙසැම්බර් 9 වන දින පැවැත්වූ රාජ්‍ය නොවන සංවිධාන වැඩසටහනේදී සොබාකෙත සඟරාව එළිදැක්වීමට සහභාගී විය.

තවද, සඟරාවේ මුද්‍රිත පිටපත් සියලුම ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවලට, අනෙකුත් ඉලක්කගත ප්‍රේක්ෂකයින්ට සහ ප්‍රදර්ශන සහ දැනුවත් කිරීමේ ව්‍යාපාරවලදී ප්‍රේක්ෂක ඉල්ලීම මත ලබා දෙන ලදී.

I. පරිසර පුවත් සඟරාව මුද්‍රණය කිරීම

පරිසර ප්‍රවර්ධන ඒකකයෙන් සෑම වසරකම පරිසර පුවත් පත්‍රිකා දෙකක් ප්‍රකාශයට පත් කරන අතර එයින් ජාතික පාරිසරික ක්‍රියාකාරකම් මෙන්ම පාරිසරික නියමුවන්ගේ ක්‍රියාකාරකම් ඉස්මතු කරයි. කෙසේ වෙතත්, මෙම වසරේ මූල්‍යමය සීමාකිරීම් හේතුවෙන් පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් එක් පුවත් සඟරාවක් පමණක් මුද්‍රණය කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ විශේෂ පාරිසරික දින සඳහා පවත්වන ලද නවතම ක්‍රියාකාරකම්, පාරිසරික නීති, ස්වභාවික සම්පත් කළමනාකරණය ට අදාළ රෙගුලාසි සහ පාඨක රුචිකත්වය වැඩිදියුණු කිරීම සඳහා විවිධ කණ්ඩායම් විසින් ලියන ලද කවි නිර්මාණ සඳහා කැප වූ පිටුවක් ද පරිසර පුවත් සඟරාවේ අඩංගු වේ.

ඉහත විස්තර කර ඇති තොරතුරු ඇතුළත් පරිසර පුවත් සඟරාවක් නිෂ්පාදනය කර, මුද්‍රණය කර, **2022** වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් **වෙත බෙදාහරින ලදී.**

II. වෙනත් ක්‍රියාකාරකම්

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව 2022 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් පහත ක්‍රියාකාරකම් ද ඉටුකරන ලදී.

a. ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳව සොයා බැලීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පරිශ්‍රයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහනක් පැවැත්වීම.

මධ්‍යම පරිසර අධිකාරියේ **පරිසර ප්‍රවර්ධන ඒකකයේ විෂයභාර** නිලධාරීන් විසින් ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝවන ස්ථාන සෙවීම සඳහා සතිපතා ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. නිරීක්ෂණ වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස නිරීක්ෂණය කරන ලද රෝග වාහක මදුරුවන් ගේ අභිජනන වාසස්ථාන පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. වාහක මදුරුවන්ගේ අභිජනන ස්ථාන ගණනාවක් ඉවත් කරන ලද අතර බලයලත් නිලධාරීන්ගේ උපදෙස් අනුව ඉදිකිරීම්වල වෙනස් කිරීම් සිදුකරවන ලදී.







FIGURE 42 : ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගැනීම සඳහා සිදුකරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහන්

b. බාලදක්ෂිකාවන්ගේ මිහිතල පදක්කම් පරීක්ෂනය පැවැත්වීම

පරිසර ප්‍රවර්ධන ඒකකයේ බලයලත් නිලධාරිනියක් බාලදක්ෂිකාවන්ගේ “මිහිතල සුරකින්නිය" පරීක්ෂණය සඳහා පරීක්ෂණයක් පවත්වයි. 2022 වර්ෂයේදී බාලදක්ෂිකාවන් 10 දෙනෙකුට ඔවුන්ගේ විභාග සඳහා සූදානම් වීමේ උපදෙස් ලබා දී “මිහිතල සුරකින්නිය" පදක්කම් පරීක්ෂණය මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරන ලදී.

c. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ප්‍රවර්ධන ඒකකය මඟින් රාජ්‍ය නොවන සංවිධාන වඩා හොඳින් හඳුනා ගැනීම සහ පරිසර සංරක්ෂණය සහ ආරක්ෂාව සඳහා ප්‍රජා සහයෝගය ලබා ගැනීමට අදාළ සංවිධානවලට ලියාපදිංචි වීමට ඉඩ සලසා ඇත.

2022 වර්ෂය තුළ සිවිල් සමාජයෙන් රාජ්‍ය නොවන සංවිධාන හතරක් මෙම ක්‍රියාකාරකම සඳහා ලියාපදිංචි වී ඇති අතර පරිසර නියමු වැඩසටහනේ රන් පදක්කම ලබා ගැනීමේ නිර්ණායකයට අනුව පරිසර නියමුවන් 29 දෙනෙකු ද තම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කර ඇත.

රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචියට සමගාමීව ප්‍රජාව තුළ ඔවුන්ගේ පාරිසරික ගැටලු සඳහා විසඳුම් සකස් කිරීම පිණිස දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී. වැඩමුළුවෙන් පසුව, වට්ස්ඇප් සමූහයක් නිර්මාණය කරන ලද අතර, සමස්ත සංරක්ෂණ ප්‍රයත්නය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම පිණිස විවිධ ප්‍රදේශ අතර සම්බන්ධතා ස්ථාපිත කරන ලදී.




d. මාධ්‍ය කටයුතුවල නිරත වූ තෝරාගත් මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ගේ මාධ්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසියක් පැවැත්විණි.

J. පරිසර ප්‍රවර්ධන ඒකකයේ මාධ්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රගතිය - 2022

ඒකකයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරන ලදී. ඉහත සඳහන් කර ඇති ගැටළු පිළිබඳ මහජනතාවගේ දැනුම වැඩි කිරීම පිණිස, පරිසර සංරක්ෂණය සහ ආරක්ෂාව කෙරෙහි සක්‍රීය ප්‍රජා සහභාගීත්වය ලබාගැනීම දිරිමත් කිරීම සඳහා සහ පාරිසරික ගැටළු සහ දැනට මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳව සාමාන්‍ය ජනතාව සමඟ සන්නිවේදනය කිරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය ක්‍රියාකාරකම් කිහිපයක නිරත වේ.

ජනතාව දැනුවත් කිරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය පහත සඳහන් ක්‍රියාමාර්ගවල නිරත වී ඇත.

I.. “සොබාකෙත” ගුවන්විදුලි වැඩසටහන විකාශය

පාරිසරික ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය පිළිබඳ පණිවිඩය බෙදා හැරීම සඳහා “සොබාකෙත” ත ගුවන් විදුලි වැඩසටහන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 94.3/94.5 සංඛ්‍යාතයෙන් විකාශනය කරන ලදී. සෑම ඉරිදා දිනකම පෙරවරු 8.00 සිට 8.30 දක්වා මෙම වැඩසටහන ඉදිරිපත් කෙරේ. පරිසරය සම්බන්ධ ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමෙන් වැඩසටහන පිළිබඳ ප්‍රතිපෝෂණ සැපයීමට සවන්දෙන්නන්ට හැකි වේ. සම්පත් දායකයින් 28 දෙනෙකුගේ සහාය ඇතිව, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව විසින් 2022 දී සෝබාකෙත ගුවන් විදුලි වැඩසටහන් 52ක් විකාශය කරන ලදී.







“සොබාකෙත” ගුවන් විදුලි වැඩසටහනට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ සම්පත් දායකයින්ගේ පරිසර සම්බන්ධ ගුවන් විදුලි සාකච්ඡා 08ක් විකාශය කිරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් ලක්විරු, ලක්හඬ, ලක් FM සහ ශ්‍රද්ධා ගුවන්විදුලි නාලිකා සමඟ සම්බන්ධීකරණය කර ඇත.

II. සමාජ මාධ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මුහුණු පොත සහ යූ ටියුබ් හරහා මාධ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කරයි.







FIGURE 43 : මුහුණු පොතට සිදුකළ උඩුගත කිරීම්

පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් පුළුල් ලෙස ප්‍රේක්ෂකයින් ඇමතීමට පුවත්පත් ලිපි සහ වෙළඳ දැන්වීම් හරහා මාධ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කරයි. 2022 තුළ පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් මුහුණු පොතට සිදුකළ උඩුගත කිරීම් 450ක්, පුවත්පත් ලිපි 24ක්, වෙබ් උඩුගත කිරීම් 20ක්, රූපවාහිනී සාකච්ඡා 23ක්, මාධ්‍ය නිවේදන 7ක් සහ මාධ්‍ය සාකච්ඡා 3ක් සිදු කර ඇත. ඉහත ක්‍රියාකාරකම් සඳහා මාධ්‍ය සම්බන්ධීකරණය අවසන් කර ඇති අතර ශ්‍රව්‍ය දෘශ්‍ය කණ්ඩායම පාරිසරික සිදුවීම් 63ක් ආවරණය කර ඇත.


III. තනි භාවිත ප්ලාස්ටික් තහනම් කිරීම පිළිබඳ මාධ්‍ය වැඩසටහන.

තනි භාවිත ප්ලාස්ටික් තහනම් කිරීමට අදාළ රජයේ රෙගුලාසිවලට සමගාමීව, පරිසර ප්‍රවර්ධන ඒකකය විසින් එක්සත් රාජධානියේ Cefas (Centre for Environment, Fisheries and Aquaculture Science) ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා හරහා “තනි භාවිත ප්ලාස්ටික් තහනම් කිරීම” පිළිබඳ දීපව්‍යාප්ත මාධ්‍ය වැඩසටහනක් පවත්වන ලදී. මෙම කටයුත්ත සඳහා **Cefas**

ව්‍යාපෘතිය විසින් රුපියල් මිලියන 40ක් පමණ පරිත්‍යාග කරන ලදී. ඉහත සඳහන් ප්‍රවර්ධන ද්‍රව්‍ය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිෂ්පාදනය කරන ලදී. මෙම මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන මාස 3ක පමණ කාලයක් ක්‍රියාත්මක විය.







පුවත්පත් දැන්වීම් ගණන - 08,

නාට්‍ය සංඛ්‍යාව – 04,

මහජන නිවේදන සංඛ්‍යාව - 04,

වීඩියෝ ගණන - 04

පුවත්පත් - මව්බිම, ලංකාදීප, ද මෝනිං, අරුණ, සන්ඩේ ඔබ්සවර්, සිළුමිණ, වීරකේසරි, සන්ඩේ ටයිම්ස්.

ගුවන්විදුලිය - ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, යර්ස් fm, සිරස fm, ශක්ති, හිරු , Sun, සූරියන්, දෙරණ, ලක්හඬ

රූපවාහිනිය - ස්වාධීන රූපවාහිනී සංස්ථාව, ඩයලොග්, සිරස, හරිත,ශක්ති, දෙරණ, හිරු , ස්වර්ණවාහිනී,

2022 වර්ෂයේදී ප්‍රජාවට ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ පරිසර ප්‍රවර්ධන ඒකකය 2022 සඳහා වෙන් කළ අයවැයෙන් 100%කට වඩා ඉලක්ක සපුරා ගෙන ඇත.

7.3. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය



ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාරිසරික තොරතුරු බෙදාහරින නාභික මධ්‍යස්ථානය වේ. මෙහි ප්‍රධාන කාර්යය වන්නේ පාරිසරික තොරතුරු අත්පත් කරගැනීම, එම තොරතුරු සංවිධානය කිරීම සහ බෙදා හැරීමයි.

A. පරිසර අධිකාරියේ පළාත් කාර්යාල තුළ පරිසර පුස්තකාල පිහිටුවීම.

I. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය විසින් පොත්පත් 1143ක් (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසී භාෂා තුනෙන්) ද පොත් කබඩ් 04ක් ද ගම්පහ සහ කන්තලේ කාර්යාල සඳහා ලබා දී ඇත.



B. පුස්තකාල එකතු සංවර්ධනය

I. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය 114 ක් විෂයානුබද්ධ පොත්පත් පුස්තකාල එකතුව සඳහා අත්පත්කරගෙන ඇත. පොත් 54ක් පරිත්‍යාග ලෙස ද, මූලික පාරිසරික වාර්තා/ පරිසර බලපෑම් වාර්තා 36 ක් ද පුස්තකාල එකතුවට අත්පත්කරගෙන ඇත.

C. ප්‍රලේඛන සේවා සහ පුස්තකාල පිරිසැකසුම්කරණය

I. පුස්තකාල දත්ත පදනමට සහ විද්‍යුත් තැම්පතුව සඳහා දත්ත 578 ක ප්‍රමාණයක් ඇතුලත්කර ඇත.

II. පොත්පත් 187 ප්‍රතිග්‍රහණය කර ඇති අතර පුස්තකාල සාමාජිකත්ව 22ක් ලබා දී ඇත.



D. පාරිසරික තොරතුරු හුවමාරු කර ගැනීම

I. විද්‍යුත් තැපැල් සහ දුරකථන මාර්ගයෙන් පාඨකයන් 650ක් පාරිසරික දැනුම අත්පත් කරගෙන ඇති අතර පොත් 2275ක් බැහැරගෙන ගොස් ඇත. විදේශීය පාඨකයින් 3245ක් පරිසර අධිකාරියේ විද්‍යුත් තැම්පතුව මාර්ගයෙන් තොරතුරු අත්පත්කරගෙන ඇත.

II. පාරිසරික පෝස්ටර් 1759ක් බෙදාහැර ඇත.

III. පහත සඳහන් සේවා පවත්වාගෙන යාම වෙනුවෙන් රු. 40,055.00 ක ආදායමක් උපයා දී ඇත.

- පාරිසරික බලපෑම් ඇඟයීම් වාර්තා / මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා - 37
- ඡායා පිටපත් - පිටු 283



E. වෙනත් ක්‍රියාකාරකම්

I. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය උදෙසා වෙබ් අඩවියක් සහ මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර වක්‍රලේඛ සඳහා දත්ත පදනමක් නිර්මාණය කර පාරිසරික තොරතුරු බෙදාහරින ලදි.

Chapter 8 : සැලසුම් හා පසුවිපම් ඒකකය

සැලසුම් ඒකකයේ මූලික කාර්යභාරය වන්නේ ජාතික පාරිසරික පනතේ දක්වා ඇති සියලුම නියාමන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක ක්‍රිරීම සඳහා දිගුකාලීන හා කෙටි කාලීන ඉලක්ක සැකසීම සමඟ උපාය මාර්ග සැකසීම හරහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිරිනමනු ලබන සේවා සැපයීම සහතික කිරීමයි.

සැලසුම් ඒකකය විවිධ ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කරමින් සැලසුම් ක්‍රියාවලියට නායකත්වය දුන් අතර, ආයතනික සැලැස්ම මත පදනම්ව සකස් කරන ලද මෙහෙයුම් සැලසුම්. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රගතිය සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ අදාළ පාර්ශ්වකරුවන් වෙත වාර්තා කිරීම සඳහා මෙම ඒකකය වගකීම දරයි. ඒ අනුව සැලසුම් ඒකකයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සාරාංශ කෙරේ.

A. සංයුක්ත සැලැස්ම සකස් කිරීම.

සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ ඉදිරි වසර පහ සඳහා පිහිටුවා ඇති කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව යොදා ගනිමින් රජයේ පවතින සංවර්ධන ක්‍රියාවලිය පහසු කරවීම සහ සංවර්ධන ක්‍රියාවලියේ සංවර්ධන උපාය මාර්ග කළමනාකරණය කිරීමයි.. ඒ අනුව, සෑම වසර පහකට වරක්, අධිකාරියේ සියලුම අංශ, ඒකක, පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල සහභාගීත්වයෙන් සැලසුම් ඒකකය සංයුක්ත සැලැස්ම සකස් කරයි. වාර්තාකරණ කාල සීමාව තුළ, සැලසුම් ඒකකය 2022 සිට 2025 දක්වා කාලසීමාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර ඇත.

B. මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව සකස් කිරීම

අධිකාරිය ලබා ඇති ප්‍රගතිය අදාළ පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ වාර්ෂික වාර්තාවයි. ඒ අනුව, සැලසුම් ඒකකය විසින් වාර්ෂිකව සියලුම කොට්ඨාශ, ඒකක, පළාත් කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රගතිය එක්රැස් කර ඒවා එක වාර්තාවකට සම්පාදනය කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

C. වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම, පසු විපරම් කිරීම, වාර්තා කිරීම සහ අධීක්ෂණය

- භාණ්ඩාගාර අරමුදල් හරහා ක්‍රියාත්මක කරන ක්‍රියාකාරී සැලසුම්

සැලසුම් ඒකකය විසින් භාණ්ඩාගාරයේ අරමුදල් සපයන ව්‍යාපෘතිවල මාසික පසු විපරම්, ප්‍රගති වාර්තා කිරීම, අධීක්ෂණය සහ අදාළ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සිදු කරයි.

- මධ්‍යම පරිසර අධිකාරියේ ඉපැයීම් හරහා ක්‍රියාත්මක ක්‍රියාකාරී සැලසුම්.

මධ්‍යම පරිසර අධිකාරියේ ඒකක 16 මගින් ක්‍රියාත්මක කෙරෙන විධිමත් සංවර්ධන ක්‍රියාකාරකම් / සංවර්ධන මූලපිරීම් සැලසුම් ඒකකය මාසිකව පසුවිපරම් කරයි. මෙම ක්‍රියාකාරී සැලසුම් මාසිකව පසුවිපරම් කෙරෙන අතර ප්‍රගතිය අදාළ පාර්ශවකරුවන් වෙත වාර්තා කරනු ලැබේ.

D. නව ව්‍යාපෘති යෝජනා

නව ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සැලසුම් ඒකකය මධ්‍යම පරිසර අධිකාරියේ තාක්ෂණික ඒකක සම්බන්ධීකරණය කිරීම සහ සහාය වීම. තවද, එවැනි ව්‍යාපෘති යෝජනා සඳහා රේඛීය අමාත්‍යාංශයෙන්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සැලසුම් අංශය මඟින් සපයයි.

E. රැස්වීම්

- තීරණ ගැනීමේ කමිටුව, කළමනාකරණ කමිටු රැස්වීම ක්‍රියාත්මක කිරීම
- තීරණ ගැනීමේ රැස්වීම්

පාරිසරික බලපෑම් ඇගයීම් (EIA), මූලික පාරිසරික අධ්‍යන (IEE), පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLs) 'A', 'B' සහ 'C' කාණ්ඩ නිකුත් කිරීම සඳහා සාකච්ඡා කිරීමට සහ අනුමැතිය ලබා දීමට මසකට වරක් අධීක්ෂණ කමිටුව රැස්වේ. BOI කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ, අනුමත කිරීමේ ක්‍රියාවලියේ ගැටළු තිබේ නම් පමණි. 2022 වර්ෂය තුළ තීරණ ගැනීමේ කමිටු රැස්වීම් 06ක් පවත්වන ලදී.

- **කළමනාකරණ කමිටු රැස්වීම්**

කළමනාකරණ කමිටු රැස්වීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන් සහභාගී වේ. මෙම රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ කළමනාකරණ ගැටළු සමථයකට පත් කිරීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමයි. රැස්වීමේදී ගනු ලබන තීරණ සම්බන්ධීකරණය, වාර්ථා සකස් කිරීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේ ඒකකය සිදු කරයි.

වසංගත තත්ත්වය හේතුවෙන් සහ රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, 2022 වර්ෂය

තුළ භෞතික කම්බු රැස්වීම් නොපැවැත්විණි. කෙසේ වෙතත්, කළමනාකාරීත්ව ගැටළු දුරකථන සාකච්ඡා මගින් සාකච්ඡා කරන ලදී.

F. වාර්තා කිරීම

• සැලසුම් ඒකකය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව යනාදියට වාර්තා කරයි.

• සැලසුම් ඒකකය කාර්ය සාධන වාර්තා, කැබිනට් නිරීක්ෂණ, පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු අවශ්‍යතාවයන් පැණනැගුණු විට සකස් කරයි.

G. වෙනත් ක්‍රියාකාරකම්

I. පවතින විදුලි පද්ධතිය සූර්ය පැනල පද්ධතියක් බවට පරිවර්තනය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරියේ ගොඩනැගිල්ලේ වහලයේ 300KW සූර්ය පැනල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අයවැය යෝජනාවලින් මුදල් ලබා ගැනීම සඳහා සැලසුම් ඒකකය ව්‍යාපෘති යෝජනාවක් සකස් කළේය. මෙම යෝජනාව පරිසර අමාත්‍යාංශය සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. එහෙත් රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් එම ව්‍යාපෘතිය අත්හිටුවීමට සිදුව තිබේ. මේ අතර, මධ්‍යම පරිසර අධිකාරිය ඉන්දියානු ණය මාර්ගයෙන් අරමුදල් ඉල්ලා ඇති අතර එයට ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී තිබේ.

II. ජනාධිපති පරිසර සම්මානය

සැලසුම් ඒකකය විසින් ජනාධිපති පාරිසරික සම්මාන උළෙලේ 'හොඳම පරිසර හිතකාමී පෞද්ගලික අංශයේ ආයතනය' කාණ්ඩය හසුරුවන ලද අතර, ඇගයීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් අනතුරුව විශේෂඥ මණ්ඩලයක් හරහා රන් පදක්කම් ලාභියා තෝරා ගන්නා ලදී.

CHAPTER 9 : අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය

අනුකූලතා පසුවිපරම් ඒකකය 2017 වර්ෂයේදී පිහිටුවන ලද අතර එය අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. පසුව 2022 වර්ෂයේදී පැමිණිලි සම්බන්ධීකරණ ඒකකයද මෙම ඒකකයට ඒකාබද්ධ කර මෙම ඒකකය අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය ලෙස වෙනස් කරන ලද අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්) යටතට පත් කරන ලදි. මෙම ඒකකය වෙනස් විෂය පථයන් වන අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි සම්බන්ධීකරණයට අදාලව ක්‍රියාත්මක වුවද පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීම, පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමේ අභිමතාර්ථය ලභාකර ගැනීමේ අවසාන අරමුණ සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

A. අනුකූලතා පසුවිපරම්

මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර / අනුමැතීන් සඳහා අදාල ඒකක සහ පළාත් / දිස්ත්‍රික් කාර්යාල හරහා විධිමත් අනුකූලතා පසුවිපරම් යාන්ත්‍රණයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම අනුකූලතා පසුවිපරම් ඒකකය සතු ප්‍රධාන කාර්යභාරය වේ.

කර්මාන්තකරුවන් / ආයෝජකයින් විසින් ජාතික පාරිසරික පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි හා ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික කර ගැනීම අනුකූලතා පසුවිපරම් ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වේ.

අංක 1534/18 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 2008 අංක 01 දරණ ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග 2022.01.27 දිනැති අංක 2264/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනයට ලක් කරන ලද අතර එමගින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අනුකූලතා පසුවිපරම් කිරීම නීතිගත කර ඇත.

I. අනුකූලතා පසුවිපරම්වලට අදාලව ඒකකයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

a. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර / උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර සඳහා අනුකූලතා පසුවිපරම් යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම.

b. අනුකූලතා පසුවිපරම් යාන්ත්‍රණය දිවයින පුරා විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.

c. ප්‍රාදේශීය කාර්යාල මගින් සිදුකරන අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදය සමලෝචනය කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම.

d. අනුකූලතා පසුවිපරම් හා කර්මාන්ත ආශ්‍රිත පරිසර දූෂණය පාලන විධි සම්බන්ධයෙන් නිලධාරීන් සඳහා ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

II. විධිමත් අනුකූලතා පසුවිපරම් යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම

B. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLs) පසුවිපරම් සිදු කිරීම.

a. අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන තෝරාගත් කර්මාන්ත අනුකූලතා පසුවිපරම් කටයුතු සිදු කිරීම.

2022 වර්ෂයේදී අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර සහිත මහා පරිමාන දූෂකාරක කර්මාන්ත පසුවිපරම් කටයුතු සඳහා තෝරාගන්නා ලද අතර එහිදී ගංගාවල ජලයේ ගුණාත්මකභාවය පවත්වාගැනීම අරමුණු කරගනිමින් කැලණි හා කළු ගංගා ද්‍රෝණිවල පිහිටි කර්මාන්ත සඳහා ඉහල ප්‍රමුඛතාවය ලබාදෙන ලදි.

අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් කර්මාන්ත පසුවිපරම් කටයුතු සිදුකිරීමේදී එම කර්මාන්ත සම්බන්ධයෙන් රාජකාරි කටයුතු සිදුකරනු ලබන ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් සමඟ ඒකාබද්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීමට මූලාරම්භයක් ගත් අතර, ඒ හරහා එම නිලධාරීන්ගේ අනුකූලතා පසුවිපරම් කටයුතු සඳහා පවතින දැනුම තවදුරටත් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

TABLE 38 : 2022 වර්ෂයේදී අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් සිදුකරන ලද කර්මාන්ත අනුකූලතා පසුවිපරම් තොරතුරු

ස්ථානය	අනුකූලතා පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන
කැලණි ගංගා ද්‍රෝණිය	38
කළු ගංගා ද්‍රෝණිය	21

ස්ථානය	අනුකූලතා පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන
වෙනත්	16
එකතුව	75

b. පළාත් / දිස්ත්‍රික් කාර්යාල මගින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර පසුවිපරම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනාගෙන ඇති පරිදි පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මගින්, නිකුත් කර ඇති මාර්ගෝපදේශ අනුගමනය කරමින් දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත අනුකූලතා පසුවිපරම් සැලසුම් 25ක් සකස් කරන ලදි.

පහත වගුව මගින් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මගින් දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද කර්මාන්ත අනුකූලතා පසුවිපරම් තොරතුරු ඉදිරිපත් කර ඇත.

TABLE 39 : 2022 වර්ෂයේදී පළාත් / දිස්ත්‍රික් කාර්යාල මගින් දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද අනුකූලතා පසුවිපරම් සංඛ්‍යාව

දිස්ත්‍රික්කය	සිදුකල අනුකූලතා පසුවිපරම් පරීක්ෂණ සංඛ්‍යාව		
	A කාණ්ඩය	B කාණ්ඩය	එකතුව
කොළඹ	319	169	488
කළුතර	40	2	42
ගම්පහ	73	28	101
ගාල්ල	54	122	176
මාතර	78	89	167
හම්බන්තොට	18	111	129
මහනුවර	119	74	193
නුවරඑළිය	67	74	141
මාතලේ	59	27	86
කෑගල්ල	58	53	111
රත්නපුර	145	121	266
කුරුණෑගල	15	30	45
පුත්තලම	29	14	43
අම්පාර	21	45	66
ත්‍රිකුණාමලය	26	68	94
මඩකලපුව	9	29	38
අනුරාධපුර	37	8	45
පොළොන්නරුව	51	46	97
බදුල්ල	61	35	96
මොණරාගල	16	17	33
යාපනය	79	86	165

දිස්ත්‍රික්කය	සිදුකල අනුකූලතා පසුවිපරම් පරීක්ෂණ සංඛ්‍යාව		
	A කාණ්ඩය	**B කාණ්ඩය**	**එකතුව**
කිලිනොච්චි	22	88	110
මුලතිව්	28	55	83
මන්නාරම	56	70	126
වව්නියාව	82	28	110
එකතුව	**1562**	**1489**	**3051**

II. උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර (SWMLS) පසුවිපරම් කිරීම.

2022 වර්ෂයේදී අපද්‍රව්‍ය උත්පාදන කාණ්ඩය ලෙස උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර සහිත කර්මාන්ත 08 ක් පසුවිපරම් කිරීම උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික කළමනාකරණ ඒකකය සමඟ ඒකාබද්ධව සිදුකරන ලදි.

සැ.යු : රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ ඉන්ධන හිඟවීම හා ප්‍රවාහන කටයුතු සීමා වීම රජයේ චක්‍රලේඛ අනුව නිලධාරීන් කාර්යාලවලට කැඳවීම සීමා කිරීම හා අන්තර් පළාත් ප්‍රවාහනය සීමා වීම වැනි කරුණු හේතුවෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර හා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර සැලසුම් කල පරිදි පසුවිපරම් කිරීම දුෂ්කර විය.

III. ප්‍රාදේශීය කාර්යාල මගින් කරනු ලබන අනුකූලතා පසුවිපරම් කටයුතුවල ඵලදායිතාවය අධීක්ෂණය.

අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් මාසික ප්‍රගති වාර්තා සමාලෝචනයට ලක්කිරීම හා ප්‍රාදේශීය කාර්යාල විසින් පසුවිපරම් සිදුකරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලිපිගොනු සමාලෝචනයට ලක්කිරීම හරහා ප්‍රාදේශීය කාර්යාල මගින් සිදුකරනු ලබන අනුකූලතා පසුවිපරම් කටයුතුවල ඵලදායිතාවය අධීක්ෂණයට ලක්කරනු ලැබේ.

ඒ අනුව, 2022 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල විසින් අනුකූලතා පසුවිපරම් කටයුතු සිදුකරන ලද තෝරාගත් ලිපිගොනු 17 ක් සමාලෝචනය කර හඳුනාගත් අඩුපාඩු අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා අදාල ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කර ඇත.

C. අනුකූලතා පසුවිපරම් හා කාර්මාන්ත ආශ්‍රිත පරිසර දූෂණ පාලන විධි සම්බන්ධව නිලධාරීන්ගේ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

I. උපලේඛණගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයට අදාලව අනුකූලතා පසුවිපරම් සිදුකිරීමේ ඵලදායිතාව වැඩිකිරීමට හා ඒ සම්බන්ධව දැනුම වර්ධනය කිරීම සඳහා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය නිකුත් කිරීමේ ක්‍රමවේදය හා ඊට අදාල ප්‍රායෝගික කරුණු සම්බන්ධව පුහුණු වැඩසටහනක් අනුකූලතා පසුවිපරම් ඒකකයේ නිලධාරීන් සඳහා 2022 අප්‍රේල් මස 21 දින මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

II. ඊට අමතරව පුහුණු අවශ්‍යතා යටතේ හඳුනාගෙන ඇති පරිදි සියළුම පළාත් / දිස්ත්‍රික් කාර්යාල හා අදාල ඒකකවල නිලධාරීන් සඳහා "ස්ථානීය ප්‍රභව විමෝචන පාලන රෙගුලාසි හා එහි යෙදීම් සහ කර්මාන්ත සඳහා වායු දූෂණ පාලන උපක්‍රම" යන මාතෘකා 2 යටතේ එම නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් රසායනාගාරය සමඟ ඒකාබද්ධව මාර්ගගත ක්‍රමය යටතේ 2022 දෙසැම්බර් 22 දින සාර්ථකව පවත්වන ලදි.

D. පැමිණිලි සම්බන්ධීකරණය

මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමුවන මහජන පැමිණිලි දිවයින පුරා ව්‍යාප්තව ඇති පළාත් / දිස්ත්‍රික් කාර්යාල හා අදාල ඒකක සම්බන්ධීකරණය කරමින් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යය වේ.

මෙලෙස යොමුවන පැමිණිලි කළමනාකරණය දී මහජනතාවට ඵලදායී සේවාවක් ලබා දීම සඳහා මෙම ඒකකය මඟින් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකරනු ලැබේ.

I. පැමිණිලි සම්බන්ධීකරණයට අදාලව ඒකකයේ ප්‍රධාන කාර්යයන්

I. පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා පැමිණිලි මෘදුකාංග දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

II. පැමිණිලි යොමු කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක 1981 - ක්ෂණික ඇමතුම් සේවාව පවත්වාගෙන යාම .

III. ගුරු අත්පොත්/මාර්ගෝපදේශ සහ පුහුණු කිරීම් හරහා පැමිණිලි කළමනාකරණ පද්ධතිය ප්‍රමිතිගත කිරීම.

IV. මුළු දියිනම ආවරණය වන පරිදි මාසික ප්‍රගතිය වාර්තා කිරීම.

V. මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට අදාළ නොවන මහජන පැමිණිලි සඳහා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රධාන වශයෙන් 1981 - ක්ෂණික ඇමතුම් සේවාව, ලිපි,විද්‍යුත් තැපෑල (complaint@cea.lk) හා වෙබ් අඩවිය (www.cea.lk) හරහා මහජන පැමිණිලි යොමු වේ.

මහජනතාවට වඩාත් ඵලදායි සේවයක් සැපයීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා මහජන පැමිණිලි යොමු කිරීම සඳහා නව ක්‍රමවේදයක් තොරතුරු තාක්ෂණ ඒකකය හා ඒකාබද්ධව සකස් කරන ලද අතර එම නව ක්‍රමවේදය ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් 2022, ඔක්තෝබර් මස 31 වන දින නිල වශයෙන් මහජනතාවට විවෘත කරන ලදී. මෙම අවස්ථාවට මෙම අධිකාරියේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරල්තුමා ද සහභාගී විය.



FIGURE 44: මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා මහජන පැමිණිලි යොමු කිරීමේ නව ක්‍රමවේදය නිල

මධ්‍යම පරිසර අධිකාරියට ලැබෙන පැමිණිලිවලින් බහුතරයක් 1981- ක්ෂණික ඇමතුම් සේවාව හරහා යොමු වේ. 2022 වර්ෂයේදී මෙම අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි 2463 න් ක්ෂණික ඇමතුම් සේවාව හරහා පැමිණිලි 1407 ක් ලැබී ඇත. එසේම දවසේ පැය 24 පුරා ක්ෂණික ඇමතුම් සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල සමඟ සම්බන්ධීකරණයෙන් නව ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත. මෙම නව ක්‍රමවේදය මඟින් කාර්යාල වේලාවෙන් පසුව, සති අන්තය සහ රජයේ නිවාඩු දිනයන්හිදී ක්ෂණික ඇමතුම් සේවාව කාලසටහනකට අනුව දිස්ත්‍රික් කාර්යාල මඟින් නම් කරන ලද නිලධාරී කණ්ඩායමක් මඟින් පවත්වාගෙන යනු ලැබේ.

මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට අදාළ පැමිණිලි සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් /දිස්ත්‍රික් කාර්යාල සහ අදාළ ඒකක විසින් විමර්ශනය කර ක්‍රියාමාර්ග ගනු ලැබේ. නීතිවිරෝධී වැලි කැණීම්, මැණික් ගැරීම, ප්‍රජා ඝෝෂා (උදා: ශබ්ද විකාශන යන්ත්‍ර වලින් නිකුත් වන ශබ්දය වැනි) ගලී බව්සර් මඟින් අපද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස බැහැර කිරීම වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සහ සාමාන්‍ය ජනතාවට පීඩාවක් වන ඇතැම් පැමිණිලි පොලිස් පරිසර ආරක්ෂණ කොට්ඨාශය යටතේ පිහිටුවා ඇති මධ්‍යම පරිසර අධිකාරියේ පොලිස් විශේෂ ඒකකය වෙත යොමු කෙරේ. පොලිස් විශේෂ ඒකකය දිවයින පුරා පිහිටි පොලිස් ස්ථානවල පරිසර පොලිස් ඒකක හා සම්බන්ධීකරණයෙන් ඉතා කඩිනමින් මෙම පැමිණිලි විමර්ශනය කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2022 වර්ෂයේදී පොලිස් විශේෂ ඒකකය වෙත යොමු කරන ලද පැමිණිලි 227 න් පැමිණිලි 226 ක් විමර්ශනය කර විසඳා ඇත.

II. 2022 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහජන පැමිණිලි විසඳීමේ ප්‍රගතිය

2022 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද පැමිණිලි මෘදුකාංග දත්ත පද්ධතිය අනුව 2022 වර්ෂයේදී ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 2463 ක් වූ අතර එම පැමිණිලි වලින් ක්‍රියාමාර්ග සම්පූර්ණ කර විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව 1884 කි. ඒ අනුව පැමිණිලි විසඳීමේ සමස්ත ප්‍රගතිය 76% කි.

- එම ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව අතරින්, ජාතික පාරිසරික පනත මඟින් නියාමනය වන ක්‍රියාකාරකම් වලට අදාලව එනම් "ඒ" කාණ්ඩයට අදාලව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 1619 කි. එම "ඒ" කාණ්ඩයේ පැමිණිලිවලින් 1129 ක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර

ක්‍රියාමාර්ග ගෙන සම්පූර්ණ කර ඇති අතර එහි ප්‍රගතිය 70% කි.

- වෙනත් ආයතනවල අනපනත් සහ රෙගුලාසි මගින් නියාමනය වන එම ආයතනවල ඉල්ලීම අනුව මෙම අධිකාරිය විසින් පාරිසරික නිර්දේශ ලබාදෙන ක්‍රියාකාරකම්වලට අදාලව එනම් "බී" කාණ්ඩයට අදාලව පැමිණිලි 233ක් ලැබී ඇත. එම පැමිණිලි 233 න් පැමිණිලි 144 ක් පරීක්ෂා කර ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එහි ප්‍රගතිය 62% කි.
- එසේම , වෙනත් ආයතනවල විෂය පථයට සෘජුවම සම්බන්ධ එනම් "සී" කාණ්ඩයට අදාලව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 611කි. එම පැමිණිලි සියල්ල අදාල ක්‍රියාමාර්ග ගැනීම සඳහා විෂය අදාල ආයතන වෙත යොමු කර ඇත. ඒ අනුව එම පැමිණිලි සඳහා ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය 100% ක් වන අතර එම පැමිණිලි විසඳීම සඳහා අදාල ආයතන මැදිහත් වී ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය වෙත එම ආයතන මගින් යහපත් ප්‍රතිචාර යොමුකර ඇත.

පහත වගුව මඟින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි කාණ්ඩ හා දිස්ත්‍රික්ක අනුව දක්වා ඇත.

TABLE 40 : යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාව - "ඒ","බී"හා"සී" කාණ්ඩ හා දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	මුළු පැමිණිලි සංඛ්‍යාව "ඒ"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "ඒ"	"ඒ" ප්‍රගතිය %	"ඒ" ක්‍රියා මාර්ග ගනිමින් පවතින සංඛ්‍යාව	මුළු පැමිණිලි සංඛ්‍යාව "බී"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "බී"	ප්‍රගතිය "බී" %	මුළු පැමිණිලි සංඛ්‍යාව "සී"	මුළු පැමිණිලි සංඛ්‍යාව "ඒ","බී" හා "සී"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "ඒ","බී" හා "සී"	ප්‍රගතිය %
කොළඹ	334	262	78	72	30	14	47	189	553	465	84
ගම්පහ	309	165	53	144	34	12	35	84	427	261	61
කළුතර	185	130	70	55	33	12	36	51	269	193	72
නුවර	116	79	68	37	20	11	55	39	175	129	74
නුවරඑළිය	5	2	40	3	2	1	50	9	16	12	75
මාතලේ	30	16	53	14	3	4	133	11	44	31	70
ගාල්ල	100	93	93	7	15	13	87	32	147	138	94
මාතර	84	67	80	17	20	19	95	30	134	116	87
හම්බන්තොට	59	43	73	16	2	0	0	16	77	59	77
රත්නපුර	41	32	78	9	15	13	87	67	123	112	91
කෑගල්ල	31	18	58	13	12	12	100	13	56	43	77
කුරුණෑගල	119	94	79	25	10	12	120	14	143	120	84
පුත්තලම	44	28	64	16	10	6	60	2	56	36	64
අනුරාධපුර	45	27	60	18	4	0	0	11	60	38	63
පොලොන්නරුව	12	5	42	7	2	1	50	5	19	11	58
බදුල්ල	21	16	76	5	5	5	100	11	37	32	86

දිස්ත්‍රික්කය	මුළු පැමිණිලි සංඛ්‍යාව "ඒ"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "ඒ"	"ඒ" ප්‍රගතිය %	"ඒ" ක්‍රියා මාර්ග ගනිමින් පවතින සංඛ්‍යාව	මුළු පැමිණිලි සංඛ්‍යාව "බී"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "බී"	ප්‍රගතිය "බී" %	මුළු පැමිණිලි සංඛ්‍යාව "සී"	මුළු පැමිණිලි සංඛ්‍යාව "ඒ" ,"බී" හා "සී"	ක්‍රියා මාර්ග ගනු ලැබූ සංඛ්‍යාව "ඒ" ,"බී" හා "සී"	ප්‍රගතිය %
මොණරාගල	21	19	90	2	2	2	100	4	27	25	93
අම්පාර	14	6	43	8	2	0	0	2	18	8	44
මඩකලපුව	6	6	100	0	4	3	75	1	11	10	91
ත්‍රිකුණාමලය	11	6	55	5	4	3	75	2	17	11	65
යාපනය	25	9	36	16	1	0	0	1	27	10	37
මුලතිව්	0	0		0	0	0	0	4	4	4	100
මන්නාරම	4	3	75	1	2	0	0	3	9	6	67
වව්නියා	3	3	100	0	1	1	100	5	9	9	100
කිලිනොච්චි	0	0		0	0	0	0	5	5	5	100
එකතුව	**1619**	**1129**	**70**	**490**	**233**	**144**	**62**	**611**	**2463**	**1884**	**76**

ප්‍රභවය: 2022.12.31 දිනට යාවත්කාලීන කරන ලද පැමිණිලි මෘදුකාංග දත්ත පද්ධතිය

පහත ප්‍රස්ථාරය මඟින් දිවයින පුරා පැමිණිලි "ඒ" "බී" හා "සී" කාණ්ඩ අනුව ලැබී ඇති ආකාරය පෙන්නුම් කරයි




FIGURE 45 : දිවයින පුරා "ඒ" ,"බී" හා "සී" කාණ්ඩවලට අදාලව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව




FIGURE 46 : පළාත් අනුව "ඒ" ,"බී" හා "සී" කාණ්ඩවලට අදාලව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව

ප්‍රස්ථාරයට අනුව වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් බස්නාහිර පළාතට යොමු වී ඇති අතර දෙවනුව වැඩිම පැමිණිලි ප්‍රමාණයක් දකුණු පළාතට ලැබී ඇත. නැගෙනහිර සහ උතුරු පළාතට ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතී.




FIGURE 47 : දිස්ත්‍රික්ක මට්ටමින් යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාවට එදිරිව ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇති

ඉහත ප්‍රස්ථාර සටහනට අනුව පළමුව, දෙවනුව හා තෙවනුව වැඩිම පැමිණිලි ප්‍රමාණයක් පිළිවෙලින් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා ලැබී ඇත. ගාල්ල, මාතර කුරුණෑගල සහ රත්නපුර දිස්ත්‍රික්ක සඳහා යොමු වී ඇති පැමිණිලි සංඛ්‍යාව බොහෝ දුරට සමාන මට්ටමක පවතින අතර මහනුවර දිස්ත්‍රික්කය සඳහා පැමිණිලි යොමුවීම ඊට වඩා ඉහල අගයක් පෙන්නුම් කරයි .

III. "ඒ" හා "බී" කාණ්ඩයේ පැමිණිලි කළමනාකරණය

ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව සියලුම පළාත් / දිස්ත්‍රික් කාර්යාල සහ අදාළ ඒකක මඟින් "ඒ" කාණ්ඩයේ පැමිණිලි විමර්ශනය කර ගනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම මඟින් එම පැමිණිලි විසඳීමට කටයුතු කරන අතර "බී" කාණ්ඩයේ පැමිණිලි විමර්ශනය කර මෙම අධිකාරියේ නිරීක්ෂණ සහ නිර්දේශ සහිතව ගැටළු විසඳීම සඳහා විෂය අදාල ආයතන වෙත යොමු කරනු ලැබේ.




FIGURE 48 : "ඒ" කාණ්ඩයේ මුළු පැමිණිලි සංඛ්‍යාවට එදිරිව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීම

ඉහත ප්‍රස්ථාරයට අනුව ,ජාතික පාරිසරික පනත යටතේ නියාමනය වන ක්‍රියාකාරකම් වලට අදාලව එනම් "ඒ" කාණ්ඩයේ පැමිණිලි වැඩිම ප්‍රමාණයක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙක සඳහා ලැබී ඇත. අනෙකුත් දිස්ත්‍රික්ක හා සසඳන විට මෙම දිස්ත්‍රික්ක දෙකේ ඉහල කර්මාන්ත ව්‍යාප්තිය හා ජන ඝනත්වය ද ඉහළ මට්ටමක පැවතීම එයට ප්‍රධාන හේතුවකි.

E. නැවත නැවත යොමුවන පැමිණිලි කළමනාකරණය කිරීම

පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය වෙත අඛණ්ඩව ලැබෙන ස්වභාවයෙන් ගැටළු සහගත පැමිණිලි අදාල තාක්ෂණික අංශවල සහයෝගය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්) ගේ මැදිහත්වීම මත විසඳීමට කටයුතු කරනු ලැබේ. 2022 වර්ෂයේදී, එවැනි නැවත නැවත යොමු වන ගැටළු සහගත පැමිණිලි 5ක් සඳහා ස්ථාන පරීක්ෂා කිරීම සිදුකර පළාත්/දිස්ත්‍රික් කාර්යාල සහ අදාළ තාක්ෂණික ඒකක සමඟ රැස්වීම් පවත්වා විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත.

F. ගුරු අත්පොත්/මාර්ගෝපදේශ සහ පුහුණු කිරීම් මගින් පැමිණිලි කළමනාකරණ පද්ධතිය ප්‍රමිතිගත කිරීම

පැමිණිලි ඵලදායි ලෙස කළමනාකරණය සඳහා ගුරු අත්පොත්/මාර්ගෝපදේශ සහ පුහුණු කිරීම් හරහා පැමිණිලි කළමනාකරණ පද්ධතිය ප්‍රමිතිගත කිරීම මෙම ඒකකය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අංගයකි. 2022 වර්ෂයේදී කාර්යාල වේලාවෙන් පසුව සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල ක්ෂණික ඇමතුම් සේවාව සඳහා ප්‍රාදේශීය කාර්යාලවලින් නම් කරන ලද නිලධාරීන් සඳහා ක්ෂණික ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීම , පැමිණිලි ලේඛනගත කිරීම, ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම සම්බන්ධව මාර්ගගත ක්‍රමය ඔස්සේ 2022 මාර්තු මස 22 හා 2022 අගෝස්තු මස 30 දිනවලදී පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. දවසේ පැය 24 පුරා ක්ෂණික ඇමතුම් සේවාව සාර්ථකව පවත්වාගෙන යාම සඳහා මෙම පුහුණු වැඩමුළු බෙහෙවින් ඉවහල් විය.

මීට අමතරව, පාරිසරික ගැටළු පිළිබඳ මහජන පැමිණිලි ඵලදායී ලෙස හැසිරවීම පිළිබඳ නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සියලුම පළාත්/ දිස්ත්‍රික් කාර්යාලවල සහ අදාළ ඒකකවල නිලධාරීන් සඳහා පැමිණිලි කළමනාකරණය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහනක් 2022 නොවැම්බර් 29 දින පවත්වන ලදී.

CHAPTER 10 : අභ්‍යන්තර විගණන ඒකකය

A. අභ්‍යන්තර විගණනයේ විෂය පථය.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිට සෘජුව වග කියන ලෙස ආයතනයේ සංවිධාන ව්‍යුහය තුල අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇති අතර අධිකාරියේ සභාපති විසින් අභ්‍යන්තර විගණකගේ විෂය පථය තීරණය කරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය හා සියළුම පළාත්/දිස්ත්‍රික් කාර්යාල වල අභ්‍යන්තර විගණකවරයාගේ විෂය පථය තුළට ඇතුළත් වේ. ඒ අනුව අධිකාරියේ සියලුම ක්ෂේත්‍ර සාමාලෝචනය කිරීමේ බලය අභ්‍යන්තර විගණකවරයාහට පැවරී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය වාර්තා හා ලිපි ලේඛන පරීක්ෂා කිරීමට සහ ගබඩා හා පුද්ගලයන් වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය සම්පූර්ණ බලය පවරා ඇත.

B. අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳව සමාලෝචනය.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු විමර්ශනය කිරීම.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳව මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ සමාලෝචනය කිරීම.
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මඟ පෙන්වීම් ක්‍රියාත්මක කෙරේදැයි පරීක්ෂා කිරීම.
- කළමනාකරණය විසින් අවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ශන.

C. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

2021 නොවැම්බර් මස 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 අනුව මධ්‍යම පරිසර අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් රැස්විය. 2022 වර්ෂයේ රටේ පැවති ඉන්ධන අර්බුධය තුල එක් කාර්තු අවසන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මාර්ගගත ක්‍රමයට පැවැත්වූ අතර අනෙකුත් කාර්තු රැස්වීම් සාමාන්‍ය පරිදි පැවැත්විය. 2022 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති ධුරය දරනු ලබුවේ මුදල් අමාත්‍යාංශයේ ප්‍රථිපත්ති සැළසුම් දේපාර්තමේනතුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් බී.එන්. ගමගේ මහත්මියයි. මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු, අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂිකා (සැළසුම්) සකච්ඡා කෙරෙන විෂයට අදාල අධ්‍යක්ෂවරුන් හා ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකද කමිටුවට සහභාගී විය. මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ හා තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා යොමු කරන ලදී.

D. 2022 වර්ෂයේ විගණන වාර්තා තුළින් පැන නැගුණු පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

I. 1988 අංක 56 හා 2000 අංක 53 දරණ පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරණ පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1993.06.24 දිනැති 772/22 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව පරිසර නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමේදී අධිකාරියේ අවධානය යොමුවිය යුතු සිද්ධීන්.

II. 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධි, 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 2022 ජනවාරි 27 දිනැති 2264/18 අංක දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් බලපත්‍රය ලබාගැනීමට අවශ්‍ය වූ කටයුතු නිසි ලෙස හඳුනාගැනීම.

III. අධිකාරියේ වත්කම් පරිපාලන සම්බන්ධයෙන් දුර්වලතා සඳහා අභ්‍යන්තර පරිපාලන ක්‍රම ඉදිරිපත් කිරීම.

IV. විශේෂ විමර්ශන වලින් හඳුනාගත් අභ්‍යන්තර පාලන ක්‍රම ඉදිරිපත් කිරීම.

Chapter 11 : විමර්ශණ ඒකකය

2018 මාර්තු මාසයේ දී විමර්ශන ඒකකය පිහිටුවන ලද අතර එය අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක වේ. තහනම් පොලිතින් සම්බන්ධ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මහපෙන්වීම යටතේ තීරණාත්මක පාරිසරික ගැටළු පිළිබඳ විශේෂ විමර්ශන සිදු කිරීම මෙම ඒකකයේ කාරය භාරයට අයත් වේ. මෙම ඒකකය අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් දෙදෙනෙකු, සංවර්ධන නිලධාරියෙකු, කාර්යාල සහායකවරයෙකු සහ පරිසෘක අභ්‍යාසලාභියෙකුගෙන් සමන්විත වේ.

A. කසළ අවම කිරීම විධිමත් කිරීම සහ නිසි ලෙස බැහැර කිරීම

තනි භාවිත ප්ලාස්ටික් මගින් සිදුවන පාරිසරික බලපෑම සැලකිල්ලට ගෙන පොලිතින් නිෂ්පාදන කිහිපයක් තහනම් කරමින් හා පොලිතින් සැරසිලිවලට භාවිතා කිරීම සහ ප්ලාස්ටික් අඩංගු අපද්‍රව්‍ය පිළිස්සීමට අදාල ක්‍රියාකාරකම් තහනම් කරමින් ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පනවන ලද නියෝග හා රෙගුලාසි 2017 සැප්තැම්බර් මස 01 දින අංක 2034/33, 2034/34, 2034/35, 2034/36, 2034/37 හා 2034/38 දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් පසුව, තවත් තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය කීපයක් තහනම් කරමින් ජාතික පාරිසරික පනතෙහි 23 ද වගන්තිය යටතේ අංක 2211/51 දරණ 2021 ජනවාරි මස 21 දිනැති ගැසට් පත්‍රය මගින් 2021 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කරන ලදී.

I. අංක 2034/34, 2034/36, සහ 2211/51 දරන ගැසට් නිවේදන ක්‍රියාත්මක කිරීම

මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහාය ඇතිව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ සියලුම පළාත් / දිස්ත්‍රික් කාර්යාල මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වැටලීම් අඛණ්ඩව සිදු කරයි. 2022 වර්ෂය තුළ මුළු වැටලීම් 3 979 ක් සිදු කර ඇති අතර ඒ අනුව වැඩසටහනේ ප්‍රගතිය 66% කි. අනාවරණය වූ උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව 122 කි.

ජාතික පාරිසරික පනත යටතේ පවතින නීතිමය ප්‍රතිපාදනවලට අනුව, මධ්‍යම පරිසර අධිකාරියට නීති විරෝධී ආහාර දවටන තොග අත් අඩංගුවට ගැනීමට හැකියාවක් නොමැති නමුත් එම නිෂ්පාදන වල සාම්පල ගැනීම සිදුකර අදාළ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට බලතල පවතී. එබැවින්, නීති විරෝධී ආහාර දවටන නිෂ්පාදන කර්මාන්ත සහ තොග අලෙවි කරන්නන් වැටලීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (CAA) සමඟ ඒකාබද්ධ වැටලීම් සැලසුම් කරන ලදී. එහිදී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අත්අඩංගුවට ගෙන ඇති මුළු පොලිතින් ආහාර දවටන තොගය කිලෝ ග්‍රෑම් 3 772.25 (ටොන් 3.77) වන අතර එහි අන්තර්ගත පොලිතීන් ආහාර දවටන මිලියන 1.8ක් පරිසරයට බැහැර කිරීම වළක්වා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියට හැකි වූ අතර එය වැටලීම් ක්‍රියාවලියේ විශාල ප්‍රතිඵලයක් ලෙස සැලකේ.

තනි භාවිත ප්ලාස්ටික් දූෂණය පාලනය කිරීමේ වැඩසටහන් සම්බන්ධ වැටලීම් වල ප්‍රගතිය පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

TABLE 41 : අංක **2034/34** දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි බලාත්මක කිරීම

පොලිතින් ආහාර දවටන			
වැටලීම් ගණන	නීතිමය පියවර	අවවාද ලිපි	අත් අඩංගුවට ගත් තොගය /කිලෝ ග්‍රෑම්
3166	122	03	3772.25

මෙම ඒකාබද්ධ වැටලීම් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කර නීති විරෝධී නිෂ්පාදන පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදි..



FIGURE 49 : කැස්බෑව කර්මාන්තයක පොලිතින් ලන්ඩ් ෂීට් වැටලීම පිළිබඳව පළ කරන ලද පුවත්පත් වාර්ථාවක්.

TABLE 42 : අංක **2211/51** දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි බලාත්මක කිරීම

මිලිලීටර 20ට / ග්‍රෑම් 20ට සමාන හෝ අඩු සැෂේ			ප්ලාස්ටික් කූර සහිත කොටින් බඩිස්			සුළං වලින් පිරවිය හැකි සෙල්ලම් බඩු		
වැටලීම් ගණන	නීතිමය පියවර	අවවාද ලිපි	වැටලීම් ගණන	නීතිමය පියවර	අවවාද ලිපි	වැටලීම් ගණන	නීතිමය පියවර	අවවාද ලිපි
1295	13	129	948	04	19	821	03	05




FIGURE 50 : දිස්ත්‍රික් මට්ටමින් වැටලීම් වැඩසටහන

පොලිතින් ආහාර දවටන වැටලීම් ගණන සහ 2018 සිට 2022 දක්වා අනාවරණය වූ උල්ලංඝනය කිරීම් ප්‍රතිශතය පහත ප්‍රස්තාරය 02 දක්වා ඇත.




FIGURE 51 : වැටලීම් සංඛ්‍යාවට එදිරිව උල්ලංඝනය කිරීමේ ප්‍රතිශතයේ වාර්ෂික ප්‍රවණතාවය.

II. ප්ලාස්ටික් අඩංගු කසල හෝ පහසුවෙන් දැවෙන වෙනත් කසල විවෘතව පිළිස්සීම, පිළිස්සීමට ඉඩ දීම හෝ අවසර දීම තහනම් කරමින් නිකුත් කරන ලද රෙගුලාසි බලාත්මක කිරීම

මහජන පැමිණිලි 14ක් ලැබී ඇති අතර ඉන් පැමිණිලි නවයක් සම්බන්ධ විමර්ශනයක් සිදු කර, එක් පැමිණිල්ලක් සඳහා නීතිමය කටයුතු සඳහා යොමු කර ඇති අතර, අනෙක් 08 සඳහා අවවාද කිරීමේ ලිපි නිකුත් කරන ලදී.

පොලිතින් සහ ප්ලාස්ටික් විවෘතව පිළිස්සීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවැසි ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව සහ ඒ සඳහා වූ ලිපියේ ආකෘති පත්‍ර සකස් කර මධ්‍යම පරිසර අධිකාරියේ සියලුම පළාත් කාර්යාල/ දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කර ඇත.

අංක 2034/36, 2034/37, සහ 2211/51 දරන ගැසට් නිවේදනවල සඵලතාවය සහ එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් නිසා පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව සමීක්ෂණ හතරක් මෙම ඒකකය විසින් සිදු කර ඇත.

III. වෙරළ ආශ්‍රිත කසල විශ්ලේෂණය පිලිබඳ සමීක්ෂණය

පොදු රාජ්‍ය මණ්ඩලීය කසළ වැඩසටහන (Commonwealth Litter Program) (CLiP) යටතේ සංවිධානය කර ඇති ජාත්‍යන්තරව භාවිතා වන OSPAR මාර්ගෝපදේශ අනුගමනය කරමින් කසළ බහුලත්වය සහ සංයුතිය විශ්ලේෂණය කිරීම පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ව පුහුණු කිරීමේ වැඩසටහනක් සීෆාස් (Cafes) ආයතනය මගින් සිදු කරන ලදී. ඒ අනුව සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සහ රසායනාගාරය සමඟ ඒකාබද්ධව එක් වසරකදී මාස හතරකට වරක් කසළ බහුලත්වය සහ සංයුතිය විශ්ලේෂණය කිරීම සඳහා වෙරළ තීරයේ අපද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණ වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එම සමීක්ෂණය 2022 වර්ෂයේ දී දික්ඕවිට වරායේ සිට මීටර් 500 ක් පමණ දුරින් දික්ඕවිට වෙරළ තීරයේ ආරම්භ කරන ලදී. මුහුදු වෙරළේ රළ වදින ස්ථානයේ සිට සිට ශාක/තෘණ සහිත ප්‍රදේශය වන තෙක් 100 m දිග රේඛාවක් ඔස්සේ ඇති සියලු අපද්‍රව්‍යය එකතු කිරීම සිදු කරනු ලබයි.

ලබා ගන්නා ලද සාම්පල, විමර්ශන ඒකකයට සාම්පල විමර්ශන ඒකකයට ගෙනැවිත් පොලිමර් ද්‍රව්‍ය, රබර්, වීදුරු, කඩදාසි, ලී ලෙස වර්ග කර ඒවා අයිතමවලට අනුව වර්ග කර බර කිරා බැලීම සිදු කරනු ලබයි. එය 2022 වසරේ 2022.04.27, 2022.06.10 හා 2022.12.19 (වසරකට තුන් වතාවක්) යන දින වලදී සිදු කරන ලද අතර මෙම සමීක්ෂණය 2023 සහ 2024 දී ද සිදු කිරීමට නියමිත අතර අදාළ දත්ත සීෆාස් වෙත ඉදිරිපත් කළ යුතු ය.





FIGURE 52 : වෙරළ ආශ්‍රිත කසල විශ්ලේෂණය **2022.12.19**

IV. අලි වසුරු තුල ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනය

වනජීවී අභයභූමි අසල කසළ බැහැර කිරීම ප්‍රධාන ගැටලුවකි. අවාසනාවකට, වන අලි ඇතුළු බොහෝ වන සතුන් ආහාර සඳහා මෙම කසළ බැහැර කරන ස්ථාන වෙත ආකර්ෂණය වේ. බොහෝ අලි රංචු කුණු දමන ස්ථාන මත යැපෙන බැවින්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් වනජීවී වාසභූමි තුළට විසිරී යයි. ශ්‍රී ලංකා රජය තනි භාවිත ප්ලාස්ටික් මගින් සිදුවන පාරිසරික බලපෑම් සැලකිල්ලට ගෙන පොලිතින් නිෂ්පාදන කිහිපයක් තහනම් කිරීම මෙන්ම වනජීවී කලාප ආඥාවේ නීතිවිරෝධී ලෙස කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් නඩු කිහිපයක් පවරා ඇත. කෙසේ වෙතත්, වනාන්තරවල සහ වනජීවී අභයභූමිවල වන සතුන්ට තර්ජනයක් වෙමින් මෙම ගැටළුව දිගටම පවතී.

මෙම අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැරදි ක්‍රමවේද හේතුවෙන් වනජීවී අභයභූමිවලට ප්ලාස්ටික්

දූෂණයෙන් සිදුවන හානිය තක්සේරු කිරීම සඳහා විමර්ශන අංශය විසින් මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ බුද්ධංගල වනජීවී අභයභූමිය ආසන්නයේ කසල බැහැර කරන ස්ථානයක මෙම අධ්‍යයනය සිදු කර ඇත.






FIGURE 53 :බුද්ධංගල වනජීවී අභයභූමිය ආසන්නයේ අධ්‍යයනය හා සමීක්ෂණය කිරීම

අධ්‍යයනය ප්‍රධාන අදියර දෙකක් යටතේ සිදු කරන ලදී.

a. මූලික සමීක්ෂණය- සණ අපද්‍රව්‍ය කළමනාකරණයෙහි වැරදි, එහි සෘණාත්මක බලපෑම සහ එය ගම්වැසියන්ගේ ජීවනෝපාය, සහ වන ජීවීන්ට බලපාන ආකාරය හඳුනා ගැනීම සඳහා මූලික සමීක්ෂණයක් පවත්වන ලදී.

b.අලි වසුරු විශ්ලේෂණය - අලි වසුරු සාම්පල වර්ග ක්‍රම දෙකක් යටතේ එකතු කරන ලදී. ඉන් එකක් කසළ බැහැර කරන ස්ථානය තුළ එකතු කරන ලද අතර දෙවැන්න වනාන්තරය තුළ සහ වනාන්තර මායිමෙන් එකතු කරන ලදී. අලි වසුරුවල ප්ලාස්ටික් සංයුතිය සොයා ගැනීම සඳහා කසල අංගනය අවට අලි වසුරු සාම්පල 89ක් එකතු කරන ලදී.






FIGURE 54 : ප්ලාස්ටික් අපද්‍රව්‍ය සහිත අලි වසුරු

FIGURE 55 : දේශීය ප්‍රජාවන්ට බලපාන

V. වැව් ඉවුරු තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය විශ්ලේෂණය





FIGURE 56 : කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගල්ල වැවේ සමීක්ෂණය

අංක 2211/51 දරණ ගැසට් පත්‍රයේ දක්වා ඇති පරිදි සැෂේ තහනම් කිරීම සඳහා පනවා ඇති රෙගුලාසි මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී ඇත්දැයි සොයා බැලීම සඳහා, වාරි වැව් ඉවුරුවල සැෂේ බැහැර කිරීම පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා අනුරාධපුර, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි දිය නෑම සඳහා බහුලව භාවිතා වන වාරි වැව් හයක් තෝරා ගන්නා ලද අතර 2022 වසරේ දී ද මෙම සමීක්ෂණය ඒ ආකාරයෙන්ම සිදු කරන ලදී.

2021 වර්ෂයේ පෙබරවාරි මාසයේදී තුරුවිල වැව සහ තිසා වැව් ඉවුරුවලින් සැලකිය යුතු සැෂේ ප්‍රමාණයක් හමු වී ඇති අතර එම වසරේ දෙසැම්බර් මාසයේදී අනෙකුත් වාරි වැව්වල එම සැෂේ හමු වීම් අඩු ප්‍රමාණයක් වාර්තා වී ඇති බව උක්ත විශ්ලේෂනයේ දී පෙනී ගොස් ඇත. 2022 වසරේ සමීක්ෂණ ප්‍රතිඵල අනුව වැව් ඉවුරුවල සැෂේ පැකට් හමුවීම ඉතා අවම වී ඇත.

TABLE 43 : සමීක්ෂණය සිදු කරන ලද දිනයන්

වසර	අනුරාධපුර	හම්බන්තොට	කුරුණෑගල
2021	24.02.2021	03.12.2021	12.11.2021
2022	21.10.2022	26.10.2022	18.11.2022




FIGURE 57 : වාරිමාර්ග වැව්වල සැෂේ පැකට් බැහැර කිරීම් සංසන්දනය කිරීම

ගැසට් නිවේදනය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2021 සහ 2022 වසර තුළදී සැෂේ පැකට් බැහැර කිරීම ක්‍රමයෙන් අඩු වී ඇත සැෂේ පැකට් තහනම් කර ඇති බැවින් ආදේශක ලෙස ප්ලාස්ටික් භාජන දැන් වෙළෙඳපොළට එක්ව තිබෙන නමුත් ඒවා භාවිතයෙන් පසු ප්‍රතිචක්‍රීයකරණය නොකර මුදා හැරියහොත් පරිසරයට වැඩිපුර ප්ලාස්ටික් එකතුවේ.

VI. ජාතික පරිසර පනත යටතේ නිකුත් කරන ලද අංක 2034/36 දරන ගැසට් නිවේදනය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම පිළිබඳ සමීක්ෂණය

ප්ලාස්ටික් අපද්‍රව්‍ය විවෘතව පිළිස්සීම දේශගුණික විපර්යාස, වෘක්ෂලතා, මානව සහ සත්ව සෞඛ්‍ය සහ සමස්ත පරිසරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරයි. පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිස්ටරීන් හා පෙට් වැනි ප්ලාස්ටික් ද්‍රව්‍ය දහනය කිරීමෙන් වායුගෝලයට විෂ සහිත වායුන් විමෝචන මුදා හැරිය හැක. ප්ලාස්ටික් අපද්‍රව්‍ය විවෘතව පිළිස්සීමේ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා රජය විසින් 2017.09.01 දින ප්ලාස්ටික් ඇතුළු කසළ සහ අනෙකුත් දහනය කළ හැකි දෑ විවෘතව පිළිස්සීම තහනම් කිරීම සඳහා ගැසට් නිවේදනය (අංක 2034/36) මඟින් රෙගුලාසියක් පනවන ලදී. ජාතික පාරිසරික පනත යටතේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය විවෘතව පිළිස්සීම තහනම් කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ දැනුවත් වීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විමර්ශන අංශය විසින් මෙම සමීක්ෂණය සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත.

ගැසට් පත්‍රය නිකුත් කර වසර 05ක් ගතවී ඇතත් ඒ පිළිබඳව ජනතාවට තවම නිසි අවබෝධයක් නොමැත. එබැවින් ගැසට් පත්‍රය පිළිබඳ අඩු අවබෝධයක් ඇති බවට හඳුනාගත් ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් වැඩි දැනුවත් කිරීම් ප්‍රමාණයක් සිදු කළ යුතුය.

නිසි අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් බොහෝ දෙනා අවිධිමත් ලෙස

අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේද (ප්‍රධාන වශයෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය පිළිස්සීම) වෙත යොමු වී ඇති අතර පළාත් පාලන ආයතන විසින් කසළ එකතු කිරීමේ ක්‍රමය ක්‍රමවත්ව සිදු කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වන ජනතාව විසින් බැහැර කරනු ලබන ප්ලාස්ටික් පොලිතින් එකතු කිරීමේ ක්‍රමයවිදය විධිමත් හා සංවිධානාත්මකව සිදු විය යුතුය.




FIGURE 58 : රාජත් නොවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම

අංක 2034/36 දරණ ගැසට් නිවේදනය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම අවම මට්ටමක පවතින බැවින් හඳුනාගත් ප්‍රදේශ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර දැනුවත් කිරීම් කල යුතු බව සමීක්ෂණ ප්‍රතිඵලවලින් අනාවරණය වේ.

a. විශේෂ පාරිසරික ගැටළු විමර්ශනය:

සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යොමු කරන ලද විශේෂ පාරිසරික ගැටලු පිළිබඳ විමර්ශන 16ක් පවත්වා වාර්තා සකස් කිරීම සහ එම ගැටලු විසඳීමට සහාය වීම මෙම ඒකකය මගින් සිදු කර ඇත.

b. ගේජ් මීටර් ක්‍රමාංකනය කිරීම

පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල ඇති ගේජ් මීටර් 11 ක් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ක්‍රමාංකනය කරන ලදී.

c. පළාත් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් සඳහා මාර්ගගත පුහුණුවීම් දෙකක් පැවැත්වීම

- 2022 පෙබරවාරි 03
- 2022 සැප්තැම්බර් 15

B. භෞතික ප්‍රගතිය:

2022 වර්ෂය සඳහා වැටලීම් 5 307ක් ඉලක්ක කර ඇති අතර වැටලීම් 3 512ක් සිදු කර ඇත. ඒ අනුව වසරේ භෞතික ප්‍රගතිය 75% කි.

C. මූල්‍ය ප්‍රගතිය:

විමර්ශන ඒකකය සඳහා රුපියල් මිලියනයක් වෙන් කරන ලද අතර, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් 763,274.00 ක් යොදවා ඇති අතර වර්ෂයේ මුල්‍ය ප්‍රගතිය 76.3% ක් වේ .

Chapter 12 : තොරතුරු තාක්ෂණ ඒකකය

A. හැඳින්වීම

ආයතනයක ස්වභාවය වෙනස් කිරීමෙහිලා තාක්ෂණයට සැලකිය යුතු බලපෑමක් එල්ල කල හැකි අතර එමගින් පුද්ගල කාර්යක්ෂමතාවය වේගවත් කල හැක. ඒ අතරින් තොරතුරු තාක්ෂණයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි ,ඒ මන්දයත් තොරතුරු තාක්ෂණය ආයතනයක සේවා නියුක්තිකයන්ට නිර්මාණශීලී වීමටත් ඵලදායී වීමටත් ඉඩ සලසා දෙන බැවිනි. මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපනය කර ඇති තොරතුරු තාක්ෂණ ඒකකය ඩිජිටල් තාක්ෂණය සමඟ තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතයෙන් සාර්ථක පාරිභෝගික සේවාවක් ලබාදෙන අතර එමගින් ආයතනයේ කීර්තිය පවත්වා ගෙන යාම සඳහා විශාල දායකත්වයක් ලබා දෙනු ලැබේ.

B. 2022 වර්ෂය තුල තොරතුරු තාක්ෂණ ඒකකයේ ප්‍රධාන කාර්යයන්

I. ජාල පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය.

a. ජාල යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සහාය ලබා දීම. රැහැන්ගත ජාල පහසුකම ස්ථාපිත කිරීම - පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

b. තොරතුරු ජාලය සඳහා හදිසි උපස්ථ සැලසුම් පවත්වා ගෙන යාම සහ දුරස්ථ ස්ථාන කලමනාකරණය. (පළාත් / දිස්ත්‍රික් කාර්යාලය)

c. කාර්යක්ෂම දෝෂ නිවැරදි කිරීමේ ක්‍රම මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ තොරතුරු ජාලය අධීක්ෂණය සහ සහය ලබා දීම. (පරිශීලක කළමනාකරණය, සේවාදායක කළමනාකරණය, ජාල කළමනාකරණය, ගිනි පවුර කළමනාකරණය, දුරස්ථ ස්ථාන හැසිරවීම ආදිය)

II. මධ්‍යම පරිසර අධිකාරියේ සේවා ක්ෂේත්‍ර සඳහා මෘදුකාංග ස්ථාපිත කිරීම, සංවර්ධනය හා වැඩිදියුණු කිරීම මඟින් ක්‍රියාකාරිත්වය වේගවත් කිරීම.

III. දෝෂ නිරාකරණය සහ නඩත්තුව සඳහා දෘඩාංග වල සහාය ලබා දීම.

IV. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ දැනට පවතින CCTV පද්ධතිය වැඩිදියුණු කිරීම.

a. CCTV පද්ධතිය අධීක්ෂණය කිරීම.

b. CCTV පද්ධතියේ ඇතිවන ගැටළු විසඳීම.

C. මෘදුකාංග පද්ධති සංවර්ධනය

a. පාරිසරික පැමිණිලි සඳහා නව මාර්ගගත පාරිභෝගික ද්වාරය සංවර්ධනය කිරීම.

b. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ වෙබ් අඩවියෙහි පසුපිට නඩත්තු කිරීම.(ස්ර්වර් නිර්මාණය සහ වින්‍යාසය)

c. වායු තත්ත්ව දර්ශකය නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම.


d. නීති ඒකකය සඳහා නව ලේඛන හුවමාරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

D. මධ්‍යම පරිසර අධිකාරියේ ඩිජිටල් පරාවර්තනය (2020 - 2030)

මධ්‍යම පරිසර අධිකාරියේ සමස්ත ක්‍රියාකාරිත්වය 2021 වර්ෂය අවසානයේදී සම්පූර්ණ ඩිජිටල් රාමුවක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ඒකකය මූලික සාකච්චා සහ සැලසුම් ආරම්භ කරන ලදී. පාරිසරික ගැටළු පිළිබඳ ගෝලීය ප්‍රමිති පෙළ ගැස්වීම, මධ්‍යම පරිසර අධිකාරිය හරහා පුරවැසියන්ට හොඳම සේවාවන් සහ ප්‍රතිලාභ ලබා දීම. පූර්ණ මහජන අවධානයයොමුවූ අංශ කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි පළමු අදියර යටතේ සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සාධක පහත පරිදි පෙලගැස්විය හැක.

- කඩදාසි රහිත සේවා ස්ථානය
- විමෝචනය ශූන්‍ය කිරීම
- පුනර්ජනනීය බල ශක්තිය
- හරිත සංස්කෘතිය



Chapter 13 : මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල

A.මධ්‍යම පරිසර අධිකාරියේ බලය පලාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය වශයෙන්, ජාතික ප්‍රමිතීන්, මිනුම් දඩු ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම ජාතික වශයෙන් සිදු කරන අතර ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ඉලතල ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වසරේ දී මධ්‍යම හා දකුණු පළාත සඳහා ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවිය.

2002 වසරේ එසේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමෙන් ලබා ගන්නා ලද අත්දැකීම මත එම වැඩ පිළිවෙල මුළු දිවයින පුරා ව්‍යාප්ත කරන ලද අතර, 2007 වසර වන විට සියළුම පළාත් පාදක කොට ගෙන පළාත් කාර්යාල පිහිටුවා, පරිසර කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල වලින් කොටසක් මෙම පළාත් කාර්යාල ප්‍රධානීන් වෙත මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලදි.

B. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම

උප ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පවරාදීමේ වගන්ති ජාතික පාරිසරික පනත මඟින් සම්පාදනය කොට ඇත.

ඒ අනුව, එකී පනතේ 26 වන වගන්තිය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ රජයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පවරා ඇති බලතල අනුව අනුව, අධිකාරියේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මේ වගන්තිය අනුව, 1993 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ බලතල වලින් යම් කොටසක් පළාත් පාලන ආයතන වලට පවරා දීමේ මූලික කටයුතු සිදු කරන ලද අතර, 1994.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සුළු පරිමාණ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල හා තවත් කටයුතු 12 ක් සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත එනම්, මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා වෙත පවරන ලදි.

1993 වසරේ දී සුළු පරිමාණ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විමධ්‍යගත කරන ලද බලතල නැවත පවරාගෙන 2000 අංක 53 දරන සංශෝධිත පවතින් ප්‍රකාශයට පත් කරන ලද, 1159/22 දරන ගැසට් නිවේදනයට අනුව, එම ගැසට් නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් කර්මාන්ත / කටයුතු 45 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල එම පළාත් පාලන ආයතන වෙත පවරා දෙන ලදි.

ඉන්පසු නැවතත්, අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නියමිත කටයුතු 'අ' , 'ආ' සහ 'ඇ' වශයෙන් කාණ්ඩ තුනක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 පෙබරවාරි 14 දින පළාත් පාලන ආයතන වෙතපවරා තිබූ බලතල නැවතත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගන්නා ලද අතර, 2008.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් නියමිත කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල නැවතත්, පළාත් පාලන ආයතන වලට පවරා දෙන ලද අතර, එම ආයතන ඒ අනුව කටයුතු කරන ලදි.

C. දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC)

- 1995 වසරේ දී දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව නමින්, කමිටු සෑම දිස්ත්‍රික්කයක් පාසාම පිහිටුවීමේ පරිපාලනමය ක්‍රියාවට නංවන අතර, මෙම කමිටුවේ සභාපති වශයෙන් අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කටයුතු කරයි.
- මෙම කමිටුවේ අනිකුත් සාමාජිකයන් වනුයේ;
- සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
- දිසා වන නිලධාරී
- පළාත් පාලන සහකාර කොමසාරිස්
- වන ජීවී දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ප්‍රධානී
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්

- එම පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්

- එම පරිපාලන දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්

මෙම කමිටුවේ ලේකම් වශයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරියෙක් කටයුතු කරනු ඇත.

එසේම අවශ්‍යතාවය මත මෙම කමිටුව සඳහා වෙනත් සාමාජිකයන් හා නියෝජිතයන් පත් කළ හැකිය.

මෙම කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික වැරදි හෝ අක්‍රමිකතා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කර, ඊට අදාල ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් අදාල ආයතන වන පොලිසිය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පළාත් ආයතන ලවා සිදුකරවීමය.

මෙම කමිටුවේ මූලික කර්තව්‍යය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමය.

මෙම කමිටු රැස්වීම් සෑම මසකම, සෑම දිස්ත්‍රික්කයකම, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබයි

Chapter 14 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල

A. හැඳින්වීම

පරිසර ආරක්ෂණය සඳහා පළාත් කාර්යාල වෙත පවරා ඇති බලතල අතරින් ප්‍රධානතම නෛතික ක්‍රියාවලිය වනුයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් පනවා ඇති, අපද්‍රව්‍ය පිට කිරීම සඳහා වූ ප්‍රමිතීන් හා උපමාන, වායු විමෝචන හා ශබ්ද මට්ටම් අනුව ක්‍රියාත්මක කිරීම තුලින් පාරිසරික ආරක්ෂාව මෙම බලපත්‍ර ක්‍රමය තුලින් තහවරු කෙරේ. ශ්‍රී ලංකාවේ වර්තමානය දෙස බැලීමේ දී පෙනී යන්නේ මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමට ප්‍රථම එනම්, මීට දශක දෙකකට හෝ තුනකට පෙර ස්ථානගත කරන ලද කර්මාන්ත වලින් විශාල වශයෙන් පාරිසරික ගැටළු ඇති වී තිබෙන බවය.

කාර්මික අපද්‍රව්‍යන්ද (පිලියම් කල හෝ නොකළ) ආසන්නතම ජල ප්‍රවාහ වන ගංගා, වැව් සහ මුහුදු වැනි නිදහස් පරිසරයට මුදාහැරීම සාමාන්‍යයෙන් සිදු වේ. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් පොදු මහජනතාවගේ ඉල්ලුම සඳහා අවශ්‍ය වන ජලය සපයා ගනු ලබන්නේ ගංගා වලිනි. එහෙයින් අපද්‍රව්‍ය ජල මූලාශ්‍ර වලට මුදා හැරීම විශාල ප්‍රශ්නයක් වී ඇත. පොදු ජනතාවගේ පානීය ජල ප්‍රභව අපවිත්‍ර වීම කෙරෙහි මතුපිට ජල දූෂණයට අමතරව භූගත ජල දූෂණය ද බලපානු ලබයි.

පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රමිතීන් මඟින් භූගත ජලය නැවත පිරීම සහ එහි ආරක්ෂාව යන කරුණු ආවරණය නොවේ.

I. පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය

2022 වර්ෂයේ දී ‘‘අ’’ කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 249 ක් සහ ‘‘ආ’’ කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 855 ක් අලුතින් නිකුත් කර ඇති අතර ‘‘අ’’ කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 2,081 ක් සහ ‘‘ආ’’ වර්ගයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 4,470 ක් අළුත් කරන ලදී.

නෛතිකව බැඳී පවතින නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයන්හි නිර්දේශිත ක්‍රියාකාරකම් අඩංගු වී ඇත. එහෙයින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. නිර්දේශිත ක්‍රියාකාරකම් වලින් වැඩි සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇති දත්ත අනුව මහා පරිමාන හා මධ්‍යම පරිමාණයෙන් පරිසර දූෂණයට දායක වන කර්මාන්තශාලා වලින් 37% ක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පළාතේ එම අගය 10% ක් වන අතර සහ දකුණු පළාතේ එම අගය 13% සහ 40% ක් වන ඉතිරිය අනකුත් පළාත් වන සබරගමුව, නැගෙනහිර, උතුරු මැද, ඌව, උතුර සහ වයඹ පළාත් වල පිහිටා ඇත. මෙම කර්මාන්ත සමීක්ෂණය අදාල පළාත් වල පරිසර නිලධාරීන් විසින් කරන ලද අතර, ඒ සඳහා මහ පෙන්වීම් පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ලබාදෙන ලදි.

නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අළුත් කළ යුතු වේ. එමෙන්ම, යම් කර්මාන්ත කරුවෙක් තම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනි ලෙස ක්‍රියාකර ඇති බව ඔප්පු වුවහොත් එම බලපත්‍ර අවලංගු කිරීමේ බලතල ද අධිකාරිය සතු වේ. එම අවලංගු කිරීමකින් පසු යම් කෙනෙක් අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම්, පාරිසරික අමාත්‍යාංශයේ ලේකම්වරයාට එය ඉදිරිපත් කළ යුතු අතර, එතුමාගේ තීරණය ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය වේ.

TABLE 44 : පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

පළාත	දිස්ත්‍රික්කය	නිකුත් කරන ලද බලපත්‍ර ගණන						අළුත් කරන ලද බලපත්‍ර ගණන					
		2020		2021		2022		2020		2021		2022	
		"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"
බස්නාහිර	කොළඹ	141	36	154	24	24	125	922	101	461	85	166	288
	ගම්පහ	95	87	270	67	50	164	803	113	1486	278	225	1169
	කළුතර	89	56	24	9	6	42	370	50	374	8	69	351
මධ්‍යම	මහනුවර	29	13	18	7	7	59	278	823	622	130	91	40
	මාතලේ	31	18	51	15	8	31	238	23	269	33	42	45
	නුවරඑළිය	6	1	6	1	9	4	106	11	132	4	62	0
දකුණු	ගාල්ල	24	46	34	45	5	25	274	159	483	172	75	397
	මාතර	16	19	19	25	3	16	252	72	371	140	32	252
	හම්බන්තොට	31	35	55	37	4	39	257	18	276	41	44	217
සබරගමු	කෑගල්ල	8	18	9	26	25	43	81	35	284	129	336	81
	රත්නපුර	18	3	10	5	57	65	59	23	215	31	580	81
උතුරු මැද	අනුරාධපුර	66	39	95	61	17	74	307	50	423	46	61	353
	පොලොන්නරුව	15	9	21	15	2	33	136	26	150	44	18	122
නැගෙනහිර	ත්‍රිකුණාමලය	14	15	25	17	1	9	100	32	195	68	49	51
	අම්පාර	12	9	33	48	3	4	169	66	354	35	9	67
	මඩකලපුව	26	57	16	10	2	33	258	71	168	58	24	38
ඌව	බදුල්ල	5	14	21	21	3	13	151	23	359	63	36	254
	මොණරාගල	10	6	13	2	1	8	45	11	57	12	17	212
උතුරු	යාපනය	0	8	3	15	0	4	131	42	282	68	9	229
	කිලිනොච්චි	3	6	4	23	2	10	52	66	45	21	14	37
	මුලතිව්	0	20	2	5	3	8	62	33	18	23	29	21
	වව්වනියා	16	6	34	10	2	15	116	9	185	24	38	95
	මන්නාරම	3	4	6	5	1	10	68	19	145	24	1	75
වයඹ	කුරුණෑගල	23	14	16	13	2	6	101	16	87	24	10	71
	පුත්තලම	17	5	8	11	2	15	61	6	33	6	14	24
මුළු එකතුව		**698**	**544**	**947**	**517**	**249**	**855**	**5397**	**1898**	**7474**	**1567**	**2081**	**4470**

II. නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

යම් ස්ථානයක නව කර්මාන්තයක් ස්ථානගත කිරීමට ප්‍රථම අධිකාරියේ නිර්දේශය ලබා ගැනීම මූලික අවශ්‍යතාවන් වන අතර එමඟින් එම

ස්ථානගත කිරීම වළක්වාගත හැකි වී තිබෙන අතර මේ නිසා කර්මාන්තකරුවන්ට නියම ස්ථානයේ නියම කර්මාන්තය අදාල පරිසර දූෂණ පාලන පිරිවිතරයන් අනුගමනය කිරීම තුලින් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති නිසා ඔවුන්ටද විශාල වශයෙන් ප්‍රතිලාභ අත් වී තිබේ. එමෙන්ම සුදුසු ස්ථානයන්හි සුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම තුලින් අසල්වාසීන්ටද පරිසර දූෂණයෙන් හෝ

කර්මාන්තය නුසුදුසු ප්‍රදේශයක ස්ථානගත වීම වැළැක්වේ. මෙම පාරිසරික නිර්දේශ නිකුත් කිරීම තුලින් නුසුදුසු ස්ථානයන් හි නුදුසු කර්මාන්ත

මහජන පීඩාවන්ගෙන් තොරව වාසය කිරීමේ හැකියාව ලැබී ඇත.

2022 වසර තුල නව කර්මාන්ත 1,140 ක් නිර්දේශ සඳහා අයදුම් කළද 2021 වසරේ අයදුම්පත් ද ඇතුළුව කර්මාන්ත 663 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත. එමෙන්ම අයදුම්පත් 33ක් නිර්දේශ ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා නොමැති බැවින් ප්‍රතික්ශේප කර ඇත.

TABLE 45 : නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

පළාත	දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් ගණන			අනුමැතිය ලබාදුන් ගණන			ප්‍රතික්ෂේප ගණන		
		2020	2021	2022	2020	2021	2022	2020	2021	2022
බස්නාහිර	කොළඹ	57	60	1	36	27	8	1	0	0
	ගම්පහ	157	190	134	55	117	69	2	21	5
	කළුතර	88	48	77	49	53	64	4	2	3
මධ්‍යම	මහනුවර	6	18	45	22	12	11	0	0	0
	මාතලේ	30	20	71	18	10	28	1	0	0
	නුවරඑළිය	9	11	7	3	16	2	0	0	0
දකුණු	ගාල්ල	73	84	65	31	35	32	9	5	2
	මාතර	42	46	76	21	35	29	4	6	7
	හම්බන්තොට	54	72	79	34	50	46	2	0	1
සබරගමු	කෑගල්ල	7	0	0	7	1	0	0	0	0
	රත්නපුර	2	94	70	2	0	31	0	0	0
උතුරු මැද	අනුරාධපුර	72	57	38	42	46	23	2	2	1
	පොලොන්නරුව	26	8	6	19	4	4	0	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	17	21	23	26	20	15	0	0	2
	අම්පාර	29	29	17	32	36	19	1	1	2

පළාත	දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් ගණන			අනුමැතිය ලබාදුන් ගණන			ප්‍රතික්ෂේප ගණන		
	මඩකලපුව	32	33	35	46	35	27	0	0	0
උඩ	බදුල්ල	19	58	39	13	39	26	1	1	0
	මොණරාගල	35	113	62	20	46	26	1	2	1
උතුරු	යාපනය	64	68	89	39	29	41	0	0	0
	කිලිනොච්චි	66	85	54	63	63	29	0	0	0
	මුලතිව්	23	37	20	22	24	13	0	0	1
	වව්වනියා	15	21	29	24	34	35	2	0	0
	මන්නාරම	21	57	61	11	36	45	0	0	8
ඌව	කුරුණෑගල	52	25	13	47	17	11	2	1	0
	පුත්තලම	55	67	29	48	37	29	0	0	0
මුළු එකතුව		**1051**	**1322**	**1,140**	**730**	**822**	**663**	**32**	**41**	**33**

B. ISO 14000 තත්ත්ව සහතිකකරණය පිළිබඳ බස්නාහිර පළාත් කාර්යාලයේ දායකත්වය.

ISO 14000 ප්‍රමිති යටතේ නව කාර්මාන්ත සහතික කිරීම සඳහා බස්නාහිර පළාත් කාර්යාලය දායක වීම

කාර්මික හා තාක්ෂණික කරුණු පිළිබඳව ප්‍රවීණ දැනුම ලබා දෙමින් කර්මාන්ත සඳහා ISO 14001 සහතිකය ලබා දීමේදී බස්නාහිර පළාත් කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට සහාය වේ. පහත වගුවේ දැක්වෙන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදු කරන ලද විගණන ක්‍රියාවලියේ තාක්ෂණික හා නෛතික යෙදවුම් සහිතව අ ISO 14001 සහතික ලබා දුන් කර්මාන්ත සඳහා ය.

C. පරිසර කළමනාකරණය

I. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE)

1993 වසරේ සිට සියළු ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත්විය යුතුය. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත, උද්‍යාන වැඩි දියුණු කිරීම ආදී මහා පරිමාණ නියමිත කටයුතු මෙම ක්‍රියාවලියට අයත් වේ. පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ දී මහා පරිමාණ ව්‍යාපෘතීන් පරිසර බලපෑම් මුල් අවධියේ ම හඳුනාගෙන එම බලපෑම් අවම කිරීමේ අවශ්‍ය නිර්දේශ සපයනු ලැබේ. මේ නිසා ව්‍යාපෘති යෝජකට ව්‍යාපෘතියේ මුල් අදියරේම පරිසර බලපෑම් අවම කර ගැනීමට හැකි වේ.

පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත් ව්‍යාපෘති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම පළාත් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ .

පහත දැක්වෙන්නේ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට භාජනය වීමට යෝජනා වූ ව්‍යාපෘතින් පිළිබඳ විස්තර.

TABLE 46 : මූලික පාරිසරික පරීක්ෂණ **(IEE) /** පරිසර බලපෑම් ඇගයීම **(EIA)** නියමයන්ට අනුකූලව **2022** වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව.

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය		
		2020	**2021**	**2022**	**2020**	**2021**	**2022**	**2020**	**2021**	**2022**
බස්නාහිර	කොළඹ	0	0	0	9	0	0	00	0	0
	ගම්පහ	0	0	0	0	0	0	00	0	0
	කළුතර	4	2	0	5	0	1	00	0	0
දකුණු	ගාල්ල	2	8	0	0	2	1	00	0	0
	මාතර	0	1	3	1	0	0	00	0	0
	හම්බන්තොට	3	0	0	5	7	1	00	0	0
මධ්‍යම	මහනුවර	72	67	23	16	37	36	00	0	0
	මාතලේ	0	0	0	0	0	0	00	0	0
	නුවරඑළිය	8	0	0	3	0	2	00	0	0
සබරගමු	කෑගල්ල	0	0	0	6	7	1	00	0	0
	රත්නපුර	13	38	6	0	0	4	00	0	4
ඌව	බදුල්ල	30	179	220	29	148	176	00	0	0
	මොණරාගල	0	1	1	3	2	7	00	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	0	0	0	0	0	3	00	0	0
	අම්පාර	0	0	0	0	0	0	00	0	0
	මඩකලපුව	0	0	0	1	0	1	00	0	0
උතුරු මැද	අනුරාධපුර	2	3	5	4	2	16	00	0	0
	පොලොන්නරු	0	2	2	0	1	1	00	0	0
වයඹ	කුරුණෑගල	3	0	3	2	0	0	00	0	0
	පුත්තලම	0	0	0	1	0	0	00	0	0

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය		
		2020	**2021**	**2022**	**2020**	**2021**	**2022**	**2020**	**2021**	**2022**
උතුරු	යාපනය	3	0	3	2	0	0	00	0	0
	කිලිනොච්චි	0	0	0	0	0	0	00	0	0
	මුලතිව්	0	0	2	0	0	2	00	0	0
	වව්වනියා	2	2	0	3	1	0	00	0	0
	මන්නාරම	0	0	2	0	0	0	00	0	0
එකතුව		**142**	**303**	**270**	**90**	**207**	**252**	**00**	**00**	**4**

2022 වසර තුල දී අයදුම්පත් 270 ක් ලැබුණු අතර ඉන් 252 ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර අපේක්ෂිත තත්වයේ නොවන අයදුම්පත් මේ වසරේ ලැබී නොතිබිණි.

II. ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම.

ඒ ඒ ව්‍යාපෘති යෝජකයන් විසින් ඉදිරිපත් කරන්නා වූ ඉල්ලුම් පත්‍ර අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම් අවම කිරීමට අදාල කොන්දේසි සමඟ මෙම පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව, ගත වූ වසර තුල හෝටල්, දැව හෙලීම්, විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම් හා ඉඩම් කට්ටි කිරීම ආදී වශයෙන් වූ ව්‍යාපෘතින් 1,163 (පසුගිය වසරේ අයදුම්පත් ද ඇතුළුව) ක් සඳහා පහත දැක්වෙන පරිදි පාරිසරික නිර්දේශ පළාත් කාර්යාල විසින් නිකුත් කරන ලදි. සංවර්ධිත ක්‍රියාවලියේ මූලික සැලසුම් අවධියේ ම පාරිසරික බලපෑම් හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදවීමට ඉහත සඳහන් ක්‍රියාවලිය පහසුකම් සලසයි.

TABLE 47 : 2022 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන	අනුමත ගණන	ප්‍රතික්ෂේප වූ ගණන	පැමිණිලි පසුවිපරම් ගණන
බස්නාහිර	කොළඹ	71	104	0	0
	ගම්පහ	0	61	2	0
	කළුතර	152	204	1	0
දකුණ	ගාල්ල	117	63	0	0
	මාතර	0	16	0	0
	හම්බන්තොට	0	39	0	0
මධ්‍යම	මහනුවර	0	141	0	37
	මාතලේ	30	129	1	0
	නුවරඑළිය	0	21	0	0
සබරගමුව	කෑගල්ල	0	40	0	0
	රත්නපුර	38	66	0	0

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන	අනුමත ගණන	ප්‍රතික්ෂේප වූ ගණන	පැමිණිලි පසුවිපරම් ගණන
ඌව	බදුල්ල	111	108	0	0
	මොණරාගල	16	103	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	0	98	0	0
	අම්පාර	0	0	1	1
	මඩකලපුව	0	130	0	0
උතුරු මැද	අනුරාධපුර	133	112	0	0
	පොලොන්නරුව	0	9	0	0
උතුරු	යාපනය	0	15	0	0
	කිලිනොච්චි	24	4	0	0
	මුලතිව්	81	122	2	2
	වව්වනියා	0	17	0	0
	මන්නාරම	5	34	0	0
වයඹ	කුරුණෑගල	33	46	4	0
	පුත්තලම	11	42	0	0
එකතුව		**822**	**1,724**	**11**	**40**

ඉහත වගුවේ දැක්වෙන්නේ 2022 දී ලබා දී ඇති එවැනි නිර්දේශයන්ගේ තොරතුරුය

CHAPTER 15 : ප්‍රාදේශීය මෙහෙයුම් අංශය

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලය (පළාත් / දිස්ත්‍රික් කාර්යාල) මඟින් සපයනු ලබන සේවාවන් වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂමව ඉහළ නැංවීම සහතික කිරීමේ අරමුණින් ප්‍රාදේශීය මෙහෙයුම් අංශය 2018 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලදි. කොවිඩ් 19 ගෝලීය වසංගතය පැතිරීම පාලනය කිරීම (දිවයින පුරා ඇදිරි නීතිය පැනවීම,තෝරාගත් ප්‍රදේශ හුදකලා කිරීම) සහ පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම වැනි ක්‍රියාමාර්ග හේතුවෙන් ඇතැම් වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කර ගැනීමට අපහසු වූවද නව තාක්ෂණික උපක්‍රම භාවිතා කරමින් එම වැඩසටහන් හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ අනුව මෙම අංශය වෙත පවරන ලද ප්‍රධාන වගකීම් දෙක යටතේ 2022 වසරේ දී පහත කාර්යයන් ඉටු කරන ලදි.

A. මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශ හා ඒකක සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මඟින් ඉටු කරනු ලබන කාර්යයන් / ක්‍රියාකාරකම් විධිමත් කිරීම.

I. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල (ප්‍රාදේශීය කාර්යාල) ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම කාර්යාල මෙහෙයුම් කටයුතු කිරීමේදී ඇතිවන දුෂ්කරතා, ගැටළු හඳුනා ගැනීම හා ඒවාට අවශ්‍ය විසඳුම් ලබාදීම හා කාර්යාල ක්‍රමවේදයන් විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

2022 ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රාදේශීය කාර්යාල වෙත ගොස් මනා සම්බන්ධීකරණයක් තුළින් ප්‍රගතිය සමාලෝචනය කිරීමේ ක්‍රියාමාර්ග සිදු කල යුතු වුවද රටේ උද්ගත ආර්ථික හා මූල්‍යමය අර්බුදය හේතුවෙන් පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීමේ අරමුණින් රජය විසින් නිකුත් කල චක්‍රලේඛන වලට අනුව ප්‍රධාන කාර්යාලයේ සිට පළාත් කාර්යාල වෙත ප්‍රවාහන පහසුකම් ලබාගෙන ගමන් කිරීම සිදු නොකරන ලදි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 417/50001/22) සහිතව 2022 ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයට ලක් වූ අතර ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර 4 ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදි. එම ප්‍රගති සමාලෝචන රැස්වීම්, සියළු පළාත් කාර්යාල / දිස්ත්‍රික් කාර්යාල ප්‍රධානීන් හා අදාළ අංශ/ඒකක ප්‍රධානීන් සමඟ 2022/02/15, 2022/05/25, 2022/07/27 හා 2022/11/29 යන දින වලදී ප්‍රාදේශිය මෙහෙයුම් අංශය විසින් සංවිධානය කර පවත්වන ලදි.

මෙහිදී පාරිසරික ආරක්ෂණ බලපත්‍ර / ලැයිස්තු ගත අපද්‍රව්‍ය කළමණාකරන බලපත්‍ර, පාරිසරික නිර්දේශ නිකුත්කිරීම්, මහජන පැමිණිලි සම්බන්ධ කරුණු, පාරිසරික අනුමැතීන් නිකුත් කිරීම්, පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රාදේශිය කාර්යාල මෙහෙයුම් කටයුතු හා දෛනිකව මුහුණපාන (මානව සම්පත් හා පරිපාලනමය / තාක්ෂණික / මූල්‍ය / භෞතික ආදී) ගැටළු පිළිබඳව සියළු පළාත් ප්‍රධානීන් විසින් කරුණු දක්වන ලද අතර ඊට අනුකූලව අදාල අංශ / ඒකක සම්බන්ධීකරණය මඟින් විසඳුම් හා උපදෙස් ලබාදීමට කටයුතු සිදු කරන ලදි.

II. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රගතිය නිරන්තරයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම, පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවා අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම.

ප්‍රාදේශීය කාර්යාල සමඟ මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද සෑම රැස්වීමකදීම රැස්වීම් වාර්ථා එහි සඳහන් හා ඊට සම්බන්ධ වන සියළු අංශ හා ඒකක වෙත ඔවුන්ගෙන් ඉටුවිය යුතු විසඳුම් සඳහා යොමු කිරීමට කටයුතු සිදු කර ඇත.

III. පාරිසරික ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්ය මණ්ඩලය වෙත මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශ /ඒකක සමඟ සම්බන්ධීකරණය මඟින් ලබා දීම.

දිගු කාලීන වශයෙන් පවතින පාරිසරික ගැටළු සම්බන්ධයෙන් හා විශේෂයෙන්ම සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් විටින් විට යොමු කරනු ලබන විෂයය සම්බන්ධයෙන් අදාළ අංශ /ඒකක වල ප්‍රධානීන් සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ ප්‍රාදේශීය මෙහෙයුම් අංශය විසින් ලබා දෙන ලදි. එමෙන්ම විශේෂයෙන්

පහත සඳහන් ගැටළු සම්බන්ධයෙන් Online (මාර්ගගත) රැස්වීම් පවත්වන ලදී.

a.ඝන අපද්‍රව්‍ය කළමණාකරන අංශය සමග ඒකාබද්ධ සම්බන්ධීකරනය තුලින් ජනාධිපති කාර්යාලය හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සඳහා ජීව වායු පද්ධති සංකල්පිත ව්‍යාපෘති යෝජනාවක් සැකසීම සඳහා 2022/07/08 දි මාර්ගගත ක්‍රමයට රැස්වීමක් පවත්වන ලදි.

b. පරිසර දූෂණ පාලන ඒකකය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, අනුකූලතා පසුවිපරම් හා පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය හා නැගෙනහිර පළාත් / දිස්ත්‍රික් කාර්යාල ප්‍රධානීන් සමග “වී මොල් කර්මාන්ත මගින් සිදුවන පරිසර ගැටළු හා පැමිණිලි” සඳහා ගැටළු නිර්කරණයට හා විසඳුම් සඳහා අදාළ අංශ / ඒකක සම්බන්ධීකරණය සිදුකර 2022/08/02 රැස්වීම පවත්වන ලදි.

c. අධ්‍යක්ෂ ජනරාල්, පරිසර කළමණාකරණ හා ඇගයීම් ඒකකය, පරිසර දූෂණ පාලන ඒකකය හා දකුණු පළාත් / දිස්ත්‍රික් කාර්යාල ප්‍රධානීන් සමග 2022/11/22 දින, හම්බන්තොට ප්‍රදේශයේ හා දකුණු පළාත තුළ දීර්ඝ කාලයක් නොවිසඳුනු පාරිසරික ගැටළු සම්බන්ධව රැස්වීම පැවැත්වීම.

d.අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (උෂව පළාත්) හා ස්වභාවික සම්පත් කළමණාකරණ ඒකකය සමග අතිගරු ජනාධිපති තුමාගේ සම්ප්‍රාප්තියට පෙරාතුව බදුල්ල දිස්ත්‍රික්කයේ නොවිසඳුනු ගැටළු සම්බන්ධව 2022/12/12 දින රැස්වීම පැවැත්වීම.

B. ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලය ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.

I. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල පවතින ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය මැදිහත් වීම සිදු කිරීම.

a. පරිසර දූෂණ පාලන අංශය හා සියළු පළාත් / දිස්ත්‍රික් ප්‍රධානීන් සමග 2022/12/20 දින මාර්ගගත ක්‍රමයට “පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නව ගැසට් පත්‍රය (2264 / 17 හා 2264/18) ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු” සම්බන්ධ සාකච්ඡාව සම්බන්ධීකරණය කර (මාර්ගගත) පැවැත්වීම.

b. අනුකූලතා පසුවිපරම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය මෙහෙයුම් අංශය ද සක්‍රීයව සම්බන්ධ වී ඊට අදාළ පසුවිපරම් කටයුතු සඳහා රාජකාරි වල නිරත වීම.

II. පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු හඳුනා ගැනීම හා පැවැත්වීම.

a. 2022 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් / ව්‍යාපෘති පිළිබඳව පළාත් / දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු සහ දිස්ත්‍රික් කාර්යාල ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022/01/12 දින පවත්වන ලදි. එහි දී ‘‘සුරකිමු ගංගා’’ ජාතික පාරිසරික වැඩසටහන, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති හා ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන සම්බන්ධ මූලික දැනුවත් කිරීම සිදු කරන ලදී.

b. 2022/09/29 දින මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් විගණන කාර්යභාරය සම්බන්ධව මාර්ගගත ඔස්සේ දැනුවත් කිරීම සඳහා සහකාර විගණකාධිපති ඩී.ජී.ඒ.එස්.අනුලසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි. ඒ සඳහා සියළු පළාත්/දිස්ත්‍රික් කාර්යාල වල නිලධාරීන් සහ ප්‍රධාන කාර්යාලයේ බොහෝමයක් අංශ වල නිලධාරීන් ඊට සම්බන්ධ විය.

c. 2022/06/06 දින සම්මානනීය මහාචාර්ය අතුල පෙරේරා මහතා හා ආචාර්ය ජගත් ගුණවර්ධන මහතා විසින් නීති අංශ නිලධාරීන්, රසායනාගාර නිලධාරීන් හා අධිකාරියේ අනෙකුත් අංශ නියෝජනය කරමින් පැමිණි සිටි සියළු නිලධාරීන් ‘‘ජෛව සුරක්ෂිතතාව සම්බන්ධව පවතින නෛතික හා තාක්ෂණික කරුණු’’ සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

C.වෙනත් කරුණු

I. “සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහන සැලසුම්කරණ හා සම්බන්ධීකරණ කටයුතු වලට සහභාගී වීම.

II. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්) වෙත ජෛව සුරක්ෂිතතා කෙටුම්පත් පනත අවසන් කිරීමේ වගකීම භාරදීම සිදු වූ අතර ඒ අනුව ජෛව සුරක්ෂිතතා පනතෙහි කෙටුම්පත අවසන් කිරීමේ රාජකාරී කටයුතු හා ඊට අදාළ අනිකුත් කර්තව්‍යයන්ට සම්බන්ධ සිදු කල සියළු ක්‍රියාකාරකම් ඇතුළත් ප්‍රගතිය, අංක inf / 417 /3 / 22 දරණ තොරතුරු පත්‍රිකාව මගින් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පරිසර අමාත්‍යාංශය මූලිකත්වයෙන් ජෛව සුරක්ෂිතතා ව්‍යාපෘති කළමනාකාරිත්වය, නීති හා තාක්ෂණික උපදේශක (සම්මානනීය මහාචාර්ය අතුල පෙරේරා මහතා හා ආචාර්ය ජගත් ගුණවර්ධන මහතා), මෙම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්), අදාළ අංශ / ඒකක භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු, අධ්‍යක්ෂවරු හා නිලධාරි සමඟ පැවති ජෛව සුරක්ෂිතතා පනත් කෙටුම්පත් කිරීම, ව්‍යාපෘතියේ ප්‍රගතිය, රසායනාගාර පහසුකම්, පුහුණු වැඩමුළු හා ඊට අනුබද්ධ අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධ සාකච්ඡා කිරීමේ රැස්වීම්වාර තුනකට ප්‍රාදේශීය මෙහෙයුම් අංශය සහභාගි විය.

මෙම අංශයේ මූලිකත්වයෙන් ජෛව සුරක්ෂිතතා පනත් කෙටුම්පත සංශෝධනය, පුහුණු වැඩසටහන් සැකසීම, ව්‍යාපෘතිය ඇගයීම් රැස්වීම්(Terminal Evaluation Review) හා ජෛව සුරක්ෂිතතා පනත අධිකාරියේ පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ සාකච්ඡාවන් හා රැස්වීම් එකලොහක් සිදු කර ජෛව සුරක්ෂිතතා පනත කෙටුම්පත් කිරීමේ සංශෝධනයට අදාළ මූලික ක්‍රියාකාරකම් සිදු කර ඇත.

තවද ජාන විකරණය කරන ලද ජීවීන් හඳුනාගැනීම හා අනාවරණය කර ගැනීම සඳහා රසායනාගාර තුළ සිදු කරන ප්‍රයෝගික පුහුණුවක් සඳහා මෙම අධිකරියේ නිලධාරීන් හතරදෙනෙකු 2022.06.13 දින සිට 2022.06.16 දින දක්වා ඉන්දියාවේ විදේශීය පුහුණුවක් සඳහා යොමුකර ඇත.

CHAPTER 16 : පළාත් කාර්යාල වලින් සාර්ථක වැඩසටහන්

A. දදුරු ඔය අසල ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම




758 , 790.00 වැය කරමින් දදුරු ඔය අසල ආක්‍රමණශීලී පැල ඉවත් කිරීම සිදු කරන ලදී.

B. දදුරු ඔයේ ජල පෝෂක ප්‍රදේශයේ රුක් රෝපණ වැඩසටහන





සුරකිමු ගඟ වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මගින් ද මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. වැඩසටහන සඳහා රුපියල් 404,000.00ක මුදලක් වැය කර ඇත.

C. "හුස්ම දෙන තුරු" ජාතික රුක් රෝපණ වැඩසටහන 2022 හුස්ම ගැනීම සඳහා රුක් රෝපණය- කිලිනොච්චි දිස්ත්‍රික්කය.

මධ්‍යම පරිසර අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, කිලිනොච්චිය විසින් "හුස්ම සඳහා පැල" වැඩසටහන 2022 අප්‍රේල් 27 වන දින අක්කරායන් - ස්කන්තපුරම් ජල මාර්ග පරිශ්‍රයේදී සංවිධානය කරන ලදී. කිලිනොච්චිය, උතුරු පළාත් කාර්යාලයේ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ (රාජකාරී ආවරණ) ටී.සුබෝහරන් මහතාගේ මඟපෙන්වීම යටතේ මෙම රුක් රෝපණ වැඩසටහන පැවැත්විණි. මෙම අවස්ථාවට Access Engineering PLC ආයතනයේ නියෝජිත වන්නියනායක මහතා, අක්කරායන් වසමේ ග්‍රාම සේවක නිලධාරී, කිලිනොච්චි බටහිර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරී, ගොවි සංවිධානයේ සභාපති අක්කරායන් මහතා ඇතුළු මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සක්‍රීය සහභාගීත්වයෙන් සිදු විය. මෙහිදී උතුරු පළාත් කාර්යාලය, කිලිනොච්චිය විසින් මෙහිදී තේක්ක පැළ 500ක් රෝපණය කරන ලදී.




D. Tantri Tailers පුද්ගලික සමාගම, අංක **117, බියගම පාර, කැලණිය.**

මෙම කර්මාන්තය පරිසර ආරක්ෂණ බලපත්‍රය සමඟ 2003 සිට ක්‍රියාත්මක වේ. කර්මාන්තය පවත්වාගෙන යාමේදී ඇතිවන ශබ්දය සම්බන්ධයෙන් දිගින් දිගටම

පැමිණිලි ලැබිණි. කෙසේ වෙතත්, ලබාගත් ශබ්ද මට්ටම් මිනුම් වාර්තා පිළිගත හැකි සීමාවන් තුළ ඇත.

එබැවින් කාර්මික ක්‍රියාවලියෙන් ජනනය වන ශබ්දයේ මූලාරම්භය සැලකිල්ලට ගනිමින් වඩාත් තාක්ෂණික හා නිශ්චිත මතයකට පැමිණීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විසින් දින තුනක අඛණ්ඩ ශබ්ද මට්ටම් තක්සේරු වාර්තාවක් ලබා ගන්නා ලදී.

ඉහත වාර්තාවට අනුව, අදාළ කර්මාන්තය එහි සීමාවේ පසුබිම් ශබ්ද මට්ටම නිවැරදි නොකර ක්‍රියාත්මක වීමෙන් ජනනය වන ශබ්ද මට්ටම ප්‍රමිතිය ඉක්මවා නැත. ඒ අනුව අදාළ කර්මාන්තය 1996.01.01 දරණ නිශ්චිත ජාතික පාරිසරික (ශබ්ද පාලන) රෙගුලාසිවලට අනුකූල වේ.

ඒ අනුව කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන ශබ්දය පිළිබඳ පැමිණිල්ල ඵලදායී ලෙස විසඳා ඇති බව විද්‍යාත්මකව තහවුරු කර ඇත.

E. මරගල පරිසර ආරක්ෂක ප්‍රදේශයෙහි පර්යේෂණ අධ්‍යයනය



මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය මේ වන විට මාරගල EPA හි පාරිසරික ඇගයීම සඳහා ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා දර්ශක සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයනයක් සිදු කරයි. ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් සඳහා සිදු කරන ලද මෙවැනි අධ්‍යයනයක පළමු අවස්ථාව මෙයයි . පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ සහභාගීත්වයෙන් අධ්‍යයනය සිදු කෙරේ.


F. බණ්ඩාරවෙල ඉඩම් අවහිර කිරීමේ ව්‍යාපෘතියේ අරමුණින් අනවසර ඉඩම් එළිපෙහෙළි කිරීම සඳහා ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග.

G. බදුල්ල සන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය වැඩිදියුණු කිරීම

බදුල්ල නගරසභා බල ප්‍රදේශය, බදුල්ල දිස්ත්‍රික්කයේ ඉහළ ජනාකීර්ණ ප්‍රදේශයක් ලෙස සැලකිය හැකි අතර වාණිජ හා ගෘහස්ත අපද්‍රව්‍ය උත්පාදනය ගැටළුකාරී මට්ටමක පවතී. දෛනික අපද්‍රව්‍ය එකතු කිරීම ටොන් 18-22 ක් පමණ වන අතර මීට පෙර බදුල්ල නගරසභාව විසින් එකතු කරන ලද අපද්‍රව්‍ය විවෘතව බැහැර කිරීම සිදු කරන ලද අතර ප්‍රදේශයේ කාන්දු බැහැර කිරීම, දුගඳ, සෞඛ්‍ය ගැටලු ආදිය හේතුවෙන් ඉඩම් හා ජලය දූෂණය වීම වැනි සැලකිය අත්තනෝමතිකව සිදුකරණ ඉඩම් එළිපෙහෙළි කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය මගින් පැමිණිලි කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ උඟව පළාත් කාර්යාලය මේ සම්බන්ධයෙන් වහා අවධානය යොමු කර අදාළ ආයතනවල සහභාගිවන්නන් ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් කැඳවා නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත. ව්‍යාපෘති යෝජකයා වරද පිළිගත් බැවින් දඩ නියම කරන ලදී. අධිකරණ එකොළහකට පසුව බණ්ඩාරවෙල මහේස්ත්‍රාත්වරයා කැඳවා IEE ක්‍රියාවලිය යටතේ පාරිසරික අනුමැතිය ලබා ගන්නා ලදී.

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ "බඹරකන්ද" සහ "කුඩාඔය" යන "බඹරකන්ද" සහ "දියලුම" දියඇලි අසල සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සහ පරිසර දූෂණය පාලනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ එම ප්‍රදේශයේ ප්ලාස්ටික් සහ පොලිතින් ඉවත් කිරීමේ පිරිසිදු කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. "බඹරකන්ද" දිය ඇල්ල සහ එහි ප්‍රවේශ මාර්ගය සහ ජල දූෂණය සම්බන්ධ ප්‍රදර්ශන පුවරුව ස්ථානගත කිරීම සහ අපද්‍රව්‍ය බඳුන් සැපයීම ද සිදු කරණ ලදි.





හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මධ්‍යම පරිසර අධිකාරිය මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට දායක වූ ප්‍රධාන දායකයින් විය.

යුතු පාරිසරික ප්‍රතිවිපාක ඇතිවූ බව නිරීක්ෂණය කර ඇත. නමුත් මෙම වැඩසටහනින් පසු 1970 ට පෙර තුරහ තරහ පිටියක් සහිත සුන්දර වැවක් සහිත ප්‍රෙද්ශය නැවත සකස් කළ හැකි විය.

අනතුරුව සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන පළාත් මෙහෙයුම් කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස මෙම ගැටලු විසඳීමට සුදුසු විසඳුම් සෙවීමට උඟව පලාත් කාර්යාලය, ප්‍රධාන කාර්යාලය සම්බන්ධ විය. ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ කමිටුව පිහිටුවන ලදී. ගරු ආණ්ඩුකාරවරයාගේ උපදෙස් පරිදි ආණ්ඩුකාරවරයා සහ ප්‍රධාන ලේකම් ආණ්ඩුකාර.

උaව පළාත් කාර්යාලයේ තාක්ෂණික මගපෙන්වීම, ආයතනික සහය සහ සම්බන්ධීකරණය සමඟින් විවෘතව බැහැර කරන ලද ප්‍රදේශය වැඩිදියුණු කිරීමට දායක විය. අද වන විට කුණු කසළ නිසා ඇතිවන පාරිසරික ප්‍රතිවිපාක කළමණාකරණය කිරීමට හැකි වී ඇත.





ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර, වැඩිදියුණු කිරීමෙන් පසුව

සිදුවීම (4)	රුක් රෝපණ හුස්ම ගැනීමේ ව්‍යාපෘතිය (හුස්ම දෙන තුරු)-2022
අරමුණ	ගෝලීය උණුසුම අවම කරමින් ගස් සිටුවීමෙන් මිහිමත නිරෝගී පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම
ඉලක්ක කණ්ඩායම	පොදු ස්ථාන, ආගමික ස්ථාන, පාසල් සහ ඓතිහාසික ස්ථාන
දිනය සහ වේලාව සහ ස්ථානය	2022.12.21 පෙ.ව. 9.00 ට සහ Mn/ බදියුදීන් GMMS වෙල්ලිමලෙයි, Mn/සිලාවතුරෙයි GMMS, Mn/සවාරියර්පුරම් RCTMS, Mn/මුසලි ජාතික පාසල, MOH කාර්යාලය, MOH කාර්යාලය මුසලි සහ ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය, මුසලි
විස්තර	▪ Mn/ Badhiudeen GMMS Vellimalai වෙතින් EPP සිසුන් විසින් ඉදිරිපත් කරන ලද පාරිසරික ගීතය සහ දිවුරුම. ▪ මන්නාරම OIC/CEA විසින් ගස් සිටුවීමේ වැදගත්කම සහ පරිසර පද්ධතිය සංරක්ෂණය පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබා දෙන ලදී. ▪ ගස් පැළ 500 ක්, කොම්පෝස්ට් සහ ආරක්ෂිත කූඩු ලබා දෙන ලදී.





H. විශේෂ ජනාධිපති පදක්කම් ව්‍යාපෘති

පරිසර නියමු ජනාධිපති පදක්කම සඳහා වන ඔහුගේ ව්‍යාපෘතිය සඳහා දැනට ප්‍රායෝගික ගැටලුවකට විසඳුමක් ලෙස පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට දැඩි දුෂ්කරතාවයකට මුහුණ පා සිටින කිලිනොච්චි 09 වන විජයබාහු පාබල රෙජිමේන්තු යුද හමුදා කඳවුරේ වැසි ජල සංරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම, කොළඹ 02. , ආරක්ෂක සේවා විද්‍යාලයේ පරිසර නියමු PRD කවීෂා දිනාල් සිසුවා විසින් සිදු කරන ලදී.





I. පාරිසරික පුරෝගාමීන්ගේ ගෙවතු වගා වැඩසටහන – 2022

රජය විසින් දියත් කර ඇති "වග සංග්‍රාමය" වැඩසටහනට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරියේ දකුණු පළාත් කාර්යාලය මගින් දකුණු පළාතේ පාසල් පරිසර පුරෝගාමීන්ගේ තරඟ වැඩසටහනක් ලෙසද මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ පරිසර පුරෝගාමීන්ගේ ආහාර සුරක්ෂිතතාව සඳහා ගෙවත්ත ආරම්භ කිරීමට ප්‍රායෝගික දැනුම ලබා දෙමින් ඔවුන් දිරිමත් කිරීම සහ ඔවුන් දිරිමත් කිරීමයි.

මෙම වැඩසටහන ආරම්භ වී මාස දෙකහමාරකට පසු විද්‍යුත් මණ්ඩලය විසින් පරිසර පුරෝගාමීන්ගේ ගෙවතු නිරීක්ෂණය කරමින් ඇගයීම් සිදු කර දිස්ත්‍රික්ක පදනම් කරගත් හොඳම උද්‍යාන 25 සඳහා සහතික පත්‍ර 25ක් ප්‍රදානය කරන ලදී.





J. ඉලෙක්ට්‍රොනික සහ විදුලි අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන -2022

මෙම වැඩසටහන මධ්‍යම පරිසර අධිකාරියේ දකුණු පළාත් කාර්යාලය විසින් 2022.11.30 වන දින BOI කොග්ගල ක්‍රීඩාංගනයේදී ප්‍රධාන කාර්යාලයේ අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සම්බන්ධීකරණ මගපෙන්වීම යටතේ පවත්වන ලදී.

මෙම වැඩසටහනේදී ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එක්රැස් කරන ලද විද්‍යුත් අපද්‍රව්‍ය කොග්ගල ප්‍රදේශයට ප්‍රවාහනය කර මධ්‍යම පරිසර අධිකාරියට භාරදෙන ලදී. මෙම වැඩසටහනේ දී එක්රැස් කරන ලද මුළු ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් දෙකක් වූ අතර එකතු කරන ලද සියලුම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය දිනය අවසානයේදී විද්‍යුත් අපද්‍රව්‍ය බලපත්‍රලාභීන්ගේ සමාගම වෙත භාර දෙන ලදී.





K. පරිසර හිතකාමී කුඩා පරිමාණ ව්‍යාපෘති ඇගයීම ක්‍රියාත්මක කිරීම ලෝක පරිසර දිනය සඳහා වන තරඟය - 2022, දිස්ත්‍රික් මට්ටම - යාපනය දිස්ත්‍රික්කය.

2022 ලෝක පරිසර දිනය නිමිත්තෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් දීප ව්‍යාප්ත කුඩා පරිමාණ පරිසර හිතකාමී ව්‍යාපෘති ඇගයීම් තරඟයක් දියත් කරන ලදී. සෑම දිස්ත්‍රික්කයකම තරඟයක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව යාපනය දිස්ත්‍රික්කයෙන් ව්‍යාපෘති 12ක් තෝරා ගත්තා. තරඟ ඇගයීම් වාරිකා සාර්ථකව සිදු කරන ලදී. ඇගයීම් සලකුණු කිරීමේ නිර්ණායක අනුව ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලදී.









2022.04.24 දින පොලිතින් භාවිතය සම්බන්ධයෙන් පොළොන්නරුව කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සිරකරුවන් සඳහා පවත්වන ලද L. වැඩසටහන .

CHAPTER 17 : මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරණු ලබන විශේෂ ව්‍යාපෘති.

17.1 "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන .

A. හැඳින්වීම

"සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන ශ්‍රී " ලංකාවේ ගංගා ද්‍රෝණි සියල්ලම සංරක්ෂණය කිරීමේ උදාර චේතනාවෙන් හා පුළුල් දැක්මක් සහිතව ආරම්භ .කරන ලද කර්තව්‍යයකි

වසර ගණනක් මිනිසා විසින් අවිධිමත් ව මෙම ගංගාභාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ බොහෝ ගංගාවන්ගේ ජලයඃජුවම භාවිතයට ගැනීමට නුසුදුසු තත්වයට පත්ව ඇත. මේ හේතුවෙන් වර්තමානය වන විට පානීය අවශ්‍යතාවයන් මෙන් ම වෙනත් කටයුතු සඳහා පරිභෝජනයට අවශ්‍ය ජලය සපයා ගැනීම දුෂ්කරතත්වයකට පත්ව ඇත.

මෙරට ගංගා සහ ජලය සංරක්ෂණය උදෙසා ආයතන රැසක් පිහිටවා ඇත. මෙම ආයතන සියල්ල විවිධාකාර වූ වගකීම් ඉටුකරමින් සිටින නමුත් මෙම ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීමෙන් සමහර කාර්යයන් නිසි ලෙස ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම තත්වය මගහරවා ගැනීමට, “සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහන මගින් ගංගා සංරක්ෂණය සඳහා අදාළ සියලු පාර්ශවයන් ඒකරාශීකර සියලුම ගංගා ද්‍රෝණි සංරක්ෂණයට කටයුතු කිරීම උදෙසා නිසි තිරසාර සංරක්ෂණ වැඩසටහනක් සැකසීමට කටයුතු යොදා ඇත.

2020 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය මගින් ස්ථාන 10,377 නිරීක්ෂණය කොට ගංගාවන් පිළිබඳ ව කරන ලද සමීක්ෂණයේ දී හෙළිවූ කරුණු අනුව ගංගා ජලයේ ගුණාත්මකභාවයට හානිවන පහත කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

- අපජලය එක්වීම හේතුවෙන් සිදුවන ජල දූෂණය
- ඝන අපද්‍රව්‍ය සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හේතුවෙන් සිදුවන ජල දූෂණය
- පාංශුඛාදනය සහ ගං ඉවුරු ඛාදනය
- අනවසර හා අවිධිමත් ඉදිකිරීම්
- ගංගා රක්ෂිත නීත්‍යානුකූල නොවීම
- අනවසර හා පාලනයකින් තොරව සිදුවන ඛණිජ කැනීම්.

B. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ සියලුම ගංගා, ජල මූලාශ්‍ර පවිත්‍ර කොට විධිමත් සැලැස්මක් යටතේ පොදු ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම අරමුණු කර ගනිමින් ‘‘සුරකිමු ගංගා’’ ජාතික පාරිසරික වැඩසටහන ස්ථාපනය කර ඇත.

මේ ජාතික වැඩසටහනක් සඳහා පරිසර අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්පාදනය කරන ලද අතර සඳහා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

C. අපේක්ෂිත ප්‍රතිපල හා ප්‍රතිලාභ

මෙම වැඩසටහන තුළින් පිරිසිදු ජලධරාවක් මෙන්ම ඒව විවිධත්වයෙන් සපිරි ගංගා පරිසර පද්ධතියක් බිහි කිරීමට අපේක්ෂිතය. මේ අනුව මෙම වැඩසටහන පරිසරය සංරක්ෂණය කරමින් රට සංවර්ධනය කරා මෙහෙයවීම සඳහා වන ඉලක්ක සපුරාගැනීමට සැකසුනු ප්‍රධාන වැඩසටහනකි.

D. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මෙහෙයුම් යාන්ත්‍රණය

"සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ ප්‍රධාන ස්ථර (කමිටු) 03ක් හරහා මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වේ.

- ජාතික මට්ටමින් ස්ථාපිත අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව.
- දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් කමිටුව.
- ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය කමිටුව.

සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන ජාතික මට්ටමින් මෙහෙයවීම සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් **අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුවක්** ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ ලේකම්වරයා වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබයි.

සුරකිමු ගංගා වැඩසටහනට අදාල සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ අදාල ලේකම්වරුන් විසින් නම් කරන ලද අතිරේක

ලේකම්වරයෙකු මෙම කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කරනු ලබයි. අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව මාස දෙකකට වරක් රැස් වේ.

මෙම ජාතික වැඩසටහන රට තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින්**"සුරකිමු ගංගා දිස්ත්‍රික් කමිටු"**25 ක් පිහිටුවා ඇත. මෙම කමිටුව දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වන අතර ලේකම් වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයේ අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂවරයකු කටයුතු කරනු ලබයි. කමිටුවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සංයුතියකින් යුතු මෙම කමිටුව මසකට වරක් රැස් වේ.

මෙම වැඩසටහනේ ප්‍රධාන සහ බිම් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමිවන්නේ **සුරකිමු ගංගා ප්‍රාදේශීය කමිටුව** වෙතයි .ඒ අනුව ගංගා සංරක්ෂණය කර කළමනාකරණය කිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කමිටු 310ක් පිහිටුවා ඇත. තවද මේ සඳහා අදාළ වන සියළුම ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද මෙම කමිටුව මඟින්සිදුකෙරේ.

සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන ක්‍රියාත්මක කරවීම හා මෙහෙයවීම, සඳහා **"සුරකිමු ගංගා" ලේකම් කාර්යාලය** පිහිටුවා ඇති අතර මෙම කාර්යාලය, බත්තරමුල්ල පිහිටි මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ස්ථානගත කර ඇත.

1. "සුරකිමු ගංගා" භූගෝලීය තොරතුරු තාක්ෂණික (GIS) වෙබ් අඩවිය

ශ්‍රී ලංකාවේ ගංගා සංරක්ෂණයේ ප්‍රමුඛතම වැඩසටහන වශයෙන් "සුරකිමු ගංගා" වැඩසටහනේ අවකාශීය දත්ත සහ තොරතුරු

රැස්කිරීම, කළමනාකරණය සහ ඉදිරිපත් කිරීම සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික පහසුකම් භාවිතයෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර තිබේ. මෙම පද්ධතිය ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට, වාර්තා කිරීමට මෙන්ම මහජනතාවට ද ව්‍යාපෘති ප්‍රගතිය නිරීක්ෂණය කළ හැකි පරිදි ජනතාවට විවෘත වෙබ් අඩවියක් ලෙස පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මෙමගින් සපයනු ලබන සේවාවන් වන්නේ,

- ගංගාවල දූෂණ මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා සිදුකරන ලද සමීක්ෂණ දත්ත හා තොරතුරු ලබාගැනීම
- අලුතින් හඳුනාගනු ලබන දූෂණ මූලාශ්‍ර වාර්තා කිරීම
- ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය කමිටු සාමාජිකයින්ගේ තොරතුරු ලබාගැනීම
- ව්‍යාපෘති යෝජනා ලබාදීම සහ ලබාදී ඇති ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය
- ව්‍යාපෘති කටයුතු වල ප්‍රගතිය වාර්තා කිරීම සහ ප්‍රගතිය පසුවිපරම් කිරීම
- "සුරකිමු ගංගා" මාර්ගෝපදේශය සහ ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍ර බාගත කිරීම
- මහජනතාවට පාරිසරික ප්‍රශ්න පිළිබඳව තොරතුරු වාර්තා කළ හැකි වීම

ඉහත සේවාවන් ලබාගැනීම සඳහා "සුරකිමු ගංගා" භූගෝලීය තොරතුරු තාක්ෂණික වෙබ් අඩවියට https://surakimuganga.maps.arcgis.comසබැඳිය ඔස්සේ සම්බන්ධ වීමේ හැකියාව ඇත.

2. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා වල ප්‍රගතිය.

2022 වර්ෂය සඳහා "සුරකිමු ගංගා" ප්‍රාදේශීය කමිටු මගින් ව්‍යාපෘති යෝජනා 102ක් ඉදිරිපත් වී තිබූ අතර ඉන් ව්‍යාපෘති යෝජනා 72ක් ව්‍යාපෘති ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. එම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා වලින් ව්‍යාපෘති 30 ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරන ලදී.

TABLE 48 : 2022වසර තුළ ශ්‍රී ලංකාවේ සියලුමපළාත් ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා 30 ක් ''සුරකිමු ගංගා'' ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් අනුමත කරන ලදුව ප්‍රතිපාදන නිදහස් කර ඇත.

අනු අංක	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අනුමතකළප්‍රතිපාදන රු.	ව්‍යාපෘතියේ නම
1	මොණරාගල	මොණරාගල	9,719,081.76	මරගල ඔය සංරකෂණය කිරීමේ වැඩසටහන.
2		බුත්තල	4,735,033.10	බුත්තල මැණික් ගඟ සංරක්ෂණය කිරීමේ වැඩසටහන.
3	හම්බන්තොට	වීරකැටිය	1,743,000.00	ඌරුබොකුඔය සංරක්ෂණ ව්‍යාපෘතිය. ඌරුබොකු ඔයෙහි හානියට ලක්ව ඇති ඇළ ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය.

අනු අංක	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අනුමතකළප්‍රතිපාදන රු.	ව්‍යාපෘතියේ නම
4		අහුණකොළපැලැස්ස	2,196,924.82	කව්විගල්ආර ඉවුරු සංරක්ෂණ ව්‍යාපෘතිය.
5	ත්‍රිකුණාමලය	සේරුවිල	1,410,400.00	මාවිල්ආරු (රාජ ඇළ කොටස) ආක්‍රමණකාරී වල් පැළෑටි ඉවත් කිරීමේ ව්‍යාපෘතිය.
6	ගාල්ල	අම්බලන්ගොඩ	2,349,400.00	මාදම්පාකලපුවේ පෝෂක අතුරු ඇළමාර්ගයක් වන හල්වතුර ඇළ පවිත්‍ර කර සංරක්ෂණය කිරීම.
7	මාතර	දෙවිනුවර	356,090.12	අපරැක්ක උතුර රතු දොළ ආශ්‍රිතව ජලයේ ගුණාත්මක භාවය ආරක්ෂා වන පරිදි රතු දොළ පිරිසිදුකිරීම හා රුක් රෝපණය.
8	කළුතර	බුලත්සිංහල	900,000.00	ගල්වක් ඇළ ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය.
9		අගලවත්ත	928,553.50	රත්මලේ ප්‍රදේශය හරහා ගලා යන පැවත්ත ගඟෙහි කිලෝමීටරයක් පමණ දිගින් යුතු ආරම්භක කොටස තුළ ඉවුරු දෙපස රක්ෂිත සීමා වෙන් කිරීම සහ ගං ඉවුරු සංරක්ෂණය කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
10	පොලොන්නරුව	ඇලහැර	1,461,000.00	මිනිපුරගම ආශ්‍රිත අඹන් ගහ සංරක්ෂණ වැඩසටහන.
11	නුවරඑලිය	වලපනේ	1,937,453.06	වතු ආශ්‍රිතව ඇති ජල මූලාශ්‍ර මැන වෙන් කිරීම සහ භූමි සළකුණු කිරීම.(රක්ෂිත වෙන් කරගැනීම.)
12		කොත්මලේ	1,430,400.00	කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මහවැලි ගඟ ඉහළ ජල පොෂක ප්‍රදේශයේ පිහිටි ජලමූලාශ්‍ර සහිත වඟුරු බිම් හඳුනා ගැනීම සහ සංරක්ෂණය.
13		හඟුරන්කෙත	1,237,920.00	රක්ෂිතසංරක්ෂණය
14	බදුල්ල	හල්දුම්මුල්ල	360,320.00	"බඹරකන්ද" සහ "කුඩාඔය" හි "බඹරකන්ද" සහ "දියලුම" දියඇල්ල අසල පරිසර දූෂණය පාලනය සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන
15		මහියංගනය	352,160.00	ජල දූෂණය අවම කිරීම ගං ඉවුරු බාදනය සහ මහවැලි ගඟ සංරක්ෂණය
16		හපුතලේ	546,507.00	හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හපුතලේගම ඔය, රංජල්ලාව ඔය සහ කහගොල්ල ඔය අසල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ගං ඉවුරු සංරක්ෂණ වැඩසටහන.
17		ඒකාබද්ධප්‍රා.ලේ.	3,928,332.10	බදුලුඔයද්‍රෝණියසංරක්ෂණයසහකළමනාකරණ වැඩසටහන
18	කුරුණෑගල	වාරියපොළ	404,000.00	දැදුරුඔය ජල පෝෂක කලාපය සංරක්ෂණය සඳහා රුක් රෝපණය කිරීමේ වැඩසටහන.
19		රිදීගම	1,512,246.50	දැදුරුඔය ආශ්‍රිත ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම.
20	පුත්තලම	වනාතවිල්ලුව	467,990.00	කළාඔයගං ඉවුර පොලිතින් සහ ප්ලාස්ටික් වලින් ආරක්ෂා කිරීම

අනු අංක	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අනුමතකළප්‍රතිපාදන රු.	ව්‍යාපෘතියේ නම
21	කොළඹ	කඩුවෙල	1,465,287.44	කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කැළණි ගං ඉවුරේ සිට මීටර් 500 ක් ඇතුලත පිහිටිඅප ජලය ජනනය වන කර්මාන්ත වලින් මුදාහරින අපජලය මඟින් කැළණි ගඟ දූෂණය පාලනයකිරීම.
22	මහනුවර	උඩුනුවර	1,668,000.00	ගෙලිඔයට සන අපද්‍රව්‍ය එකතුවීම වැළැක්වීම මඟින් ගෙලි ඔය සුරැකීමේ ව්‍යාපෘතිය.
23		මැදදුම්බර	1,570,750.00	සුරකිමුගංගා ව්‍යාපෘතිය යටතේ කොටගහ වතු නිවාස ආශ්‍රිතව වැසිකිලි පද්ධතියක් නිර්මාණයකිරීම.
24		පස්බාගේ කෝරළේ	405,000.00	මහවැලිගඟට ප්ලාස්ටික් බෝතල් හා පොලිතීන් එකතු වීම වැලැක්වීමේ ව්‍යාපෘතිය.
25		කුණ්ඩසාලේ	308,400.00	වික්ටෝරියා ජලාශයේ පවිත්‍රතාව සුරැකීම, ජලාශයේ ජෛවීය පැවැත්ම රැක ගැනීම හා එහි ජලයේ ගුණාත්මක බව ආරක්ෂා කිරීම සඳහා ජලාශයට එකතු වන පොලිතීන් හා ප්ලාස්ටික් සණඅපද්‍රව්‍ය ජලාශයේ වම් ඉවුරේ පිහිටි ආඔකොටේ මිරිදිය දිවර තොටුපල අසලින් එක් රැස්කිරීමේ ව්‍යාපෘතිය.
26		පූජාපිටිය	140,904.74	පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් භූනන් ඔයට අනවසර කසළ බැහැර කිරීම මඟින් දූෂණයවීම අවම කර ගැනීමේ ව්‍යාපෘතිය.
27		උඩපළාත	459,454.00	උඩ පළාත ගම්පෙල නගරයේ අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් ජල මූලාශ්‍ර වලට සන අපද්‍රව්‍යය එකතුවීම වැලැක්වීමේ ව්‍යාපෘතිය.
28		යටිනුවර	142,629.20	ගන්නෝරුව බීජ පර්යේෂණ ආයතනය ඉදිරිපිට සංචාරක ආකර්ශණ කලාපය ආශ්‍රිතව ප්ලාස්ටික් බෝතල්, බියර් කෑන්, වීදුරු බෝතල් එක් රැස් කිරීමේ කුටීර ඉදි කිරීම හා ඊට අදාල දැන්වීම්පුවරු ඉදි කිරීම මඟින් මහවැලි ගඟ දූෂණය වීම වැලැක්වීම.
29		මිනිපේ	1,703,000.00	මහියංගනය හසලක පාලමේ සිට මහවැලි ගඟ හරහා කිලෝමීටර් දෙකක පමණ දුරක් සහිත ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශයේ පාතේනියම් සහ යෝධ නිදිකුම්බා ශාක ඉවත් කිරීම.
30		පාතහේවාහැට	2,322,644.85	වික්ටෝරියා ජලාශ රක්ෂිතයට සහ තලාතු ඔයට සණ අපද්‍රව්‍ය එක් කිරීම වැලැක්වීම මඟින් වික්ටෝරියා ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය.

TABLE 49 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ පොදු කර්තව්‍යන්ගේ ප්‍රගතිය

	ප්‍රධාන ක්‍රියාකාරකම	තොරතුරු / 2022වසර සඳහා වාර්ෂික ඉලක්ක	31.12.2022 දින දක්වා ප්‍රගතිය
1	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම පැවැත්වීම	දැනුවත් කිරීමේ සැසි 25 ක් පවත්වා ඇත	25
2	"සුරකිමු ගංගා" දිස්ත්‍රික් කමිටු පිහිටුවීම	දිස්ත්‍රික් කමිටු 25 ක් පිහිටුවා ඇත	25

	ප්‍රධාන ක්‍රියාකාරකම	තොරතුරු / 2022වසර සඳහා වාර්ෂික ඉලක්ක	31.12.2022 දින දක්වා ප්‍රගතිය
3	"සුරකිමු ගංගා" ප්‍රාදේශීය කමිටු පිහිටුවීම	ප්‍රාදේශීය කමිටු310	310
5	ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්	රැස්වීම් 1ක් පවත්වා ඇත	1*
6	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටු රැස්වීම	පරිසර අමාත්‍යාංශය විසින් සාමාජිකයින් 7 දෙනෙකු පත් කර ඇත	
6.1	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටු රැස්වීම් පැවැත්වීම	රැස්වීම් වාර 5ක් පවත්වා ඇත.	5*
6.2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැබී ඇති ව්‍යාපෘති යෝජනාගණන	ව්‍යාපෘති යෝජනා 102ක් ලැබී ඇත.	102
6.3	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටුවට යොමු කර ඇති ව්‍යාපෘති යෝජනා ගණන	ලැබී ඇති ව්‍යාපෘති යෝජනා 102න් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති යෝජනා 72 ක් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.	72
6.4	ඇගයීම් කමිටුව මගින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	ව්‍යාපෘති යෝජනා 30 ක් අනුමත කර ඇත.	30*
7	ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටුවේ උපදෙස් පරිදි)	ව්‍යාපෘති පසු විපරම් කිරීම සඳහා ඒකාබද්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලදී.	10*

* රට තුල ඇති වූ මුල්‍ය අර්බුධය හේතුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් 2022.04.26 වන දින ප්‍රකාශයට පත් කරන ලද චක්‍රලේඛ අංක 03/2022, "රාජ්‍ය ගිණුම් පාලනය කිරීම" අනුව 2022 වර්ෂයේ සිදු කිරීමට අපේක්ෂිත කාර්යන් සහ වැඩසටහන් සංශෝධනය කරන ලදී.

3. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මුල්‍ය ප්‍රගතිය

2022වසර තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ මුල්‍ය අර්බුධය හේතුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් 2022.04.26 වන දින ප්‍රකාශයට පත් කරන ලද චක්‍රලේඛ අංක 03/2022, "රාජ්‍ය ගිණුම් පාලනය කිරීම" අනුව 2022 වර්ෂයේ ඉදිරි කාල පරිච්ඡේදය සඳහා සිදු කිරීමට අපේක්ෂිත කාර්යන් සහ වැඩසටහන් සංශෝධනය කරන ලදී. ඒ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේඛම් විසින් සියලුම දිසාපතිවරුන් වෙත දන්වා යවන ලදී. ඒ අනුව අනුමත කරන ලද බොහෝ ව්‍යාපෘති මුල්‍ය ප්‍රතිපාදන පාලනය කිරීම ගැටළු හේතුවෙන් අත්හිටුවා ඇති බවට ප්‍රාදේශීය කමිටු මගින් දන්වා ඇත.

TABLE 50 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මුල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘති කාලසීමාව	වෙන් කරන ලද ප්‍රතිපාදන (2022) රුපියල් මිලියන	31.12.2022 දිනට ප්‍රගතිය
		රුපියල්
ජනවාරි - දෙසැම්බර් 2022	73,000,000.00	29,780,628.24

TABLE 51 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ වියදම් සාරාංශය

සුරකිමු ගංගාජාතික පරිසර වැඩසටහන - 2022			
2022/11/25 දක්වා ප්‍රතිපාදන සාරාංශය **වැය ශීර්ෂය : 160-2-3-145-2509(11)**			
අනු අංක	**දිස්ත්‍රික්කය**	**අතැති බිල්පත්ඇතුළුවදිස්ත්‍රික්කයට ලබාදුන් මුළුප්‍රතිපාදන ප්‍රමාණය**	**2022/11/25 දිනට වැය ශීර්ෂය යටතේ දිස්ත්‍රික් මට්ටමින් වියදම**
1	කළුතර	5,296,867.98	3,019,514.48
2	මහනුවර	6,522,234.63	970,830.63
3	මාතලේ	2,991,174.88	1,495,587.44
4	නුවරඑළිය	4,931,773.06	4,406,225.52
5	ගාල්ල	4,668,130.00	2,370,797.46
6	මාතර	3,801,436.25	3,460,866.55
7	හම්බන්තොට	2,196,924.48	0.00
15	ත්‍රිකුණාමලය	1,410,400.00	750,780.00
16	කුරුණෑගල	1,878,246.50	1,159,540.00
17	පුත්තලම	400,240.00	28,000.00
19	පොලොන්නරුව	758,907.30	63,069.20
20	බදුල්ල	3,320,677.02	415,504.60
21	මොණරාගල	14,708,582.23	1,070,880.97
22	රත්නපුර	3,080,317.36	3,059,431.39
23	කෑගල්ල	15,004,800.00	7,502,400.00
24	කොළඹ	7,200.00	7,200.00
එකතුව		**70,977,911.69**	**29,780,628.24**

CHAPTER 18 : මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මුල්‍ය අංශය

18.1 මානව සම්පත් සංවර්ධන ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සියළුම කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා සංවර්ධනය මානව සම්පත් සංවර්ධන ඒකකයේ ප්‍රධාන කාර්යයක් වන අතර, ඊට අමතරව කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම සිදු කරනු ලැබේ.

2022 වර්ෂය තුළ කාර්ය මණ්ඩලයට දේශීය හා විදේශීය වශයෙන් පහත සඳහන් පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

A. දේශීය පුහුණුව

1) මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්, පරිසර නිලධාරීන්, කළමනාකරණ සහකාරවරුන්, පුස්තකාල කාර්ය මණ්ඩලය, නෛතික හා අභ්‍යන්තර විගණන ඒකක සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් ඇතුළුව මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා 2022 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 24 ක් සඳහා සංවිධානය කර පහසුකම් සපයන ලදී.

2) ඉහත වැඩසටහන් අතරට පහත කණ්ඩායම් පුහුණු සහ වැඩමුළු ඇතුළත් විය.

පුහුණු වැඩසටහනේ නම	සහභාගී වූ නිලධාරීන් ගණන
1) කළමනාකරණ සහකාරවරුන් සඳහා පුහුණු වැඩසටහන	110
2) ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	120
3) රියදුරන් සඳහා පුහුණු වැඩසටහන	100
4) කර්යාල සහායකයින් සඳහා පුහුණු වැඩසටහන	50
5) නීති කාර්ය මණ්ඩලය සඳහා දෙදින පුහුණු වැඩසටහන	15
6) ISO 9001:2015 පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	55
7) සංවර්ධන නිලධාරීන් සඳහා පස් දින මාර්ගගත පුහුණු වැඩසටහන	300

B. විදේශීය පුහුණුව

2022 වර්ෂය තුළදී, පරිසර දූෂණ පාලනය, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය, වායු තත්ත්ව අධීක්ෂණය, පාරිසරික කළමනාකරණය සහ තක්සේරු කිරීම් යනාදී ක්ෂේත්‍රවල කෙටිකාලීන පුහුණුවීම් සඳහා ප්‍රධාන වශයෙන් නිලධාරීන් 12 දෙනෙකු නම් කරන ලද අතර 2022 දී 36 දෙනෙකු මූලික වශයෙන් තෝරා ගන්නා ලදී.

2022 තුළ, මානව සම්පත් සංවර්ධන ඒකකය මගින් මූලික විමර්ශන 36 ක් සිදු කරන ලදී.

18.2. මානව සම්පත් කළමනාකරණ උප ඒකකය

මානව සම්පත් කළමණාකරන උප ඒකකය මගින් ප්‍රධාන වශයෙන් පහත කාර්යයන් ක්‍රියාවට නංවනු ලැබේ.

- සමස්ත මානව සම්පත් සැලසුම්කරණය
- තෝරා ගැනීම්, බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම්
- වැටුප් කළමනාකරණය සහ සුපරීක්ෂණය
- එක් එක් සේවකයාගේ කාර්යයාමනය ඇගැයීම
- සේවකයින්ගේ දුක්ගැනවිලි සමනය කිරීම
- මානව සම්පත් දත්ත ගබඩාව පවත්වාගෙන යාම

2021.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1166 ක් වන අතර, ස්ථීර සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාව 869 ක් විය.

සභාපති සිරිපාල අමරසිංහ මහතා 2022.10.24 දින අධිකාරියේ සේවය අවසන් කල අතර, 2022.10.25 දින සිට සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සමාජියෙකු ලෙස සුපුන් යු. පතිරගේ මහතා වැඩ භාර ගන්නා ලදි.

TABLE 52 : 2022 වර්ෂයේ සේවයට බඳවා ගැනිම්, උසස්වීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය හැර යාම සහ විශ්‍රාම ගැනිම.

	තනතුර	2022			
		බඳවා ගැනීම්	උසස්වීම්	ඉල්ලා අස්වීම් / සේවය හැර යාම	විශ්‍රාම ගැනිම
1	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණ**				
	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්				02
	අධ්‍යක්ෂ		04		01
2	**මධ්‍යම කළමනාකරණ**				
	නියෝජ්‍ය අධ්‍යක්ෂ				01
	සහකාර අධ්‍යක්ෂ		02		03
	කළමනාකරු (දොම්පේ කසල මධ්‍යස්ථානය)			01	
3	**කණිෂ්ඨ කළමනාකරණ**				
	තාක්ෂණ නිලධාරි (දොම්පේ කසල මධ්‍යස්ථානය)			01	
	පරිපාලන නිලධාරි		05		
	රසායනාගාර නිලධාරි		01		
	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරි			02	
4	**බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති**				
	පරිසර නිලධාරි			05	02
5	**කළමනාකරණ සහකාර (තාක්ෂණ)**				
	රසායනාගාර සහකාර			03	
6	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**			03	02
7	**ප්‍රාථමික මට්ටම (ශිල්පීය)**				
	රියදුරු			02	01
8	**ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන)**				
	කාර්යාල සහායක			04	
		--	**12**	**21**	**12**

ඉහත දක්වා ඇති උසස්වීම් වලට අමතරව, එක් ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරියෙකු කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළමු ශ්‍රේණියට උසස් කරන ලද අතර පරිසර නිලධාරි 31 ක් බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති සේවයේ පළමු ශ්‍රේණියට ද, පරිසර නිලධාරි 02ක් බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති සේවයේ දෙවන ශ්‍රේණියට උසස් කරන ලදි. කළමනාකරණ සහකාරවරයෙකු කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) සේවයේ දෙවන ශ්‍රේණියටද,

රියදුරු 05ක් ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය) පළමු ශ්‍රේණියට උසස් කරන ලදි. තවද කාර්යාල සහායක 03ක් ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) දෙවන ශ්‍රේණියට ද එක් කාර්යාල සහයකයකු ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) පළමු ශ්‍රේණියට උසස් කරන ලදි.

18.3 මුදල් ඒකකය

2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

1. ආයතනික තොරතුරු

1.1 පිහිටි ස්ථානය හා නෛතික ස්භාවය

මධ්‍යම පරිසර අධිකාරිය (CEA) යනු ව්‍යවස්ථාපිත ආයතනයකි .ප්‍රධාන කාර්යාලය අංක 104, "පරිසර පියස "ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ,ශ්‍රී ලංකාව යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ,අපගේ තාක්ෂණික විශේෂඥතාව සහ කැපවීම මත පදනම්ව පරිසර දූෂණ පාලනය, ස්වභාවික සම්පත් කළමනාකරණය සහ පාරිසරික අධ්‍යාපනය තුළින් පරිසරයේ ගුණාත්මක බව ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීමයි.

1.3 සේවක සංඛ්‍යාව

2022 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව 865ක් විය. (908-2021)

2.සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 සකස් කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය ,මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ,කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලින් සමන්විතය .මෙම ප්‍රකාශනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය **(ICASL)** විසින් නියම කර ඇති ප්‍රමිතීන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLPSAS)** අනුකූලව සකස් කර ඇත.

2.1.2 මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති මධ්‍යම පරිසර අධිකාරිය විසින් අඛණ්ඩව යෙදී ඇති අතර එය පෙර වසරේ භාවිතා කරන ලද ඒවාට අනුකූල වේ .වත්මන් ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය විටෙක පෙර වසරේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

2.2 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

2.2.1 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (LKRS) වලින්ය.

2.2.2 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල් වල ගණුදෙනු මුලින්ම සටහන් වන්නේ ගණුදෙණුවේ දිනයේ පවතින ක්‍රියාකාරී අනුපාත වලට අනුවය .විදේශ මුදල් වලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් පරිවර්ථනය කරනු ලබන්නේ ගණුදෙනුව සිදු වූ දිනයේ දී ය.

2.2.2 ආදායම් හඳුනාගැනීම

වියදම් සහ ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත .වසර 3ක් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම 2022සඳහා උපයාගත් ආදායමෙන් 1/3ක් පමණක් ගිණුම්ගත කර ඇති අතර ඊට පෙර වසර දෙක සඳහා ද ආකාරයෙන්ම ගලපා ඇත. තවද, එක් අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කරන ලබන බලපත්‍ර මගින් ලැබුනු දිනය කුමක් වුවත් එම වසරේම ආදායමක් සේ සලකා ගිණුම් තබා ඇත.

පොලී සහ කුලී ආදායම හැර අනෙකුත් සියලුම ආදායම් මුදල් පදනම මත සටහන් වේ.

2.2.3 දේපල ,පිරියත සහ උපකරණ

2.2.3.1 හඳුනා ගැනීමේ පදනම

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් ,දේපල ,පිරියත සහ උපකරණ හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. දේපල, පිරියත සහ උපකරණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු අඩු කිරීමෙන් පිරිවැයට ප්‍රකාශ වේ .වත්කමක් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් සහ එම වත්කම අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගත හැකි වන පරිදි ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන අනෙකුත් වියදම් ද, කොටස් අයිතම ඉවත් කර එම අයිතම පිහිටා ඇති පරිශ්‍රය නැවත සකස් කිරීම සඳහා දරනු ලබන වියදම් ද,ප්‍රාග්ධනික කළ ණය ගැනුම් පිරිවැය ද පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත කොටස් වලින් සමන්විත වන විට, ඒවා වෙන් වෙන්වූ දේපළ, පිරියත සහ උපකරණ අයිතම (ප්‍රධාන සංචරක) ලෙස ගිණුම් තබනු ලැබේ.

2.2.3.2 ප්‍රත්‍යාගණන ආකෘතිය

රැගෙන යා හැකි අගය වාර්තාකරණ වර්ෂය අවසානයට පවතින සාධාරණ වටිනාකම යොදා ගනිමින් තීරණ කරනු ලබන රැගෙන යා හැකි අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන ආකාරයකට ප්‍රමාණවත් නිත්‍ය බවක් සහිතව ප්‍රත්‍යාගණනයෙන් සිදු කරනු ලැබේ.

වාහන (මෝටර් බයිසිකල් හැර) ප්‍රත්‍යාගණනය කරනු ලබන විට, රැගෙන යා හැකි අගයෙහි ප්‍රත්‍යාගණනය සමඟ ස්ථාවර ලෙස දළ රැගෙන යා හැකි අගය ගැළපීම් කරනු ලැබේ. සමුච්චිත හානිකරණ පාඩු සැලකිල්ලට ගනීමෙන් අනතුරුව, දළ රැගෙන යා හැකි අගයෙහි සහ රැගෙන යා හැකි අගයෙහි වෙනස සමාන වන ලෙස එම දිනට සමුච්චිත ක්ෂය ගළපනු ලැබේ.

ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක රැගෙන යා හැකි අගයෙහි යම් වැඩිවීමක් සිදු වුව හොත් එය අනෙකුත් විස්තීරණ ආදායම් හඳුනාගනු ලබන අතර, හිමිකම්වල ප්‍රත්‍යාගණන සංචිතයට එකතු කරනු ලැබේ. එම වත්කමෙහිම පූර්වයෙන් ලාභලාභවල හඳුනා ගන්නා ලද ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට ලාභාලාභ වල හඳුනා ගනු ලැබේ.

ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක රැගෙන යා හැකි අගයෙහි යම් අඩු වීමක් සිදු වුව හොත්, එය ප්‍රවර්තන වර්ෂයේ ලාභාලාභ වල හඳුනා ගනු ලැබේ. එම අඩු වීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි යම් ණය ශේෂයක් පවතින්නේනම් එම ශේෂයෙහි ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායම් වල හඳුනා ගනු ලැබේ. අනෙකුත් විස්තීර්ණ ආදායම් වල හඳුනා ගනු ලබන අඩුවීම හිමිකම් වල ප්‍රත්‍යාගණන සංචිතයෙහි එකතු වී ඇති අගය අඩු කරයි.

වත්කම ගිණුම් වලින් ඉවත් කළ විට, වාහන වලට අදාළ ප්‍රත්‍යාගණන සංචිතය රදවා ගෙන ඇති ආදායමට සෘජුවම මාරු කරනු ලැබේ.

2.2.3.3 අපහරණ මත ලාභ සහ පාඩු

දේපල ,පිරියත සහ උපකරණ අයිතම අපහරණ මත ලබන ලාභ සහ පාඩු එම දේපළ, පිරියත සහ උපකරණ අයිතම වල රාගන යා හැකි අගය ඒවා අපහරණ මගින් ලැබෙන ආදායම සමඟ සංසන්දනය කිරීම මගින් තීරණය කරනු ලබන අතර, එය ලාභාලාභ ප්‍රකාශනයෙහි "වෙනත් ආදායම් /වෙනත් වියදම් " තුළ ශුද්ධ ලෙස හඳුනා ගනු ලැබේ .

2.2.3.4 පසුකාලීන පිරිවැය

දේපල ,පිරියත සහ උපකරණ යන අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේදී එම කොටස මගින් ලැබිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් එම කොටස ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන පිරිවැය එම අයිතමයෙහි රැගෙන යා හැකි අගයෙහි හඳුනා ගනු ලැබේ. ප්‍රතිස්ථාපිත කොටසෙහි රැගෙන යා හැකි අගය හඳුනා ගනු නොලැබේ. දේපළ, පිරියත සහ උපකරණ වල එදිනෙදා සිදු කරනු ලබන සේවා කිරීම් පිරිවැය දරණ ලද පිරිවැයක් ලෙස ලාභාලාභ වල හඳුනා ගනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ නැවත ස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපළ ,පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා දරනු ලබන වියදම් දැරූ විට වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ .

2.2.3.5 ගිණුම් වලින් ඉවත් කිරීම

දේපල ,පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීම හෝ අපහරණ මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එම දේපල ,පිරියත සහ උපකරණවල අයිතමයෙහි රැගෙන යා හැකි අගය ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. දේපල ,පිරියත සහ උපකරණ අයිතමයෙහි ගිණුම් වලින් ඉවත් කිරීම මගින් ඇතිවන ලාභය හෝ පාඩුව, එම අයිතමය ඉවත් කරන විට ලාභයෙහි හෝ පාඩුවෙහි ඇතුලත් කරනු ලැබේ.

වත්කම්වල අවශේෂ්‍ය වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේනම් ගැලපීම් කරනු ලැබේ.

2.2.3.6 ප්‍රදානයක් ලෙස ලැබෙන දේපල ,පිරියත සහ උපකරණ

යම් ප්‍රදානයක් යටතේ අත්පත් කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට ප්‍රාග්ධනිත කරනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපල ,පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය අඩු කළ පිරිවැයට දක්වා ඇත. සින්නක්කර ඉඩම් ඒ සඳහා දරණ ලද පිරිවරයට සඳහන් කරනු ලැබේ.

ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා පිරිවැය කපා හැරීම පිණිස සින්නක්කර ඉඩම්වලින් හැර අනෙකුත් සියලුම දේපල ,පිරියත සහ උපකරණ වලින් අගය ක්ෂයවීම් අඩු කර ඇත.

ක්ෂය ගණනය කර ඇත්තේ ප්‍රයෝජනයට ගත් දිනයේ සිට දේපළ පිරියත හා උපකරණ අපහරණය දින දක්වා වේ.

දේපල ,පිරියත සහ උපකරණ සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කර ඇති අතර, එයට අදාළ වන අනුපාත පහත සඳහන් පරිදි වේ;

2.2.3.7 ක්ෂය වීම

ගොඩනැගිල්ල-ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදේශීය කාර්යාලය	වර්ෂයකට 2.5%
මෝටර් වාහන	වර්ෂයකට 25%
ලී බඩු සහ කාර්යාලීය උපකරණ	වර්ෂයකට 10%
පිරියත සහ උපකරණ	වර්ෂයකට 10%
පරිගණක සහ උපාංග	වර්ෂයකට 25%

ගිණුම්කරණ මෘදුකාංග	වර්ෂයකට 50%
රසායනාගාර උපකරණ	වර්ෂයකට 10%
පුස්තකාල පොත්	වර්ෂයකට 10%
දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය	වර්ෂයකට 5%
සොබාදහම් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	වර්ෂයකට 10%
නාම පුවරුව	වර්ෂයකට 10%
ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි වර්ණාලේප	වර්ෂයකට 20%
ජංගම රසායනාගාරය	වර්ෂයකට 10%

2.2.3 කල්බදු වත්කම් සහ ක්‍රමක්ෂයය

කල්බදු වත්කම් කල්බදු ගිවිසුමෙහි කල්බදු කොන්දේසි අනුව තක්සේරු කරනු ලබන අතර කල්බදු ගිවිසුම් කාලපරිච්ඡේදය මත පදනම්ව ක්‍රමක්ෂය ගාස්තු අය කරනු ලැබේ. කල්බදු වත්කම් පිරිවැයෙන් ශුද්ධ සමුච්චිත ක්‍රමක්ෂය ගාස්තු අඩුකළ අගයට මිනුම් කරනු ලැබේ. හදුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ වන්නේ නම් වත්කමේ සංරචක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ද එකී පිරිවැයට ඇතුළත් වේ .ගිවිසුම්ගත කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකින් පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය ගණනය කෙරේ.

කල් බදු ඉඩම් - වර්ෂයකට 2%

ඉඩම -රත්නපුර කාර්යාලය - වර්ෂයකට3.33%

2.2.5 තොග

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග මනිනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී තොග විකිණිය හැකි මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය අඩුකළ මිල වේ.

තොග ඒවායෙහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය පහත සඳහන් පිරිවැය සූත්‍රය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ;

පෙර පිවිසි පෙර නිකුතු පදනමින් මිලදීගැනුම් පිරිවැයට

වර්ෂය තුළ කරන ලද සමස්ත රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ මිලදී ගැනීම් පරිභෝජනයන් ලෙස සළකා ඇත. මෙම අයිතම මිනුම් කිරීමේ දුෂකරතාවය නිසා සහ සාපේක්ෂ ලෙස බාවිතා කිරීමේ පිරිවැය අඩු නිසා මෙම කුමය අනුගමනය කර තිබේ.

2.2.6 ආයෝජනය

මාස තුනකට වඩා වැඩි කල්පිරීමේ කාලයක් සහිත මුදල් වෙළෙඳපොළ උපකරණවල සිදු කරනු ලබන ආයෝජන කෙටිකාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර එම ආයෝජන ඒ සඳහා දරන ලද පිරිවැයට දක්වා ඇත. ස්ථාවර තැන්පතුවල සහ කෙටි කාලීන තැන්පතු වල සිදු කරනු ලබන ආයෝජනය පිරිවැයටදක්වා ඇත. එවැනි ආයෝජන වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් ගණනය කර ඇත.

2.2.7 මුදල් සහ මුදල් සමාන දේ

මුදල් සහ මුදල් සමාන දේ අත ඉතිරි මුදල් සහ ඉල්ලූ විට ආපසු ගැනීම සඳහා බැංකුවල තැන්පත්කර ඇති මුදල් වලින් සමන්විත වේ.

2.2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර තිබේ.

2.2.9 බදු අය කිරීම

බදු වියදම් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධන මගින් සලකා ඇති විධිවිධාන ප්‍රකාරව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත.

2.2.10 සේවක ප්‍රතිලාභ

2.2.10.1 නිර්වචිත දායක සැලසුම

නිර්වචිත දායක සැලැසුම් සඳහා ඇති බැදීම් දරන වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ක් පිළිවලින් අර්ථසාධක අරමුදලට සහ භාර අරමුදලට දායක කරයි.

2.2.10.2 නිර්වචිත ප්‍රතිලාභ සැලැසුම්

පාරිතෝෂිකය නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් වේ. අදාළ අභ්‍යාපනත්‍රප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට මධ්‍යම පරිසර අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම පිණිස, සේවකයින් සේවයට බැඳුණු පළමුවන වර්ෂයේ සිට ආරම්භ කර සම්පූර්ණ කරන ලද එක් වර්ෂය සඳහා මුදල් වර්ෂයේ අවසාන් මාසයේ දී සියලුම සේවකයන්ගේ මාසික වැටුපෙන් අර්ධයක ප්‍රමාණයක් පදනම් කරගෙන ගණනය කරපු ලබන මුදලට සමාන මුදලකට ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන එනු ලැබේ.

1983අංක 12දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික මුදලට අදාළව සියලුම සේවකයින් සඳහා විශ්‍රාම පාරිතෝෂික ගෙවීම පිණිස ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙය ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ බාණ්ඩ කර ඇත.

භාණ්ඩාගාරයට අනුව අවශ්‍ය වූ විට භාණ්ඩාගාරය විසින් අරමුදලක් අවශ්‍ය නොවේ ,මන්ද ඔවුන් අවශ්‍ය

වූ විට අරමුදල් ලබා දෙන නිසා මුදලක් පවත්වා ගෙන යාම අවශ්‍ය නොවේ.

2.2.11 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් ඉල්ලූ විට හෝ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දිනයේ සිට වර්ෂයක කාලයක් ඇතුළත ගෙවිය යුතු වන වගකීම වේ .මූල්‍ය සාධන ප්‍රකාශනයේ දිනයේ සිට වසරකට වැඩි කාලයක් පසුව ගෙවීමට ඇති හිඟ ශේෂයන් ජංගම නොවන වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණනය කර ඇත

2.2.12. ප්‍රදානයන් ගිණුම් කිරීම

2.2.12.1 රජයේ ප්‍රදාන

ඉදිරිපත් කිරීමේ ක්‍රම ද ඇතුළුව රජයේ ප්‍රදානයන් සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි වේ.

වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රදානයන්එම වත්කම් වලට ප්‍රයෝජනවත් ජීවිත කාලයන් තුළ ලැබූ ආදායම් ලෙස හඳුනාගෙන තිබේ.

විදේශීය නියෝජිතායතන වලින් ලැබුණු අනෙකුත් පුනරාවර්තන ප්‍රදාන සහ ඒ මත දරනු ලැබූ වියදම් ලාභ සහ අලාභ ගිණුමට ඇතුළත් කර ඇත.

පාසල් වැඩසටහන් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්හි ප්‍රත්‍යක්ෂ වත්කම් නොමැති නිසා එම ප්‍රදානයන් වර්ෂය තුළ වියදමක් ලෙස සළකා ඇත.

2.2.12.2 අනෙකුත් නියෝජිතායතනවලින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රධාන

වෙනත් නියෝජිතායතන වලින් ලැබුණු ප්‍රධානයන් ගණනය කිරීම සඳහා ද රජයන් ලැබුණු ප්‍රදානයන් ගණනය කිරීමට යෝදා ගනු ලැබූ ක්‍රමයම යොදා ගෙන ඇත.

TABLE 53 : මධ්‍යම පරිසර අධිකාරියට **2022** වර්ෂය තුළ පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබී ඇත.

විස්තර	රුපියල්.
භාණ්ඩාගාරය -පුනරාවර්තන	803,242,500
භාණ්ඩාගාරය -ප්‍රග්ධනය -මුදලින්	11,600,000
ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රග්ධන සහනාධාර අගය	2,940,000
අභ්‍යන්තර ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය පිළිබඳ පසු විපරම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම	494,000
R22 සමීකරණ සමඟ R 32 වායුසමීකරණ දිරි ගැන්වීමේ දීමනා	595,500
පරිසර නියමු වැඩසටහන	366,452
පරිසර අධ්‍යාපනය සහ දැනුවත් කිරීම	199,500

2.2.14 අසම්භාව්‍යයන් සහ වගකීම්

අසම්භාව්‍යයක් යනු පසුගිය සිදු වීමක් හේතුවෙන් ඇති විය හැකි වත්කමක් හෝ වගකීමක් විය හැකි අතර , මධ්‍යම පරිසර අධිකාරියේ පාලනයෙන් ඔබ්බෙහි වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදුනොවීම මත පමණක් ඒවා තහවුරු වනු ඇත.

හඳුනාගත හැකි සියලුම වගකීම් වල ප්‍රමාණය තීරණය කිරීමේදී ප්‍රත්‍යක්ෂ සියලුම අවදානම් සැලකිල්ලට ගෙන තිබේ. අසම්භාව්‍ය වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ පවරාදීම සසම්භාවී නොවන හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි, අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන, ඉදිරියේදී ඇති විය හැකි බැඳීම් වේ. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා නොකරන නමුත් ඒවා නුදුරෙහි සිදු වන්නේනම් එහි අනාවර්ණය කර ඇත

අධ්‍යක්ෂ (නීති) විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව, 2022 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරනු ලැබ ඇති, විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 119 වන අතර, ඉන් 04ක් හිමිකම් ඉල්ලා පවරන ලද නඩු බව පෙනී යයි. මධ්‍යම පරිසර අධිකාරයට එරෙහිව දැනට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුකර මගින් මධ්‍යම පරිසර අධිකාරියෙහි වාර්තා කර ඇති මූල්‍ය ප්‍රතිඵල වලට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවනු ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් රුපියල් 18,564,991/= මුදලක් සහ 7% ක පොළියක් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන ශාඛාවේ ඉඩම සඳහා ගෙවීමට ඉල්ලීම් කර ඇත. කෙසේ නමුත් ම.ප.අ. මගින් එම පොළි මුදල ඉවත් කරන මෙන් ඉල්ලා සිටි අතර, තවම ඒ සඳහා තීරණයක් ලැබී ඇත. එම නිසා ඒ සඳහා මේ වන තුරු වෙන් කිරීමක් මෙම වර්ශයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නැත.

2.2.15 ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සිදුවීම්.

ශේෂ පත්‍ර දිනයට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, යෝග්‍ය තැන්හීදී මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදාළ සටහනෙහි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

TABLE 54 : මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරිය				
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය				
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		**සටහන**	**2022**	**2021**
			රුපියල්.	**රුපියල්.**
මෙහෙයුම් ආදායම				
CEAආදායම		**4**	433,159,621	362,873,286
පුනරාවර්තන දීමනාව	- භාණ්ඩාගාර		803,242,500	750,000,000
	-අන් අය	**4.1**	50,361,121	170,504,791
විලම්භිත ආදායම			64,326,610	82,016,119
මුළු ආදායම			**1,351,089,853**	**1,365,394,197**
මෙහෙයුම් වියදම්				
පුද්ගල වැටුප්		**5**	823,826,661	794,792,961
ගමන් වියදම්		**6**	45,398,977	49,657,888
සැපයුම් සහ පරිභෝජනය භාවිතය		**7**	150,276,882	84,725,656
නඩත්තු		**8**	64,400,927	43,831,779
කොන්ත්‍රාත් සේවා		**9**	97,715,072	85,704,531
පර්යේෂණ හා සංවර්ධන		**10**	41,946,359	40,188,281
ක්ෂයවීම් සහ ක්‍රම ක්ෂය කිරීම		**11**	139,389,387	143,603,311
වෙනත් මෙහෙයුම් වියදම්		**12**	6,165,183	3,403,288
වැඩසටහන් ක්‍රියාකාරකම්		**13**	29,819,195	140,991,498
සම්පූර්ණ මෙහෙයුම් වියදම්			**1,398,938,645**	**1,386,899,194**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/(හිඟය)			**(47,848,792)**	**(21,504,997)**
මූල්‍ය පිරිවැය				
බැංකු ගාස්තු			633,263	616,762
සම්පූර්ණ මෙහෙයුම් නොවන වියදම්			**633,263**	**616,762**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්/(හිඟය)			**(48,482,055)**	**(22,121,759)**

TABLE 55 : මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරිය			
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය			
දෙසැම්බර් 31වන දිනට	**සටහන**	**2022**	**2021**
		රුපියල්.	**රුපියල්.**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල ,පිරියත සහ උපකරණ	**14**	797,151,001	885,115,348
ආයෝජන	**15**	9,960,000	9,960,000
මාර්ගස්ථ තොග හා කෙරී ගෙන යන වැඩ	**16**	18,251,035	52,927,928
		825,362,035	**948,003,276**

මධ්‍යම පරිසර අධිකාරිය			
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය			
දෙසැම්බර් 31වන දිනට	සටහන	2022	2021
		රුපියල්.	රුපියල්.
ජංගම වත්කම්			
තොග	**17**	28,018,589	25,076,674
උපචිත ආදායම්	**18**	104,052,530	93,620,849
පෙරගෙවුම්	**19**	6,841,277	4,094,857
මුදල් සහ මුදල් සමාන දෑ	**20**	442,619,775	422,697,450
මුළු ජංගම වත්කම්		**581,532,171**	**545,489,830**
මුළු වත්කම්		**1,406,894,206**	**1,493,493,106**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	**21**	218,932,717	181,187,498
උපචිත වියදම්	**22**	135,937,540	190,131,514
විලම්බිත ආදායම් සංචිතය		16,114,667	18,378,000
වත්මන් නොවන වගකීම්			
කොම්පෝස්ට් බදුන් රක්ෂිතය		-	7,887,531
පුනරාවර්තන දීමනාව	**23**	28,452,862	27,871,443
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	**24**	393,617,165	377,888,375
මුළු වගකීම්		**793,054,951**	**803,344,361**
මුළු ශුද්ධ වත්කම්		**613,839,256**	**690,148,745**
ශුද්ධ වත්කම් /කොටස්			
සමුච්චිත අරමුදල		74,181,224	74,181,224
අතිරික්ත ඉදිරියට ගෙන ආ දෑ		(387,554,711)	(385,736,679)
වර්ෂය සඳහා අතිරික්ත / (හිඟය)		(48,482,055)	(22,121,759)
නැවත තක්සේරු කිරීමේ සංචිතය		243,723,310	243,723,310
ප්‍රග්ධන දීමනා	**25**	731,971,488	780,102,649
		613,839,256	**690,148,745**

TABLE 56 : මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරිය				
මුදල් ප්‍රවාහ ප්‍රකාශය				
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		**සටහන**	**2022**	**2021**
			රුපියල්.	**රුපියල්.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ				
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/ (හිඟය)			(48,482,055)	(22,121,759)
සඳහා ගැලපීම්:				
	ක්ෂය වීම	**11**	139,389,387	143,603,312
	පෙර වසර ගැලපීම්		12,416,196	10,193,706
	මුදල් නොවන අයිතම සඳහා ගැලපීම්		(7,357,639)	(8,639,855)
	ප්‍රාග්ධන ප්‍රදාන ක්ෂය කිරීම		(64,326,610)	(82,016,119)
	මූල්‍ය පිරිවැය		633,263	616,762
	පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	**5**	31,235,318	30,487,677
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය			63,507,860	72,123,725
	(වැඩිවීම) / තොග අඩුවීම	**17**	(2,941,915)	(9,353,659)
	(වැඩිවීම) / ලැබිය යුතු දෑ අඩුවීම	**18**	(10,431,681)	8,918,804
	(වැඩි කිරීම) / පෙර ගෙවීම්වල අඩුවීම	**19**	(2,746,420)	967,879
	ගෙවිය යුතු ඉදිරියට කළ ගෙවීම්	**21**	37,745,219	31,470,097
	උපචිත වියදම් වැඩි කිරීම / (අඩු වීම)	**22**	(54,193,974)	66,452,791
	වෙනස් ආදායම් විලම්භිත ආදායම වැඩි වීම / (අඩු වීම)		(2,263,333)	(927,280)
පුනරාවර්තන දීමනා		**23**	581,419	(9,092,147)
	මෙහෙයුම් වලින් උපයන මුදල්		29,257,175	160,560,209
	ගෙවූ මූල්‍ය වියදම්		(633,263)	(616,762)
	පාරිතෝෂික ගෙවීම්		(15,506,528)	(11,667,898)
(භාවිතා කරන)මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්			**13,117,384**	**148,275,549**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ				
	දේපල ,පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	**14**	(12,834,561)	(57,281,058)

මධ්‍යම පරිසර අධිකාරිය				
මුදල් ප්‍රවාහ ප්‍රකාශය				
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		සටහන	2022	2021
			රුපියල්.	රුපියල්.
	දේපල කම්හල සහ උපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම		99,900	-
	භාණ්ඩ සංක්‍රමණයේ සහ වැඩ කෙරෙමින් පවතී	16	34,676,893	(16,573,533)
ආයෝජන ක්‍රියාකාරකම් වලින්/ (භාවිතා කරන ලද)ශුද්ධ මුදල් ප්‍රවාහයන්			**21,942,232**	**(73,854,591)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ				
	කොම්පෝස්ට් බදුන් සංචිත ශේෂය භෘවිතයෙනි ඉවත් කිරීම		7,887,531	-
	(භාවිතා කරන ලද) ප්‍රාග්ධන ප්‍රදාන වලින් ලැබෙන ආදායම	25	(23,024,822)	69,128,212
මූල්‍ය ක්‍රියාකාරකම් වලින්/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහයන්			**(15,137,291)**	**69,128,212**
ශුද්ධ වැඩි වීම් / අඩු වීම් මුදල් හා මුදල් සමාන දෑ			19,922,325	143,549,170
වර්ෂය මුල මුදල් හා මුදල් සමාන දෑ			422,697,450	279,148,281
වර්ෂය අග මුදලි හා මුදල් සමාන දෑ			442,619,775	422,697,450

TABLE 57 : කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරිය					
කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය					
2022දෙසැම්බර් 31දිනට					
	සමුච්චිත අරමුදල	**මෙහෙයුම් අතිරික්තය (හිඟය)**	**ප්‍රාග්ධන දීමනා**	**නැවත තක්සේරු කිරීමේ සංචිතය**	**මුළු**
	රුපියල්.	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**
2021.01.01 දිනට ශේෂය	**74,181,224**	**(395,930,385)**	**793,439,050**	**243,723,311**	**715,413,20**
වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය).	-	(22,121,759)	-	-	(22,121,759)
පෙර වසර ගැලපීම්	-	10,193,706	-	-	10,193,706
ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ වෙනස් වීම	-	-	(13,336,401)	-	(13,336,401)

මධ්‍යම පරිසර අධිකාරිය					
කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය					
2022දෙසැම්බර් 31දිනට					
	සමුච්චිත අරමුදල	**මෙහෙයුම් අතිරික්තය (හිඟය)**	**ප්‍රාග්ධන දීමනා**	**නැවත තක්සේරු කිරීමේ සංචිතය**	**මුළු**
	රුපියල්.	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**
2021.12.31 දිනට ශේෂය	**74,181,224**	**(407,858,438)**	**780,102,649**	**243,723,311**	**690,148,745**
වර්ෂය සඳහා අතිරික්තය /(හිඟය)	-	(48,482,055)	-	-	(48,482,055)
පෙර වසර ගැලපීම්	-	20,303,727	-	-	20,303,727
ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ වෙනස් වීම	-	-	(48,131,161)	-	(48,131,161)
2022.12.31 දිනට ශේෂය	**74,181,224**	**(436,036,766)**	**731,971,488**	**243,723,311**	**613,839,256**

පෙර වර්ෂයට ගැලපීම් **:** 2022 වර්ෂය තුළ රුපියල් 20,303,727 ක අගයක් මධ්‍යම පරිසර අධිකාරිය මගින් පෙර වර්ෂ ගැළපීම් ලෙස හඳුනා ගෙන ඇත.

ලියා හරින ලද කොම්පෝස්ට් බින් ගිණුම -	7,887,531	
ඌණ අතිරික්ත වියදම් වෙන් කිරීම	2,456,814	
පළ කරන ලද පුස්තකාල පොත් වියදම් සඳහා ගැලපීම	9,959,382	12,416,196
		20,303,727

TABLE 58 : මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				**2022**		**2021**
				රුපියල්.		**රුපියල්.**
4	**CEAආදායම**					
	පරීක්ෂණ ගාස්තු			223,824,275		210,490,189
	බලපත්‍ර ගාස්තු			147,052,369		111,447,908
	BOIපරීක්ෂණ ගාස්තු			2,143,000		2,348,610
	BOIබලපත්‍ර ගාස්තු			5,135,550		5,054,750
	උපදේශන ගාස්තු			320,000		2,507,922
	වාතයේ ගුණාත්මකභාවය සහ ශබ්ද පරීක්ෂාව			1,664,228		2,171,265
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු			665,461		896,447
	ජල ගුණාත්මකභාවය			11,975,450		9,435,381

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				**2022**		**2021**
				රුපියල්.		**රුපියල්.**
	උසාවි නඩු ආදායම			1,465,306		1,101,775
	ඩිජිටල් සිතියම			9,367		2,889
	විවිධ ආදායම්			208,358		613,182
	කොම්පෝස්ට් ආදායම			23,462		57,991
	හරිත උද්‍යානය සනීපාරක්ෂක ගොඩකිරීම් දොම්පේ			21,358,173		5,141,185
	රසායනික අපද්‍රව්‍ය -පරිපාලන ගාස්තුව			2,789,920		2,250,372
	වීරවිල බංගලා වෙන්කරවා ගැනීමේ ගාස්තුව			5,733		6,000
	ගලි බෝවර්ස් ලියාපදිංචි කිරීම			200,741		40,000
	අන්තරායකර අපද්‍රව්‍ය වැඩසටහන			13,347,573		9,203,449
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආදායම			970,655		-
	E අපද්‍රව්‍ය බැහැර කිරීමේ ආදායම			-		103,972
				433,159,621		**362,873,286**

4.1	**වෙනත් පුනරාවර්තන දීමනා**					
	පරිසර පුරෝගාමී වැඩසටහන-අමාත්‍යාංශය			5,537,286		59,855,000
	අධ්‍යාපන දැනුවත් කිරීම් සහ හරිත සම්මාන වැඩසටහන			10,800,500		19,895,000
	පාරිසරික පුරෝගාමී කඳවුර -ගාල්ල (සෝභා කෙත)			223,880		46,355
	වාහන රක්ෂණ හිමිකම - CEA			4,542,709		989,118
	පොලී ආදායම			4,156,362		3,715,542
	හුස්ම දෙනතුරු ජාතික රුක් රෝපණ වැඩසටහන			880,945		228,865
	ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම			227,405		5,900,000
	කැලණි ගං ප්‍රදානය			21,318		16,093
	මාසයක වැටුප් අයකර ගැනීම			165,545		158,688
	ඕසෝන් වියානා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන			21,888		26,047
	ICEG MAS සඳහා අනුග්‍රහය			222,334		190,561
	සුරකුම ගංගා			508,000		33,419,646
	EIA සහ IEE ව්‍යාපෘති වියදම් ප්‍රතිපූරණය			568,877		4,208,673
	SAICM- දූෂණ පාලන ප්‍රාදේශීය ප්‍රදානය			1,021,716		-

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	වායු තත්ත්ව අධීක්ෂණ VET ප්‍රදානය			17,230,632		-
	දියවනාන ඔය ප්‍රදානය			3,660,508		-
	X-Press Pearl Ship - වියදම් ප්‍රතිපූරණය			241,200		-
	පාරිසරික පුරෝගාමී කඳවුර -දකුණු පළාත් සභාව			230,000		-
	අන්තරායකර අපද්‍රව්‍ය පිළිබඳ දිවයින පුරා සමීක්ෂණය			47,857		
	H& M කමිටු ගෙවීම			40,000		-
	නුවරඑළිය මහ බැංකුව විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන			12,160		-
	SDF ව්‍යාපෘති ප්‍රදානය			-		19,401,779
	ජල සම්පත් වල ගුණාත්මක බව අනුගමනය කිරීම ක්‍රියාත්මක කිරීම			-		8,942,946
	පෙතියකන්ද ව්‍යාපෘතිය			-		6,212,221
	ඒකාබද්ධ WM පිළිබඳ ව්‍යාපෘතිය පසු විපරම් කරන්න			-		2,709,870
	අපද්‍රව්‍ය ප්‍රදානය			-		2,240,150
	CEFAS පරිත්‍යාගය			-		1,783,821
	ගුවන්විදුලි වැඩසටහන් ප්‍රදානය			-		233,975
	බැදුම්කර නිරවුල් කිරීම -රැකියාව			-		108,613
	තෙත්බිම් දින වැඩසටහන			-		120,000
	ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන සුන්දරපොල			-		81,827
	ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන			-		20,000
				50,361,121		**170,504,791**
5	**පුද්ගලික දීමනා**					
	වැටුප් සහ වේතන			630,738,415		595,380,072
	සේවක අර්ථසාධක දායකත්වය			86,464,358		86,700,571
	සේවා නියුක්ති භාරකාර දායකත්වය			17,305,307		17,471,511
	අතිකාල දීමනා සහ නිවාඩු ගෙවීම			12,427,812		14,769,943
	වෛද්‍ය නිවාඩු මුදල් අයකිරීම			34,509,586		38,903,442
	පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන			31,235,318		30,487,677
	මණ්ඩල සහ සභා සාමාජිකයින් සඳහා දීමනාව			249,000		216,000
	සභා ,කළමනාකරණය සහ මණ්ඩල රැස්වීම් සඳහා විනෝදාස්වාදය			1,233,258		608,712

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	වෘත්තීය දීමනා			9,663,608		10,255,033
				823,826,661		**794,792,961**
6	**ගමන් වියදම්**					
	දේශීය			45,350,477		47,737,390
	විදේශ			48,500		1,920,498
				45,398,977		**49,657,888**
7	**සැපයුම් සහ පරිභෝජන අයිතම**					
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා			16,927,387		9,407,326
	ඉන්ධන සහ ප්‍රවාහනය			130,421,607		73,645,578
	නිල ඇඳුම්			811,370		820,510
	පුවත්පත්			540,830		369,193
	මුද්‍රණය කිරීම			1,575,688		483,050
				150,276,882		**84,725,657**
8	**නඩත්තු**					
	මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව			34,227,786		17,580,423
	ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම			15,865,516		18,209,396
	කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම			14,307,625		8,041,960
				64,400,927		**43,831,779**
9	**කොන්ත්‍රත්තු සේවා**					
	විදුලි			11,204,064		9,268,158
	ආරක්ෂක සේවා			29,030,090		27,108,640
	රක්ෂණ			13,931,571		12,064,355
	තැපැල් ගාස්තු			5,014,911		2,894,436
	දුරකථන			11,508,108		11,480,332
	ගොඩනැගිලි කුලියට			22,653,366		19,244,355
	ජලසම්පාදන			1,867,742		1,357,325

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	සාමාජික ගාස්තු			105,219		61,931
	විගණන ගාස්තු			2,400,000		2,225,000
				97,715,072		**85,704,531**
10	**පර්යේෂණ හා සංවර්ධන**					
	පරිසර අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ වියදම්			12,002,915		20,965,252
	පරිසර දූෂණය පාලනය	**10.1**		9,728,075		10,491,868
	පරිසර කළමනාකරණය සහ ඇගයීම	**10.2**		5,367,965		1,908,370
	උපාය මාර්ගික පරිසර තක්සේරු ඒකකය			182,025		16,000
	විමර්ශන ඒකකය			931,324		882,350
	නීතිමය වියදම්			4,161,951		3,936,831
	මානව සම්පත් සංවර්ධනය			8,240,416		1,662,889
	පුස්තකාල ඒකකය			1,259,324		303,071
	කලාපීය මෙහෙයුම් අංශය			72,365		21,650
				41,946,359		**40,188,281**
11	**ක්ෂය සහ ක්‍රමක්ෂය කිරීම්**					
	දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය			19,760,000		19,760,000
	ගොඩනැගිලි			6,124,564		5,410,847
	මෝටර් වාහන			63,687,192		63,687,192
	ගෘහ භාණ්ඩ සහ උපාංග			4,402,961		3,488,253
	පරිගණක සහ උපාංග			4,916,195		12,868,996
	කාර්යාල උපකරණ			9,605,993		9,260,369
	රසායනාගාර උපකරණ			15,499,228		13,996,782
	පුස්තකාල පොත්			290,426		347,013
	පිරියත සහ උපකරණ			213,403		213,403
	නාම පුවරු			81,055		79,195
	ප්‍රාදේශීය කාර්යාලය			3,808,458		3,700,688
	ස්වභාවික ක්ෂේත්‍ර මධ්‍යස්ථානය			298,727		89,388
	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වර්ණ ගැන්වීම			1,531,239		1,531,239

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	ජංගම රසායනාගාරය			8,275,200		8,275,200
	රත්නපුර ඉඩම ක්‍රුවක්ෂය කිරීම			315,490		315,490
	ප්‍රධාන කාර්යාලය බදු දුන් ඉඩම ක්‍රුවක්ෂය කිරීම			579,256		579,256
				139,389,387		**143,603,312**
12	**වෙනත් මෙහෙයුම් වියදම්**					
	මාධ්‍ය ප්‍රචාරණය			1,052,845		301,006
	විවිධ			38,715		52,353
	සුභසාධක වියදම්			4,148,528		2,907,624
	ජාතික සිදුවීම්			925,095		142,305
				6,165,183		**3,403,288**
13	**වැඩසටහන් ක්‍රියාකාරකම්**					
	පාරිසරික පුරෝගාමී වැඩසටහන-අමාත්‍යාංශය			5,537,286		59,750,000
	වායු තත්ත්ව අධීක්ෂණ වියදම්			17,230,632		1,042,036
	හුස්ම දෙනතුරු ජාතික රුක් රෝපණ වැඩසටහන			880,945		228,865
	සුරකුම ගංගා			581,451		33,419,646
	ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වාතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම			227,405		5,900,000
	දැනුවත් කිරීමේ වියදම් ඕසෝන් වියානා			21,888		26,047
	කැලණි ගඟේ වියදම්			21,318		16,093
	ICEG වියදම් සඳහා අනුග්‍රහය			10,710		201,325
	දියවන්නා ඔය ව්‍යාපෘතිය			3,660,508		-
	SAICM පරිසර දූෂණ පාලනය			1,021,716		-
	පුරෝගාමී කඳවුර -දකුණු පළාත			230,000		-
	පාරිසරික පුරෝගාමී කඳවුර -ගාල්ල			223,880		-
	MAS Kreeda- රුක් රෝපණ වියදම්			123,600		-
	ශ්‍රී ලංකාවේ අන්තරායකර අපද්‍රව්‍ය පිළිබඳ දිවයින පුරා සමීක්ෂණය			47,857		
	SDF ව්‍යාපෘති වියදම්			-		19,401,779
	ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා පසු විපරම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම			-		9,765,516

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	පෙතියකන්ද වියදම්			-		6,212,221
	ඒකාබද්ධ පසු විපරම් WMP පිළිබඳ ව්‍යාපෘතිය			-		2,709,870
	CEFAS පරිත්‍යාග ආශ්‍රිත වියදම්			-		1,783,821
	ගුවන් විදුලි වැඩසටහන් වියදම්			-		233,975
	තෙත්බිම් දින වියදම්			-		120,250
	මාර්ගගත ජල තත්ත්ව වියදම්			-		81,852
	Env පුරෝගාමී කඳවුර Galle Exp. සෝබා කෙත			-		46,355
	ජල තත්ත්ව වාර්තාව බැක්ටීරියා විද්‍යාත්මක පරීක්ෂණය			-		40,500
	දොම්පේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනේ වියදම්			-		11,347
				29,819,195		**140,991,498**
15	**ආයෝජන**					
	භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව			9,960,000		9,960,000
				9,960,000		**9,960,000**
16	**මාර්ගස්ථ තොග හා කෙරී ගෙන යන වැඩ**					
	ප්‍රාග්ධනය			13,788,353		48,465,247
	රන්දෙණිය සෝබාකෙත			4,168,141		4,168,141
	රත්නපුර කාර්යාල ගොඩනැගිල්ල Geo Tech			294,541		294,541
				18,251,035		**52,927,929**
17	**තොග**					
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා			11,003,489		8,324,844
	පොත් සහ ප්‍රකාශනය			11,791,490		13,365,178
	මෝටර් රථ අමතර කොටස්			658,283		1,202,360
	විදුලි භාණ්ඩ			213,383		397,068
	ඩීසල් තොගය			3,357,200		792,480
	රසායනාගාර උපකරණ අමතර කොටස් (CEFAS පරිත්‍යාග)			994,744		994,744
				28,018,589		**25,076,674**

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
18	ලැබිය යුතු					
	විවිධ අත්තිකාරම්	18.1		626,269		108,859
	ස්ථාවර නොවන මිලදී ගැනීමේ අත්තිකාරම්	18.2		3,469,331		2,539,534
	ලැබිය යුතු තැන්පතු	18.3		1,554,466		1,516,311
	යතුරුපැදි ණය -රියදුරන්			14,984		129,649
	EIA අත්තිකාරම් සහ EIA ලැබිය යුතු මුදල්	18.4		373,709		83,223
	ආපදා ණය			87,474,743		80,466,422
	දොම්පේ ලැබිය යුතු මුදල්			6,974,657		4,929,405
	පෙරගෙවුම්			1,675,350		1,675,350
	පවුල් වෛද්‍ය රක්ෂණය			1,370,020		304,088
	උත්සව අත්තිකාරම්			226,600		315,350
	වැටුප් අත්තිකාරම්			207,877		175,077
	විශේෂ අත්තිකාරම්			75,059		75,059
	මුදල් අග්‍රම			5000		5,000
	IEE Cash අග්‍රම			4,466		-
	EEAඅත්තිකාරම්			-		30,735
	CEFAS ආයතනය රසායනාගාර පරිත්‍යාගය			-		1,266,786
				104,052,530		**93,620,849**
19	**පෙරගෙවුම්**					
	අත්තිකාරම් ගෙවීම්			6,825,840		4,079,418
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ අත්තිකාරම් සටහන			15,438		15,439
				6,841,277		**4,094,857**
20	**මුදල් සහ මුදල් සමාන**					
	ලංකා බැංකුව ,පැලවත්ත -ප්‍රධාන A/C 0-002937303			434,980,931		409,701,034
	ලංකා බැංකුව ,ආයතනික ශාඛාව , 1608			7,638,844		12,996,415
				442,619,775		**422,697,450**
21	**ගෙවිය යුතු**					

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	EIAව්‍යාපෘති		21.1	203,123,332		169,421,327
	ගෙවිය යුතු තැන්පතු			35,514		35,514
	මෝටර් බයිසිකල් සඳහා අත්තිකාරම්			2,862,570		2,862,570
	ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු			781,754		887,764
	වෛද්‍ය රක්ෂණ හිමිකම්			204,363		204,363
	මුද්දර ගාස්තු ගෙවිය යුතු			3,536,184		4,904,305
	රඳවා ගැනීමේ ගාස්තුව			935,347		1,260,056
	මෝටර් සයිකල් රක්ෂණය			69,851		69,851
	බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම			174,365		174,365
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දීමනාව (DO)			3,000		3,000
	කාර්ය සාධන බැඳීම			40,210		40,210
	රසායනික අපද්‍රව්‍ය බැහැර කිරීම ගෙවිය යුතුය			5,638,562		323,669
	ගෙවිය යුතු මෝටර් රථ ණය			6,667		6,667
	අත්තිකාරම් පොලී ගිණුම			719,226		224,380
	ගෙවිය යුතු පාරිතෝෂිකය.			740,522		769,458
	ගෙවිය යුතු සුබසාධනය			61,250		-
				218,932,717		**181,187,498**
22	**උපචිත වියදම්**					
	වැටුප් සහ වේතන			5,323,508		5,442,384
	සේවක අර්ථ සාධක අරමුදල			7,138,390		7,286,077
	සේවක භාරකාර අරමුදල			1,427,678		1,457,215
	අතිකාල දීමනා			1,458,698		1,921,462
	දේශීය සංචාරය			5,132,732		4,910,247
	ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව සහ නඩත්තුව			1,124,038		2,531,185
	කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම			1,854,820		1,152,030
	ආරක්ෂක ගාස්තු			2,462,548		4,516,740
	විදුලි ගාස්තු			954,318		1,489,236
	ඉන්ධන සහ ප්‍රවාහන			11,115,601		10,250,437
	ලිපි ද්‍රව්‍ය			1,817,435		1,023,206
	විදුලි සංදේශ			584,464		1,015,540
	පුවත්පත්			44,160		22,040
	ජලය			99,529		54,290
	වැට් බදු ගෙවිය යුතු			8,810,073		3,716,846

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	විගණන ගාස්තු			2,400,000		6,557,425
	NRM අංශය			618,760		99,895
	පාසල් වැඩසටහන -අමාත්‍යාංශය			1,218,878		31,082,818
	සුභසාධන වියදම්			12,445		46,925
	අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණ අංශය			824,256		1,064,558
	WIPප්‍රාග්ධන වත්කම්			9,532,468		35,915,452
	මෝටර් රථ අලුත්වැඩියාව			14,457,161		1,504,344
	ලෙඩ නිවාඩු			34,509,586		38,995,865
	නීති ඒකකය			2,378,350		136,620
	දේශීය පුහුණුව			2,070,221		106,877
	ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වාතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම			1,701,603		4,751,410
	පාසල් වැඩසටහන			1,209,766		7,397,055
	පෙතියකන්ද			1,170,725		1,170,725
	පරිසර දූෂණය පාලනය			1,030,278		515,990
	රසායනාගාරය			2,798,272		1,947,841
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය			1,031,646		544,799
	පසු විපරම් අන්තර්ග්‍රහනය			888,705		888,705
	පාරිසරික පුවත් ලිපි			695,407		467,975
	WEPA ව්‍යාපෘතිය			409,874		409,875
	අනුකූලතා අධීක්ෂණය			304,000		55,000
	SEA ඒකකය			187,630		188,530
	මාධ්‍ය ප්‍රචාරණය			173,655		2,761
	විමර්ශන ඒකකය			150,455		289,500
	අනුගාමිකත්වය ක්‍රියාත්මක කිරීම			99,108		5,453,192
	සාමාජික ගාස්තුව			28,000		8,000
	කාර්යාල ගොඩනැගිලි කුලී			2,149,115		2,198,900
	දියවන්නා ව්‍යාපෘතිය			2,857,303		-
	පර්යේෂණ හා සංවර්ධන			553,730		-
	විනෝදාස්වාද			46,118		-
	කැලණි ගඟේ වියදම්			4,490		-
	සමාජ ආරක්ෂණ දායක බද්ද			1,077,541		-
	රක්ෂණ			-		1,163,135
	සුරකුමු ගංගා			-		333,877
	තැපැල් ගාස්තු			-		29,203
	දැනුවත් කිරීම ඕසෝන් වියානා			-		4,650

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	සැලසුම් අංශය			-		4,527
	පුස්තකාල තොරතුරු මධ්‍යස්ථානය			-		2,300
	හුස්ම දෙනතුරු ජාතික රුක් රෝපණය			-		2,000
	මාර්ගගත ජල තත්ත්ව අධීක්ෂණය			-		1,852
				135,937,540		**190,131,515**
23	**පුනරාවර්තන දීමනා**					
	Male ප්‍රකාශය			1,146,315		1,146,316
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රදානය			14,531,330		14,531,330
	GISතොරතුරු පද්ධතිය			67,009		67,009
	Evtසඳහා දත්ත පදනම සංවර්ධනය කිරීම . දූෂක ක්‍රියාකාරකම්			110,732		110,732
	මහා පරිමාණ ජල තත්ත්ව දීමනා			659,937		659,937
	KITAප්‍රදාන			105,822		105,822
	ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන			509,422		509,422
	SAICMපරිසර දූෂණ පාලනය			189,157		1,520,268
	කැලණි ගං ප්‍රදාන			564,037		585,355
	ජල ගුණාත්මකභාවය -ප්රධාන ජල පද්ධති			1,116,258		1,116,259
	දොම්පේ ප්‍රධාන			944,287		944,287
	පරිසර පුරෝගාමී කඳවුර -ගාල්ල			14,210		190,090
	ජල තත්ත්ව පර්යේෂණ ආයතනය			190,657		190,657
	අන්තරායකර අපද්‍රව්‍ය පිළිබඳ දිවයින පුරා සමීක්ෂණය			1,624,562		1,672,419
	තෙත්බිම් සිතියම්ගත කිරීම සහ ප්‍රමුඛත්වය දීම			480,164		480,164
	UNEP- E අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන			72,940		72,940
	මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව			123,540		123,540
	හුස්ම දෙනතුරු වැව්ලි වැඩසටහන			432,190		540,635
	රසායනාගාර පරිත්‍යාග CEFAS ආයතනය			2,630,730		994,744
	ඊ-අපද්‍රව්‍ය ප්‍රදානය			500,000		500,000
	මාර්ගගත ජල තත්ත්ව අධීක්ෂණය			1,520,673		1,520,673
	පිළිසරු ව්‍යාපෘතිය			1,427		1,426
	ඕසෝන් වියානා දැනුවත් කිරීමේ වැඩසටහන			263,665		273,954

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	ගුවන්විදුලි වැඩසටහන් ප්‍රදානය			13,465		13,465
	වායු තත්ත්ව අධීක්ෂණ VET			350,833		-
	අධ්‍යාපන දැනුවත් කිරීම් සහ හරිත සම්මාන ආදායම			199,500		-
	ලෝක මිහිකත දිනය			90,000		-
				28,452,862		**27,871,443**
24	පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන			393,617,165		377,888,375
				393,617,165		**377,888,375**
25	**ප්‍රාග්ධන දීමනාව**					
	Dutch ප්‍රාග්ධන ප්‍රදානය			1,864,527		2,028,383
	EA1P ප්‍රදානය			3,679,446		4,002,801
	ප්‍රාග්ධන ප්‍රදාන -භාණ්ඩාගාර අරමුදල			224,418,095		232,540,252
	පුස්තකාල පොත් ප්‍රදාන			3,410		3,711
	ජාත්‍යන්තර සංවර්ධන සංගමය			66,895,728		72,774,613
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාග්ධන ප්‍රදානය			437,582		476,038
	GIS ප්‍රාග්ධන ප්‍රදානය			46,779		289,505
	නේවර් ෆීල්ඩ් සෙන්ටර් ප්‍රදානය			287,256		312,500
	Mezzanine මහල			15,511,803		16,875,000
	පුස්තකාල තොරතුරු මධ්‍යස්ථානය			103,138		112,201
	පුරෝගාමී වැඩසටහන -අමාත්‍යාංශය			848,355		556,458
	මධ්‍යම පරිසර අධිකාරිය රසායනාගාරය දියුණු කිරීම			36,115,154		39,289,001
	පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය			8,336,068		9,068,653
	SAICM අනතුරුදායක අපද්‍රව්‍ය කළමනාකරණය			96,130		104,578
	SAICM පරිසර දූෂණ පාලනය			567,539		617,415
	පිළිසරු ව්‍යාපෘතිය -රසායනාගාර උපකරණ			1,365,123		1,485,092
	EDCF ගොඩනැගිලි අරමුදල			1,234,502		1,342,991
	KOICA ප්‍රාග්ධන ප්‍රදානය			263,410,575		286,559,440
	යුනිසෙෆ්			38,239		41,600

මධ්‍යම පරිසර අධිකාරිය						
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්						
දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා				2022		2021
				රුපියල්.		රුපියල්.
	UNREDD වැඩසටහන			938,368		1,020,833
	පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය			9,951		10,826
	යුනෙස්කෝ ප්‍රාග්ධන ප්‍රදානය			66,567		72,417
	අධ්‍යාපන දැනුවත් කිරීම් සහ හරිත සම්මාන			992,705		880,445
	WEPA			1,556,628		1,693,426
	Dilu Transport (Pvt) Ltd			20,150		21,921
	සීමාසහිත කැපිටල් මහරාජා සංවිධානය			130,707		142,194
	ජලයේ ගුණාත්මකභාවය JAICA			1,681,474		2,926,950
	අමාත්‍යාංශය -මෝටර් රථ			643,453		700,000
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ,කිලිනොච්චි DO-මෝටර් රථ			160,863		175,000
	කැලණි ගඟේ ප්‍රාග්ධන ප්‍රදානය			41,045		44,652
	ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය සහ රසායනාගාර සවිබල ගැන්වීම			91,190		99,204
	VET වැඩසටහනේ දෙපාර්තමේන්තුව -මෝටර් රථ			74,433,549		80,974,867
	සුරකුමු ගංගා			6,024,748		6,554,211
	පසු විපරම් ප්‍රාග්ධන වත්කම් ක්‍රියාත්මක කිරීම			7,870,643		8,330,483
	CEFAS පරිත්‍යාග ප්‍රාග්ධන ප්‍රදාන			3,755,778		4,085,841
	ඒකාබද්ධ WM පිළිබඳ ව්‍යාපෘතිය පසු විපරම් කිරීම			2,803,010		2,787,184
	ජල නිරීක්ෂණ (JICA)			1,459,142		489,667
	ලෝක සෞඛ්‍ය සංවිධානය			2,702,501		-
	එක්සත් ජාතීන්ගේ ප්‍රදානය කරන ලද ව්‍යාපාරික තරඟය මොනරාගල			562,833		-
	R22 පදනම් වූ වායු සමීකරණය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දිරි දීමනා ගෙවීමේ ක්‍රමය			547,394		-
	පරේෂණ හා සංවර්ධන ඒකකය ප්‍රාග්ධන ප්‍රදානය			219,339		-
	ව්‍යාපාරික තරඟය මොනරාගල ප්‍රාග්ධන ප්‍රදානය			-		612,296
				731,971,488		**780,102,649**

මධ්‍යම පරිසර අධිකාරිය					
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්					
2022දෙසැම්බර් 31දිනට					
14	**දේපල ,පිරියත සහ උපකරණ**				
14.1	**පිරිවැය**				
		2022.01.01 දිනට ශේෂය	**වසර තුළ එකතු කිරීම්**	**වර්ෂය තුළ බැහැර කිරීම්**	**2022.12.31 දිනට ශේෂය**
	ස්ථාවර වත්කම්	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**
	ප්‍රාදේශීය කාර්යාල ඉඩම	2,450,000	-	-	2,450,000
	ගොඩනැගිල්ල	217,381,330	21,955,737	-	239,337,067
	පරිගණක සහ උපාංග	73,733,757	994,308	-	74,728,065
	දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය	395,200,000	-	-	395,200,000
	ගෘහ භාණ්ඩ සහ උපාංග	100,380,770	6,941,480	-	107,322,250
	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වර්ණ ගැන්වීම	7,656,197	-	-	7,656,197
	රසායනාගාර උපකරණ	261,201,066	2,940,000	-	264,141,066
	පුස්තකාල පොත්	11,061,697	-	-	11,061,697
	ජංගම රසායනාගාරය	87,394,743	-	-	87,394,743
	කාර්යාල උපකරණ	212,810,136	9,258,951	(99,900)	221,969,187
	මෝටර් වාහන	275,899,312	-	-	275,899,312
	නාම පුවරුව	1,669,852	17,185	-	1,687,037
	පිරියත සහ යන්ත්‍රෝපකරණ	9,874,412	-	-	9,874,412
	ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම	151,787,762	4,634,789	-	156,422,551
	ස්වභාවික ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	5,740,188	4,769,107	-	10,509,295
		1,814,241,222	51,511,557	(99,900)	1,865,652,879
	කල්බදු රඳවා තබා ගැනීම				
	ඉඩම - ප්‍රධාන කාර්යාලය	28,962,813	-	-	28,962,813

මධ්‍යම පරිසර අධිකාරිය					
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්					
2022දෙසැම්බර් 31දිනට					
14	**දේපල ,පිරියත සහ උපකරණ**				
14.1	**පිරිවැය**				
		2022.01.01 දිනට ශේෂය	**වසර තුළ එකතු කිරීම්**	**වර්ෂය තුළ බැහැර කිරීම්**	**2022.12.31 දිනට ශේෂය**
	ස්ථාවර වත්කම්	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**
	ඉඩම -රත්නපුර RO	9,474,188	-	-	9,474,188
		38,437,001	-	-	38,437,001
		1,852,678,221	**51,511,557**	**(99,900)**	**1,904,089,880**

මධ්‍යම පරිසර අධිකාරිය					
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්					
2022දෙසැම්බර් 31දිනට					
14.2	**සමුච්චිත ක්ෂයවීම්**				
		2022.01.01 දිනට ශේෂය	**වර්ෂය සඳහා ක්ෂයවීම් ගාස්තුව**	**බැහැර කිරීම් මත ක්ෂය වීම**	**2022.12.31 දිනට ශේෂය**
	ස්ථාවර වත්කම්	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**	**රුපියල්.**
	ප්‍රාදේශීය කාර්යාල ඉඩම				
	ගොඩනැගිල්ල	97,600,547	6,124,564	-	103,725,111
	පරිගණක සහ උපාංග	64,208,224	4,916,195	-	69,124,419
	දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය	138,320,000	19,760,000	-	158,080,000
	ගෘහ භාණ්ඩ සහ උපාංග	82,850,313	4,402,961 කි	-	87,253,274
	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වර්ණ ගැන්වීම	5,109,724	1,531,239 කි	-	6,640,963
	රසායනාගාර උපකරණ	185,685,778	15,499,228	-	201,185,006
	පුස්තකාල පොත්	10,060,780	290,426	-	10,351,206
	ජංගම විද්‍යාගාරය	13,867,553	8,275,200	-	22,142,753
	කාර්යාල උපකරණ	164,511,657	9,605,993	(13,384)	174,104,266
	මෝටර් වාහන	147,680,920	63,687,193	-	211,368,113
	නාම පුවරුව	1,395,138	81,055	-	1,476,193
	පිරියත සහ යන්ත්‍රෝපකරණ	8,837,269	213,403	-	9,050,672
	ප්‍රාදේශීය කාර්යාලය	28,231,295	3,808,458	-	32,039,753
	ස්වභාවික ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	4,213,158	298,727	-	4,511,885
		952,572,356	**138,494,642**	**(13,384)**	**1,091,053,614**
	කල් බදු				
	ඉඩම -ප්‍රධාන කාර්යාලය	13,419,046	579,256	-	13,998,302
	ඉඩම -රත්නපුර RO	1,571,471	315,490	-	1,886,961
		14,990,517	**894,747**	**-**	**15,885,264**
		967,562,873	**139,389,389**	**(13,384)**	**1,106,938,878**

මධ්‍යම පරිසර අධිකාරිය					
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්					
2022 දෙසැම්බර් 31දිනට			**2022**		**2021**

				රුපියල්.		රුපියල්.
14.3	**ශුද්ධ ඉදිරියට ගෙන යන අගය**					
	ප්‍රාදේශීය කාර්යාල ඉඩම			2,450,000		2,450,000
	ගොඩනැගිල්ල			135,611,956		119,780,783
	පරිගණක සහ උපාංග			5,603,646		9,525,533
	දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය			237,120,000		256,880,000
	ගෘහ භාණ්ඩ සහ උපාංග			20,068,976		17,530,457
	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වර්ණ ගැන්වීම			1,015,233		2,546,472
	රසායනාගාර උපකරණ			62,956,060		75,515,287
	පුස්තකාල පොත්			710,491		1,000,917
	ජංගම විද්‍යාගාරය			65,251,990		73,527,190
	කාර්යාල උපකරණ			47,864,920		48,298,479
	මෝටර් වාහන			64,531,199		128,218,392
	නාම පුවරුව			210,844		274,714
	පිරියත සහ යන්ත්‍රෝපකරණ			823,740		1,037,143
	ප්‍රාදේශීය කාර්යාලය			124,382,798		123,556,468
	ස්වභාවික ක්ෂේත්‍ර මධ්‍යස්ථානය			5,997,410		1,527,031
				774,599,264		861,668,865
	කල් බදු					
	ඉඩම -ප්‍රධාන කාර්යාලය			14,964,511		15,543,767
	ඉඩම -රත්නපුර RO			7,587,226		7,902,716
				22,551,737		23,446,483
				797,151,001		**885,155,348**

Chapter 19 : විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FWL/B/CEA/01/F.ACC./22
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 මැයි 31 දින

සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය.

මධ්‍යම පරිසර අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පරිසර අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුමේ පෙර වර්ෂය අවසානයට එකතුව රු.9,596,172 ක් වූ තොග අයිතම 07 ක ශේෂය, සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ ආරම්භක ශේෂය වශයෙන් ගැනීමේදී රු.10,657,132 ක් වශයෙන් රු.1,060,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. ආරම්භක ශේෂය, ඊට අදාළව ඉදිරිපත් කළ උපලේඛනය සමඟ සැසඳීමේදී ද රු.261,828 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමේ අයි වෙන්කිරීමක් ලෙස දක්වා තිබූ රු.1,708,574 ක වටිනාකම, ගිණුම් තුලනය කිරීම සඳහා භාවිතා කළ අවිනිශ්චිත ගිණුම් ශේෂයන් බවට නිරීක්ෂණය වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.18,251,035 ක කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ශේෂයේ නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.906,692 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සහ ඉදිකිරීම් කටයුතු අවසන් කළ රන්දෙණිය සොබා කෙත මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වියදම් රු.4,168,141 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර මාර්ගස්ථ තොග හා කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව එම වත්කම්වලට අදාළව ක්ෂය කිරීම් ද ගණනය කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය අඩුවෙන් දැක්වුණි.

(ඈ) පරිසර අධිකාරියේ Firewall මෘදුකාංගය සපයා ස්ථාපනය කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත 2018 වර්ෂයේ ලබා දී තිබූ රු.3,475,005 ක ඇණවුමකට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,127,505 ක් ගෙවා තිබුණ ද, ඊට අදාළව කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග ගිණුමේ ඇතුළත් වටිනාකම රු.1,563,877 ක් පමණක් වූයෙන් එම ගිණුමේ ශේෂය රු.1,563,628 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) පරිසර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර එම අමාත්‍යාංශය විසින් 2001, 2003 හා 2012 යන වර්ෂවලදී අධිකාරියේ පරිහරණය සඳහා ලබා දී තිබුණු රු.27,630,000 ක් වටිනා කැබ් රථ 16 ක නීත්‍යානුකූල අයිතිය පවරා නොගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) පාරිසරික බලපෑම් ඇගයීම් ඒකකය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තහවුරු කළ පාරිසරික ඇගයීම් බලපත්‍ර ආදායම රු.22,028,440 ක් වුවද, ලෙජර් ගිණුමට මාරුකළ ආදායම රු.568,877 ක් පමණක් වූයෙන් ආදායම් වශයෙන් ගිණුම්ගත විය යුතු රු.21,459,563 ක් ගෙවිය යුතු වියදම් වශයෙන් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(උ) ඌව පළාත් කාර්යාලය මඟින් ඉදිරිපත් කරන ලද ගෙවිය යුතු පාරිසරික බලපෑම් ඇගයීම් බලපත්‍ර වටිනාකම රු.8,256,157 ක් වුවද, ප්‍රධාන කාර්යාලයේ පොත් අනුව එම වටිනාකම රු.14,377,105 ක් වූයෙන් රු.6,120,948 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) 2021 දෙසැම්බර් 31 දිනට අදාළව සිදුකර 2022 දෙසැම්බර් මස ලබා දී තිබුණු පුස්ථකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව ලියා හැරී පොත් 1,024 ක් හා නැති වූ පොත් 2,746 ක් සම්බන්ධයෙන් ගිණුම් ගැලපීම් සිදු කර නොතිබුණි.

(එ) අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එකතු කළ අගය මත බදු අය කළ හැකි සැපයුම රු.416,488,904 ක් වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ එකතු කළ අගය මත බදු වාර්තා අනුව එම අගය රු.394,686,528 ක් වූයෙන් බදු අය කළ හැකි සැපයුම රු. 21,802,376 ක් ද, ඊට අදාළව සියයට 15 ක් වන එකතු කළ අගය මත බද්ද රු.3,270,356 ක් ද අඩුවෙන් ගිණුම් ගතකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණි.

(ඒ) අධිකාරියේ තොග මිලදී ගැනීම් අදාළ තොග ගිණුම්වලට හර නොකර වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණු අතර තොග නිකුත් කිරීම් ගිණුම් ගලපා නොතිබුණි. වර්ෂය අවසානයේ භෞතික සත්‍යාපන තොගය අනුව තොග ගිණුම්වල ඉතිරි තොග ශේෂය ගලපා වෙනස වියදම් ගිණුම්වලට හර හෝ බැර වශයෙන් ගැලපීම් කර තිබුණි. වියදම් ගිණුම්වලට බැර වූ වටිනාකම්වල එකතුව ඊළඟ වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණු අතර ඒ ආකාරයට පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු වියදම් හර කර සමුච්චිත අරමුදලට බැර කළ වටිනාකම රු.9,959,382 ක් විය. තොග මිලදී ගැනීම් හා නිකුත් කිරීම් නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු නොකර මේ ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම, ගෙවිය යුතු වියදම හා සමුච්චිත අරමුදල් ශේෂය නිවැරදිව නිරූපණය වන බවට සනාථ කළ නොහැකි විය.

(ඔ) අධිකාරියට අයත් රත්නපුර පළාත් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2018 වසරේදී රු.1,675,350 ක් ගෙවා තිබුණ ද, එම ඉදිකිරීම සිදුකර නොතිබුණි. ගෙවූ මුදල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්විය යුතු වුවත්, ලැබිය යුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) වසර 30 ක බදු ගිවිසුම් යටතේ අධිකාරියට ලබා දී ඇති ඉඩම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණු අතර කන්තලේ බදු ඉඩම සඳහා 2010 සිට 2022 දෙසැම්බර් 31

දක්වා කාලයට අදාළව ගෙවිය යුතු රු.792,044 ක බදු මුදල සඳහා ගිණුම්වලින් වෙන් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ක) දේපල පිරියත හා උපකරණ පිරිවැය වටිනාකම තුළ ඇතුළත් ගෘහස්ථ වායු තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට අදාළ පිරිවැය රු.11,605,308 ක් වූ මිනුම් උපකරණ 2016 වසරේ සිට අක්‍රීයව පැවතුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 (අ) හා (ආ) ඡේද ප්‍රකාරව ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 24 ඡේදය ප්‍රකාර අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා සසඳා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ච) දේපල පිරියත හා උපකරණ තුළ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතයට ගන්නා පිරිවැය රු.374,750,208 ක් වූ අයිතම 08 ක් පැවතිය ද, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගතනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී

හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධිවිධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 4.1 ඡේදය	2017 නොවැම්බර් 06 දින පරිසර නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන පාරිසරික බලපෑම් හා ඇගයීම් ඒකකයට අනුයුක්ත කොට සිටි නිලධාරිණියක් මාසයක් කල් දී හෝ ඒ වෙනුවට මාසයක වැටුප ගෙවීමක් හෝ සිදු නොකර 2018 වර්ෂයේ ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර නිලධාරියෙකු ලෙස පත්වීම් ලබා අධිකාරියේ සේවය අතහැර ගොස් තිබුණි. එසේ වුවද, එම නිලධාරිණියට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 372(2)	2022 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීම් අත්තිකාරම් රු.3,469,331 ක් හා විවිධ අත්තිකාරම් රු.626,269 ක් වශයෙන් එකතුව රු.4,095,600 ක් පියවා නොතිබුණු අතර ඒ තුළ වසර 05 ඉක්ම වූ අත්තිකාරම් රු.791,900 ක් ද, වසර 02 ඉක්ම වූ අත්තිකාරම් රු.202,225 ක් හා මාස 01 ත් මාස 10 ත් දක්වා කාලයකට අදාළ අත්තිකාරම් රු.1,814,544 ක් ද විය.
(ii)	මුදල් රෙගුලාසි 104 (1) , (3) හා (4)	පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය

		දක්වා කාලය තුළ සිදු වූ වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදුකර කර නොතිබුණු අතර මූලික පරීක්ෂණ සිදුකළ වාහන අනතුරු 12ක අලාභ අයකර ගැනීමට හා වූදිතයින්ට විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.
	(ඇ) 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2004/පුස/1 (2006-සංශෝධිත) වක්‍රලේඛයේ 2, 3.1, 3.2 හා 4.2 ඡේද	අධිකාරියේ ජාතික පරිසර තොරතුරු කේන්ද්‍රයේ කටයුතු සඳහා පුස්තකාල කමිටුවක් පිහිටුවා නොතිබුණු අතර වාර්ෂිකව හා එහි භාරකාරිත්වය වෙනස් වන අවස්ථාවලදී තොග සමීක්ෂණය ද කර නොතිබුණි. මේ හේතුවෙන් 2022 දෙසැම්බර් 23 දින ඉදිරිපත් කර තිබුණු 2021 වර්ෂය අවසාන සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගත් නැතිවූ පොත් 2746 ක අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගත නොහැකි වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 24(ඇ) -2(1) වගන්තිය	පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වගකිව යුතු බව දක්වා තිබුණ ද, මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, වලව්වත්ත වතුරාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සහ බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීමෙන් මානව ක්‍රියාකාරකම්

හා ස්වාභාවික සිද්ධීන් ආශ්‍රයෙන් පැන නගින ගැටළු නිරාකරණ කරගෙන එම පාරිසරික කළාප ආරක්ෂා කර ගැනීම නිසි පරිදි සිදුවන බවට සහතික කළ නොහැකි විය.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික (සංශෝධිත) පනතේ 23 (අ) සහ (ආ) වගන්ති

අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ එම පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට හා වෙනත් උපමානවලට අනුකූලව හැර පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම සිදු නොකළ යුතු වුවද, මධ්‍යම පරිසර අධිකාරියේ අප ජල පිරිපහදු පද්ධතිය සඳහා භාවිතය ආරම්භ කළ දින සිට විගණිත දිනය වූ 2023 මාර්තු 23 දක්වා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සංස්ථාපනය කර වසරක් වැනි කෙටි කාලයක් ගත වූ පුද්ගලික සමාගමක් සමඟ 2014 අගෝස්තු 08 දින ඇති කර ගත් ගිවිසුමක් මත එම සමාගමේ පූර්ව ක්‍රියාකාරකම් හා කාර්යසාධනය පිළිබඳ අදහසකින් තොරව කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියකට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන ගිවිසුමකට එළැඹ තිබුණු නමුත් මේ දක්වා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර එම සමාගමේ පවතින අභ්‍යන්තර ගැටලු හා නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් එම සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ද ගැටලුකාරී තත්ත්වයක් පැවතුණි. ඒ හේතුවෙන් වැය කළ රු.64,356,400 ක මුදල ද, 2009 වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය මඟින් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා වැය කළ රු. 13,071,372 ක මුදල ද, කසළ භාවිතා කරමින් විදුලිය නිපදවීම සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ද නිෂ්කාර්ය වී තිබිණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ඒකකයේ කාමර වෙන් කිරීම සඳහා ලබාදුන් කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.629,190 ක් වුවද, ඊට අදාළව 2021 දෙසැම්බර් 27 දින ඉදිරිපත් කර තිබූ බිල්පත්වල වටිනාකම රු.1,116,072 ක් වෙත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 177 ක් විය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව මෙම විවලනය සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය සඳහා අවුරුදු 50 ක බදු පදනම මත 2000 වර්ෂයේ අතිරේකව ලබා ගත් පර්චස් 129.88 ක ඉඩම් කොටස වර්ෂ 19 කට වැඩි කාලයකත්, පර්චස් 109.88 ක බිම් කොටස වසරකට වැඩි කාලයක් සිට භුක්ති විඳිමින් පැවතිය ද අදාළ බදු මුදල් ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එයින් පර්චස් 20 ක ඉඩම් කොටසක් වෙනත් ආයතනයකට ලබා දීමට කටයුතු කර තිබුණි.

(ආ) සුරකිමු ගංගා වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන ආකාරයට එම ප්‍රතිපාදනවලින් රු.2,030,000 ක් වැය කර Electric cart රථයක් මිලදී ගෙන කතරගම පූජා භූමියේ පරිහරණය සඳහා යොදවා තිබුණි.

(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 1988 වර්ෂයෙන් පසු සංශෝධනය කර නොතිබුණි.

(ඈ) පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇති කර්මාන්ත සමීපව අධීක්ෂණය කිරීම, විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වන ජාතික පාරිසරික ඇගයීම් ව්‍යාපෘති සමීපව අධ්‍යයනය කිරීම සහ මහා පරිමාණ ක්‍රියාවලි හා සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබාදුන් වාහනයක් එම අරමුණුවලින් බැහැරව සභාපති කාර්යාලයට අනුයුක්ත කර 2021 හා 2022 වර්ෂයන්හි රු.105,165 ක් වැය කර ඉන්ධන ලීටර් 533.80 ක් යොදා කිලෝ මීටර් 2,669 ක දුරක් ධාවනය කර තිබුණු අතර තවත් රු.719,321 ක් වැය කර ඉන්ධන ලීටර් 4004.38 ක් මිලදී ගෙන සිදු කළ ධාවන කටයුතු රාජකාරී කටයුතු සඳහා බවට සහතික නොකරන ලදී.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී නියමිත පරිදි ප්‍රධාන කාර්යාල ගිණුමට මාරු නොකර රු.333,488,686 ක මුදලක් මාස ගණනාවක් දිස්ත්‍රික් කාර්යාල බැංකු ජංගම ගිණුම් තුළ රඳවා ගැනීමත්, ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමෙහි වියදම් අවශ්‍යතාවය ඉක්මවා රු.129,209,300 ක සාමාන්‍ය මාසික තැන්පතු ශේෂය ද තබා ගැනීමත් හේතුවෙන් එම මුදල් ආයෝජනය කිරීම තුළින් උපයා ගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ඊ) සුරකිමු ගංඟා වැඩසටහනට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු.1,083,333 කට මිලදී ගත් තණතොළ කපන යන්ත්‍ර (Brush Cutter) 60 න් රු.98,484 ක් වටිනා යන්ත්‍ර 05 ක් අස්ථානගත වී තිබුණු අතර ඊට අදාළව සිදුකරන පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(උ) පරිසර කළමනාකරණ කටයුතු සිදු කිරීමේදී තොරතුරු රැස් කිරීම අරමුණු කොටගෙන 2020 දෙසැම්බර් 15 දින රු. මිලියන 1.39 කට මිලදී ගෙන තිබූ ඩ්‍රෝන යන්ත්‍රය ගුවන්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ ගිවිසුම් අත්සන් කිරීමට 2022 ජූලි 15 දක්වා කල්ගත කර තිබුණු අතර ඉන් අනතුරුව ද කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට නිරීක්ෂණය නොවිය.

(ඌ) පුස්තකාලයේ පොත්පත් සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන පරිග්‍රහණ ලේඛනයෙන් පොත් 1983 ක් ඉවත් කිරීම පැහැදිළි ක්‍රමවේදයකට අනුව සිදු කර නොතිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලබා ගත් බවට ද සාක්ෂි නොතිබුණි.

(එ) නිසි අධීක්ෂණයක් යටතේ ඉන්ධන ලැබීම්, නිකුත් කිරීම් හා ලේඛනගත කිරීම් සිදු කර නොතිබීමෙන් 2022 ජූනි 08 දින සිට 2022 අගෝස්තු 16 දින දක්වා කාලය තුළ අධිකාරියේ විදුලි ජනන යන්ත්‍රය සඳහා මිලදී ගෙන ගබඩා කර තිබුණු රු.713,800 ක් වටිනා ඩීසල් ලීටර් 1660 ක් අස්ථාන ගත වී තිබුණු අතර ඊට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභයන් අයකරගෙන නොතිබුණි.

(ඒ) දොම්පේ ඝනීපාරක්ෂක බිම් පිරවුමට 2018 වර්ෂය දක්වා අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් බියගම ප්‍රාදේශීය සභාවෙන් රු.1,427,728 ක් හා කොළඹ නගර සභාවෙන් රු.1,313,202 ක් වශයෙන් අයවිය යුතු එකතුව රු. 2,740,930 ක් වර්ෂ 04කට අධික කාලයක් තිස්සේ අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) අධිකාරිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ විදේශාධාර වශයෙන් ලැබී ව්‍යාපෘති සඳහා වැයකර ඉතිරි වී ඇති රු.18,527,257 ක් වර්ෂ 04 ක සිට වර්ෂ 09ක් දක්වා කාලයක් නිරවුල් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වගකීමක් යටතේ දක්වා තිබුණි.

(ඕ) 2016 හා 2017 වර්ෂයන්හිදී පිළිවෙළින් රු.3,577,108 ක් හා රු.8,028,200 ක් ගෙවා මිලදී ගෙන තිබූ Dusk Track DRX Desktops Model 8553 උපකරණය සහ Micro mate Instantal වර්ගයේ කම්පන විශ්ලේෂණ උපකරණ 02 ක් නියමිත කාලය තුළ ක්‍රමාංකනය සිදු නොකිරීම නිසා 2022 වර්ෂයේ අවසානය දක්වාම නිෂ්කාර්යව පවතුණි.

(ක) පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසිවලට පටහැනිව මාතර අකුරැස්ස ප්‍රාදේශීය සභාවට අයත් කාබනික පොහොර නිෂ්පාදන අංගනයේ එකතු වන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පරිසර හානියක් සිදු නොවන ආකාරයට සනීපාරක්ෂක ලෙස බැහැර කිරීමට කටයුතු නොකර අනාරක්ෂිත පරිදි විවෘත භූමියකට බැහැර කර තිබුණු අතර භූගත ජලයට හෝ බාහිර පරිසරයට එක් නොවන ආකාරයට කළමනාකරණය කළ යුතු කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියේදී ජනනය වන ක්ෂීරිතය (Leachate) මඟින් වළවල් පිරීගොස් බාහිර පරිසරයට එකතුවීමේ අවධානමක් පවතින බවට ද නිරීක්ෂණය විය. තවද, මෙම පරිශ්‍රය තුළ යාවත්කාලීන කරන ලද ගිණි නිවීමේ උපකරණ සහ පහසුකම් ද පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ග) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණ කටයුතු සඳහා වසර 05 ක ගිවිසුම් කාලයකට 2013 වර්ෂයේදී අධිකාරිය වෙත ලබා දී ඇති අංක LK – 8428 දරන ජංගම වායු තත්ත්ව රසායනාගාරයේ ගිවිසුම් කාලය 2018 ජූලි මස අවසන් වී තිබුණි. එසේ වුවද, එම ගිවිසුම නැවත දීර්ඝ කර ගැනීමට හෝ වත්කම මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති